# පෙරදිග සංගීතය

## 12 ශ්‍රේණිය

ගුරු මාර්ගෝපදේශය
(2017 සිට ක්‍රියාත්මක වේ)



සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව
www.nie.lk

# පෙරදිග සංගීතය

## ගුරු මාර්ගෝපදේශය

## 12 ශ්‍රේණිය

**(2017 වර්ෂයේ සිට ක්‍රියාත්මක කෙරේ)**


**සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**ජාතික අධ්‍යාපන ආයතනය**
**මහරගම**
**ශ්‍රී ලංකාව**

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපෑල : info@nie.lk

පෙරදිග සංගීතය
12 ශ්‍රේණිය
ගුරු මාර්ගෝපදේශය
ප්‍රථම මුද්‍රණය - 2017

© ජාතික අධ්‍යාපන ආයතනය

සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය,
මහරගම,
ශ්‍රී ලංකාව.

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපෑල : info@nie.lk

## අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවුඩය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිර්දේශිත ජාතික අධ්‍යාපන අරමුණු සාක්ෂාත් කර ගැනීම සහ පොදු නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සහිත ව එවකට පැවති අන්තර්ගතය පදනම් වූ විෂයමාලාව නවීකරණයට භාජනය කොට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු අදියර, වර්ෂ 2007 දී ජාතික අධ්‍යාපන ආයතනය විසින් ශ්‍රී ලංකාවේ ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදි.

පර්යේෂණවලින් අනාවරණය වූ කරුණු ද, අධ්‍යාපනය පිළිබඳ ව විවිධ පාර්ශ්වයන් ඉදිරිපත් කළ යෝජනා ද පදනම් කොට ගෙන සිදු කරන ලද විෂයමාලා තාර්කිකරණය කිරීමේ ක්‍රියාවලියක ප්‍රතිඵලයක් ලෙස විෂයමාලා චක්‍රයේ දෙවැනි අදියර අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දීම 2015 වසරේ සිට ආරම්භ කර ඇත.

මෙම තාර්කිකරණ ක්‍රියාවලියේ දී සියලු ම විෂයයන්ගේ නිපුණතා පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූල ව ගොඩ නැගීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සංකලනය භාවිත කර ඇති අතර විවිධ විෂයයන්හි දී එක ම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත් වීම හැකිතාක් අවම කිරීම, විෂය අන්තර්ගතය සීමා කිරීම සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍ය මිතුරු විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සංකලනය ද භාවිත කර ඇත.

ගුරු භවතුන්ට පාඩම් සැලසුම් කිරීම ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියෙහි සාර්ථක ව නිරත වීම, පන්ති කාමර මිනුම් හා ඇගයීම් ප්‍රයෝජනවත් පරිදි, යොදා ගැනීම සඳහා අවශ්‍ය වන මාර්ගෝපදේශ ලබාදීමේ අරමුණින් නව ගුරු මාර්ගෝපදේශ හඳුන්වා දී ඇත. පන්ති කාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයෙකු ලෙස කටයුතු කිරීමට මෙම මාර්ගෝපදේශ උපකාරී වනු ඇත. සිසුන්ගේ නිපුණතා වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරා ගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙමගින් ලබා දී තිබේ. එමෙන් ම නිර්දේශිත පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළිබඳ ව වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නොවේ. එම නිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායී වීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසා ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමග සමගාමී ව භාවිත කිරීම අත්‍යවශ්‍ය වේ.

තාර්කිකරණය කරන ලද විෂය නිර්දේශ, නව ගුරු මාර්ගෝපදේශ හා නව පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් මිදී ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන රටාවක් හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට එළඹීම මගින් වැඩ ලෝකයට අවශ්‍ය වන්නා වූ නිපුණතා හා කුසලතාවන්ගෙන් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීමයි.

නව විෂය නිර්දේශ සහ ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කිරීමේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ ද, ආයතන සභාවේ ද, රචනයේ දී දායකත්වය ලබා දුන් සියලු ම සම්පත්දායකයින් හා වෙනත් පාර්ශ්වයන්ගේ ද ඉමහත් කැපවීම ඇගයීමට ද මෙය අවස්ථාවක් කර ගනු කැමැත්තෙමි.

**ආචාර්ය ජයන්ති ගුණසේකර**

**අධ්‍යක්ෂ ජනරාල්**

**ජාතික අධ්‍යාපන ආයතනය**

**මහරගම**

## නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවුඩය

ඉගෙනුම, පුළුල් ක්ෂේත්‍රයක විහිද යන්නකි. එය ජීවිත අතිමහත් බවට ද, ඉතා ම සරල බවට ද පත්කරයි. මනුෂ්‍යයා ඉගෙනුම් කුසලතාවෙන් උත්කෘෂ්ට ය. මානව සමාජ සංවර්ධනය කේන්ද්‍ර කොට ගත් රටක්, සමාජයක් බුද්ධිය විසින් හඳුනාගත් අසම්මතයන් බැහැර කිරීමට ද සුභාවිතයන් තුළින් නව ලොවක් නිර්මාණය කර ගැනීමට ද මෙවලම කරගනු ලබන්නේ ඉගෙනුමයි.

ඉගෙනුම සඳහා වටිනා යමක් ද, ඉගෙනුම් ක්‍රමවේදයන් හා පහසුකම් ද අධ්‍යාපනය වටා නිර්මාණය විය යුතු ය. විෂය මාලාව, විෂය නිර්දේශ, මාර්ගෝපදේශ, සුසාධ්‍යකරුවන් ඉගෙනුම් ක්ෂේත්‍රයට එක්වනුයේ මේ ආකාරයෙනි.

නූතන ශ්‍රී ලංකාව ගෝලීය ප්‍රවණතාවන් මෙන් ම පුරාතන උරුමයන් ද සම්මිශ්‍රණය කර ගනිමින් ස්වීය අධ්‍යාපන රටාවක් හිමි කරගෙන ඇත. කාලීන අවශ්‍යතා මත ප්‍රතිසංස්කරණයන් තුළින් වසර අටකට වරක් යාවත්කාලීන වන විෂය මාලාවේ ඉගෙනුම් සම්පතක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශ නිර්මාණය වේ.

විෂයයෙහි අරමුණුවල සංගතතාව ජාතික මට්ටමින් පවත්වාගත යුතු ය. එහෙත් ගුරු මාර්ගෝපදේශයන්හි ඉගෙනුම් ක්‍රමවේදයන්, අකුරක්වත් වෙනස් නොකොට පිළිපැදිය යුත්තක් නම් නොවේ. විෂය නිර්දේශයෙහි නිපුණතා, නිපුණතා මට්ටම්, සාධනය වීම සඳහා විෂය අන්තර්ගතය තුළින් ඉගෙනුම් පල සම්ප්‍රාප්තිය පිණිස ඉගෙනුම් ක්‍රමවේද නිර්මාණශීලී ව වෙනස්කර ගැනීමට සුසාධ්‍යකරුවන්ට පැහැදිලිව ම ඉඩක් ඇති බව සඳහන් කරමි. ශිෂ්‍ය සාධන ප්‍රතිශතය ඉහළ මට්ටමකට ගැනීම සඳහා උදව් වන, පහසුකම් සලසන ගුරු භූමිකාවට කිසියම් ප්‍රවේශයක් සඳහා නිර්මාණය වන ගුරු මාර්ගෝපදේශ ශික්ෂකයාහට ද දෙගුරුනට ද භාවිත කළ හැක. අදාළ පෙළ පොතට සහකරුවකු වන ගුරු මාර්ගෝපදේශය තවත් පෙළ පොතක් නොවන බව දැන ගුරුභවතුන් ගුරු මාර්ගෝපදේශ හා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ සම්පාදිත අදාළ පෙළ පොත යන සම්පත් ද්‍රව්‍ය දෙක ම භාවිත කළ යුතු ය.

ඒ ඒ විෂයයන්හි සාධනය පිළිබඳ ඇගැයීම් සිදුකරන ජාතික මට්ටමේ පරීක්ෂකවරයෙකු වුව ද අපේක්ෂා කරන සාධනයන්, විෂය ඉගැන්වීමට මග පෙන්වන සුසාධ්‍යකරුවන් විසින් පාඩම අවසානයෙහි පන්ති කාමරයේ දී දරුවන් සමග ප්‍රත්‍යක්ෂකරණයට පත්විය යුතු ය. එම ඒකාත්මික වීම සඳහා වූ ප්‍රබෝධාත්මක සංස්කෘතියක් ගොඩනගා ගැනීමට ගුරු මාර්ගෝපදේශය පහුරක්, යාත්‍රාවක් කරගනු ඇතැයි ආයාචනා පූර්වක ව අපේක්ෂා කරමි.

**ආචාර්ය පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි**
**පීඨාධිපති, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්**
**භාෂා මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය**
**ජාතික අධ්‍යාපන ආයතනය.**

## විෂයමාලා කමිටුව

| | |
|---|---|
| **උපදේශකත්වය හා අනුමතිය** | ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය,<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| විෂය උපදේශනය | සුදත් සමරසිංහ අධ්‍යක්ෂ, සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව. |
| **විෂය සම්බන්ධීකරණය** | ජානකී පතිරණගේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,<br>සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව |
| **බාහිර සම්පත් දායකත්වය** | |
| ඩබ්. වී. ජී. විතානගේ | අතිරේක කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ, (විශ්‍රාමික),<br>කලාප අධ්‍යාපන කාර්යාලය, රත්නපුර. |
| ඩී. චානක පීරිස් | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය,<br>කොළඹ 07. |
| කපිල මැද්දෙගොඩ | මධ්‍යස්ථානාධිපති,<br>සම්පත් මධ්‍යස්ථානය, මීගොඩ |
| කේ. කේ. එස්. ජයවික්‍රම | සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (විශ්‍රාමික),<br>කලාප අධ්‍යාපන කාර්යාලය, පිළියන්දල. |
| රංජිත් ප්‍රියන්ත සිල්වා | කථිකාචාර්ය, ගුරු විද්‍යාලය, ගිරාගම. |
| ආර්. ඩී. පෙරේරා | ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, මහනුවර. |
| ඊ. ඒ. ප්‍රේමසිරි | ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, කළුතර. |
| ටී. එච්. එම්. ශාන්ත | ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, මුලටියන. |
| **අභ්‍යන්තර සම්පත් දායකත්වය** | |
| ජානකී පතිරණගේ | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,<br>සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව. |
| **භාෂා සංස්කරණය** | |
| අමරසිරි වික්‍රමරත්න | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,<br>භාෂා අධ්‍යයන අංශය,<br>ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය, ඔළුවිල්. |
| ශ්‍රීනාත් ගණේවත්ත | භාෂා සංස්කාරක |
| **පරිගණක යතුරු ලියනය** | එම්.ඒ.ජේ. මංචනායක, කුඹුක්ගැටේ ම.ම.වි.<br>ඉබ්බාගමුව.<br>කේ. ඒ. ඒ. ජයරාණි ගුණතිලක |
| **පිටකවර නිර්මාණය** | රවීන්ද්‍ර තේනුවර |
| **විවිධ සහාය** | ලක්ෂ්මි පෙරේරා<br>එන්. දීපා ශිරෝමණී<br>ප්‍රේමරත්න පෙරේරා |

# පටුන

පිටුව


| | |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල් පණිවුඩය | iii |
| අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල් පණිවුඩය | iv |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් පණිවුඩය | v |
| විෂයමාලා කමිටුව | vi |
| පටුන | vii |
| හැඳින්වීම | viii |
| ජාතික අධ්‍යාපන පද්ධතිය සඳහා අරමුණු | ix |
| මූලික නිපුණතා | x |
| පෙරදිග සංගීත විෂය අරමුණු | xii |
| ජාතික පොදු අරමුණු සහ පෙරදිග සංගීත විෂය අරමුණු අතර සම්බන්ධතා දැක්වීම | xiii |
| නිපුණතා, නිපුණතා මට්ටම, විෂය අන්තර්ගතය, ඉගෙනුම් පල සහ කාලච්ඡේද | xix |
| වාර බෙදා දැක්වීම (වාර සටහන) | xix |
| පෙරදිග සංගීත විෂය ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් | xxii |

# හැඳින්වීම

නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණය යටතේ උසස් පෙළ විෂය නිර්දේශය 2017 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ. පෙරදිග සංගීතය විෂයයක් ලෙස හැදෑරීමෙන් ශිෂ්‍යයා තුළ වර්ධනය විය යුතු ප්‍රධාන නිපුණතා 11ක් මෙම විෂය නිර්දේශය මගින් ආවරණය කෙරේ.

6 සහ 11 ශ්‍රේණිවල දී අධ්‍යයනය කළ විෂය කරුණු තව දුරටත් ගැඹුරින් අධ්‍යයනය කිරීම උසස් පෙළ දී අපේක්ෂිත ය. එසේ ම සංගීතය තම නිර්මාණ කාර්යයන්ට යොදා ගැනීම මෙන් ම සංගීතයේ භෞතික විද්‍යාත්මක, ජීව විද්‍යාත්මක හා මනෝ විද්‍යාත්මක අධ්‍යයනයන්ය පිළිබඳ ව අධ්‍යයනය කිරීමට ද මඟ පෙන්වීම හා පරිගණකයෙන් සංගීත නිර්මාණකරණයට පිවිසීමට අත්වැලක් සැපයීම ද මෙම විෂය නිර්දේශයෙන් සිදු කොට ඇති නව්‍ය ප්‍රවේශයන්ය.

පන්ති කාමරයෙන් ලබා ගන්නා අධ්‍යාපනයට අමතර ව අන්තර්ජාලය හා පුස්තකාලය පරිශීලනයෙන් තම දැනුම් පරාසය පුළුල් කර ගැනීමට සිසුන් පෙළඹවීම මෙහි නිර්දේශිත විෂය කරුණු පිළිබඳ වැඩිදුර අධ්‍යයනය කිරීමට සිසුන්ට කෙරෙන වටිනා මඟපෙන්වීමක් වනු ඇත.

නිර්දේශිත විෂය කරුණු ගායනය මූලික කොට ගෙන ගොඩ නඟා ඇති වුව ද කිසියම් ශිෂ්‍යයෙක් වාදනය මූලික කොටගෙන මෙම විෂයය හදාරන්නට අපේක්ෂා කරන්නේ නම් නිර්දේශිත ස්වර වාද්‍ය භාණ්ඩයක් මගින් සියලු ම කොටස් ප්‍රායෝගික ව අධ්‍යයනය කළ හැකි ය. නිර්දේශිත ස්වර වාද්‍ය භාණ්ඩ වන්නේ, වයලින්, එස්රාජ්, දිල්රුබා, සිතාර්, බටනලා, සරෝද්, සන්තූර්, සාරංගි, ෂෙහනායි, ගිටාර්, සහ ඉංග්‍රීසි මැන්ඩලීනය යි.

ගායනය හෝ වාදනය ප්‍රධාන කරගත් සෑම ශිෂ්‍යයෙකු තුළම ස්වර පුවරු වාද්‍ය භාණ්ඩයක නිපුණතාවය ලබා දීම අනිවාර්ය වේ. සංගීතය උසස් අධ්‍යාපනයට හැදෑරූ 21 වන සියවසේ දරුවෙක් තුළ ස්වරපුවරු වාද්‍ය භාණ්ඩයක නිපුණතාවය ලැබිය යුතු වන්නේ ලෝක සංගීතය පරිශීලනය කිරීමට පහසු වීමටය. මේ තුළින් ඕනෑම ස්වර ප්‍රස්තාරයක් පහසුවෙන් වාදනය කර අධ්‍යයනය කිරීමේ හැකියාව ලැබෙනු ඇත. ප්‍රායෝගික ඇගයීමක දී මේ සඳහා 10% ලකුණු හිමිවේ.

මීට අමතරව ගායනය ප්‍රධාන කරගත් අපේක්ෂකයෙක් සරලව වාදන කුසලතාවය ප්‍රදර්ශනය කළ යුතුව ඇත. මෙහිදී පාසලේ භාවිත වන ඕනෑම ස්වර වාද්‍ය භාණ්ඩයක දක්ෂතා ශිෂ්‍යාට ප්‍රදර්ශනය කළ හැකිවේ. එසේ නැතිනම් තබ්ලාවේ සරල වාදන හැකියා ප්‍රදර්ශනය කළ හැකිය. ඉහත දැක්වූ නිර්දේශිත වාද්‍ය භාණ්ඩ අතරින් එකක් තෝරා ගෙන වාදනය ප්‍රධාන කරගත් සිසුවෙක් සරලව ගායන හැකියා ප්‍රදර්ශනය කළ යුතුවේ. එසේ කළ නොහැකි නම් පාසලේ භාවිත වන වෙනත් ඕනෑම ස්වර වාද්‍ය භාණ්ඩයක දක්ෂතා ශිෂ්‍යයාට ප්‍රදර්ශනය කළ හැකිවේ. එසේ නැතිනම් තබ්ලාවේ සරල වාදන හැකියා ප්‍රදර්ශනය කළ හැකිය. ප්‍රායෝගික ඇගයීමක දී මේ සඳහා ද 10% ලකුණු හිමිවේ.

# ජාතික අධ්‍යාපන පද්ධතිය සඳහා අරමුණු

## ජාතික අරමුණු

දෛනික ජීවිතය සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟාවීම සඳහා පුද්ගලයන්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතිය සහාය විය යුතු ය. වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අරමුණු නියම කරනු ලැබී ය. සමකාලීන අධ්‍යාපන ව්‍යූහයන් හා ක්‍රියාවලීන් තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ළඟා කරගත යුතු පහත දැක්වෙන අරමුණු ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් හඳුනාගෙන ඇත. මෙම අරමුණු සපුරා ගැනීම අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොටගෙන ඇත.

1. මානව අභිමානයට ගරු කිරීමේ සංක්ලපය මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කරගනිමින්, ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම හ සාමය ප්‍රවර්ධනය කිරීමෙන් ජාතිය ගොඩනැගීම සහ ලාංකේය අනන්‍යතාව තහවුරු කිරීම.

2. වෙනස් වන ලෝකයක අභියෝගයනට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැගි දායාදයන් හඳුනාගැනීම සහ සංරක්ෂණය කිරීම.

3. මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග වර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතාන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණය කිරීම සහ පවත්වාගෙන යාමට සහාය වීම.

4. පුද්ගලයන්ගේ මානසික හා ශාරීරික සුව සම්පත සහ මානව අගයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම.

5. සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම.

6. පුද්ගලයාගේ සහ ජාතියේ ජීව ගුණය වැඩි දියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායී කාර්යයන් සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම.

7. ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩගැසීමට හා ඒවා පාලනය කරගැනීමට පුද්ගලයන් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම.

8. ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවණීය ස්ථානයක් හිමි කරගැනීමට දායක වන යුක්තිය, සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුශලතා, පෝෂණය කිරීම.

# 3.0 මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු මුදුන්පත් කරගැනීමට දායක වනු ඇත.

**1. සන්නිවේදන නිපුණතා :**

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය ය න අනු කාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

**සාක්ෂරතාව** : සාවධාන ව ඇහුම්කන් දීම, පැහැදිලි ව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලාදායී අයුරින් අදහස් හුවමාරු කරගැනීම

**සංඛ්‍යා පිළිබඳ දැනුම** : භාණ්ඩ, අවකාශය සහ කාලය ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකුල ඉලක්කම් භාවිතය

**රූපක භාවිතය** : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති හා වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම.

**තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය** : පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද, සේවා පරිශ්‍රයන් තුළ දී ද, පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කරගැනීම.

**2. පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා :**

- නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තිය, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයාගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුශලතා
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම වැනි අගයන්
- චිත්තවේගී බුද්ධිය

**3. පරිසරයට අදාළ නිපුණතා :**

මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරයන්ට අදාළ වේ.

**සමාජ පරිසරය** : ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුශලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පුද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්.

**ජෛව පරිසරය** : සජීවී ලෝකය, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුදු, ජලය, වාතය සහ ජීව - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුශලතා

**භෞතික පරිසරය** : අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතා, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සැප පහසුව, ශ්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මළ බැහැර කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදීතාව හා කුශලතාව ඉගැනීම, වැඩ කිරීම සහ ජීවත්වීම සඳහා මෙවලම් හා තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුශලතා මෙහි අඩංගු වේ.

**4. වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා :**

ආර්ථික සංවර්ධනයට දායක වීම. තම වෘත්තීය ලැදියා සහ අභියෝග්‍යතා හඳුනාගැනීම. හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරාගැනීම සහ වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම යන හැකියාවන් උපරි ම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුශලතා.

**5. ආගම සහ ආචාර ධර්මයන්ට අදාළ නිපුණතා :**

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල ව හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයන් උකහාගැනීම හා ස්වීයකරණය.

**6. ක්‍රීඩාව හා විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා :**

සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්.

**7. ඉගෙනීමට ඉගෙනුම් පිළිබඳ නිපුණතා :**

ශීඝ්‍රයෙන් වෙනස් වන, සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීන ව ඉගැන්වීමත් සඳහා පුද්ගලයන්ට ශක්තිය ලබා දීම.

(ඉහත ජාතික අරමුණු හා මූලික නිපුණතා ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්ති රාමුවක් සඳහා යෝජනා ඇතුළත් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ 2003 දෙසැම්බර් වාර්තාවෙන් උපුටා ගැනිණ.)

# 4.0 පෙරදිග සංගීත විෂයයේ අරමුණු

1. රාගධාරී සංගීතාංග සහ සිද්ධාන්ත ඇසුරින් ශික්ෂණය ලබා ගායන වාදන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

2. ශ්‍රී ලාංකේය සංස්කෘතික උරුමය හා බැඳි ජනගායන, වාදන පිළිබඳ විමර්ශනාත්මක අත්දැකීම් ලබා එහි අගය විශ්ව සංගීතය කරා රැගෙන යාමට පෙළඹෙයි.

3. ශ්‍රී ලාංකේය, භාරතීය සහ බටහිර සම්භාව්‍ය සංගීතඥයින්ගේ නිර්මාණ පරිශීලනය කරමින් සම්භාව්‍ය සංගීත රසාස්වාදයේ හුරුව ලබයි.

4. ශ්‍රී ලාංකේය ව්‍යවහාරික සංගීත ක්ෂේත්‍රයේ ප්‍රබලතම අංගය ලෙසට අගය කරමින් සරල ගී සංකල්පයේ විකාශය සහ නූතන ස්වභාවය පිළිබඳ ව ප්‍රායෝගික සංවාදයේ යෙදෙයි.

5. ශ්‍රී ලංකාවේ සහ උත්තර භාරතයේ වඩාත් ජනප්‍රිය වූ සම්භාව්‍ය ගණයේ ලා සැළකෙන තෝරාගත් චිත්‍රපට ගීත ප්‍රායෝගිකව අධ්‍යයනය කරයි.

6. දේශීය රංග සම්ප්‍රදායන් හා බැඳි රංග ශෛලීන් සහ සංගීත ශෛලීන් පිළිබඳ අධ්‍යයනය කරමින් නූතන ප්‍රසංග වේදිකාවට ගැලපෙන ලෙස නිර්මාණ කරණයේ යෙදෙයි.

7. බටහිර සංගීත නිර්මාණ විමර්ශනය කර විශ්ව සංගීත නිර්මාණ අගයයි.

8. විශ්ව සංගීතාංග ඇසුරු කිරීමටත් දේශීය සංගීතාංග විශ්වයට මුදා හැරීමටත් අවශ්‍ය මට්ටමට සංගීත ප්‍රස්තාකරණයේ බටහිර ක්‍රමවේද පිළිබඳ අභ්‍යාසයේ යෙදෙයි.

9. සංගීතයේ භෞතික විද්‍යාත්මක පදනම විග්‍රහ කරමින් නව තාක්ෂණ විධි සංගීත නිර්මාණකරණයේ දී යොදා ගැනීම අත්හදා බැලීම් කරයි.

10. සංගීත විෂයය ඉගෙනීමට, සංරක්ෂණය සහ නිර්මාණකරණයට අන්තර් ජාලය සහ පරිගණකය යොදා ගන්නා අයුරු ප්‍රායෝගිකව හඳුනා ගනියි.

11. නූතන වෙළඳපොළට ගැලපෙන පරිදි සංගීත භාණ්ඩ නිෂ්පාදනයට පෙළඹෙයි.

## 5.0 ජාතික අරමුණු සහ විෂය අරමුණු අතර සම්බන්ධතාව

| පෙරදිග සංගීත විෂයයේ අරමුණු | ජාතික අරමුණු | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | i | ii | iii | iv | v | vi | vii | viii |
| 1. රාගධාරී සංගීතාංග සහ සිද්ධාන්ත ඇසුරින් ශික්ෂණය ලබා ගායන වාදන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි. | | | | | ✓ | | | |
| 2. ශ්‍රී ලාංකේය සංස්කෘතික උරුමය හා බැඳි ජනගායන, වාදන පිළිබඳ විමර්ශනාත්මක අත්දැකීම් ලබා එහි අගය විශ්ව සංගීතය කරා රැගෙන යාමට පෙලඹෙයි. | | ✓ | | | | | | |
| 3. ශ්‍රී ලාංකේය, භාරතීය සහ බටහිර සම්භාව්‍ය සංගීතඥයන්ගේ නිර්මාණ පරිශීලනය කරමින් සම්භාව්‍ය සංගීත රසාස්වාදයේ හුරුව ලබයි. | ✓ | | | | | | | |
| 4. ශ්‍රී ලාංකේය ව්‍යවහාරික සංගීත ක්ෂේත්‍රයේ ජනප්‍රියතම අංගය ලෙසට අගය කරමින් සරල ගීතයේ විකාශය සහ නූතන ස්වභාවය පිළිබඳ ව ප්‍රායෝගික සංවාදයේ යෙදෙයි. | | | ✓ | ✓ | | | | |
| 5. ශ්‍රී ලංකාවේ සහ උත්තර භාරතයේ වඩාත් ජනප්‍රිය වූ සම්භාව්‍ය ගණයේ ලා සැලකෙන තෝරාගත් චිත්‍රපට ගීත ප්‍රායෝගික ව අධ්‍යයනය කරයි. | ✓ | | | | | | | |
| 6. දේශීය රංග සම්ප්‍රදායයන් හා බැඳි රංග ශෛලීන් සහ සංගීත ශෛලීන් පිළිබඳ අධ්‍යයනය කරමින් නූතන ප්‍රසංග වේදිකාවට ගැළපෙන ලෙස නිර්මාණ කරණයේ යෙදෙයි. | | | ✓ | | | | | |
| 7. බටහිර සංගීත නිර්මාණ විමර්ශනය කර විශ්ව සංගීත නිර්මාණ අගයයි. | | | | | | | | ✓ |
| 8. විශ්ව සංගීතාංග ඇසුරු කිරීමටත් දේශීය සංගීතාංග විශ්වයට මුදා හැරීමටත් අවශ්‍ය තත්ත්වයට සංගීත ප්‍රස්තාරකරණයේ බටහිර ක්‍රමවේද පිළිබඳ ව අභ්‍යාසයේ යෙදෙයි. | | | | | | | | ✓ |
| 9. සංගීතයේ භෞතික විද්‍යාත්මක පදනම විග්‍රහ කරමින් නව තාක්ෂණ විධි සංගීත නිර්මාණකරණයේ දී යොදා ගැනීම පිළිබඳ ව අත්හදා බැලීම් කරයි. | | | | | | | ✓ | |
| 10. සංගීත විෂය ඉගෙනීමට, සංරක්ෂණය සහ නිර්මාණකරණයට අන්තර් ජාලය සහ පරිගණකය යොදා ගන්නා අයුරු ප්‍රායෝගික ව හඳුනා ගනියි. | | | | | | | ✓ | |
| 11. නූතන වෙළෙඳපොළට ගැළපන පරිදි සංගීත භාණ්ඩ නිෂ්පාදනයට පෙලඹෙයි. | | | | ✓ | | ✓ | | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය සන්ධාරය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 1.0 සම්භාව්‍ය සංගීතයේ ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනා ගනිමින් ගායන/ වාදන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි | 1.1 රාගධාරී සංගීතයට අදාළ උසස් ගායනයක්/වාදනයක් ඉදිරිපත් කිරීම සඳහා වර්ධනය කර ගත යුතු මූලික ගුණාංග ප්‍රායෝගිකව අධ්‍යයනය කරයි. | • මන්ද්‍ර මධ්‍ය උච්ච සප්තක කරා විහිදුණු ස්වර අභ්‍යාස<br>• කටහඬ පාලනය පිළිබඳ අභ්‍යාස<br>• ගායනයේ දී සිරුරේ ඉරියවු (ස්වරාලය, උගුර, පිටකොන්ද මුහුණ) හෝ වාදනයේ ඉරියවු සහ හස්ත සාධන අභ්‍යාස.. | රාගධාරී සංගීතය අධ්‍යයනයට පිවිසෙන ආධුනිකයකු ලෙස අවශ්‍ය මූලික කුසලතා වර්ධනය කරගනියි. | 02<br>02<br>02 |
| | 1.2 උත්තර භාරතීය සංගීතයට අයත් රාග කිහිපයක ස්වභාවය සහ සමවිෂමකම් හඳුනා ගනිමින් ගායනයේ/වාදනයේ යෙදෙයි. | • බාගේශ්‍රී, දේස්, ආසාවරී යන රාගවල සර්ගම් සහ මධ්‍යලය ගීත හා රාග විස්තර<br>• දේස් - තිලක්කාමෝද් ආසාවරී-ජෞනපූරි යන රාග යුගලයන්හි සම ප්‍රකෘති බව රාග විස්තර හා ස්වර විස්තාර විශේෂ ස්වර සංගති මගින් ප්‍රායෝගික ව<br>• ගානසමය, මුඛ්‍යාංග | රාගධාරී ගීත ගායනයේ යෙදෙයි.<br><br>නිර්දේශිත රාගවල සෛද්ධාන්තික පසුබිම හා සුවිශේෂ ලක්ෂණ අධ්‍යයනය කරමින් ප්‍රායෝගික කුසලතා වර්ධනය කරගනියි. | 54<br>12<br>02 |
| | 1.3 සම්භාව්‍ය සංගීතයේ උසස් දක්ෂතා ප්‍රදර්ශනය කිරීමට උපයෝගි වන සංකල්ප පිළිබඳ ව අදහස් දක්වමින් ඒවා පිළිබඳ තමා තුළ ඇති ශිල්පීය ප්‍රාගුණ්‍යය ප්‍රදර්ශනය කරයි. | • ආලාප සහ ආලාප වර්ග<br>• තාන සහ විවිධ තාන වර්ග<br>• මීන්ඩ්, ගමක්, කණ්, මූර්කි, ආන්දෝලන් සහ උපජ්, ජලා, මුඛඩා, තිහායි, චක්‍රදාර් (සෛද්ධාන්තික සහ ප්‍රායෝගික කරුණු)<br>• නිර්දේශිත රාගයන්හි සුවිශේෂ ස්වර සංගති මගින් රාග අතර වෙනස්කම් දැක්වීම (ප්‍රායෝගික ව)<br>• රාගවිස්තාර හෝ කෙටි ආලාප ඛණ්ඩ (මධ්‍යලය ගීතයේ ප්‍රායෝගික අභ්‍යාස සමඟ)<br>• නිර්දේශිත රාග වල විවිධ තානාලංකාර (මධ්‍යලය ගීතයේ ප්‍රායෝගික අභ්‍යාස සමඟ) | උත්තර භාරතීය රාගධාරී සංගීතයේ ශිල්පීය දක්ෂතා ප්‍රදර්ශනය කෙරෙන සුවිශේෂ අංග හා ශිල්පාංග පිළිබඳ ප්‍රායෝගික හුරුව ලබයි. | 02<br>02<br>08<br>-<br>-<br>- |

| | නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය සන්ධාරය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|---|
| | | 1.4 තාලයේ ගති ලක්ෂණ පැහැදිලි කරමින්, දේශීය සහ භාරතීය විවිධ තාල අතර ස්වභාවය හඳුනා ගනිමින් තාල නිරූපණය කරයි. | • ගති මිති ලය යන පාරිභාෂික පද<br>• ත්‍රිතාල්, ඣප්තාල්, දීප්චන්දි, දාදරා හඳුනා ගැනීමේ අභ්‍යාස සහ සමගුණ, දෙගුණ නිරූපණය<br>• ත්‍රිතාල්, ඣප්තාල්, දීප්චන්දි, දාදරා තාලවල අවනද්ධාක්ෂර තබ්ලාවේ නිකුත් වන අයුරු<br>• දේශීය තිත් ක්‍රමය ගොඩනැගෙන අයුරු සහ දෙතිතට අයත් තිත්රූප සෛද්ධාන්තික ව හා ප්‍රායෝගික ව අධ්‍යයනය | උත්තර භාරතීය සංගීතයේ තාල පද්ධතිය හා බැඳි සංකල්ප වෙන් කොට දක්වමින් නිර්දේශිත තාල ප්‍රායෝගිකව භාවිත කිරීමේ කුසලතාව ලබයි.<br><br>දේශීය තිත් රූප ගොඩනැඟීමේ පදනම විග්‍රහ කරමින් දෙතිතට අයත් තිත්රූප ප්‍රායෝගික ව භාවිත කිරීමේ කුසලතා ලබයි. | 02<br>04<br>04<br>04 |
| 2.0 | විශ්ව සංගීතයේ ස්වභාවය වටහා ගනිමින් විවිධතා ගවේෂණය කරයි. | 2.1සංගීතයේ පොදු ලක්ෂණ හා වෙනස්කම් විචාරාත්මක ව දැක්වීමට තොරතුරු රැස් කරයි. | • විවිධ නිර්වචන මඟින් සංගීතය යනු කුමක් දැයි පැහැදිලි කිරීම.<br>• සංගීතයේ වෙනස්කම් හා ඊට බලපාන හේතු (භාෂාව, දේශගුණික, භූගෝලීය සාධක)<br>• ලෝක සංගීතයේ එකිනෙකට වෙනස් පද්ධති (පෙරදිග සහ අපරදිග සංගීත පද්ධති දෙකෙහි ස්වභාවය Melody & Harmony සිද්ධාන්තය, ස්වර සාධන විධි) | සංගීතය විශ්වයට පොදු කලාවක් ලෙසට හා විවිධ හේතුසාධක මත එකිනෙක වෙනස් වන බවට තර්ක කරයි. | 02<br>02<br>02 |
| | | 2.2 භාරතීය සංගීතයේ විවිධතා පිළිබඳ විචාරාත්මක අදහස් දක්වමින් විවිධ ශෛලීන් ප්‍රායෝගික අධ්‍යයනයට පෙළඹෙයි. | • භාරතීය සංගීතයේ ස්වභාවය<br>• උත්තර සහ දක්ෂිණ සංගීත පද්ධතීන් හි සමවිෂමතා<br>• උතුරු ඉන්දීය ගායන ශෛලීන් (ධ්‍රැපද්, ධමාර්, චතුරංග) හා බැඳි සිද්ධාන්ත<br>• ඛ්‍යාල්, තරාණා, භජන්, ගසල්, කව්වාලි ප්‍රායෝගික සහ සිද්ධාන්ත කොටස් ඇසුරින් තර්කානුකූල සහ සංසන්දනාත්මක අදහස්<br>• තරාණා ගීතයක් (මාලකෞන්ස් රාගයෙන්) | භාරතීය සංගීතයේ ස්වභාවය හා පැරණිතම ගායන ශෛලීන් පිළිබඳ සෛද්ධාන්තික කරුණු අධ්‍යයනය කරමින් අත්‍යවශ්‍ය ශෛලීන් කිහිපයක ප්‍රායෝගික දක්ෂතා ප්‍රදර්ශනය කරයි. | 02<br>02<br>04<br>12<br>04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය සන්ධාරය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 3.0 වාද්‍ය භාණ්ඩයන්හි ස්වරූපය වටහා ගනිමින් වාදන හැකියා ප්‍රදර්ශනය කරයි. | 3.1 වාදන දක්ෂතා ප්‍රසංගාත්මක ව ප්‍රදර්ශනය කරයි. | සියලු සිසුන් සඳහා ස්වරපුවරු භාණ්ඩ වාදනය (උසස් පෙළට ගැළපෙන ලෙස)<br>• ගායනය ප්‍රධාන කරගත් සිසුන් සඳහා තෝරා ගත් ස්වර වාද්‍ය භාණ්ඩයකින් අද්‍යතන සරල ගීතයක් වාදනය හෝ රාගධාරී සංගීතාංගයක් වාදනය නැතහොත් තබ්ලාව වාදනය (කායදා, පල්ටා, තිහායි, මුඛඩා)<br>• වාදනය කරනු ලබන භාණ්ඩයේ ස්වර පිහිටීම, ව්‍යුහය, කොටස් පිළිබඳ දැනුම<br>• වාදනය කරනු ලබන භාණ්ඩය තනි ව සුසර කර ගැනීමේ අභ්‍යාස<br>• වාදනය ප්‍රධාන කරගත් සිසුන් නිර්දේශිත සියලු ප්‍රායෝගික කොටස් වාදනය කිරීම | ස්වර පුවරු භාණ්ඩයක් වාදනය කිරීමේ දක්ෂතා ප්‍රදර්ශනය කරයි.<br><br>ස්වර වාද්‍ය භාණ්ඩයක ව්‍යුහය අවබෝධ කරගනිමින් සහ එය තනි ව සුසර කරගනිමින් වාදන දක්ෂතා ප්‍රදර්ශනය කරයි.<br><br>නැතහොත් තබ්ලාව සරල ශාස්ත්‍රීය කොටස් සමඟ සරල ව වාදන දක්ෂතා ප්‍රදර්ශනය කරයි. | 12<br><br>12<br><br>02<br><br>02<br><br>-- |
| 4.0 සංගීත රසාස්වාදනයේ යෙදෙමින් ජීවිතයේ සතුට හා බැඳි මානසික තත්ත්වයන් ළඟා කර ගැනීමට හුරු වෙයි. | 4.1රාගධාරී සංගීතය ආශ්‍රයෙන් නිර්මාණය වී ඇති ගායන විශ්ලේෂණාත්මක ව සාකච්ඡා කරමින් ප්‍රායෝගික රසාස්වාදයක යෙදෙයි. | • ගුරුවරයාගේ අභිමතය පරිදි රාගධාරී ශාස්ත්‍රීය පදනමක් සහිත සිංහල/ හින්දි සරල ගී දෙකක් හෝ චිත්‍රපට ගී දෙකක් හෝ ඇසුරින් රසාස්වාදනයේ යෙදීම සහ ගායනය/වාදනය | ශාස්ත්‍රීය පදනමක් සහිත හින්දි හෝ සිංහල හෝ ගීතයක් ගයා/වයා රසාස්වාදනයේ යෙදෙයි. | 06 |
| 5.0 දේශීය ජන සංගීතාංග පිළිබඳ ප්‍රායෝගික හැකියා වර්ධනය කර ගනිමින් සංස්කෘතික උරුමයන් රැක ගනියි. | 5.1 ගැමි ගායනා පිළිබඳ තර්කානුකූල අදහස් දක්වමින් ගැමි ගී ගායන/වාදන දක්ෂතා වර්ධනය කර ගනියි. | • ශ්‍රී ලංකාවේ ගැමි ගී පිළිබඳ තොරතුරු<br>• ගෝත්‍රික ගී වශයෙන් වැදි ගී<br>• උඩරට, පහතරට, සබරගමු වශයෙන් ගැමි ගී ගායනාවල වෙනස්කම් (ශාන්ති කර්ම ගී ඇසුරින්)<br>• අනාසාතාත්මක මෙහෙ ගී (පතල්, බඹර, ටීකා සීපද)<br>• මෙහෙ ගී (නෙළුම් ගී, ඕසේ ගායනා) - වරම් ගී | ශ්‍රී ලංකාවේ ගැමි ගී පිළිබඳ ව තොරතුරු රැස් කරමින් තෝරාගත් ගැමි ගී ගායනයේ යෙදෙයි. | 02<br>02<br><br>04<br><br>06<br><br>03 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය සන්ධාරය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 6.0 සංගීත ඉතිහාසය පිළිබඳ තොරතුරු ගවේෂණය කරයි. | 6.1 ශ්‍රී ලංකාවේ සංගීත ඉතිහාසය පිළිබඳ තොරතුරු ගවේෂණය කරයි. | • මහනුවර යුගයේ ශ්‍රී ලංකාවේ සංගීතයේ විකාශය (රාජ්‍ය අනුග්‍රහය, රජවාසලේ සංගීතය හා සම්බන්ධ ආයතන, කවිකාර මඩුව, කර්ණාටක සංගීතයේ ආභාසය) | මහනුවර යුගයේ දී ශ්‍රී ලංකාවේ සංගීතයේ විකාශයට ඇති වූ බලපෑම් විග්‍රහ කරයි. | 10 |
| | | • සංගීත අධ්‍යාපනය හා සම්බන්ධ ශ්‍රී ලංකාවේ මුල් යුගයේ සංගීතඥයන් හා ඔවුන් කිහිප දෙනෙකු අතින් නිර්මිත අධ්‍යාපනික ග්‍රන්ථ හා ඒවායේ අන්තර්ගතය ඉතා ම සැකෙවින්<br>(ගීත ශික්ෂක, ගානවිද්‍යා - ඇම්.ජී.පෙරේරා<br>සංගීත - ප්‍රේමවංශ හපුවලාන<br>පෙරදිග සංගීත ශාස්ත්‍රය- බී.ඇස්.විජයරත්න.<br>භාවික ගීත- වින්සන්ට් සෝමපාල<br>බ්‍යාල ගීත -ආනන්ද ජයසිංහ<br>සංගීත සංහිතා-විමල් අභයසුන්දර<br>සිංහල ගැමි නාටකය- එදිරිවීර සරච්චන්ද්‍ර<br>හෙළ ගී මග- ඩබ්.බී.මකුලොලුව<br>ලංකාවේ සංගීත සම්භවය- සී. ද ඇස් කුලතිලක)<br>ආචාර්ය ලයනල් එදිරිසිංහ | සංගීතය පිළිබඳ ව හෙළ බසින් ලියැවී ඇති ග්‍රන්ථ කියවීමට පෙලඹෙයි. | 08 |
| 7.0 ව්‍යාවහාරික සංගීතය සහ රංග කලා හා බැඳි සංගීතාංග පිළිබඳ අත්දැකීම් ලබයි.<br>සංගීත නිර්මාණ කාර්යයයේ අත්හදා බැලීම් කරයි. | 7.1ශ්‍රී ලංකාවේ රංග සම්ප්‍රදායයන් පිළිබඳ තොරතුරු දක්වමින් ගීත ගායනයේ/ වාදනයේ යෙදෙයි. | • සොකරි, කෝලම්, නාඩගම්, නූර්ති, රංග ශෛලි | ශ්‍රී ලංකාවේ රංග සම්ප්‍රදායයන් පිළිබඳ තොරතුරු ගවේෂණය කරයි. | 04 |
| | | • එම රංග සම්ප්‍රදායයන්හි ගීත ගායනය/වාදනය | | 08 |
| | | • නාඩගම් සංගීත ශෛලිය (විවිධ තනු, තාලපද, භාණ්ඩ) තෝඩායම, ඉන්නිසය, පොතේසින්දුව, උරුට්ටුව යන අංශ ඇතුළත් ගීත ප්‍රායෝගික ව | නාඩගම් රංග සම්ප්‍රදායයේ සුවිශේෂතා ප්‍රායෝගික ව පැහැදිලි කරයි. | 04 |
| | | • නූර්ති සංගීතයේ රාගධාරී පසුබිම, දොහොරාව, වාදිත (ගත්) ගීත වශයෙන් යොදා ගැනීම සනාථ කිරීමට ගීත ප්‍රායෝගික ව | නූර්ති සංගීතයේ රාගධාරී පසුබිම පැහැදිලි කරයි. | 04 |
| | 7.2 ව්‍යාවහාරික සංගීතය සඳහා සංගීත භාණ්ඩ යොදා ගැනීමේ ක්‍රමවේද හඳුනා ගනියි. | • වයලීනය සුසර කිරීමේ විවිධ ක්‍රම හා කපිරිඤ්ඤා ගීතයක් වාදනය. | ව්‍යවහාරික සංගීතයේ දී වයලීනය භාවිත වන ක්‍රම සොයා බලයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය සන්ධාරය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 8.0 සංගීත නිර්මාණකරණයේ අත්හදා බැලීම් කරයි. | 8.1 රිද්මය, තාලය, ලය සහ ස්වර නිර්මාණයක දී වැදගත් වන අයුරු පිළිබඳ තර්කානුකූල නිදසුන් මඟින් අදහස් දක්වමින් නිර්මාණ කාර්යයයේ යෙදෙයි. | • ශ්‍රැතිය, ස්වර, ස්වර පරාසය සහ Scale නිර්මාණයක දී වැදගත් වන අයුරු සහ ප්‍රායෝගික අත්හදා බැලීම් | විවිධ ස්වර ශ්‍රැති ස්ථාන කරගනිමින් නිර්මාණයේ යෙදෙයි. | 04 |
| | 8.2 විවිධ හඬතල නිර්මාණ කාර්යයයේ දී වැදගත් වන අයුරු සාකච්ඡා කරයි. | • හඬතල සඳහා සංගීත භාණ්ඩ නිර්මාණය වී ඇති අයුරු (Violin Family, Brass Family) | විවිධ හඬතල අනුව නිර්මාණය වී ඇති සංගීත භාණ්ඩ පවුල් පිළිබඳ විස්තර කරයි. | 04 |
| 9.0 සංකේතානුසාරයෙන් සංගීතය ලියා දක්වන විධි හඳුනා ගනිමින් විශ්ව සංගීත කෘති ඇසුරු කිරීමටත්, දේශීය සංගීතාංග ලෝකය වෙත යොමු කිරීමටත් අත්‍යවශ්‍ය මූලික නිපුණතා වර්ධනය කර ගනියි. | 9.1 විවිධ ස්වර ශ්‍රැති කර ගනිමින් ප්‍රස්තාරකරණයේ යෙදෙයි. | • කෝමල නිෂාදය සහ කෝමල ගාන්ධාරය ශ්‍රැති කරගනිමින් ප්‍රස්තාරකරණය B.flat, E.flat Major Scale | විවිධ ස්වර ශ්‍රැති ස්ථාන කර ගනිමින් නිර්මාණයේ යෙදෙයි. | 04 |
| | | • මධ්‍යමය සහ පංචමය ශ්‍රැති කර ගනිමින් ප්‍රස්තාරකරණය F. G Major/Minor Scale | | 04 |
| 10.0 සංගීතය හා බැඳි භෞතික විද්‍යාත්මක සහ ජීව විද්‍යාත්මක තත්ත්වයන් අධ්‍යයනය කර ප්‍රසංගාත්මක හැකියා වඩාත් සාර්ථක ලෙස ඉදිරිපත් කරයි. | 10.1 නව තාක්ෂණික උපකරණ සංගීත නිර්මාණයේ දී සහ අධ්‍යයනයේ දී උපයෝගි වන අයුරු පරීක්ෂා කරමින් භාවිත කරයි. | • සංගීත නිර්මාණය, ශ්‍රවණය ගවේෂණය සඳහා පරිගණකයේ උපයෝගීතාව හා අදාළ මෙවලම් (පරිගණකය හැඳින්වීම, සාමාන්‍ය පරිගණකයක උපාංග හා පරිබාහිරින් එකතු කර ගනු ලබන උපාංග හා දෘඪාංග (Sound card, Midi Keyboard, Midi cable, Music soft ware) | පරිගණක ආශ්‍රිත සංගීත නිර්මාණය පිළිබඳ වත් , අන්තර්ජාලය මඟින් සංගීත ඉගෙනීම පිළිබඳ වත් තර්කානුකූල අදහස් දක්වයි. | 06 |
| | | • සංගීතය පටිගත කිරීම, සංගීත නිර්මාණයක් කිරීම, සංගීතය සංස්කරණය සහ නිර්මාණය කර ගත් සංගීතය බෙදා හැරීම | | 10 |
| | | • සංගීත අධ්‍යාපනය සඳහා අන්තර් ජාල භාවිතය සහ විවිධ වෙබ් අඩවි ආශ්‍රයෙන් සංගීත අධ්‍යාපනය ලබා ගැනීම සහ ගවේෂණය (ඇගයීම් සඳහා කාලච්ඡේද 36ක් වෙන් කළ හැකිය.) | | 10<br>-----<br>263<br>36 |

# වාර සටහන

**12 ශ්‍රේණිය**

| පාඩම් අංක | විෂය අන්තර්ගතය | පළමු වාරය කාලච්ඡේද | දෙවන වාරය කාලච්ඡේද | තෙවන වාරය කාලච්ඡේද |
|---|---|---|---|---|
| 01 | • මන්ද්‍ර මධ්‍ය උච්ච සප්තක කරා විහිදුන ස්වර අභ්‍යාස | 02 | - | - |
| 02 | • කටහඬ පාලනය පිළිබඳ අභ්‍යාස | 02 | - | - |
| 03 | • ගායනයේ දී සිරුරේ ඉරියව් (ස්වරාලය, උගුර, පිටකොන්ද මුහුණ) හෝ වාදනයේ ඉරියව් සහ හස්ත සාධන අභ්‍යාස. | 02 | - | - |
| 04 | • භාගේශ්‍රී රාගය (සර්ගම් සහ මධ්‍යලය ගීත සමග රාග විස්තර හා ස්වර විස්තාර, කෙටි ආලාප ඛණ්ඩ විශේෂ ස්වර සංගති, තානාලංකාර සමග ප්‍රායෝගිකව) | 18 | - | - |
| 21 | • දේස් රාගය (සර්ගම් සහ මධ්‍යලය ගීත සමග රාග විස්තර හා ස්වර විස්තාර, කෙටි ආලාප ඛණ්ඩ විශේෂ ස්වර සංගති, තානාලංකාර සමග ප්‍රායෝගිකව) | - | 18 | - |
| 37 | • ආශාවරී රාගය (සර්ගම් සහ මධ්‍යලය ගීත සමග රාග විස්තර හා ස්වර විස්තාර, කෙටි ආලාප ඛණ්ඩ විශේෂ ස්වර සංගති, තානාලංකාර සමග ප්‍රායෝගිකව) | - | - | 18 |
| 22 | • දේස් - තිලක්කාමෝද් යන රාග යුගලයන්හි සම ප්‍රකෘති බව | - | 06 | - |
| 38 | • ආශාවරී-ජෞනපූරි යන රාග යුගලයන්හි සම ප්‍රකෘති බව | - | - | 06 |
| 05 | • ගානසමය, මුඛ්‍යාංග | 02 | - | - |
| 06 | • ආලාප සහ ආලාප වර්ග | 02 | - | - |
| 23 | • තාන සහ විවිධ තාන වර්ග | - | 02 | - |
| 24 | • මීන්ඩ්, ගමක්, කණ්, මූර්කි, උපජ්, ජලා, මුකඩා, තිහායි, චක්‍රදාර් සිද්ධාන්තික සහ ප්‍රායෝගික) | - | 08 | - |
| 07 | • තාල සංකල්පය (ගති මිති ලය සහ තාල පදයක කොටස්) | 02 | - | - |
| 08 | • ත්‍රිතාල්, ඣප්තාල්, දීප්චන්දි, දාදරා හඳුනා ගැනීමේ අභ්‍යාස සහ සමගුණ, දෙගුණ නිරූපණය | 04 | - | - |
| 09 | • ත්‍රිතාල්, ඣප්තාල්, දීප්චන්දි, දාදරා තාලවල අවනද්ධාක්ෂර තබ්ලාවේ නිකුත් වන අයුරු | 04 | - | - |
| 25 | • දේශීය තිත්තාල පද්ධතිය ගොඩනැගෙන අයුරු සහ දෙතිතට අයත් තිත්රූප ප්‍රායෝගිකව භාවිතය | - | 04 | - |
| 10 | • විවිධ නිර්වචන මගින් සංගීතය යනු පැහැදිලි කිරීම. | 02 | - | - |
| 11 | • සංගීතයේ වෙනස්කම් හා ඊට බලපාන හේතු (භාෂාව, දේශගුණික, භූගෝලීය සාධක) | 02 | - | - |
| 12 | • ලෝක සංගීතයේ එකිනෙකට වෙනස් පද්ධති (පෙරදිග සහ අපරදිග සංගීත පද්ධති දෙකෙහි ස්වභාවය Melody & Harmony සිද්ධාන්තය, ස්වර සාධනය) | 02 | - | - |
| 39 | • භාරතීය සංගීතයේ ස්වභාවය | - | - | 02 |

# වාර සටහන

**12 ශ්‍රේණිය**

| පාඩම් අංක | විෂය අන්තර්ගතය | පළමු වාරය කාලච්ඡේද | දෙවන වාරය කාලච්ඡේද | තෙවන වාරය කාලච්ඡේද |
|---|---|---|---|---|
| 40 | • උත්තර සහ දක්ෂිණ පද්ධතිවල සම විෂමතා | | - | 02 |
| 41 | • උතුරු ඉන්දීය ගායන ශෛලීන් (ධ්‍රැපද්, ධමාර්, චතුරංග හා බැඳි සිද්ධාන්ත කොටස් ඇසුරින් තර්කානුකූලව සහ සංසන්දනාත්මක අදහස් | - | - | 04 |
| 42 | • ඛ්‍යාල්, ගායන ශෛලිය (උසස් පෙළට නියමිත රාගයක විළම්භ ලය ගීතයේ ස්ථායි කොටසේ ප්‍රායෝගික පිවිසීම සමග) | - | - | 06 |
| 43 | • භජන් ගායන ශෛලිය (පයෝජි මේනේ, තුමක චලිත, වෛෂ්ණු වජනකෝ, ධීරසමීරේ යමුනා තීරේ, කලෙරාත මෝරා, යන ගීත අතරින් එකක ප්‍රායෝගික පිවිසීම සමග) | - | - | 03 |
| 44 | • ගසල් ගීතයක් ප්‍රයෝගිකව | - | - | 03 |
| 26 | • තාරණා ගායන ශෛලියෙන් ගීතයක් (මාලකෞන්ස් රාගයෙන්) | - | 04 | - |
| 13<br>27<br>45 | • සියලු සිසුන් සඳහා ස්වරපුවරු භාණ්ඩ වාදනය (උසස් පෙළට ගැළපෙන ලෙස) | 04 | 04 | 04 |
| 14A<br>28<br>46<br>14B | • ගායනය ප්‍රධාන කරගත් සිසුන් සඳහා තෝරා ගත් ස්වර වාද්‍ය භාණ්ඩයකින් අධ්‍යතන සරල ගීතයක් වාදනය හෝ රාගධාරී සංගීතාංගයක් වාදනය නැතහොත් තබ්ලාව වාදනය (කායදා, පල්ටා, මුඛඩා) වාදනය ප්‍රධාන කරගත් සිසුන් අධ්‍යතන සරල ගීතයක් ගායනය හෝ රාගධාරී ගීතයක් ගායනය නැතහොත් තබ්ලාව වාදනය (කායදා,පල්ටා, මුඛඩා) | 04 | 04 | 04 |
| 29 | • වාදනය කරනු ලබන භාණ්ඩයේ ස්වර පිහිටීම, ව්‍යුහය, කොටස් පිළිබඳ දැනුම හා තබ්ලාවේ කොටස් | - | 02 | - |
| 47 | • වාදනය කරනු ලබන භාණ්ඩය තනිව සුසර කර ගැනීමේ අභ්‍යාස (ගායන කාලච්ඡේද වලදී නිර්දේශිත සියලු ප්‍රායෝගික කොටස්වාදනය කිරීම ) | - | - | 02 |
| 15<br>30 | • ගුරුවරයාගේ අභිමතය පරිදි රාගධාරී ශාස්ත්‍රීය පදනමක් සහිත සිංහල/හින්දි සරල ගී දෙකක් හෝ චිත්‍රපට ගී දෙකක් ඇසුරින් රසාස්වාදයේ යෙදීම සහ ගායනය/වාදනය | 03 | 03 | - |
| 16 | • ශ්‍රී ලංකාවේ ගැමි ගී පිළිබඳ තොරතුරු | 02 | - | - |
| 17 | • ගෝත්‍රික ගී වශයෙන් වැදි ගී | 02 | - | - |
| 31 | • උඩරට,පහතරට, සබරගමු වශයෙන් ගැමි ගී ගායනාවල වෙනස්කම් (ශාන්ති කර්ම ගී ඇසුරින්) | - | 04 | - |
| 48 | • අනාඝාතාත්මක මෙහෙ ගී (පතල්, බඹර, ටීකා සීපද) | - | - | 06 |
| 49 | • මෙහෙ ගී (නෙලුම් ගී, ඕසේ ගායනා - වරම් ගී) | - | - | 03 |
| 32 | • මහනුවර යුගයේ ශ්‍රී ලංකාවේ සංගීතයේ විකාශය (රාජ්‍ය අනුග්‍රහය, රජවාසලේ සංගීතය හා සම්බන්ධ ආයතන, කවිකාරමඩුව, කර්ණාටක සංගීතයේ ආභාෂය) | - | 10 | - |

# වාර සටහන

**12 ශ්‍රේණිය**

| පාඩම් අංක | විෂය අන්තර්ගතය | පළමු වාරය කාලච්ඡේද | දෙවන වාරය කාලච්ඡේද | තෙවන වාරය කාලච්ඡේද |
|---|---|---|---|---|
| 18 | • 50-60 දශකවල සංගීත අධ්‍යාපනය හා සම්බන්ධ ශ්‍රී ලංකාවේ මුල් යුගයේ සංගීතඥයින් කිහිපදෙනෙකු අතින් නිර්මිත අධ්‍යාපනික ග්‍රන්ථ හා ඒවායේ අන්තර්ගතය ඉතාමත් සැකෙවින්<br>(ගානවිද්‍යා - ඇම්.ජී.පේරේරා<br>සංගීත - ප්‍රෙමවංශ හපුවලාන<br>පෙරදිග සංගීත ශාස්ත්‍රය- බී.ඇස්.විජයරත්න.<br>භාවිත ගීත- වින්සන්ට් සෝමපාල<br>ඛ්‍යාල ගීත -ආනන්ද රණසිංහ<br>සංගීත සංහිතා-විමල් අභයසුන්දර<br>ගැමි නාටක- එදිරිවීර සරත්චන්ද්‍ර<br>හෙළගී මග- ඩබ්.බී.මකුලොලුව<br>සංගීත සම්භවය- සී. ද ඇස් කුලතිලක<br>ආචාර්ය ලයනල් එදිරිසිංහ) | 08 | -- | -- |
| 19 | • සොකරි, කෝලම්, රංග ශෛලීන් | 02 | - | - |
| 20 | • සොකරි, කෝලම්, ගීත ගායනය | 04 | - | - |
| 33 | • නාඩගම්, නූර්ති, රංග ශෛලීන් | - | 02 | - |
| 34 | • නාඩගම්, නූර්ති, ගීත ගායනය/වාදනය | - | 04 | - |
| 35 | • නාඩගම් සංගීත ශෛලිය (විවිධ තනු, තාලපද, භාණ්ඩ) තෝඩායම, ඉන්නිසය, පොතේ සින්දුව, උරුට්ටුව යන අංග ඇතුළත් ගීත ප්‍රායෝගිකව | - | 04 | - |
| 50 | • රාගධාරී පසුබිම, දොහොරාව, වාදිත (ගත්) ගීත වශයෙන් යොදා ගැනීම සනාථ කිරීමට ගීත ප්‍රායෝගිකව | - | - | 04 |
| 51 | • වයලීනය සුසර කිරීමේ විවිධ ක්‍රම හා කපිරිඤ්ඤාවක් වාදනය | - | - | 02 |
| 52 | • ශ්‍රැතිය, ස්වර, ස්වර පරාසය සහ Scale නිර්මාණයකදී වැදගත් වන අයුරු සහ ප්‍රායෝගික අත්හදා බැලීම් | - | - | 04 |
| 53 | • හඬතල සඳහා සංගීත භාණ්ඩ නිර්මාණය වී ඇති අයුරු (Violin Family, Brass Family) | - | - | 04 |
| 54 | • කෝමළ නිෂාදය සහ කෝමළ ගාන්ධාරය ශ්‍රැති කර ගනිමින් ප්‍රස්තාර කරණය B.flal, E.flal Major Scale | - | - | 04 |
| 55 | • මධ්‍යමය සහ පංචමය ශ්‍රැති කර ගනිමින් ප්‍රස්තාරකරණය F. G Major/Minor Scale | - | - | 04 |
| 56 | • සංගීත නිර්මාණය, ශ්‍රවණය ගවේෂණය සඳහා පරිගණකයේ උපයෝගීතාවය හා අදාළ මෙවලම් (පරිගණකය හැඳින්වීම, සාමාන්‍ය පරිගණකයක උපාංග හා පරිබාහිරින් එකතු කර ගනු ලබන උපාංග හා දෘඨාංග (Sound card, Midi Key board, Midi cable, Music soft ware) | - | - | 06 |
| 57 | • සංගීතය පටිගත කිරීම, සංගීත නිර්මාණයක් කිරීම, සංගීතය සංස්කරණය සහ නිර්මාණය කර ගත් සංගීතය බෙදා හැරීම | - | - | 10 |
| 36 | • සංගීත අධ්‍යාපනය සඳහා අන්තර් ජාල භාවිතය සහ විවිධ වෙබ් අඩවි ආශ්‍රයෙන් සංගීත අධ්‍යාපනය ලබා ගැනීම සහ ගවේෂණය | - | 10 | - |
| | (ඇගයීම් - ප්‍රායෝගික වන ඇගයීම 01-02- | 06 | 06 | 06 |
| | ප්‍රායෝගික නොවන ඇගයීම 01-02-03- | 06 | 06 | 06 |
| | මුළු කාලච්ඡේද | 85 | 101 | 113 |

# ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස්

දෛනික ජීවිතය සාර්ථකව පවත්වා ගැනීම හා යහපත් සමාජයක් ගොඩනැංවීමට අත්‍යවශ්‍ය නිපුණතා පාදක කොටගෙන සහශ්‍රයේ සිදු කළ නව ප්‍රතිසංස්කරණවලට අනුව සකස් කළ සංගීත විෂය 12 සහ 13 ශ්‍රේණි නව විෂය නිර්දේශ 2017 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ. විෂය නිර්දේශයේ අන්තර්ගත නිපුණතා හා නිපුණතා මට්ටම් සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය මාර්ගෝපදේශකත්වය සැපයීමට මෙම ග්‍රන්ථය සකස් කොට තිබේ. මෙය සම්පාදනයේ දී හා පරිහරණය කිරීමේ දී අ.පො.ස (උ.පෙළ) විභාගයේ ඇති වැදගත්කම සහ එම විභාගය කෙරෙහි අධ්‍යාපන පද්ධතියේ සියලු ම අය දක්වන සංවේදී බව සැලකිල්ලට ගත යුතු වේ.

සංගීත විෂය හා සබැඳි අරමුණු පදනම් කරගෙන නිපුණතා 11ක් ඔස්සේ නව විෂය නිර්දේශය සැලසුම් කොට තිබේ. 12 වන ශ්‍රේණියේ දී නිපුණතා මට්ටම් 34ක් ද 13 වන ශ්‍රේණියේ දී නිපුණතා මට්ටම් 25ක් යටතේ විෂය අන්තර්ගතය ගොනුකර ඇත. නිපුණතා, නිපුණතා මට්ටම් හා සබැඳි ක්‍රියාකාරකම්වල අන්තර්ගත විෂය සන්ධාරයෙන් ලබන දැනුමෙන් පමණක් පෝෂිත ව විභාගවලින් ඉහළ සමාර්ථ ලබාගත්ත ද යහපත් සමාජ ජීවිතයක් ගතකිරීමට එය ප්‍රමාණවත් නොවේ. දැනුම, කුසලතා හා ආකල්ප සංවර්ධනයෙන් හිස හදවත හා දෑත් ද පෝෂණය කළ යුතුවේ. එකී පෝෂණයෙන් තමා ද සමාජය යහපත් මාවතක් කරා යොමු කරවීමට ගැළපෙන ජීවිතය නංවාලීම අද්‍යතන යුගයේ ප්‍රබල සමාජ අවශ්‍යතාවකි.

මෙම ග්‍රන්ථය භාවිත කරණ සියලු ම ගුරුභවතුන් මෙහි මුල් පිටුවේ සිට අවසාන පිටුව දක්වා ඇති කරුණු අවධානයෙන් යුතු ව කියවා අවබෝධ කරගත යුතු වේ. අපේක්ෂිත අරමුණු කරා එළඹීමට නිපුණතා, නිපුණතා මට්ටම් කෙරෙහි අවධානය යොමු කළ යුතු අතර අදාළ ඉගෙනුම් පල කරා ළඟාවීමට ක්‍රියාකාරකම් ස්වාධීනව සැලසුම් කළ යුතුවේ.යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවලින් තමන් ට අභිමත පරිදි ඉගැන්වීම් ක්‍රමයක් තෝරා ගැනීමට නිදහසක් ඇත. එමෙන්ම තෝරා ගන්නා ප්‍රවේශය සතුටුදායක හා කාර්යක්ෂම විය යුතු ය. ක්‍රියාකාරකමෙන් අපේක්ෂිත පල කරා සිසුන්ට ළඟාවීමට අවශ්‍ය පසුබිම හා පහසුකම් සැපයීමට පියවර ගැනීම වැදගත් ය. එක් එක් ක්‍රියාකාරකම් සඳහා කාලච්ඡේද වෙන් කර ඇත. පන්ති කාමරයේ සිසුන් ප්‍රමාණය ශක්‍යතා සලකා බලමින් විවිධ පරිසර තත්ත්වයන් යටතේ කාලච්ඡේද සුදුසු පරිදි යොදා ගැනීමට අවකාශය ඇත.

නිපුණතා පාදක අධ්‍යාපනයේ දී ශිෂ්‍ය කාර්යයන් ප්‍රබල ස්ථානයක් ගන්නා අතර නූතන ගුරු භූමිකාව ඊට අනුගත විය යුතුව ඇත. ඉගෙනුම් ඉගැන්වීම් සහ ඇගයීම යන කාර්යයේ දී ගුරුවරයාගේ වගවීම හා වගකීම පුළුල් පරාසයක් කරා විහිදී ඇත. ක්‍රියාකාරකම් අවසානයේ ඇගයීමට අවශ්‍ය ප්‍රශ්න සකස් කිරීම, ඒ සඳහා ඇගයීම් නිර්ණායක ගොඩනැගීම ක්‍රියාකාරකම් සැලසුමෙහි සුවිශේෂ අංගයකි. උක්ත ගුරු භූමිකාව පරිණාමන ගුරු භූමිකාව ලෙස නම් කර තිබේ.

නිර්මාණශීලී ගුරුවරයෙකු ලෙස ක්‍රියාකාරකම් සැලසුම් කර ගැනීම සඳහා සරල මගපෙන්වීමක් ලෙස ඉදිරිපත් කර ඇති මෙම ගුරු මාර්ගෝපදේශය ඉගෙනුම් ඉගැන්වීම් සහ ඇගයීමේ කාර්ය සාර්ථක කර ගැනීමට මනා පිටිවහලක් වේවායි පතමු.

ක්‍රියාකාරකම 1

## මන්ද්‍ර, මධ්‍ය, උච්ච සප්තක කරා විහිදුණු ස්වර අභ්‍යාස

නිපුණතාව 1.0 — සම්භාව්‍ය සංගීතයේ ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනාගනිමින් ගායන/ වාදන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම 1.1 — රාගධාරි සංගීතයට අදාළ උසස් ගායනයක් වාදනයක් ඉදිරිපත් කිරීම සඳහා වර්ධනය කර ගත යුතු මූලික ගුණාංග ප්‍රායෝගික ව අධ්‍යයනය කරයි.

ක්‍රියාකාරකම 1.1.1 — මන්ද්‍ර, මධ්‍ය, උච්ච සප්තක කරා විහිදුණු ස්වර අභ්‍යාස

කාලච්ඡේද සංඛ්‍යාව — 02

ඉගෙනුම් පල

- මන්ද්‍ර, මධ්‍ය හා උච්ච සප්තකයේ ස්වර ගායනා කරයි.
- මන්ද්‍ර, මධ්‍ය හා උච්ච සප්තකයන්හි වෙනස හඳුනා ගනියි.
- සප්තක තුනෙහි ස්වර ගැයීමෙහි හැකියාව ලබා ඉදිරිපත් කරනු ලබන ගායනය මිහිරි බව ප්‍රකාශ කරයි.

ගුණාත්මක යෙදවුම්

- සර්පිනාවක්, තාම්පුරාවක්

විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්

නිවැරදි ශ්‍රැතියේ පිහිටා ගායනය කිරීම ගායනය පුහුණු වන්නකුට අත්‍යවශ්‍ය ම අංගයකි. පළමු ව ඒ පිළිබඳ ව සිසුන් දැනුම්වත් කොට අවශ්‍ය උපදෙස් හා අභ්‍යාස ලබා දීම අපේක්ෂිතය. මන්ද්‍ර හා උච්ච සප්තක කරා ගමන් කිරීමට පළමු ව මධ්‍ය සප්තකය ඉතා හොඳින් ගැයීම අනිවාර්ය ය. ඒ සඳහා අදාළ වන්නා වූ උපදෙස් හා අභ්‍යාස ද ලබා දෙන්න.

පෙර උගත් ස්වසන අභ්‍යාස පිළිබඳ ව නැවත සිහිපත් කොට 12 වසර සිසුනට ගැළපෙන ස්වසන අභ්‍යාස කිහිපයක් හෝ ලබා දීම මෙම පාඩමේ සාර්ථකත්වයට මනා පිටිවහලකි. (2009 පෙරදිග සංගීතය 12 ශ්‍රේණියේ මාර්ගෝපදේශ සංග්‍රහයෙහි මුල් පාඩම් මගින් ආදර්ශ සපයා ගන්න.)

ඇමුණුම 1හි දී ඇති අභ්‍යාස, නිසි උපදෙස් ලබා දෙමින් පුහුණු කරවන්න. මන්ද්‍ර සප්තකයේ ස්වර හොඳින් පුහුණු වීමෙන් ඉහළ ස්වර කරා හොඳින් ගමන් කිරීමේ හැකියාව ලැබෙන බැවින් මන්ද්‍ර ස්වර හොඳින් පුහුණු කරවන්න. තනි ව ම පුහුණුව සඳහා සුදුසු ම කාලය අලුයම් කාලය බ සිසුන්ට පහදා දෙන්න.

පාඩම සංවර්ධනය

- 6 ශ්‍රේණියේ දී උගත් ස්වසන අභ්‍යාස පිළිබඳ ව ප්‍රායෝගික ව සිහිපත් කරමින් පාඩමට පිවිසෙන්න.
- සප්තක තුනෙහි ස්වර ගැයීම සඳහා එක් එක් සිසුවාට ගැළපෙන ශ්‍රැතිය තෝරා දෙමින් අභ්‍යාසයන්හි යොදවන්න.

(කාලච්ඡේද 01)

ඇමුණුම 01හි දී ඇති අභ්‍යාස 1, 2 හා 3 පිළිවෙළින් පුහුණු කරවන්න.

(කාලච්ඡේද 01)

ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- ස්වර ස්ථානයන් ගේ නිවැරදි බව මැනීම සඳහා වූ ප්‍රායෝගික ඇගයීමක් මඟින් තක්සේරු කළ යුතු යි.

අතිරේක උදවු

- අභ්‍යාස සහිත ග්‍රන්ථ
- අභිනව ස්වර මාලිකා - සුදත් සමරසිංහ.

ඇමුණුම 01

**මන්ද්‍ර ස්වර අභ්‍යාස 01**

| | | | |
|---|---|---|---|
| ස - නි̣ - | ස - - -, | ස - නි̣ - | ධ̣ - නි̣ - |
| ස - - -, | ස - නි̣ - | ධ̣ - ප̣ - | ධ̣ - නි̣ - |
| ස - - -, | ස - නි̣ - | ධ̣ - ප̣ - | ම̣ - ප̣ - |
| ධ̣ - නි̣ - | ස - - -, | ස - නි̣ - | ධ̣ - ප̣ - |
| ම̣ - ග̣ - | ම̣ - ප̣ - | ධ̣ - නි̣ - | ස - - -, |

මෙය එක් එක් සිසුවා ගේ ශක්ති ප්‍රමාණය අනුව පුහුණු වෙමින් ක්‍රමයෙන් මන්ද්‍ර ෂඩ්ජය තෙක් ගැයීමට පුහුණු විය හැකි නම් වඩාත් ඵලදායී වේ.

**මන්ද්‍ර හා මධ්‍ය ස්වර අභ්‍යාස 02**

| | | | |
|---|---|---|---|
| ස - නි̣ - | ස - - -, | ස - රි - | ස - - -, |
| ස - නි̣ - | ධ̣ - නි̣ - | ස - - -, | ස - රි - |
| ග - රි - | ස - - -, | ස - නි̣ - | ධ̣ - ප̣ - |
| ධ̣ - නි̣ - | ස - - -, | ස - රි - | ග - ම - |
| ග - රි - | ස - - -, | ස - නි̣ - | ධ̣ - ප̣ - |
| ම̣ - ප̣ - | ධ̣ - නි̣ - | ස - - - | ස - රි - |
| ග - ම - | ප - ම - | ග - රි - | ස - - - |

මේ අයුරින් ස්වර අභ්‍යාසය වර්ධනය කරමින් පුහුණු කරවන්න.

## උච්ච ස්වර අභ්‍යාස 03

(සිසුන්ට ගායනය කළහැකි උච්ච ස්වරය දක්වා ක්‍රම ක්‍රමයෙන් ඉහළට රැගෙන යන්න)

| | | | |
|---|---|---|---|
| ස̣ - රි̣ - | ස̣ - - -, | ස̣ - රි̣ - | ග̣ - රි̣ -, |
| ස̣ - - - | ස̣ - රි̣ - | ග̣ - ම̣ -, | ග̣ - රි̣ - |
| ස̣ - - - | ස̣ - රි̣ -, | ග̣ - ම̣ - | ප̣ - ම̣ - |
| ග̣ - රි̣ - | ස̣ - - -, | ස̣ - රි̣ - | ග̣ - ම̣ - |
| ප̣ - ධ̣ - | ප̣ - ම̣ -, | ග̣ - රි̣ - | ස̣ - - - |
| ස̣ - රි̣ - | ග̣ - ම̣ - | ප̣ - ධ̣ - | නි̣ - ධ̣ - |
| ප̣ - ම̣ - | ග̣ - රි̣ - | ස̣ - - - | ස̣ - රි̣ - |
| ග̣ - ම̣ - | ප̣ - ධ̣ - | නි̣ - ස̣ - | නි̣ - ධ̣ - |
| ප̣ - ම̣ - | ග̣ - රි̣ - | ස̣ - - - | ස̣ - - - |

ක්‍රියාකාරකම 2

# කට හඬ පාලනය කිරීමේ අභ්‍යාස

නිපුණතාව 1.0 :- සම්භාව්‍ය සංගීතයේ ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනාගනිමින් ගායන/ වාදන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි

නිපුණතා මට්ටම 1.1 :- රාගධාරී සංගීතයට අදාළ උසස් ගායනයක් වාදනයක් ඉදිරිපත් කිරීම සඳහා වර්ධනය කර ගත යුතු මූලික ගුණාංග ප්‍රායෝගික ව අධ්‍යයනය කරයි.

ක්‍රියාකාරකම :- කට හඬ පාලනය කිරීමේ අභ්‍යාස

කාලච්ඡේද සංඛ්‍යාව :- 02

ඉගෙනුම් පල :-

- කට හඬ පාලනය කිරීමේ අවශ්‍යතාව පිළිබඳ ව සාකච්ඡා කරයි.
- හඬ පාලනයෙන් යුතු ව ගායනය කරයි.
- හඬ පාලනයෙන් යුතු ව ගායනය කිරීම නිසා ගායනය රසවත් බව ප්‍රකාශ කරයි.

ගුණාත්මක යෙදවුම් :- ශ්‍රැතිය, තාම්පුරාව, සර්පිනාව

විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :-

ගායකයකු සතු ව තිබිය යුතු ගුණාංගයකි තම හඬ පාලනයෙන් යුතු ව ගායනයෙහි යෙදීම. හඬ පාලනය කළ යුතු වන්නේ

1. රසාලිප්ත ගායනයක් ඉදිරිපත් කිරීම සඳහා.
2. ශබ්දවාහිනී යන්ත්‍ර භාවිතයෙන් තොර ව ප්‍රේක්ෂකයන්ට ඇසෙන සේ වේදිකාවේ සිට ගායනා කිරීම සඳහා.
3. ශබ්ද වාහිනී යන්ත්‍ර භාවිතයෙන් ගායනා කිරීම සඳහා.
4. පටිගත කිරීමක දී හඬ භාවිතය සඳහා

යන කරුණු පිළිබඳ ව සිසු අවධානය යොමු කළ යුතු අතර ඒ සඳහා වූ හුරුව ලබා දිය යුතු ය.

නිවැරදි හඬ පාලනයකින් යුතු ව ගැයීම සඳහා ශ්වසනය නිවැරදි විය යුතු අතර සිරුරේ ඉහිල් බව ද ඇති කර ගත යුතු ය යන්න පිළිබඳ ව ද සිසුන් දැනුම්වත් කළ යුතුය. ඇමුණුම 1හි සඳහන් අභ්‍යාසයන්හි සිසුන් යොදවමින් හඬ පාලනය පිළිබඳ සිසු හැකියා වර්ධනය කළ යුතු ය. මේ සඳහා 2009 පෙරදිග සංගීතය 12 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ 20, 21, 22 යන පිටු භාවිතයට ගන්න.

පාඩම සංවර්ධනය

- 6 ශ්‍රේණියේ දී අධ්‍යයනය කළ ස්වසන අභ්‍යාස පිළිබඳ ව නැවත ප්‍රායෝගික ව සිහිපත් කරමින් ද කට හඬ පාලනය සඳහා එයින් ඇති ප්‍රයෝජන පිළිබඳ ව සිහිපත් කරමින් ද පාඩමට පිවිසෙන්න.

- සිරුර ඉහිල් කිරීමේ අභ්‍යාස හා ස්වසන අභ්‍යාස පිළිබඳ ව අධ්‍යයනය කිරීමට සිසුනට මඟ පෙන්වන්න.
- ඇමුණුම 1 සිසුන් අතට පත් කොට එහි සඳහන් අභ්‍යාසයන්හි සිසුන් යොදවන්න.
- අවශ්‍ය උපදෙස් ලබා දෙමින් සිසුන් නිවැරදි ව හසුරුවන්න.

(කාලච්ඡේද 01)

- එක් ගීතයක් නියම කොට එය විවිධ රස භාව මතුවන සේ ළඟට හා දුරට ඇසීමට සලස්වා දුර්වල තැන් නිවැරැදි කරන්න.

(කාලච්ඡේද 01)

ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

හඬ පාලනය කිරීම නිවැරදි වන සේ ඇගයීම සකසා ගන්න.

අතිරේක උදව් : නිදහස් කාල වලදී තනිව අභ්‍යාසයේ යෙදෙන්න. ඒ සඳහා අවශ්‍ය නම් අන්තර්ජාලයේ Voice Training යනුවෙන් Search කර ලැබෙන වෙබ් අඩවි පරිශීලනය කළ හැකිය.

ඇමුණුම 01.

නිරතුරු ව ම ඔබ ගේ ගුරුතුමාගේ /තුමියගේ මඟ පෙන්වීම යටතේ මෙම අභ්‍යාසයන්හි යෙදිය යුතුය.

පළමු ව දුරට හා ළඟට ඇසෙන සේ හඬ පාලනය කිරීමේ අභ්‍යාසයක යෙදෙමු.

**ළඟට හා දුරට**

පියවර 01. ඔබට හැකි අවම හඬින් හා උපරිම හඬින් ශ්‍රැති ස්වරය ගයන්න. (''ස'' හෝ ''රි'' හෝ ඔබ කැමති ස්වරයක් භාවිත කළ හැකි ය. දුරට ඇසෙන සේ ගැයීමේ දී ශ්‍රැතිය මත ම පිහිටා ගැයීම අනිවාර්ය වේ.)

පියවර 02. ඔබ සිටගෙන සිටින තැන සිට අඩි 3ක් ඉදිරියට ඇසෙන සේ ගයන්න. ක්‍රමයෙන් දුර පරතරය වැඩි කරමින් ඈතට ඇසෙන සේ පුහුණු වන්න.

පියවර 03 ඔබ සිටගෙන සිටින තැන ඉදිරියෙන් ඇති උපකරණ ඉලක්ක කර ගනිමින් ඒවාට ඇසෙනවා යැයි යන උපකල්පනයෙන් පුහුණු වන්න. (පළමු ව ළඟ ම ඇති උපකරණය. පුටුවක් යයි සිතමු. දෙවනුව ඊට දුරින් ඇති උපකරණයක් ඉලක්ක කර ගන්න. පාසලේ දී නම් කළුලෑල්ල යයි සිතමු. මේ අයුරින් අභ්‍යාසය දෛනික ව පුහුණු විය යුතු වේ.)

පියවර 04 ඉහත පියවර අනුව ගීතයක් ගැයීමට පුහුණු වන්න.

❖ රස භාව මතු කිරීම සඳහා.

පළමු ව කුමක් හෝ කුඩා ගීතයක් තෝරා ගන්න. (එකට සතුටු සාගරේ, නිල් අහස් තලේ, දිය ගොඩ සැම තැන, වැනි ගීතයක්.)

පියවර 01. තෝරා ගත් ගීතය සතුට දනවෙන ලෙස ගැයීමට පුහුණු වන්න. (සාමාන්‍ය ජීවිතයේ දී සතුටු අවස්ථාවන්හි ඔබ හඬ භාවිත කරන අයුරු සිහියට ගෙන එම හඬින් ගීතය ගයන්න. මුහුණේ ඉරියවු ද ඉතා වැදගත් වනු ඇත.)

පියවර 02. එම ගීතය ම ශෝකය, භය වැනි රස භාව මතු කරමින් ගැයීමට පුහුණු වන්න. (මෙම අභ්‍යාසයේ දී ගීතයේ වචනාර්ථය නොසැලකිය යුතු ය.)

පියවර 03. ඒ ඒ රසයන්ට අදාළ අර්ථ සහිත ගී පද ඇති ගීත තෝරා ගනිමින් ගායනය පුහුණු වන්න. (ගීත තේරීමට ගුරු සහාය අවශ්‍ය ය.)

සැම ගීතයක ම රස උත්පාදනයේ දී හඬ පාලනය අත්‍යවශ්‍ය ය. හඬෙහි උස් පහත් බව භාවිත කොට ගැයීමෙන් රසයන් වෙනස් වන බව ඔබ ම අත් දකින්න.

පියවර 04. රස භාව සහිත ව පහත අවස්ථාවන්හි ගායනය කළ යුතු ආකාරය අධ්‍යයනය කරමින් පුහුණු වන්න. (ගුරු සහාය අත්‍යවශ්‍ය ය.)

1. ළඟ සහ දුර සිටින්නන්ට ඇසෙන සේ.

2. ශබ්දවාහිනී යන්ත්‍ර රහිත රංග ශාලාවක වේදිකාවක් මත.

3. ශබ්දවාහිනී යන්ත්‍ර සහිත අවස්ථාවක.

4. පටිගත කිරීමක දී.

ක්‍රියාකාරකම 3

# ගායනයේ දී සිරුරේ ඉරියවු (ස්වරාලය, උගුර, පිට කොන්ද, මුහුණ) හා වාදනයේ ඉරියවු හා හස්ත සාධන අභ්‍යාස

නිපුණතාව 1.0 :- සම්භාව්‍ය සංගීතයේ ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනාගනිමින් ගායන/ වාදන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි

නිපුණතා මට්ටම 1.1 :- රාගධාරී සංගීතයට අදාළ උසස් ගායනයක්, වාදනයක් ඉදිරිපත් කිරීම සඳහා වර්ධනය කර ගත යුතු මූලික ගුණාංග ප්‍රායෝගික ව අධ්‍යයනය කරයි.

ක්‍රියාකාරකම :- ගායනයේ දී සිරුරේ ඉරියවු (ස්වරාලය, උගුර, පිට කොන්ද, මුහුණ) හෝ වාදනයේ ඉරියවු හා හස්ත සාධන අභ්‍යාස.

කාලච්ඡේද සංඛ්‍යාව :- 02

ඉගෙනුම් පල

- නිවැරදි ඉරියවු සහිත පින්තූර ඇතුළත් දෘශ්‍ය උපකරණය.
- නිවරදි ඉරියවුවෙන් ගායනය වාදනය කිරීමෙන් සාර්ථක ඉදිරිපත් කිරීමක් කළ හැකි බව ප්‍රකාශ කරයි.
- නිවැරදි ඉරියවුවෙන් ගායනය වාදනය කිරීම පහසු බව පිළිගනියි.

ගුණාත්මක යෙදවුම් :-

- නිවැරදි ඉරියවු අනුව ඉදිරිපත් කරනු ලබන ගායන වාදන ඇතුළත් වීඩියෝ පට.
- වීඩියෝ පට ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය උපකරණ.
- ඇමුණුම් 1 හා 2

විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්

එදිනෙදා ජීවිතයෙහි කරනු ලබන සියලු කාර්යයන් නිවැරදි ඉරියවු භාවිතයෙන් සිදු කිරීම නිසා කාර්ය සාර්ථක වනවා පමණක් නො ව ඔබට යහපත් සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් ද ලැබෙනු ඇත. ඒ පිළිබඳ ව සිසුනට අවබෝධයක් ලබා දිය යුතුය. (මේ සඳහා 7 ශ්‍රේණියේ ගීත ගයමු තාල තබමු පාඩමේ (පිටුව 45) රූප ද භාවිත කළ හැකි ය.) එලෙස ම ගායනය හා වාදනය ද නිවැරදි ඉරියවු මත පිහිටා සිදු කිරීම අත්‍යවශ්‍ය බව අවධාරණය කරන්න.

අප හදාරනුයේ හින්දුස්ථානී රාගධාරී සංගීතයට අයත් නිවැරදි ඉරියවුවේ ගායන ශෛලිය යි. හින්දුස්ථානී රාගධාරී ගායනයක් ඉදිරිපත් කිරීමේ දී එරමිණිය ගොතා (පද්මාසනයෙන්) අසුන් ගැනීම යි. මෙසේ අසුන් ගැනීමේ දී කය ඍජු ව පිහිටන නිසා පිට කොන්ද නිවැරදි ව පිහිටයි. එය ගායනය පහසු වීමට සේ ම ශරීර සෞඛ්‍යයට ද යහපත් ය.

සරල සංගීතය තුළ ප්‍රාසංගික වේදිකාවේ දී ගීතයක් ඉදිරිපත් කරනු ලබන ඉරියවුව පහදා දීම ද අත්‍යවශ්‍ය වේ.

එහි දී ගෙල ඍජුව තබා ගත යුතු ය. ගෙල වක් වුව හොත් ස්වරාලය තෙරපෙනු ඇත. ඒ බව ඇමුණුම 01හි දී ඇති රූප සටහන් මඟින් අවබෝධ කරවන්න.

ගායනයේ දී මුහුණ ප්‍රසන්න විය යුතු අතර භාව නිරූපණය ද මුහුණින් සිදුවිය යුතු ය. ඉදිරියේ සිටින්නන්ගේ ඇස් දෙස ඍජුව බලමින් ගායනයේ යෙදීමේ හැකියාව ද වර්ධනය කර ගත යුතු වන්නේ ඒ තම හැඟීම් අන්‍යයන් කරා ගෙන යා හැකි සාර්ථක ම මාවත ඇස් වන බැවිනි.

පසුගිය 2009 පෙරදිග සංගීත 12 ශ්‍රේණිය මාර්ගෝපදේශ සංග්‍රහයෙහි දක්වා ඇති ගායන දෝෂ පිළිබඳ ව අවධානය යොමු කොට සිසුන් දැනුම්වත් කිරීම ද අනිවාර්ය වේ.

මිනිස් සිරුර තුළ ශක්ති ස්ථාන සතක් ඇත. එම ස්ථාන ''චක්‍ර'' නමින් හැඳින්වෙයි. ඒවා අවදි කර ගැනීමෙන් සුවිශේෂී ශක්තීන් ලබා ගැනීමේ හැකියාව මිනිසා සතු ය. මනසින් කථා කිරීමට හැකි වීම අතීතය අනාගතය දැන ගැනීම වැනි හැකියා එයින් ලැබෙන ප්‍රතිලාභ කිහිපයකි. මෙම ''චක්‍ර'' අවදි කර ගැනීමේ ක්‍රමවේද අතර සංගීතය ද සුවිශේෂ ක්‍රම වේදයකි. නිවැරදි ඉරියව්ව මත පිහිටා නිවැරදි ව ගායනය වාදනය ප්‍රගුණ කිරීමෙන් මෙම තත්ත්වයන් ළඟා කර ගැනීමට හැකියාව ඍෂිවරුන් දක්වා ඇති බව ඉගැන්විය යුතු ය. එම තත්ත්වය කුණ්ඩලනී ශක්තිය අවදි කර ගැනීම යි. දෙවන ඇමුණුමෙහි ඇතුළත් රූප සටහන් ද භාවිත කර සිසුන්ගේ චින්තනය නව මඟකට යොමු කරවන්න. මේ පිළිබඳ ව පළමු ව ඔබ කියවන්න.(කුණ්ඩලනී යෝග අභ්‍යාස සරත්චන්ද්‍ර ජයකොඩි/විස්මිත කුණ්ඩලිනී ශක්තිය - වසන්ත් ජී රේලි - පරිවර්තනය ජීවනී හසන්තා වික්‍රමතුංග/භාවනාව කුණ්ඩලනී බලය සහ අධිමානසික විද්‍යාවේ රහස් - නිලන්ත හෙට්ටිගේ................ අන්තර් ජාලය.)

මිහිරි භාවාත්මක වාදනයක් ඉදිරිපත් කිරීම සඳහා ද නිවැරදි ඉරියව්වල ඇති වැදගත් කම ද දෘශ්‍යාධාර හා වීඩියෝ දර්ශන මඟින් සිසුවා වයන වාද්‍ය භාණ්ඩයේ නිවැරදි ඉරියව්ව පිළිබඳ ව ද පහදන්න. සෙසු වාද්‍යයන් පිළිබඳ වත් දළ අවබෝධයක් දිය යුතු වේ. භාණ්ඩයන්ගේ අනන්‍යතා ගුණ මතුවන ලෙස ඔබ විසින් සකසා ගන්නා ලද හස්ත සාධන අභ්‍යාස පුහුණු කරවිය යුතු ය. (පසුගිය 7 ශ්‍රේණියේ වාදන පාඩම ආදර්ශයට ගන්න.)

පාඩම සංවර්ධනය

- ජීවිතයේ එදිනෙදා කරනු ලබන කාර්යයන්හි නිවැරදි ඉරියව්ව භාවිතය පිළිබඳ ව සාකච්ඡා කරමින් පාඩමට පිවිසෙන්න.. (විනාඩි 05)
- නිවැරදි ඉරියව්ව සහිත (හින්දුස්ථානී හා සරල සංගීතය තුළ) ගායක ගායිකාවන්ගේ රූප ඇතුළත් දෘශ්‍ය උපකරණ මඟින් හා වීඩියෝ දර්ශන මඟින් නිවැරදි ඉරියව්ව දැකීමට සලස්වා ඒ පිළිබඳ ව සිසුන් සමඟ පුළුල් ව සාකච්ඡා කරන්න. නිවැරදි ඉරියව්ව භාවිතයෙන් නිවැරදි ගායනයක් හෝ වාදනයක් හෝ ඉදිරිපත් කිරීමට ලැබෙන පිටිවහල පිළිබඳ ව කරුණු දක්වමින් ඒවා ප්‍රායෝගික ව අත්දැකීමට සලස්වන්න. මුහුණ බෙල්ල හා කොන්ද තිබිය යුතු ආකාරය පිළිබඳ ව පැහැදිලි කරන්න. මෙහි දී ඇමුණුම 1 භාවිතයට ගන්න. (විනාඩි 25)
- ඇමුණුම 2හි රූප සටහන් භාවිත කරමින් ශරීරය තුළ ඇති චක්‍ර පිළිබඳ ව දළ අවබෝධයක් ලබා දී එම චක්‍ර අවදි කොට කුණ්ඩලිනී ශක්තිය ලබා ගැනීම සඳහා සංගීතය ප්‍රධාන මාර්ගයක් බව සිසුන් සමඟ සාකච්ඡා කරන්න. (විනාඩි 10)
- නිවැරදි ඉරියව්ව සහිත (හින්දුස්ථානී හා සරල සංගීතය තුළ) ගායක ගායිකාවන්ගේ රූප ඇතුළත් දෘශ්‍ය උපකරණය මඟින් හා වීඩියෝ දර්ශන

මගින් නිවැරදි ඉරියවු දැකීමට සලස්වා ඒ පිළිබඳ ව සිසුන් සමඟ පුළුල් ව සාකච්ඡා කරන්න. නිවැරදි ඉරියවු මත පිහිටමින් හස්ත සාධන අභ්‍යාස වාදනය පුහුණු කරවන්න. (විනාඩි 40)


ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස් :-

- වාචික ප්‍රශ්න මගින්.
- ප්‍රායෝගික පාඩම් තුළ දී.


අතිරේක උදව් :-

- ප්‍රවීණයන් විසින් ඉදිරිපත් කරනු ලබන ගායන - වාදනයන්හි වීඩියෝ දර්ශන.

ඇමුණුම 01 :-




ඇමුණුම 2. :-



ක්‍රියාකාරකම 4

# රාගධාරී ගී ගයමු, වයමු - භාගේශ්‍රී.

**නිපුණතාව** :- සම්භාව්‍ය සංගීතයේ ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනා ගනිමින් ගායන වාදන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම** :- උත්තර භාරතීය සංගීතයට අයත් රාග කිහිපයක ස්වභාවය සහ සම විෂමකම් හඳුනා ගනිමින් ගායනයේ / වාදනයේ යෙදෙයි.

**ක්‍රියාකාරකම** :- රාගධාරී ගී ගයමු, වයමු. (භාගේශ්‍රී රාගය)

**කාලච්ඡේද** :- කාලච්ඡේද 18

**ඉගෙනුම් ඵල** :-

- නිර්දේශිත රාගවල ස්වර අභ්‍යාස ගායනය / වාදනය කරයි.
- බාගේශ්‍රී රාග ලක්ෂණ හා ස්වභාවය අවබෝධ කර ගනියි.
- සර්ගම් ගායනය / වාදනය කරයි.
- මධ්‍ය ලය ගී ගායනය / වාදනය කරයි.
- ආලාප හා මධ්‍ය ආලාප ගායනය / වාදනය කරයි.
- තානාලංකාර නිර්මාණය කර ගනී. ගායනය / වාදනය කරයි.

**ගුණාත්මක යෙදවුම්** :- තාම්පුරාව, සර්පිනාව, තබ්ලාව, දෘශ්‍යාධාර

**විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක් :-**

- බාගේශ්‍රි, දේස්, ආසාවරි යන රාගවලට අයත් ස්වර අභ්‍යාස සර්ගම්, මධ්‍ය ලය ගී, ආලාප, මධ්‍යාලාප තානාලංකාර ප්‍රායෝගික ව ගායනය / වාදනය පුහුණු කිරීම මෙම ක්‍රියාකාරකමෙන් අපේක්ෂිත ය. මේ මඟින් රාග සංගති, රාග ස්වභාවය පිළිබඳ ව මනා අවබෝධයක් ලැබෙන අතර රාග රස වින්දන ශක්තිය වර්ධනය වී නිර්මාණකරණයට ද අවස්ථාව ලැබෙනු ඇත.
- මේ සඳහා බාගේශ්‍රී රාගයට අයත් ස්වර අභ්‍යාස සර්ගම් මධ්‍ය ලය ගී, ආලාප මධ්‍යාලාප තානාලංකාර පුහුණුව හා ඇගයීම සමඟ කාලච්ඡේද 18ක් යොදාගත හැකි ය.
- රාග ස්වභාවය මැනවින් විදහා දක්වෙන ගීත මේ සඳහා යොදා ගත හැකි ය. ගීත තෝරා ගැනීම සඳහා ඇමුණුමේ දක්වෙන ගීත යොදා ගත හැකි ය.
- ශ්‍රැතිය, ස්වර ස්ථාන, ස්වර සංගති, තාලය රැක ගැනීම සහ මිහිරිතාව, රසභාව පිළිබඳ වඩාත් සැලකිලිමත් වෙමින් පුහුණු කිරීමේ කාර්යයෙහි යොදවන්න.
- මෙම නිපුණතා මට්ටම හා බැඳි ක්‍රියාකාරකම් සියල්ල අවසානයේ දී කරනු ලබන ඇගයීම් මඟින් සිසුන් ළඟා වී ඇති නිපුණතා මට්ටම පිළිබඳ ව සොයා බලා දුර්වලතා මඟහරවා ගැනීමට අවශ්‍ය පියවර ගත හැකි ය.

- පළමු වාරයට භාගේශ්‍රී රාගය, දෙවන වාරයට දේශ් රාගය, තුන්වන වාරයට ආශාවරි රාගය ඉගැන්වීම අපේක්ෂිත යි.

**පාඩම සංවර්ධනය :-**

- එක් රාගයකට වෙන් කරන ලද කාලච්ඡේද 18 පහත දැක්වෙන ලෙස බෙදා ගත හැකි ය.

| | |
|---|---|
| - රාගයේ ස්වර අභ්‍යාස ගායනය / වාදනය සඳහා | කාලච්ඡේද 01 |
| - රාගයේ විස්තර සහ ස්වභාවය සාකච්ඡා කිරීම | කාලච්ඡේද 01 |
| - රාගයේ සර්ගම් ගායනය / වාදනය සඳහා | කාලච්ඡේද 02 |
| - මධ්‍ය ලය ගීතය ගායනය / වාදනය සඳහා | කාලච්ඡේද 04 |
| - රාගයේ පූර්වාලාප සඳහා | කාලච්ඡේද 02 |
| - රාගයේ මධ්‍යාලප පුහුණුව | කාලච්ඡේද 02 |
| - රාගයේ තානාලංකාර ගොඩනැඟීම සඳහා | කාලච්ඡේද 02 |
| - තානාලංකාර තාලානුකුල පුහුණුවට | කාලච්ඡේද 02 |
| - ශිල්පාංග සහිත ව රාගධාරී ගායනයක් ලෙස | කාලච්ඡේද 02 |
| | කාලච්ඡේද 18 |

- සිසුන්ට ගැළපෙන ශ්‍රැතියක් තෝරා ගන්න. භාගේශ්‍රී රාගයට ස, ම ගැළපෙන බව අවබෝධ කරවන්න. (නි ශ්‍රැති ස්වරය කර ගත් විට ගු උචිත බව.) ඇමුණුමේ දක්වා ඇති බාගේශ්‍රී රාගයේ ස්වර අභ්‍යාස හෝ රාගයේ ස්වර සංගති ඉස්මතු කොට ඔබ සකසා ගත් ස්වර හෝ අභ්‍යාස ගායනය වාදනය කරවන්න. ගායනය කරන සිසුන්ට ස්වරයෙන් හා ආකාරයෙන් ස්වර අභ්‍යාස ගායනය කරවන්න. හුස්ම පාලනය කර ගනිමින් කටහඬ පාලනය කර ගනිමින් ශ්‍රැතිය මත පිහිටා ගායනය කරවන්න.

(කාලච්ඡේද 01)

- ස්වර අභ්‍යාස සහ දෘශ්‍යාධාර ඇසුරෙන් බාගේශ්‍රී රාගයේ විස්තර සාකච්ඡා කරන්න. බාගේශ්‍රී රාගයේ ස්වභාවය ගැන අවබෝධය ලබා දෙන්න. ආරෝහණ අවරෝහණ සහ ස්වර සංගති ගායනය / වාදනය කරවන්න.

(කාලච්ඡේද 01)

- ඇමුණුමේ දක්වා ඇති සර්ගම් ගීතය ආවර්තයෙන් ආවර්තයට ගායනය / වාදනය කරවන්න. නිවැරදි ව ස්වර ගායනය / වාදනය කෙරෙහි අවධානය යොමු කරන්න. ගයන/වයන ලද සර්ගම් ප්‍රස්තාරය සිසුන්ට ගොඩනැඟීමට ඉඩ සලස්වන්න. දෘශ්‍යාධාරයක් මඟින් සිසුන් විසින් ගොඩනඟන ලද ප්‍රස්තාරය සසඳා ප්‍රස්තාර දූර්වලතා මඟහරවා ගැනීමට අවශ්‍ය පියවර ගන්න.

(කාලච්ඡේද 02)

- ඇමුණුමේ දැක්වෙන බාගේශ්‍රී රාගයට අයත් මධ්‍ය ලය ගීත තෝරා ගන්න. වාදනය කරන සිසුන්ට රාගාංග ප්‍රධාන කොට ගත් වාදිතයක් අවශ්‍ය නම් යොදා ගත හැකි ය. ආවර්තයෙන් ආවර්තයට ගායන/වාදන කරවා සිසුන් ලවා ප්‍රස්තාර ගොඩනඟන්න. ස්ථායී කොටස හා අන්තරා කොටස තාලය හා සම්බන්ධ වෙමින්

ගායනය/වාදනය කරවන්න. ඔබ සකසා ගත් භාගේශ්‍රී මධ්‍ය ලය ගීතයේ දෘශ්‍යාධාරයකය මඟින් රාගයට අදාළ ස්වර සංකේත, තාල සංකේතවල වැදගත්කම පැහැදිලි කරන්න. ශ්‍රැතිය හා ස්වර ස්ථාන පිළිබඳ ව අවධානය යොමු කරන්න.

(කාලච්ඡේද 04)

- මෙතෙක් ඉගෙන ගත් භාගේශ්‍රී රාගයේ රාගාංග හා ප්‍රධාන ස්වර සංගති පිළිබඳ ව සිසුන්ගෙන් විමසන්න. ඒ ආශ්‍රිත ව ආලාපයන් ගොඩ නගන්න. ස්වරයෙන් හා ආකාරයෙන් ගායනය කරවන්න. වාදනය නම් ඒ ඒ භාණ්ඩයට සුවිශේෂී ව ආලාපයන් වාදනයට යොමු කරවන්න.

(කාලච්ඡේද 02)

- ඉගෙන ගත් ආලාප මධ්‍ය ලය ගීතය සමඟ යොදා ගනිමින් මධ්‍යාලාප පිළිබඳ ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල යොදවන්න. තබ්ලාවෙන් තාලය වාදනය කරන අතර ආලාප ඛණ්ඩ ගායනය/වාදනය කරවන්න. ගීතයේ මුඛඩාවෙන් තාලය සමඟ සම්බන්ධ වන ක්‍රියාකාරකම් යොදවන්න.

  මධ්‍යාලාප ස්වරයෙන් ආකාරයෙන් බෝල් ආලාප (ගීතයේ වචන යොදාගෙන) ගායනය කරවීමට යොමු කරන්න. ස්ථායී මුඛඩාව සහ අන්තරා මුඛඩාව යොදාගෙන ස්ථායී ආලාප අන්තරා ආලාප ලෙස මධ්‍යාලාප ගායනය/වාදනය කිරීමට යොමු කරන්න.

(කාලච්ඡේද 02)

- බාගේශ්‍රී රාගයේ රාගාංග ඇසුරු කරමින් සිසුන් ලවා තානාලංකාර නිර්මාණය කරවන්න. විවිධ තානාලංකාර වර්ග අනුව තානාලංකාර නිර්මාණයට යොමු කරන්න. එම තානාලංකාර ගායනය/වාදනය කරවන්න. ස්වරයෙන් හා ආකාරයෙන් ගායනයට යොමු කරවන්න.

(කාලච්ඡේද 02)

- ගොඩනඟා ගත් තානාලංකාර තාලයට අනුකූල ව ගායනය/වාදනය කරවන්න. මධ්‍ය ලය ගීතයේ තාලය තබ්ලාවෙන් වාදනය කරවන්න. තානාලංකාර ගායනය/වාදනය කර ගීතයෙන් තාලයට සම්බන්ධ වීමේ ක්‍රියාකාරකම්වල යොදවන්න. ස්වර තානාලංකාර, ආකාර තානාලංකාර, බෝල් තානාලංකාර ගායනය කිරීමට යොමු කරන්න. වාදනයේ දී තිහායි වැනි ශිල්ප ක්‍රම යොදා ගෙන තානාලංකාර වාදනය කළ හැකි ය.

(කාලච්ඡේද 02)

- බාගේශ්‍රී රාගයේ පූර්වාලාප මධ්‍යලය ගීතය හෝ වාදිතය හෝ මධ්‍යාලාප, තානාලංකාර වැනි ශිල්පාංග සහිත ව රාගධාරී ගායනයක්/වාදනයක් ඉදිරිපත් කිරීමට යොමු කරන්න. ශ්‍රැතියට අනුව ගැයීමට/වැයීමට උපදෙස් දෙන්න. නිවැරදි ව ස්වර ස්ථාන අනුව/තාලයට අනුකූල ව ගායනය/වාදනයට අවධානය යොමු කරවන්න.

(කාලච්ඡේද 02)

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :-

- පාඩම ආරම්භයේ සිට ම නිවැරදි ව ස්වර ස්ථාන ශ්‍රැතියට හා තාලයට අනුකූල වීම පිළිබඳ නිරන්තර ඇගයීමක් කළ යුතු ය.
- බාගේශ්‍රී රාගයේ මධ්‍යලය ගීතය ගායනය / වාදනය කරවා සුදුසු ලෙස අගයන්න.
- ප්‍රස්තාර කිරීම හා රාගයේ සුවිශේෂතා තහවුරු වීමට සුදුසු ඇගයීම් සකසා ගන්න.

මූලාශ්‍ර :-

- ක්‍රමික පුස්තක් මාලිකා II බාණ්ඩය
- සම්භාව්‍ය සංගීත ඩිප්ලෝමා - ප්‍රේමදාස මුදුන්කොටුව
- මහාචාර්ය දයා රත්නසේකර - හින්දුස්ථානී සංගීත ආක්ෂිප්තිකා තරංගනී
- ඛ්‍යාල් ගීත - ආනන්ද ජයසිංහ
- භාවික ගීත - වින්සන්ට් සෝමපාල
- රාගධාරී සිංහල ගීත - ශාන්ති ගීතදේව

## රාග විස්තර

| රාගය | මේලය | ආරෝහණ අවරෝහණ | ජාතිය | වාදී සංවාදී | මුඛ්‍යාංගය | ගාන සමය |
|---|---|---|---|---|---|---|
| බාගේශ්‍රී | කාෆි | සනිධනිස, මග<br>මධනිස<br>සනිධ, මග, මගරිස | ඖඩව ෂාඩව<br>ෂාඩව සම්පූර්ණ<br>සම්පූර්ණ | ම ස | ස නි ධ, ස<br>මධනිධ, ම, ගරිස | රාත්‍රී තුන්වන ප්‍රහරය<br>(මධ්‍යම රාත්‍රී) |
| දේස් | ඛමාජ් | ස, රිමප, නිස<br>සනිධප, මගරි, ගස | සම්පූර්ණ | රි ප | රිමප, නිධප<br>පධපමගරිගස | රාත්‍රී දෙවන ප්‍රහරය |
| තිලක්කාමෝද් | ඛමාජ් | සරිගස, රිමපධ, මපස<br>ස පධ, මග, සරිග, සනි | ෂාඩව<br>සම්පූර්ණ | රි ප | පනිසරිගස<br>රිපමග, සනි | රාත්‍රී දෙවන ප්‍රහරය |
| ආසාවරී | ආසාවරී | ස රි ම ප ධ ස<br>සනි ධපමගරිස | ඖඩව<br>සම්පූර්ණ | ධ ග | රි ම ප, නි ධ ප | දිවා දෙවන ප්‍රහරය |
| ජෞනපූරි | ආසාවරී | ස රි ම ප ධ නි ස<br>සනි ධපමගරිස | ෂාඩව<br>සම්පූර්ණ | ධ ග | මප නි ධ ප<br>මප ග, රි ම ප | දිවා දෙවන ප්‍රහරය |
| මාලකෞන්ස් | භෛරවී | නි ස, ග ම, ධ නි ස<br>ස නි ධ ම, ග ම ග ස | ඖඩව<br>ඖඩව | ම ස | ම ග, ම ධ නි ධ<br>ම ග ස | රාත්‍රී දෙවන ප්‍රහරය |

ඇමුණුම අංක 01

## බාගේශ්‍රී රාගය

ස නි ධ නි ස

ස නි ධ නි ස ග ම ග රි ස

ස නි ධ නි ස ග ම ධ ම ග රි ස

ස නි ධ නි ස ග ම ධ නි ධ ම ග රි ස

ස නි ධ නි ස ග ම ධ නි ස් නි ධ ම ග රි ස

ස නි ධ නි ස ග ම ධ නි ස් රි් ස් නි ධ ම ග රි ස

ස නි ධ නි ස ග ම ධ නි ස් ග් රි් ස් නි ධ ම ග රි ස

ස නි ධ නි ස ග ම ධ නි ස් ග් ම් ග් රි් ස් නි ධ ම ග රි ස

### සර්ගම්

**ස්ථායී**

| x | 2 | 0 | 3 |
|---|---|---|---|
| රි ස | නි ධ නි | ස - | ම ග ග |
| ම ධ | නි ස් නි | ධ ම | ධ ම ග |
| ම ග | ම ධ නි | ස් - | රි් ස් ස් |
| ස් නි | ධ ම නි | ධ ම | ග රි ස |

**අන්තරා**

| x | 2 | 0 | 3 |
|---|---|---|---|
| ම ග | ම ධ නි | ස් - | රි් ස් ස් |
| නි ස් | ම් ග් රි් | ස් රි් | ස් නි ධ |
| ම ධ | ස් නි ධ | ම ප | ග රි ස |
| ස් රි් | ස් නි ධ | ම ග | රි රි ස |

- පහත දැක්වෙන ගීත අතුරින් කැමති මධ්‍ය ලය ගීතයක් තෝරාගත හැකි ය.

බාගේශ්‍රී රාගය 1. බල්මා මෝරෙ තෝරේ සංග

2. කෞන කරත තොරෙ බිනති පියරවා

3. යේහෝ දාය දාය ගර ලා ගුං

ක්‍රියාකාරකම 5

# ගාන සමය මුඛ්‍යාංගය

නිපුණතාව 1.0 :- සම්භාව්‍ය සංගීතයේ ශිල්පාංග සහ සිද්ධාන්ත හා සන්ධි ප්‍රකාශ රාග වර්ග නම් කරයි. ගායන වාදන ප්‍රයෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම 1.2 :- උත්තර භාරතීය සංගීතයට අයත් රාග කිහිපයක ස්වභාවය සහ සම විෂමතා හඳුනා ගනිමින් ගායනයේ /වාදනයේ යෙදෙයි.

ක්‍රියාකාරකම :- ගානසමය, මුඛ්‍යාංගය හදාරමු

ඉගෙනුම් ඵල :-
- ගායනසමය හා මුඛ්‍යාංගය යන සංකල්ප පැහැදිලි කරයි.
- රාගයන්හි ගානසමය සෙවීමේ සිද්ධාන්තය හඳුනා ගනී.
- රාගයේ යෙදෙන 'ම' ස්වරය හා වාදී ස්වරය ගාන සමයට බලපාන බව පිළිගනී.

කාලය :- කාලච්ඡේද 02

ගුණාත්මක යෙදවුම් :- • රාග විස්තර ඇතුළත් ඇමුණුම අංක 01 ඇමුණුම අංක 02

විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක්

- ගාන සමය, මුඛ්‍යාංගය යන සංකල්ප හඳුනා ගැනීමේ කුසලතාව ලැබෙන අතර එම සංකල්පවල ඇති අවශ්‍යතාව හා නිර්දේශිත රාගවල ගානසමය හා මුඛ්‍යාංගය පිළිබඳ ව මනා අවබෝධයක් ලබාදීම මෙම ක්‍රියාකාරකම මගින් අපේක්ෂිත ය.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය
- ඇමුණුම අංක 01හි දැක්වෙන ගාන සමය ඇතුළත් චක්‍රය ප්‍රදර්ශනය කරන්න. චක්‍රයෙහි සඳහන් විස්තර අනුව ගාන සමය වර්ග කර ගන්නා ආකාරය පිළිබඳ ව අවධානය යොමු කරවන්න.

(කාලච්ඡේද 01)

- රාග විස්තර ඇතුළත් 14 පිටෙහි දැක්වෙන ඇමුණුමෙහි දැක්වෙන වගුව අධ්‍යයනය කරමින් නිර්දේශිත රාගවල මුඛ්‍යාංග පිළිබඳ ව අවධානය යොමු කරන්න. මුඛ්‍යාංගය පිළිබඳ ව අවබෝධය ලබා දෙන්න.

(මිනිත්තු 20)

ඇගයීම

දිනයේ ප්‍රහර 08කට බෙදෙන අයුරු නම් කරන්න.

පූර්වාංග වාදී රාග උත්තරාංග වාදී රාග ගැයෙන කාලය නම් කරන්න.

ශුද්ධ රි ධ වර්ගයේ රාග ගැයෙන කාලය නම් කරන්න.

කෝමල රි ධ වර්ගයේ රාග ගැයෙන කාලය නම් කරන්න.

කෝමල ග නි වර්ගයේ රාග ගැයෙන කාලය නම් කරන්න.

සන්ධි ප්‍රකාශ රාග වර්ග නම් කරන්න.

සන්ධි ප්‍රකාශ රාග වර්ග ගැයෙන කාලය නම් කරන්න.

කෝමල ''රි'' ''ධ'' සමග තීව ''ම'' යෙදේ නම් ගැයීමට උචිත කාලය

මධ්‍යමය, ගාන සමය තීරණය සඳහා බලපාන නිසා මධ්‍යමය හඳුන්වන නම කුමක් ද?

නිර්දේශිත රාගවල ගාන සමය ලකුණු කරන්න.

මුඛ්‍යාංගය යන සංකල්පය පැහැදිලි කරන්න.

නිර්දේශිත රාගවල මුඛ්‍යාංගය ලියන්න.

මිනිත්තු 20

අතිරේක උදවු


සංගීත - ප්‍රේමවංශ හපුවලාන

පෙරදිග සංගීත ශාස්ත්‍රය - බී.එස්. විජයරත්න

නිර්දේශිත රාගවල මුඛ්‍යාංගය ලියන්න.

ඇමුණුම අංක 1

උත්තර භාරතීය සංගීතයෙහි ගාන සමය ඇතුළත් චක්‍රය




- දිවා 12 සිට රාත්‍රි 12 තෙක් - පූර්වාංගවාදි රාග
- රාත්‍රි 12 සිට දිවා 12 තෙක් උත්තරාගවාදී රාග
- 4.00 - 7.00 තෙක් <u>රි</u> <u>ධ</u> වර්ගයේ රාග.

  භෛරව, පූර්වි, මාර්වා, මේලගත රාග
- 7.00 - 10.00 තෙක් රි ධ වර්ගයේ රාග

  යමන්, බිලාවල්, ඛමාජ්, මේලගත රාග
- 10.00 - 4.00 තෙක් <u>ග</u> <u>නි</u> වර්ගයේ රාග

  කාෆි, ආශාවරී, භෛරවී තෝඩි මේලගත රාග

## කියවීම් පත්‍රිකාව

ගාන සමය යනු රාග ගැයීමට උචිත කාලය යි. වේලාවයි. දිනයේ පැය 24 කොටස් අටකට (8) බෙදා රාග ගායනය කරයි. පය 03කින් යුත් කොටසක් ප්‍රහරයක් යනුවෙන් හැඳින්වේ. මෙම ප්‍රහරයන් 8 දිවා ප්‍රහරයන් සහ රාත්‍රි ප්‍රහරයන් ලෙස වෙන්කොට ඇත.

දිවා ප්‍රථම ප්‍රහරය රාත්‍රි ප්‍රථම ප්‍රහරය

දිවා දෙවන ප්‍රහරය රාත්‍රි දෙවන ප්‍රහරය

දිවා තෙවන ප්‍රහරය රාත්‍රි තෙවන ප්‍රහරය

දිවා සිවුවන ප්‍රහරය රාත්‍රි සිවුවන ප්‍රහරය

භාත්ඛණ්ඩේ පඬිතුමා සියලු රාගයන්, මෙම ගානසමය න්‍යායට අනුව වර්ග 2කට බෙදුවේ ය. ඒ මෙසේ ය.

1. පූර්වාංගවාදී රාග - සප්තකයේ පූර්ව භාගයෙහි, එනම් එහි ප්‍රථම ස්වර සතර අතරේ දී වාදි ස්වරය පිහිටි රාග උදා :- දේශ්, තිලක්කාමෝද්

   උදා :- ස රි ග ම

2. උත්තරාංගවාදී රාග - සප්තකයේ පශ්චිම භාගයෙහි හෙවත් එහි අවසාන භාගයෙහි අන්තර්ගත ස්වර අතරේ වාදි ස්වරය පිහිටි රාග - උදා - ආශාවරී, ජෞනපූරි

   උදා :- ප ධ නි ස්

මෙම ඉහත කී රාග දෙවර්ගයන් ගැයීමට නියමිත සමය කාලය නිර්ණය මෙලෙස දැක්විය හැකි ය.

ගාන සමය සිද්ධාන්තය

| පූර්වාංගවාදී රාග | උත්තරාංගවාදී රාග |
| --- | --- |
| ගාන සමය | ගාන සමය |
| මධ්‍යාහ්න 12 සිට මධ්‍යම රාත්‍රි 12 තෙක් | මධ්‍යම රාත්‍රි 12 සිට මධ්‍යහ්න 12 තෙක් |

සන්ධි ප්‍රකාශ රාගයන්හි ධෛවතය හා ඍෂභය කෝමල ව යෙදේ. එම රාග ගායන කළ යුතු ගාන සමය දෙකක් ඇත. එනම්, උදය සන්ධිය (පෙ.ව 4.00 සිට රාත්‍රි 7.00 දක්වා) වේ. එම ගාන සමය තීරණය කිරීමට රාගයේ යෙදෙන මධ්‍යමය හේතුවක් වේ. කෝමල රි, ධ සමග ශුද්ධ මධ්‍යමය යෙදේ නම් එම රාගය උදය සන්ධියේ ද, තීව්‍ර මධ්‍යමය යෙදේ නම් සන්ධ්‍යා සන්ධියේ ද ගායනය වාදනය සිදු වේ.

රාගධාරී සංගීතයේ දී ''ම'' ස්වරය ගාන සමය තීරණය සඳහා ද බලපාන නිසා මධ්‍යමය ''සමය දර්ශක'' නැතහොත් ''අද්ව දර්ශක'' ස්වරය ලෙස ද හැඳින්වේ.

මූලාශ්‍රය - සම්භාව්‍ය සංගීත ඩිප්ලෝමා - ප්‍රේමදාස මුදුන්කොටුව

රාගධාරී සිංහල ගීත - ශාන්ති ගීතදේව

ක්‍රියාකාරකම 6

# ආලාප හා ආලාප වර්ග

නිපුණතාව 1.0 :- :- සම්භාව්‍ය සංගීතයේ ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනා ගනිමින් ගායන වාදන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම :- සම්භාව්‍ය සංගීතයේ උසස් දක්ෂතා ප්‍රදර්ශනය කිරීමට උපයෝගී වන සංකල්ප පිළිබඳ ව අදහස් දක්වමින් ඒවා පිළිබඳ තමා තුළ ඇති ශිල්පීය ප්‍රාගුණ්‍යය ප්‍රදර්ශනය කරයි.

ක්‍රියාකාරකම :- ආලාප හා ආලාප වර්ග

ඉගෙනුම් ඵල :-
- ආලාප ගායනය/වාදනය කරයි.
- ආලාප ගයන අවස්ථා හඳුනා ගනියි.
- ආලාප වර්ග භාවිත කිරීමට පෙලඹෙයි.

රාග සංගති අනුව ආලාප ගොඩනගා ගනියි.

කාලයඃ- කාලච්ඡේද 02

ගුණාත්මක යෙදවුම් :- • සර්පිනාව, තබ්ලාව, තාම්පුරාව

විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක්

කෙටි ආලාප ඛණ්ඩ සකස් කිරීම සහ ප්‍රායෝගික ව ගායනය වාදනය කිරීමේ කුසලතාව වර්ධනය කිරීමත්, පූර්වාලාප මධ්‍යාලාප බඩත් ආලාප සහ සර්ගම් ආලාප ආකාරාලාප බෝල් ආලාප වැනි ආලාප වර්ග පිළිබඳ ව දැනුම්වත් කිරීමත් මෙම ක්‍රියාකාරකමෙන් අපේක්ෂිත ය.

ආලාප ගායනයේ දී/වාදනයේ දී රාග ස්වභාවය ප්‍රදර්ශනය කිරීම සහ එහි වැදගත්කම පිළිබඳ ව අවබෝධ කරවන්න.

.පාඩම සංවර්ධනය

- සූදානම් කරගත් ආලාප, මධ්‍යාලාප සහිත ගායනයක් හෝ වාදනයක් හෝ ශ්‍රවණයට සලස්වන්න. නැතහොත් භාගේශ්‍රී හෝ වෙනත් රාගයක හෝ ආලාප ගායනයක් හෝ වාදනයක් හෝ කර පාඩමට පිවිසෙන්න. ආලාප ගායනය පිළිබඳ විමසීමක් කර ආලාප ගායනය හා එහි විශේෂතා හැඳින්වීමක් කරන්න.

  (කාලච්ඡේද 01)

- මධ්‍ය ලය ගීතයක් ඇසුරෙන් පූර්වාලාප සහ මධ්‍යාලාප යන ආලාප අවස්ථා පිළිබඳ ව අවබෝධයක් ලබා දෙන්න. (මිනිත්තු 20)
- සර්ගම් ආලාප, ආකාරාලාප, බෝල් ආලාප හා ජෝඩ් ආලාප වැනි ආලාප වර්ග ප්‍රායෝගික ව ඉදිරිපත් කරන්න. එම ආලාප වර්ගවල ඇති විශේෂතා සාකච්ඡා කරන්න. (මිනිත්තු 60)

ඇගයීම :- ආලාප ගායනයක සුවිශේෂ ලක්ෂණ මොනවා ද?

පැවරුම :- මධ්‍යලය ගීතයක් විවිධ ආලාප වර්ග සහිත ව ගායනයට/වාදනයට සලස්වා අගයන්න.

අතිරේක පොත් :- සංගීත - ප්‍රේමවංශ හපුවලාන - සංගීත ප්‍රවේශිකා-ශ්‍යාමලී කේ. පෙරේරා

ක්‍රියාකාරකම 7

# තාල සංකල්පය ගති මිති ලය සහ තාලයක කොටස්

නිපුණතාව 1.0 :- සම්භාව්‍ය සංගීතයේ ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනා ගනිමින් ගායන වාදන ප්‍රයෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම :- තාලයේ ගති ලක්ෂණ පැහැදිලි කරමින්, දේශීය සහ භාරතීය විවිධ තාල අතර ස්වභාවය හඳුනා ගනිමින් තාල නිරූපණය කරයි.

ක්‍රියාකාරකම :- තාල සංකල්පය ගති මිති ලය සහ තාලයක කොටස්

ඉගෙනුම් ඵල :-
- තාල සංකල්පය පැහැදිලි කරයි.
- ගති මිති සහ ලය යන සංකල්ප හඳුනා ගනී.
- තාලයක කොටස් හඳුනා ගනී.

කාලයඃ- කාලච්ඡේද 04

ගුණාත්මක යෙදවුම් :- අදාළ සංගීත අංග පටිගත කරන ලද කැසට් පට හා කැසට් යන්ත්‍රයක්, සර්පිනාව, තබ්ලාව විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්.

තාල සංකල්පය තාලවල විවිධ ගති ලක්ෂණ හා තාලයක කොටස් හඳුනා ගැනීම මින් අපේක්ෂා කෙරේ.

තාල සංකල්පය පිළිබඳ නිර්වචන ඇතුළත් දෘශ්‍ය උපකරණ මඟින් පාඩම සංවර්ධනය කළ හැකි ය.

ගති, මිති හා ලය පිළිබඳ පැහැදිලි කරමින්, තබ්ලාවක් උපයෝගී කොට ගනිමින් එම සංකල්ප පිළිබඳ ව ප්‍රායෝගික අත්දැකීම් ලබා දිය හැකි ය.

තාලයක් ප්‍රස්තාර කළ දෘශ්‍ය උපකරණයක් හා තබ්ලාව උපයෝගී කොට ගෙන තාලයක කොටස් පිළිබඳ අධ්‍යයනයක යෙදෙන්න.

ඉගෙනුම්, ඉගැන්වීම් ක්‍රියාවලිය

- තාල සංකල්පය පිළිබඳ ව නිර්වචන ඉදිරිපත් කරන්න. එම නිර්වචන පිළිබඳ ව සිසුන්ට අදහස් දැක්වීමට අවස්ථාව දෙන්න.

(කාලච්ඡේද 01)

- ගති, මිති හා ලය සංකල්ප පිළිබඳ ව ප්‍රායෝගික අත්දැකීම් ලබා ගනිමින් සාකච්ඡාවක යෙදෙන්න.

(කාලච්ඡේද 02)

- තාලයක කොටස් දෘශ්‍ය උපකරණ මඟින් හා ප්‍රායෝගික භාවිතය ඔස්සේ හඳුනා ගැනීමේ අභ්‍යාසවල යොදවන්න.

(කාලච්ඡේද 01)

ඇගයීම :- තාලය, ගති, මිති හා ලය යන සංකල්ප පිළිබඳ අදහස් දක්වන්න. ප්‍රායෝගික භාවිතයෙන් තාලයක කොටස් හඳුනාගෙන සාකච්ඡාවක යෙදෙන්න.

අතිරේක උදවු :- ඩබ්. බී. මකුලොලුව - හෙළ ගී මඟ

ඩී. ආර්. පීරිස් - සම්භාව්‍ය තාල දීපනී

විෂය කරුණු සාරාංශය :-

- ''තාල'' යන පදය ''අල්ල'' ''තැළීම'' යන අරුත් දෙයි.
- කාලයේ සීමාව පෙන්වීමට මිනිසාගේ අත් තැළීම මූලික වූ බැවින් එය තාලය නමින් හැඳින්වූ බව සැලකිය හැකි ය.
- ගැයුම්, වැයුම් සහ නැටුම් යන කාරණත්‍රය සඳහා තාලය පදනම් වෙයි.
- කිසියම් තාලයක ඨේකාව හෝ තාල පදයෙහි රචනාවෙහි (අවනද්ධාක්ෂර රටාවෙහි) වෙනස් වීම තාලයෙහි ගතිය තීරණය කරයි.
- මිතිය යන්න මාත්‍රය යි. තාලයක ගනු ලබන මාත්‍රා සංඛ්‍යාව මිතිය යි. සංගීතයේ කාලය මනින මිම්ම මාත්‍රාව වේ.
- සංගීතයේ රිද්මයෙහි ගතිය හෙවත් ස්ථිර වූ ගමන් වේගය ලය වේ. ලය හින්දුස්ථානි සංගීතයෙහි විලම්බ, මධ්‍ය සහ ද්‍රැත යනුවෙන් තුන් ආකාර වේ.
- නිශ්චිත මාත්‍රා සංඛ්‍යාවක් ඒකකයක් ලෙස ගෙන විභාගයක් නිර්මාණය වේ. විභාග කිහිපයක එකතුවෙන් තාලයක නිර්මාණය ඇති වෙයි.
- තාල ස්ථාන (තාලි)

  තාලයක මාත්‍රා සංඛ්‍යාව කොටස් කර දක්වීමෙන් පසු ඛාලි ස්ථාන අඩංගු කොටස් හැර අනෙක් කොටස්වල මුල් මාත්‍රාවන් යෙදී ඇති ස්ථානයන්ට තාල ස්ථාන යයි කියති.

සමස්ථානය :- (මෙයට සම් හෙවත් සමග්‍රහ යැයි කියති.) තාලයේ ප්‍රථම මාත්‍රාව සමස්ථානය වේ. මෙය තාලයේ ප්‍රධාන ස්ථානය වේ. සෑම තාලයකම සමස්ථානයක් ඇත.

ඛාලීස්ථානය :- තාල ප්‍රදර්ශනයේ දී දෑත් වියෝග වන ස්ථාන ඛාලී ස්ථාන ලෙස හැඳින්වෙයි.

අනුතාල ස්ථාන :- තාලයක සමග්‍රහය හා ඛාලි ස්ථානය හැරුණු විට ඉතිරි ආඝාත ස්ථාන මේ නමින් හැඳින්වේ.

ආවර්ත :- තාලයේ සමග්‍රහය සිට අන්තිම මාත්‍රයේ අවසානය තෙක් ඇති කාල ප්‍රමාණය ආවර්ත එකක් ලෙස හැඳින්වේ.

ඨේකාව :- ඨේකාව යනු තාලයක යෙදෙන අවනද්ධාක්ෂර සමූහය වේ.

ක්‍රියාකාරකම 8

# උත්තර භාරතීය තාල හඳුනාගැනීම හා තාල ගුණ කිරීම

නිපුණතාව : සම්භාව්‍ය සංගීතයේ ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනා ගනිමින් ගායන වාදන ප්‍රයෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම :

ක්‍රියාකාරකම : උත්තර භාරතීය තාල හඳුනාගැනීම හා තාල ගුණ කිරීම.

කාලච්ඡේද සංඛ්‍යාව : 04

ඉගැනුම් පල :
- ත්‍රිතාල්, ඣප්තාල්, දීප්චන්දි හා දාදරා තාල හඳුනා ගනියි.
- ත්‍රිතාල්, ඣප්තාල්, දීප්චන්දි හා දාදරා තාලවල ඨේකා සමගුණයෙන් හා දෙගුණයෙන් නිරූපණය වන අන්දම අවබෝධ කරගනියි.

ගුණාත්මක යෙදුම් : තාල ප්‍රස්තාරගත කරන ලද පුවරු

විෂය කරුණු පැහැදිලි කරගැනීමට අත්වැලක්:

'තාල පදය' යන්න වෙනුවට 'ඨේකා' යන පාරිභාෂික පදය මින් ඉදිරියට භාවිත කරන්න. තාලවල ගති ලක්ෂණ පිළිබඳ ව සාකච්ඡා කිරීම මෙම පාඩමින් අපේක්ෂිත යි. ත්‍රිතාල්, ඣප්තාල්, දීප්චන්දි හා දාදරා තාලවල මාත්‍රා, විභාග, තාලසංඥා හා ඨේකා යෙදෙන අන්දම ගුරුවරුන් විසින් පැහැදිලි කළ යුතු ය. තාල අතින් ප්‍රදර්ශනය කරමින් අදාළ තාලයේ ඨේකාව උච්චාරණය කරන අන්දම සිසුන්ට පැහැදිලි කරන්න. තාල ප්‍රදර්ශනයේ දී ආඝාත හෙවත් තාලී යෙදෙන ස්ථාන දකුණු අත්ලෙන් වම් අත්ල මත ආඝාත කිරීමෙන් නිරූපණය කෙරෙන බවත්, ඛාලී යෙදෙන ස්ථාන දෑත් වියෝග කිරීමෙන් නිරූපණය කෙරෙන බවත්, අනෙකුත් මාත්‍රා දකුණු අතේ සුළැඟිල්ලෙන් ආරම්භ කර ඇඟිලි පිළිවෙළින් වම් අල්ල මත තැබීමෙන් නිරූපණය කෙරෙන බවත් සිසුන්ට පැහැදිලි කරන්න. තාලයක් ලියා දැක්වීමේ දී ඨේකාවට ඉහළින් මාත්‍රා සංඛ්‍යාව ලිවීමත්, ඨේකාවට පහළින් තාල් සංඥා ලිවීමත් සම්මතය බව සිසුන්ට පැහැදිලි කරන්න. තාල ප්‍රස්තාර ලිවීමේ දී ධිං, තිං, කත් වැනි අක්ෂර යටින් වක්‍රයක් නොයොදන බවත් එසේ වක්‍රය යෙදිය යුත්තේ තබ්ලා අක්ෂර(වර්ණ) දෙකකට වඩා යෙදෙන විට දී පමණක් බවත් පහදාදෙන්න.

දීප්චන්දි තාලය හා එහි ඨේකාව පහත දැක්වෙන අන්දමින් උගන්වන්න.

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 |
| ධා | ධිං | S | ධා | ධා | ධිං | S | තා | තිං | S | ධා | ධා | ධිං | S |
| X | | | 2 | | | | 0 | | | 3 | | | |

මෙහි 3, 7, 10 හා 14 මාත්‍රා මත අක්ෂර නොයෙදෙන බවත්, එම නිසා ඨේකාව උච්චාරණයේ දී නිහඬ ව සිටිය යුතු බවත් සිසුන්ට පැහැදිලි කරන්න.

මෙම මාතෘකාව සඳහා වෙන් කර ඇති කාලච්ඡේද 04 පාඩම සංවර්ධනය සඳහා මඟ පෙන්වා ඇති පරිදි සැලසුම් කරගන්න.

පාඨම සංවර්ධනය :

ත්‍රිතාල් හා ඣප්තාල් තාල දෙකෙහි මාත්‍රා, විභාග, තාලසංඥ ආදිය විස්තර කරමින් එම තාල දෙකෙහි තාල ආකෘති ගොඩනැගී ඇති අන්දම සිසුන්ට විස්තර කරන්න. එම තාලයන්ට අයත් ඨේකා සිසුන්ට ලබා දෙන්න. එම තාලවල ඨේකා උච්චාරණය කර පෙන්වන්න.

කාලච්ඡේද 01

ත්‍රිතාල් හා ඣප්තාල් අතින් තාල ප්‍රදර්ශනය කරමින් ඒවායේ ඨේකා සමගුණයෙන් හා දෙගුණයෙන් උච්චාරණය කරන ආකාරය සිසුන්ට පුහුණු කරන්න. සිසුන් එම ක්‍රියාකාරකම්වල යොදවන්න.

කාලච්ඡේද 01

දීප්චන්දි හා දාදරා තාල දෙකෙහි මාත්‍රා, විභාග, තාලසංඥ ආදිය විස්තර කරමින් එම තාල දෙකෙහි තාල ආකෘති ගොඩනැගී ඇති අන්දම විස්තර කරන්න. එම තාලයන්ට අයත් ඨේකා සිසුන්ට ලබාදෙන්න. එම තාලවල ඨේකා උච්චාරණය කර පෙන්වන්න.

කාලච්ඡේද 01

දීප්චන්දි හා දාදරා තාල අතින් තාල ප්‍රදර්ශනය කරමින් ඒවායේ ඨේකා සමගුණයෙන් හා දෙගුණයෙන් උච්චාරණය කරන ආකාරය සිසුන්ට පුහුණු කරන්න. සිසුන් එම ක්‍රියාකාරකම්වල යොදවන්න.

කාලච්ඡේද 01

ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

එක් එක් විෂය කොටස් අවසානයේ වාචික ප්‍රශ්න හා ප්‍රායෝගික යෙදවීම් මඟින් සිසුන් ඇගයීමට ලක්කරන්න.

අතිරේක උදවු

සම්භාව්‍ය තාල දීපනී - ඩී. ආර්. පීරිස් - පිටු අංක 152-157 තෙක්

**ක්‍රියාකාරකම 09**

# උත්තර භාරතීය තාලවල ඨේකා තබ්ලාවෙන් වාදනය කිරීම

නිපුණතාව 1.0 :- සම්භාව්‍ය සංගීතයේ ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනා ගනිමින් ගායන වාදන ප්‍රයෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම 1.4 :- තාලයේ ගති ලක්ෂණ පැහැදිලි කරමින් දේශීය හා භාරතීය විවිධ තාල අතර ස්වභාවය හඳුනා ගනිමින් තාල නිරූපණය කරයි.

ක්‍රියාකාරකම :- උත්තර භාරතීය තාලවල ඨේකා තබ්ලාවෙන් වාදනය කිරීම.

කාලච්ඡේද සංඛ්‍යාව :- 04

ඉගැනුම් පල :-
- ත්‍රිතාල්, ඣප්තාල්, දීප්චන්දි හා දාදරා ඨේකාවල අක්ෂර නම් කරයි.
- ත්‍රිතාල්, ඣප්තාල්, දීප්චන්දි හා දාදරා තාලවල ඨේකා තබ්ලාවෙන් වාදනය කරයි.

ගුණාත්මක යෙදුම් : අදාළ තාලවල ඨේකා තබ්ලාවෙන් වාදනය කරන අයුරු දැක්වෙන ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ හා තබ්ලාවක්.

විෂය කරුණු පැහැදිලි කරගැනීමට අත්වැලක් :

තාලවල ඨේකා තබ්ලාවෙන් වාදනය කිරීම පිළිබඳ ප්‍රායෝගික අවබෝධය සිසුන්ට ලබාදීම මෙම පාඩමින් අපේක්ෂිත යි. අදාළ අවනද්ධාක්ෂරවල නිවැරදි ධ්වනි තබ්ලාවෙන් උත්පාදනය කරන ආකාරය පිළිබඳ අවබෝධය සිසුන්ට ලබාදෙන්න. මේ සඳහා අදාළ තාලවල ඨේකා ඇතුළත් ශ්‍රව්‍ය දෘශ්‍ය ඛණ්ඩ භාවිත කළ හැකි ය. මෙම මාතෘකාව සඳහා වෙන් කර ඇති කාලච්ඡේද 4 එක් තාලයක් සඳහා එක් කාලච්ඡේදයක් බැගින් වන ලෙස වෙන් කරගනිමින් පාඩම සැලසුම් කරගන්න. පාඩම සංවර්ධනය සඳහා මඟ පෙන්වා ඇති පරිදි කාලච්ඡේද සැලසුම් කරගත හැකි ය.

පාඩම සංවර්ධනය :

ඒ ඒ තාලවල ඨේකාවන්ට අයත් අවනද්ධාක්ෂරවල නිවැරදි ධ්වනි හඳුනාගැනීම සඳහා ඔබ සූදානම් කරගත් ශ්‍රව්‍ය දෘශ්‍ය ඛණ්ඩය සිසුන්ට ඇසීමට සලස්වන්න. එම ධ්වනි තබ්ලාවෙන් උපදවාගන්නා ආකාරය එකිනෙක පැහැදිලි කරමින් එක් එක් ඨේකාව තබ්ලාවෙන් වයා පෙන්වන්න. සිසුන් ලවා ඨේකා තබ්ලාවෙන් වාදනය කරවමින් ඔවුන් ප්‍රායෝගික අභ්‍යාසයෙහි යොදවන්න.

කාලච්ඡේද 04

ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

එක් එක් විෂය කොටස අවසානයේ ප්‍රායෝගික යෙදවීම් මඟින් අගයන්න.

ක්‍රියාකාරකම 10

# සංගීතය හඳුන්වන විවිධ නිර්වචන

**නිපුණතාව 2.0** : විශ්ව සංගීතයේ ස්වභාවය වටහා ගනිමින් විවිධතා ගවේෂණය කරයි.

**නිපුණතා මට්ටම 2.1** : සංගීතයේ පොදු ලක්‍ෂණ හා වෙනස්කම් විචාරාත්මක ව දැක්වීමට තොරතුරු රැස්කරයි.

**ක්‍රියාකාරකම** : සංගීතයේ විවිධ නිර්වචන

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල** :
- සංගීතය යන්න හඳුන්වයි.
- පෙරදිග හා අපරදිග නිර්වචන පැහැදිලි කරයි.
- සංගීතය විශ්ව භාෂාවක් ලෙස පිළිගනියි.
- විවිධ රටවල ඇති සංගීතයේ පොදු ලක්‍ෂණ පිළිබඳ තර්ක කරයි.
- විවිධ නිර්වචන එකතුවක් සකස් කරයි.

**ගුණාත්මක යෙදවුම්:**
- ඇමුණුමේ සඳහන් තොරතුරු හා බැඳි දෘශ්‍ය උපකරණ හෝ ඡායා පිටපත්.
- 2009 පෙරදිග සංගීතය 12 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ පිටු අංක සිට තෙක් ඇති කොටස්.

**විෂයකරුණු පැහැදිලි කරගැනීමට අත්වැලක් :**

- සංගීතය විශ්වයට පොදු කලාවක් බවත්, එය විශ්ව භාෂාවක් බවත් පිළිගැනීමට හැකි වන ලෙස මෙම පාඩම සැලසුම් කළ යුතු වේ. මාතෘකාව හා බැඳි වීඩියෝ කොටස් සකසා ගෙන පහසුකම් සපයා ගෙන ඒවා සිසුන්ට නැරඹීමට සැලස්වීමෙන් ඵලදායී බව වැඩි කර ගත හැකි ය. ඔබ පාසලේ අන්තර්ජාල පහසුකම් ඇත්නම් විශ්ව සංගීතය පිළිබඳ තොරතුරු ගවේෂණයට සිසුන් යොමු කරන්න. 2009 ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ මෙම මාතෘකා සම්බන්ධ තොරතුරු මෙම ශ්‍රේණිවල දී නැවත භාවිත කළ හැකි ය. ඇමුණුමේ දැක්වෙන විෂය කරුණු ඔබට මෙම පාඩම සැලසුම් කර ගැනීමට උපකාරී වනු ඇත.

**පාඩම සංවර්ධනය**

- ඇමුණුමේ දැක්වෙන පෙරදිග නිර්වචන සපයා දී ඒවා එකිනෙක සාකච්ඡා කරන්න.

(කාලඡේද 01 යි)

- ඇමුණුමේ දැක්වෙන අපරදිග නිර්වචන සපයා දී ඒවා එකිනෙක සාකච්ඡා කරන්න. පෙරදිග හා අපරදිග නිර්වචනවලින් කියවෙන අදහස් පිළිබඳ සැසඳීමක් කරන්න.

(කාලඡේද 01 යි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- විවිධ නිර්වචන ඇතුළත් සටහනක් ගොඩ නංවා අගය කරන්න.

පැවරුම -

- ENCARTA - Encyclopeadia සහ Encyclopeadia Britanica විශ්ව කෝෂ/ශබ්ද කෝෂ ඇසුරින් Music ( සංගීතය ) යන වචනයේ අර්ථය විමසන්න.

අතිරේක උදවු -

- http://www.newworldencyclopedia.org/entry/Music

ඇමුණුම.
විවිධ නිර්වචන.

සාරංගදේව පඬිවරයා විසින් රචිත ''සංගීත රත්නාකරය'' නම් ග්‍රන්ථයේ මෙසේ දැක්වේ.

'' ගීතං වාද්‍යං තථා නෘත්‍යං
ත්‍රයං සංගීත මුච්‍යතේ ''

මෙහි අදහස වන්නේ '' ගායනය. වාදනය සහ නැටීම යන කරුණු තුනේ ක්‍රමානුකූල එක්වීම'' සංගීතය යන්න යි.

සංගීත පාරිජාත නම් ග්‍රන්ථයේ මෙසේ දැක්වේ.

ගීතං වාදිත්‍රනෘත්‍යානං - ත්‍රයං සංගීත මුච්‍යතේ
ගානස්‍යාත්‍ර ප්‍රධානත්වාත් - තත් සංගීත මුදරිතම්

මෙහි සරල අර්ථය සංගීතයේ ප්‍රධානත්වය ගායනය බව යි.
බෘහත්දේශි නම් ග්‍රන්ථයේ මෙසේ දැක්වේ.

න නාදේන විනා ගීතං - න නාදේන විනා ස්වරං
න නාදේන විනා නෘත්‍යං - තස්මාත් නාදාත්මකං ජගත්

මෙහි සරල අර්ථය නාදයෙන් තොර ගීතයත්, නාදයෙන් තොර ස්වරයත්, නාදයෙන් තොර නැටුමකුත් නොමැති වන අතර ඒ සියල්ල නාදය ආත්ම කොට ගෙන ඇති බව ය.

''සංගීත්'' යන වචනය සැකසී ඇති අන්දම විග්‍රහ කරමින් තවත් නිර්වචනයක් මෙසේ දැක්වේ. සං යන උපසර්ගයට ගීත් යන ශබ්දය එකතුවී (සං + ගීත්) සංගීත් යන පදය සැකසී ඇති ''සං'' යන උපසර්ගයෙන් එක් ව, මනා, යහපත්, සමූහ වැනි අර්ථ කියැවේ. ගීත් යනු ගායනය යි. ඒ අනුව මනා ගායනයට, සමූහ ගායනයට, සංගීතය යැයි කිව හැකි ය.

ඔක්ස්ෆර්ඩ් ශබ්ද කෝෂයේ Music යන වචනයේ නිර්වචනය සංගීතඥ ප්‍රේමවංශ හපුවලාන සූරීන් ලියා පළ කළ '' සංගීත '' නම් කෘතියේ මෙසේ අනුවාදයක් ලෙස දක්වා ඇත.

''හැඟීම් ප්‍රකාශනය කිරීම සඳහා ද, රමණීය නාද රූප බිහි කිරීම සඳහා ද, නාදයන් සංයෝජනය කිරීමේ කලාව සංගීතය යි''

**ක්‍රියාකාරකම 11**

# සංගීතයේ වෙනස්කම්.

**නිපුණතාව 2.0** : විශ්ව සංගීතයේ ස්වභාවය වටහා ගනිමින් විවිධතා ගවේෂණය කරයි.

**නිපුණතා මට්ටම 2.1** : සංගීතයේ පොදු ලක්ෂණ හා වෙනස්කම් විචාරාත්මක ව දැක්වීමට තොරතුරු රැස් කරයි.

**ක්‍රියාකාරකම** : සංගීතයේ වෙනස්කම් හා ඊට බලපාන හේතු

**කාලච්ඡේද සංඛ්‍යාව** : 01

**ඉගෙනුම් පල** :
- සංගීතයේ වෙනස්කම් පැහැදිලි කරයි.
- වෙනස්කම් ඇති වීමට බලපාන හේතු දක්වයි.
- සංගීතය විශ්ව භාෂාවක් වුව ද විවිධ වෙනස්කම් ද ඇති බව පිළිගනියි.
- විවිධ වෙනස්කම් දක්වමින් කථා කරයි.

**ගුණාත්මක යෙදවුම්:**
- ඇමුණුමේ සඳහන් තොරතුරු හා බැඳි දෘශ්‍ය උපකරණ හෝ ඡායා පිටපත්.
- ඇමුණුමේ දක්වන පරිදි 2009 පෙරදිග සංගීතය 12 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ විෂය කරුණු.

**විෂයකරුණු පැහැදිලි කරගැනීමට අත්වැලක් :**

- සංගීතය විශ්වයට පොදු කලාවක් වුවත් විවිධ වෙනස්කම්වලින් ද යුක්ත වන බව පිළිගත යුතු ය. ඊට හේතුව වන්නේ ඒ ඒ රටේ පවතින සංස්කෘතික වෙනස යි. ඊට අමතර ව භාෂාව, දේශගුණික සාධක, භූගෝලීය සාධක ආදිය ද හේතු වන බව පෙනේ.

**පාඩම සංවර්ධනය**

- ඇමුණුමේ දක්වෙන විෂය කොටස් සපයා දී ඒවා එකිනෙක සාකච්ඡා කරන්න. විවිධ වෙනස්කම් ඇති වීමට හේතු පැහැදිලි කරන්න.

කාලච්ඡේද 01 යි.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- සංගීතය විශ්ව භාෂාවක් වුව ද විවිධ රටවල විවිධ වෙනස්කම්වලින් යුක්ත ය. මෙම කියමන සනාථ කරමින් කතාවක් ඉදිරිපත් කරන්න.

අතිරේක උදවු -

සංගීත සංහිතා - විමල් අභයසුන්දර. (පළමු, දෙවන පරිච්ඡේද)

ඇමුණුම:-

සංගීතය විශ්ව භාෂාවක් වුව ද, විවිධ රටවල සංගීතය විවිධ වෙනස්කම්වලින් යුක්ත ය. ඊට බලපාන හේතු කිහිපයකි. ඒ ඒ රටවල භාෂාව අනුව සංගීතයේ වෙනස් කම් ඇති වේ. හින්දි භාෂව World Musical language වශයෙන් හැඳින්වෙන අවස්ථා ඇත. උත්තර භාරතීය සංගීතයේ ගීත ගායනය වඩාත් රසවත් වන්නේ එහි භාෂාව නිසා බව විද්වත්හු පිළිගනිති. භාෂාවේ ගීතවත් බව, ධ්වණි පූර්ණ වචන භාවිතය නිසා මිහිරිතාව වැඩි වී ඇත. චීන සංගීතයේ වෙනසක් ඇති වීමට චීන භාෂාව ද හේතු වී ඇති බව පෙනේ. ඉංග්‍රීසි බසින් කතා කරන බොහෝ රටවල සංගීතය බටහිර සංගීත ය යි. රට රටවල සංගීතයේ විවිධතා ඇති වීමට භාෂාව බලපාන බව පෙනේ.

සංගීතය යනු රටක සංස්කෘතියේ එක් අංගයකි. ඒ ඒ රටේ සංස්කෘතිය ගොඩ නැඟීමට භාෂාව මෙන් ම ඒ රටේ දේශගුණය හා භූගෝලීය පිහිටීම ද හේතු වන බව පිළිගැනේ. භාෂාවේ උච්චාරණ විලාශය ඇති වීමට දේශගුණය හේතුවක් වේ. අධික සීතල දේශගුණයක් ඇති රටවල වචන උච්චාරණයේ දී විශාල ලෙස මුව විවෘත වන බවක් නොපෙනේ. සංගීතයේ හා ගීත ගායනයේ දී ද වෙනසක් ඇති වීමට අධික සීතල දේශගුණය බලපාන බව පෙනේ. ඉන්දියාවේ ඔටුවන් පිටේ යන ගැල් කරුවන්ගේ ජන ගායනා උච්චස්වරයෙන් යුක්ත ය. එම ගැල්කරුවන් ගමන් කරන ප්‍රදේශ භූගෝලීය වශයෙන් විවෘත ය. කාන්තාර ස්වභාවයෙන් යුක්ත ය. එහිදී ගයනු ලබන ගීත අන් අයට ඇසීමට නම් ඉහළ හඬකින් ගායනය කළ යුතු වේ. මේ අනුව ඒ ඒ රටවල සංගීතයේ වෙනස්කම් ඇති වීමට භාෂාව, දේශගුණය සහ භූගෝලීය පිහිටීම ආදි හේතු සාධක වන බව පෙනේ.

ක්‍රියාකාරකම 12

# ලෝක සංගීතයේ එකිනෙකට වෙනස් පද්ධති.

**නිපුණතාව 2.0** : විශ්ව සංගීතයේ ස්වභාවය වටහා ගනිමින් විවිධතා ගවේෂණය කරයි.

**නිපුණතා මට්ටම 2.1** : සංගීතයේ පොදු ලක්‍ෂණ හා වෙනස්කම් විචාරාත්මක ව දැක්වීමට තොරතුරු රැස්කරයි.

**ක්‍රියාකාරකම** : සංගීත පද්ධති හා පෙරදිග අපරදිග සංගීත ක්‍රමවල ස්වභාවය

**කාලච්ඡේද සංඛ්‍යාව** : 03

**ඉගෙනුම් පල** :
- විශ්ව සංගීතයේ පිළිගත් සංගීත පද්ධති නොහොත් ක්‍රම නම් කරයි.
- විශ්ව සංගීත පද්ධති නොහොත් ක්‍රම අතර ඇති විශේෂතා පැහැදිලි කරයි.
- Melody & Harmony සිද්ධාන්ත විස්තර කරයි.
- සංගීතය විශ්ව භාෂාවක් වුව ද විවිධ වෙනස්කම් ද ඇති බව පිළිගනියි.
- තම සංගීත නිර්මාණ සඳහා විවිධ සංගීත ක්‍රමවල ආභාසය ලබා ගැනීමට පෙලඹේ.
- එම සංගීත ක්‍රම මෙරට සංගීතය කෙරෙහි ඇති කර ඇති බලපෑම සාකච්ඡා කරයි.

**ගුණාත්මක යෙදවුම්:**
- ඇමුණුමේ සඳහන් තොරතුරු හා බැඳී සකසා ගත් දෘශ්‍ය උපකරණ හෝ ඡායා පිටපත්.
- ඇමුණුමේ දක්වන පරිදි 2009 පෙරදිග සංගීතය 12 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ විෂය කරුණුවල සාරාංශ.

**විෂය කරුණු පැහැදිලි කරගැනීමට අත්වැලක් :**

- පිළිගත් සංගීත පද්ධති පහක් වේ. ඒවායේ විවිධ වෙනස්කම් ඇත. පෙරදිග සංගීත පද්ධතිය, අපරදිග සංගීත පද්ධතිය, චීන සංගීත පද්ධතිය, මැදපෙරදිග ඉස්ලාමික් සංගීත පද්ධතිය, සහ අග්නිදිග ආසියානු ගැමිලෑන් සංගීත පද්ධතිය වශයෙන් ඒවා හඳුන්වයි. මේවා පිළිබඳ ඉතා සුළු වශයෙන් පමණක් සාකච්ඡා කිරීම අපේක්ෂිත ය. මීට අමතර ව මෑත කාලයේ මෙරට නිර්මාණ සංගීතය කෙරෙහි බලපෑමක් ඇති කළ අප්‍රිකානු සංගීතය පිළිබඳ ව ද ඉතා සුළු වශයෙන් අධ්‍යයනය කිරීමට ඉඩ සැලසිය යුතු ය. විශේෂයෙන් එම සංගීතය රිද්ම රටා මඟින් පෝෂණය වී ඇති අයුරු, රිද්ම රටා වාදනය සඳහා විවිධ සංගීත උපකරණ නිර්මාණය වී ඇති අයුරු, ඒවා මෙරට නිර්මාණ සංගීතය කෙරෙහි බලපා ඇති අයුරු ආදිය සාකච්ඡා කළ හැකි ය.
  මීට අමතර ව පෙරදිග සහ අපරදිග සංගීත පද්ධති දෙකෙහි ස්වභාවය ස්වර සාධනයේ සමානකම්, Melody & Harmony සිද්ධාන්ත ආදිය පිළිබඳ වත් අධ්‍යයනයට ඉඩ සැලසීම අපේක්ෂිත ය.

**පාඩම සංවර්ධනය**

- ඇමුණුමේ දැක්වෙන විෂය කොටස් සපයා දී සංගීත පද්ධති පහ පිළිබඳ ව සාකච්ඡා කරන්න. එකිනෙක පද්ධති අතර විවිධ වෙනස්කම් ඇති වීමට හේතු පැහැදිලි කරන්න.

  කාලච්ඡේද 01 යි.

- අප්‍රිකානු සංගීතය පිළිබඳ ව ඇමුණුමේ දැක්වෙන විෂය කොටස් සපයා දී අප්‍රිකානු සංගීතයේ සුවිශේෂතා, ප්‍රචලිත ප්‍රදේශ, රිද්ම රටා සහ ඒ සඳහා භාවිත වන

නම්, විවිධ වාද්‍ය භාණ්ඩ, පිළිබඳ ව සාකච්ඡා කරන්න. මෙරට නිර්මාණ සංගීත කෙරෙහි ඇති කර ඇති බලපෑම පැහැදිලි කරන්න.

කාලඡේද 01 යි.

- අපරදිග සංගීතය සහ භාරතීය සංගීත පද්ධතිය පිළිබඳ ව ඇමුණුමේ දැක්වෙන විෂය කොටස් සපයා දී එම පද්ධති පිළිබඳ ව සාකච්ඡා කරන්න. පද්ධති දෙක අතර භාවිත වන ස්වර සාධනයේ සමානකම් පිළිබඳවත් ඒ අනුව මෙරට ජනතාවට එම පද්ධති දෙක ම ඇසුරු කිරීමට ඇති හැකියාවත්, මෙරට නිර්මාණ සංගීතයේ කෙරෙහි ඇති කර තිබෙන බලපෑමත් පැහැදිලි කරන්න. Melody & Harmony යන සිද්ධාන්ත පැහැදිලි කරන්න.

කාලච්ඡේද 01 යි.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- එක් එක් කාලච්ඡේදය අවසානයේ අධ්‍යයනය කළ විෂය කොටස් ඇසුරින් ප්‍රශ්න නගා අගය කරන්න.

පැවරුම:-

- පිළිගත් සංගීත පද්ධති පහ පිළිබඳ කෙටි සටහනක් පිළියෙළ කරන්න.
- අප්‍රිකානු සංගීතයේ භාවිත වන රිද්ම රටාවක් තෝරාගෙන එම රිද්ම රටාවට ගැළපෙන, සපයා ගත හැකි සංගීත උපකරණ භාවිත කරමින් කණ්ඩායම් වශයෙන් හෝ කේවල ව හෝ ඉදිරිපත් කිරීමට සූදානම් වන්න. එම සංගීතයේ භාවිත වන අවනද්ධ වාද්‍ය භාණ්ඩවල රූප සටහන් රැස් කරන්න.
- පෙරදිග අපරදිග සංගීත ක්‍රමවල සම විෂමකම් දක්වමින් Melody & Harmony යන සිද්ධාන්ත ප්‍රායෝගික ව පැහැදිලි කරන්න.

අතිරේක උදවු -

ජන සංගීත සිද්ධාන්ත - සී.ද ඇස් කුලතිලක

https://www.sfcv.org/learn/glossary

ඇමුණුම:-

පහත දැක්වෙන උපදෙස් පරිදි 2009 පෙරදිග සංගීතය 12 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ පහත සඳහන් පිටුවල අන්තර්ගත විෂය කරුණුවල සාරාංශයක් ගොඩ නගා ගන්න. එම මාර්ගෝපදේශ සංග්‍රහයේ දැක්වෙන තොරතුරුවලින් අත්‍යවශ්‍ය විෂය කරුණු පමණක් තෝරා **අභ්‍යාස පොතක අතින් ලියූ පිටුවක්** තරමට සාරාංශ කරගන්න.

- භාරතීය සංගීත පද්ධතිය - පිටු අංකඃ 83
- අපරදිග සංගීත පද්ධතිය - පිටු අංකඃ 87
- චීන සංගීත පද්ධතිය - පිටු අංකඃ 89
- අග්නිදිග ආසියානු ගැමිලෑන් සංගීත පද්ධතිය - පිටු අංකඃ 92
- මැදපෙරදිග ඉස්ලාමික් සංගීත පද්ධතිය - පිටු අංකඃ 95

ඉහත පද්ධති පහට අමතර ව අප්‍රිකානු සංගීතය පිළිබඳ ව ද සිසුන්ට අධ්‍යයනයට ඉඩ සළසන්න.

සංගීතය අප්‍රිකාවේ එදිනෙදා ජන ජීවිතය හා බැඳුණු වැදගත් අංගයක් වන අතර එය වැඩපොළේ දී, ආගමික කටයුතුවල දී සහ උත්සව අවස්ථාවල බැඳී පවතී. විශේෂයෙන් ගායනය, නැටුම, අත් තැළීම, සහ බෙර වර්ග වාදනය, අප්‍රිකානු වැසියන්ගේ සාමාන්‍ය දෛනික ජීවිතය හා බැඳී පවතී. ලතින් ඇමරිකානු සංගීතය හා බැඳී පවතින Reggae, Salsa, Samba, Ramba, Zauk ආදී තාල රටා නැතහොත් රිද්ම රටා අප්‍රිකානු සංගීතය තුළ පැවති ඒවා වේ. අද අප රටේ ප්‍රසංග වේදිකාවල ද නිර්මාණ සංගීතයේ දී ද මෙම තාල රටා භාවිත වේ. එසේ ම නූතන විද්‍යුත් ස්වර පුවරුවල ද මෙම තාල රටා ඒ නමින්ම

අන්තර් ගත කොට ඇත. පහත දැක්වෙනුයේ අප්‍රිකානු රටවල බහුල ව භාවිත වන සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ කිහිපයකි. ඒවා ප්‍රචලිත භාණ්ඩ වන අතර වැඩි කොටසක් තැළීමෙන් හඬ උපදවන (Percussion) භාණ්ඩ වේ. ඒ අතර තත් වාද්‍ය භාණ්ඩයක් ද ඇත. එහෙත් එය ප්‍රාථමික ගණයේ සම්ප්‍රදායික භාණ්ඩයක් වේ.













## පෙරදිග හා අපරදිග සංගීත පද්ධති.

ලෝකයේ පෙරදිග සංගීතය (Oriental Music) වශයෙන් සලකන්නේ භාරතීය රාගධාරී සංගීතය යි. අපරදිග සංගීතය නැතහොත් බටහිර සංගීතය (Western Music ) ලෝකය පුරා රටවල් ගණනාවක භාවිතයේ පවතී. ඒ අනුව මෙම විෂය කොටස්වල දී සන්සන්දනාත්මක ව අදහස් දැක්වීමට සිදු වන්නේ භාරතීය රාගධාරී සංගීතය හා අපරදිග සංගීතය අතර ය.

පෙරදිග සංගීතය සුවිශේෂ වන්නේ ඒකල ගායන වාදනවලට ය. ඊට හේතුව ප්‍රාසාංගික ව ඉදිරිපත් කරනුයේ එක් පුද්ගලයකුගේ දක්ෂතා ය. එහෙත් බටහිර සංගීතය හැම විට ම එක් අයකුට වැඩි ගණනක් විසින් ඉදිරිපත් කරනු ලැබේ. ඒ නිසා බටහිර සංගීතයේ ඒකල, ද්විත්ව, ත්‍රිත්ව, චතුර්ථ ආදි වශයෙන් ගායන වාදන අන්තර්ගත වේ. පහත දැක්වෙන අයුරින් ඒවා භාවිත වේ.

| | |
|---|---|
| ඒකල වාදන | Solo ( Piano ) |
| යුගල වාදන | Duart ( Piano and Violin ) |
| තන්ත්‍රීය ත්‍රිත්ව වාදන | String Quintet ( Violin, Viola and Cello ) |
| පියානෝව සමඟ ත්‍රිත්ව වාදන | Piano trio ( piano, violin and cello ) |
| චතුර් වාදන | Quartet= Two violins, Viola and Cello |

පෙරදිග සංගීතය ( Melody ) යන සිද්ධාන්තය මත ද, අපරදිග සංගීතය ( Harmony ) යන සිද්ධාන්තය මත ද, ගොඩ නැගී ඇත. Melody යනු තනුවේ එක් වරකට යෙදෙන්නේ එක් ස්වරයක් පමණක් යන්නය. A melody is a linear succession of musical tones that the listener perceives as a single

entity. රාගධාරී ගීත ප්‍රස්තාරයක එක් ගී පාදයක තනුවට අමතර ව එම පාදය මත ම වැටෙන වෙනත් ස්වර යෙදෙන්නේ නැත. එහෙත් බටහිර සංගීතයට අයත් නිර්මාණ කොටසක එක් ස්වර පාදයක් මත තවත් ස්වර පාද කිහිපයක් එක මත ගොඩ නැඟේ. එම නිසා එක් වරක දී ස්වර කිහිපයක් එක වර ගැයේ වැයේ. මෙම සිද්ධාන්තය Harmony නම් වේ. සමහර විට මෙම ස්වර පාද හඬතල හතරට ම අයත් විය හැකි ය. එසේ නැතහොත් එක ම හඬතලයේ විය හැකි ය. පහත රූප සටහන එක ම වරක දී හඬතල හතරේ ම ස්වර එක වර Harmony වෙමින් වාදනය වන බව දැක්වෙන නිදසුනකි.




බටහිර සංගීතයේ ඇති හාර්මනී ලක්ෂණය ශ්‍රී ලංකාවේ සරල සංගීතයටත්, චිත්‍රපට සංගීතයටත් එක් වී ඇත. සරල ගීතයක Counters මඟින් සිදුවන්නේ මෙම Harmony ලක්ෂණය යි.

Harmony describes the simultaneous sounding of two or more notes and the technique governing the construction of such chords and their arrangement in a succession of chords. Following the convention of writing music from left to right on a horizontal set of lines (staff or stave), harmony may be regarded as vertical, as opposed to counterpoint, which is horizontal. In other words harmony deals with chords, simultaneous sounds, and counterpoint with melody set against melody.

ක්‍රියාකාරකම 13

# ස්වර පුවරු භාණ්ඩ වාදනය

නිපුණතාව 3.0 : වාද්‍ය භාණ්ඩයන්හි ස්වරූපය වටහා ගනිමින් වාදන හැකියා ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම 3.1 : රාගධාරී සංගීතයට අදාළ උසස් ගායනයක් වාදනයක් ඉදිරිපත් කිරීම සඳහා වර්ධනය කර ගත යුතු මූලික ගුණාංග ප්‍රායෝගික ව අධ්‍යයනය කරයි.

ක්‍රියාකාරකම 3.1.1 : ස්වර පුවරු භාණ්ඩ වාදනය

කාලච්ඡේද සංඛ්‍යාව : 04

ඉගෙනුම් පල :

- ස්වර පුවරු භාණ්ඩ Chord සමඟ වාදනය කළ යුතු බව දැන ගනියි.
- ස්වර පුවරු භාණ්ඩ Chord සමඟ වාදනය කරයි.
- ස්වර පුවරු භාණ්ඩ Chord සමඟ වාදනය කිරීමෙන් වාදනය රසවත් වන බව පිළිගනියි.

ගුණාත්මක යෙදවුම් : ස්වර පුවරු භාණ්ඩයක්, (ඕගනය)

විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :

උසස් පෙළ සිසුනට ගැළපෙන අයුරින් මෙම පාඩම සකසා ගත යුතු වනු ඇත. සිසුන් Chord සමඟ ගීත වාදන පුගුණ කළ යුතු බැවින් මෙම පාඩම සඳහා අවශ්‍ය වනුයේ ඕර්ගන් ය. 11 වසරේ දී මූලික chord භාවිතයෙන් ගීත වාදනය කර ඇති බැවින් 12 වසරේ දී එහි පියවර කිහිපයක් ඉදිරියට තබමින් C Major scaleහි භාවිත Realty chord භාවිතයට මඟ පෙන්වා ඇත. ඒ සඳහා ඇමුණුම 1 භාවිත කරන්න. එහි ඇති ක්‍රියාකාරකම සිසුන් අතට පත් කිරීමට පෙර ඒ පිළිබඳ මනා අවබෝධයක් හා පුහුණුවක් ඔබ විසින් ලබා තිබීම අත්‍යවශ්‍ය ය.

ඇමුණුම 1හි ඇතුළත් අභ්‍යාසයන්ට අමතරව එහි පියවර 5 දෙවන කොටස සඳහා ඔබ සිසුනට ගැළපෙන ගීත ප්‍රස්තාර තෝරා දෙන්න.

පාඩම සංවර්ධනය

- ඔබ විසින් නිර්මාණශීලී ව සකසා ගත් උපක්‍රමයක් මඟින් ප්‍රවේශ වන්න.
- ගීතය සමඟ chord වාදනය කිරීමෙන් ඇති වන මිහිර පිළිබඳ ව සාකච්ඡා කරන්න.

(මිනිත්තු 10)

- ඇමුණුම 1 සිසුන් අතට පත් කොට එහි පියවර 1 හා 2හි ඇතුළත් ක්‍රියාකාරකම්වල යොදවන්න.

(කාලච්ඡේද 02)

- ඇමුණුම අංක 1හි පියවර 3 හා 4හි ඇතුළත් ක්‍රියාකාරකම්වල යොදවන්න.

- ඔබ විසින් ක්ෂණික ව නිර්මාණය කරන ලද විවිධ ස්වර ඛණ්ඩ හතරකට Chord යොදා වාදනය කිරීමට සලස්වා සිසුවා ග්‍රහණය කොට ඇති ප්‍රමාණය මැන අවශ්‍ය උපදෙස් ලබා දෙන්න. (කාලච්ඡේද 02)

ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස් :-

සමස්තය ඇගයීමකට ලක් කළ හැකි පරිදි ඇගයීම සකසා ගත යුතුය.

අතිරේක උදව්

පොත් පත් හා වීඩියෝ දර්ශන

ඇමුණුම 1

**පහත උපදෙස් සැලකිලිමත් ව කියවමින් පියවරෙන් පියවර දී ඇති ක්‍රියාකාරකම් අවධානයෙන් යුතු ව කරන්න.**

පියවර 01.

ඔබ විසින් 11 වසරේදී ස්වර පුවරුවෙන් C majorට අයත් Family Chord වාදනය කළ අයුරු පහත වගුව ඇසුරින් නැවත සිහිපත් කර එම Chord භාවිතයෙන් කුඩා ගීතයක් වාදනය කරන්න.

| Chord | අදාළ ස්වර | | වමතින් වැයීමේ දී ස්වර පිහිටන පිළිවෙළ හා අදාළ ඇඟිල්ල |
|---|---|---|---|
| C Major | ස ග ප | C E G | පු ස ග<br>5 2 1 |
| F Major | ම ධ ස් | F A C | ධ ස ම<br>4 2 1 |
| G Major | ප නි රි | G B D | පු නි රි<br>5 3 1 |

පියවර 02.

එම Family Chord ස්වර අෂ්ටකය සමඟ පහත දක්වා ඇති අයුරින් වාදනයට පුහුණු වන්න. පුහුණු වන අතර ම ස්වර අෂ්ටකය හා එම Chord අතර ඇති සම්බන්ධය වටහා ගැනීම අත්‍යවශ්‍ය ය.

වමතින් C G C F C F G C
ආරෝහණය :- ස රි ග ම ප ධ නි ස්

දකුණතින් C G F C F C G C
අවරෝහණය :- ස් නි ධ ප ම ග රි ස

පහත වගුව ඇසුරින් භාවිත කළ හැකි අනෙකුත් අධ්‍යයනයන් කරන්න.

| ස්වරය | chords | Notes of chords |
|---|---|---|
| ස | C major | ස ග ප<br>C E G |
| රි | G Major/ D Minor | ප නි රි/රි ම ධ<br>G B D/D F A |
| ග | C major/ E Minor | ස ග ප / ග ප නි<br>C E G / E G B |
| ම | F major | ම ධ ස්<br>F A C |
| ප | C major/ G Major | ස ග ප / ප නි රි<br>C E G / G B D |
| ධ | F major /A Minor | ම ධ ස් / ධ ස ග<br>F A C / A C E |
| නි | G Major/ E Minor | ප නි රි / ග ප නි<br>G B D / E G B |

පියවර 04

ස්වර අෂ්ටකය පහත chords සමඟ වාදනය කරන්න.

C = මේ අයුරින් යෙදූ විට එයින් අදහස් කෙරෙනුයේ Major chord යි.

Major chord සංකේතය - C

$C^m$ = මෙයින් අදහස් වනුයේ Minor කෝඩ්

Minor chord සංකේතය - $C^m$

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | C | $D^m$ | $E^m$ | F | C | $A^m$ | $E^m$ | C |
| ආරෝහණය :- | ස | රි | ග | ම | ප | ධ | නි | ස් |
| | C | $E^m$ | $A^m$ | C | F | $E^m$ | $D^m$ | C |
| ආරෝහණය :- | ස් | නි | ධ | ප | ම | ග | රි | ස |

එම Chord මාරු කිරීමේ දී ඇඟිලි හැසිරවීම පහත ආකාරයට සිදු කළ හැකි ය. මෙම අභ්‍යාස හුදෙක් ඇඟිලි හැසිරවීම සඳහා විශේෂයෙන් යොදා ගන්න.

| Chord | ස්වර | ඇඟිලි භාවිතය වම |
|---|---|---|
| C Major | C E G / ස ග ප | G C E<br>5 2 1 |
| D Minor | D F A / රි ම ධ | A D F<br>4 2 1 |
| E Minor | E G B / ග ප නි | G B E<br>5 3 1 |
| F Major | F A C / ම ධ ස් | F A C<br>5 2 1 |
| A Minor | A C E / ධ ස ග | A C E<br>4 2 1 |
| G Major | G B D / ප නි රි | D G N<br>5 2 1 |

# ස්වර වාද්‍ය භාණ්ඩයකින් අද්‍යතන සරල ගීතයක් වාදනය හෝ රාගධාරී සංගීතාංගයක් වාදනය

නිපුණතාව 3.0 :- වාද්‍ය භාණ්ඩයන්හි ස්වරූපය වටහා ගනිමින් වාදන හැකියා ප්‍රදර්ශනය කරයි

නිපුණතා මට්ටම 3.1 :- රාගධාරී සංගීතයට අදාළ උසස් ගායනයක්, වාදනයක් ඉදිරිපත් කිරීම සඳහා වර්ධනය කර ගත යුතු මූලික ගුණාංග ප්‍රායෝගික ව අධ්‍යයනය කරයි.

ක්‍රියාකාරකම :- ගායනය ප්‍රධාන කර ගත් සිසුන් සඳහා තෝරා ගත් ස්වර වාද්‍ය භාණ්ඩයකින් අද්‍යතන සරල ගීතයක් වාදනය හෝ රාගධාරී සංගීතාංගයක් වාදනය නැතහොත් තබ්ලාව වාදනය (කායදා පල්ටා මුඛඩා)

කාලච්ඡේද සංඛ්‍යාව 04

ඉගෙනුම් පල

- තෝරා ගත් වාද්‍ය භාණ්ඩයෙන් වාදනය කළ යුතු කොටස් හඳුනා ගනියි.
- වාදනය සඳහා කැමැත්ත පළ කරයි.
- නියමිත කොටස් වාදනය කරයි.

ගුණාත්මක යෙදවුම්

- ගීත ප්‍රස්තාර
- ඔබ විසින් නිර්මාණය කර ගන්නා ලද ගී පද පේළියක පද හා ස්වර වෙන වෙන ම ලියූ දෘශ්‍ය උපකරණ දෙක.
- රාගධාරී වාදනයන්හි ප්‍රස්තාර.
- සිසුන් වයන වාද්‍ය භාණ්ඩ.

විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :

ගායනය ප්‍රධාන ව කරනු ලබන සිසුන් ප්‍රායෝගික පරීක්ෂණයේ දී තෝරා ගත් වාද්‍ය භාණ්ඩයක් වාදනයෙන් එක් ප්‍රශ්නයකට පිළිතුරු සැපයීම අනිවාර්ය ය. ඒ සඳහා සිසුනට මඟ පෙන්වීම අපේක්ෂිත යි. එසේ ම වාදනයෙන් ප්‍රධාන විෂයයට පෙනී සිටින සිසුන් එක් ප්‍රශ්නයක් සඳහා ගායනයෙන් හෝ තබ්ලාවෙන් පිළිතුරු දීම ද අවශ්‍ය බවට දැනුම්වත් කරන්න. මේ පිළිබඳ වැඩි විස්තර මෙම මාර්ගෝපදේශ සංග්‍රහයේ මුල් පිටුවල දැක්වේ.

උසස් පෙළ සිසුනට ගැළපෙන අද්‍යතන සරල ගීතයක් තෝරා වාදනය සඳහා පුහුණු කරවන්න. කාලය හා සිසුන්ගේ හැකියාව අනුව ගීත කිහිපයක් වාදනය කරවන්නේ නම් විශිෂ්ට ය. සරල ගීතයක් වෙනුවට ඛ්‍යාල් ගීතයක්, ධූන් එකක් ඨුම්රියක් භජන් ගීතයක්, ගසල් ගීතයක් වැනි රාගධාරී සංගීතාංගයක් වාදනය කරවිය හැකි ය. පන්තියේ තත්ත්වය අනුව සරල ගීතයක් හා රාගධාරී සංගීතාංගයක් යන දෙකම පුහුණු කරවන්නේ නම් ඵලදායීතාව වැඩි වනු ඇත. ගායනය ප්‍රධානව අධ්‍යයනය කරන සිසුන්ට අවශ්‍ය නම් තෝරාගත් වාද්‍ය භාණ්ඩය වෙනුවට තබ්ලාව තෝරාගත හැකිය.

තබ්ලාව වාද්‍ය භාණ්ඩය ලෙස තෝරා ගත් සිසුන් සඳහා සරල කායදා පල්ටා හා මුඛඩා වාදනයට සලස්වන්න. මේ සඳහා ඉදිරි පිටුවේ ඇති 14B ක්‍රියකාරකම මේ කාලච්ඡේදය තුළම යොදාගන්න. වැඩිදුර අධ්‍යයනය සඳහා හැඳින්වීම පිටුව කියවන්න.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 1.

- ඔබ විසින් නිර්මාණය කර ගන්නා ලද පද පෙළක් ප්‍රදර්ශනය කරන්න.
- අනතුරු ව එම පද පෙළට ඔබ විසින් නිර්මිත තනුවේ ස්වර ප්‍රස්තාරය පෙන්වා වාදනයට දක්ෂ සිසුවකු ලවා එය වාදනය කරවා ඒ සමග ගීතය ගැයීමට සලස්වන්න.
- මීට පෙර ගීතයක තනුව සොයා ගැනීමට ස්වර ප්‍රස්තාර වාදනයෙන් ලැබුණු පිටිවහල පිළිබඳ ව සාකච්ඡා කරමින් පාඩමට පිවිසෙන්න.

(විනාඩි 10)

පියවර 02

- ගීතයන්හි ස්වර ප්‍රස්තාර හෝ රාගධාරී සංගීතාංගයක ස්වර ප්‍රස්තාර හෝ ලබා දී පුහුණු වීමට යොමු කොට අවශ්‍ය තැන්හි උපදෙස් සපයා දෙන්න.
- තබ්ලාව සඳහා කායදා පල්ටා මුඛඩා සපයන්න.

පියවර 03

- තනි තනි ව වාදනය කිරීමට සලස්වා ප්‍රතිපෝෂණය ලබා දෙන්න.

. ( විනාඩි 20).

ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස්

නිවැරදි ස්වර තාල, වාදනයේ මිහිරියාව ආදිය මැනෙන සේ ඇගයීම සකස් කර ගන්න.

( විනාඩි 10).

අතිරේක උදවු

ස්වර ප්‍රස්තාර සහිත පොත්. (ගී ප්‍රස්ථාර ශතකය i, ii, iii, iv)

ක්‍රියාකාරකම 14B

# තබ්ලාව වාදනය

නිපුණතාව 3.0 :- වාද්‍ය භාණ්ඩයන්හි ස්වරූපය වටහා ගනිමින් වාදන හැකියා ප්‍රදර්ශනය කරයි

නිපුණතා මට්ටම 3.1 :- රාගධාරී සංගීතයට අදාළ උසස් ගායනයක් වාදනයක් ඉදිරිපත් කිරීම සඳහා වර්ධනය කර ගත යුතු මූලික ගුණාංග ප්‍රායෝගික ව අධ්‍යයනය කරයි.

ක්‍රියාකාරකම : තබ්ලාව වාදනය
කාලච්ඡේද සංඛ්‍යාව : (ඉදිරි පාඩමේ ඇති කාලච්ඡේද සංඛ්‍යාව ම මෙම පාඩමට ද යොදා ගැනේ.)
ඉගැනුම් පල :
- ශාස්ත්‍රීය තබ්ලා වාදනයක ස්වභාවය මූලික ව හඳුනාගනියි.
- කායදා පල්ටා තිහායි හා මුඛඩාවල ආකෘතිය හා අන්තර්ගත ලක්ෂණ හඳුනාගනියි.
- කායදා, පල්ටා, තිහායි, හා මුඛඩාවල වාදන ශිල්ප විධි හඳුනාගනියි.

ගුණාත්මක යෙදුම් : තබ්ලා වාදන ඇතුළත් ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ. කියවීම් පත්‍රිකා.

විෂය කරුණු පැහැදිලි කරගැනීමට අත්වැලක් :

ගායනය ප්‍රධාන කරගත් සිසුන් තෝරා ගත් ස්වර වාද්‍ය භාණ්ඩයක් හෝ තබ්ලාව හෝ වාදනය කිරීම නිර්දේශිත ය. මේ සඳහා එක් වාරයකට කාලච්ඡේද 4 බැගින් 12ක් හිමි වේ. ස්වර වාද්‍ය භාණ්ඩ වාදනය කිරීමත් තබ්ලාව වාදනය කිරීමත් යන ක්‍රියාකාරකම් දෙක ම එක ම කාලයක් තුළ යොදාගත යුතු වෙයි. තබ්ලාවෙන් වාදනය කෙරෙන ශාස්ත්‍රීය පද කීපයක් වන කායදා, පල්ටා, තිහායි හා මුඛඩා පිළිබඳ ප්‍රායෝගික මෙන් ම න්‍යායාත්මක මූලික අවබෝධය ලබාදීම මෙහිදී අපේක්ෂිත ය. කායදා දෙගුණ, සිවුගුණ ආදි වශයෙන් ගුණ කරමින් වාදනය කිරීම කායදා වාදනයේ ශිල්ප විධිය බව සිසුන්ට උගන්වන්න. පල්ටා යනු කායදාවේ විස්තර රචනා බවත්, කායදාවකට පල්ටා සීමා රහිත ව පවතින බවත්, පල්ටා වාදනය අවසන් කිරීමට තිහායි භාවිත කරන බවත් සිසුන්ට පහදා දෙන්න. මුඛඩා කායදා මෙන් ගුණ කිරීමක් හා පල්ටා වාදනයක් සිදු නොකරන ස්ථිර ප්‍රබන්ධයක් බව පහදා දෙන්න. මෙහි අවසානයේ ඇමුණුමෙහි දක්වා ඇති පද මේ සඳහා භාවිත කළ හැකි ය. වාරයකට නියමිත කාලච්ඡේද 4 පාඩම සංවර්ධනය සඳහා මඟ පෙන්වා ඇති පරිදි වෙන් කර ගත හැකි ය. ඉගැන්වීමට නියමිත කාලච්ඡේදයට හෝ කිහිපයට හෝ ගැළපෙන පරිදි ක්‍රියාකාරකම් සැලැස්ම ගුරුවරයා විසින් ගොඩනඟා ගත යුතු වෙයි. ඔබේ පන්තියේ ස්වර වාද්‍ය භාණ්ඩ හා තබ්ලා වාදනය යන දෙකටම අයත් සිසුන් සිටී නම්, 14A සහ 14Bයන ක්‍රියාකාරකම් එකවර යොදාගත යුතුව්.

පාඩම සංවර්ධනය :

- ඔබ සූදානම් කරගෙන පැමිණි කායදා වාදනයක හඬ පටය සිසුන්ට ඇසීමට සලස්වමින් පාඩමට පිවිසෙන්න. එම කායදාවේ ආකෘතිමය ලක්ෂණ පිළිබඳ ව සිසුන් විමසන්න. කායදාවක මූලික ස්වභාවය සිසුන්ට පහදාදෙන්න. කායදාවක ආකෘතිය හා අන්තර්ගත ලක්ෂණ සම්බන්ධ ව ඔබ විසින් සකස් කරන ලද කියවීමේ පත්‍රිකාව බෙදා දෙන්න. ඇමුණුමෙහි කොටස 1හි දැක්වෙන කායදාව සිසුන්ට ලබාදෙන්න. එම කායදාව වාදනය කරමින් එහි ධ්වනි රටාව පිළිබඳ අවබෝධය සිසුන්ට ලබා දෙන්න. එම කායදාව සමගුණ, දෙගුණ හා සිවුගුණ වශයෙන් වාදනය වන අයුරු පෙන්වා දෙන්න. සිසුන් අභ්‍යාසයෙහි යොදවන්න.

කාලච්ඡේද 01

- පල්ටා පිළිබඳ හැඳින්වීමක් කරන්න. පල්ටා සම්බන්ධ ව ඔබ විසින් පිළියෙළ කරගනු ලැබූ කියවීමේ පත්‍රිකාව සිසුන් වෙත බෙදා දෙන්න. ඇමුණුමෙහි කොටස 2හි දැක්වෙන පල්ටා ද ඇසුරු කර ගනිමින් පල්ටා ගොඩනැඟෙන ආකාරය පහදා දෙන්න. ඇමුණුමෙහි කොටස 2හි දැක්වෙන පල්ටා ද ඇසුරු කර ගනිමින්

පෙර වාදනය කළ කායදාවේ පල්ටා කීපයක් සිසුන් වෙත ලබාදෙන්න. සිසුන් අභ්‍යාසයෙහි යොදවන්න.

කාලච්ඡේද 01

- තිහායි පිළිබඳ මූලික හැඳින්වීමක් කරන්න. තිහායි සම්බන්ධ ව ඔබ විසින් පිළියෙල කරගනු ලැබූ කියවීමේ පත්‍රිකා සිසුන් වෙත බෙදා දෙන්න. තිහායි වාදනයක හඬ පටයක් ඇසීමට සලස්වමින් තිහායි වාදනවල ඇති රිද්මීය ලක්ෂණ සිසුන්ට අවබෝධ කරවන්න. කායදාවක පල්ටා වාදනය අවසන් කිරීමට තිහායි ප්‍රබන්ධයක් භාවිත කරන අයුරු සිසුන්ට පහදා දෙන්න. පෙර ඉගැන්වූ පල්ටා වාදනය අවසන් කිරීමට මෙහි ඇමුණුමෙහි කොටස 3හි දැක්වෙන තිහායි ප්‍රබන්ධය වාදනය කිරීමට සිසුන් පුහුණු කරවන්න.

කාලච්ඡේද 01

- මුඛඩා පිළිබඳ මූලික හැඳින්වීමක් කරමින් ඔබ විසින් පිළියෙල කරගනු ලැබූ කියවීමේ පත්‍රිකාව සිසුන් වෙත බෙදා දෙන්න. මුඛඩා වාදනයක හඬ පටයක් සිසුන්ට ඇසීමට සලස්වන්න. එහි රිද්මීය ලක්ෂණ සිසුන් සමඟ සාකච්ඡා කරන්න. මුඛඩා සම්බන්ධ ව ඇමුණුමෙහි කොටස 4හි දැක්වෙන මුඛඩා ප්‍රබන්ධ වාදනය කිරීමට සිසුන් පුහුණු කරවන්න.

කාලච්ඡේද 01

ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

තබ්ලා වාදනයේ හුරුව පිළිබඳව සොයාබලා අගයන්න.

අතිරේක උදවු :

තබ්ලාව - විජයරත්න රණතුංග

සම්භාව්‍ය තාල දීපනී - ඩී. ආර්. පීරිස් - පිටු අංක 43 44 45 109 113 114 115 116 දක්වා

තබ්ලා ධ්වනි - ඩී. චානක පීරිස් - පිටු අංක 54-69 දක්වා 81-88 දක්වා 95-98 දක්වා

(පන්තියේ නියමිත කාලච්ඡේද සංඛ්‍යාවෙන් පමණක් තබ්ලා වාදන දක්ෂතා වර්ධනය කළ නොහැකි නිසා, සවස් වරු අතිරේක පන්ති මගින් සිසුන්ගේ වාදන දක්ෂතා වැඩිදියුණු කරන්න)

ඇමුණුම :

මෙම සියලූ ම පද ත්‍රිතාල් පදනම් කරගෙන වාදනය කරන්න. පහත දැක්වෙන කායදාවල තරිකිට යන අක්ෂර එකවර වාදනය අපහසු නම් මුල දී ''තිට'' යනුවෙන් යොදාගෙන ''ධා ධා ති ට'' වශයෙන් වාදනය පුහුණුවිය හැකි ය.

- කොටස 1

කායදා

| | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| i. | ධා | ධ | ති | ට | ධා | ධා | තු | නා | ii | ධා | ධා | තිරි | කිට | ධා | ධා | තු | නා |

තා තා ති ට ධා ධා තු නා　　　තා තා තිරි කිට ධා ධා තු නා

- කොටස 2

පල්ටා

1. | ධාධා තිරිකිට ධාධා තිරිකිට | ධාධා තිරිකිට ධාධා තුනා |
තාතා තිරිකිට තාතා තිරිකිට ධාධා තිරිකිට ධාධා තුනා

2. | ධාධා තිරිකිට ධාතිරි කිටධා | ධාධා තිරිකිට ධාධා තුනා |
තාතා තිරිකිට තාතිරි කිටතා ධාධා තිරිකිට ධාධා තුනා

3. | ධාධා ධාතිරි කිටධා තිරිකිට | ධාධා තිරිකිට ධාධා තුනා |
තාතා තාතිරි කිටතා තිරිකිට ධාධා තිරිකිට ධාධා තුනා

4. | තිරිකිට ධාතිරි කිටධා තිරිකිට | ධාධා තිරිකිට ධාධා තුනා |
තිරිකිට තාතිරි කිටතා තිරිකිට ධාධා තිරිකිට ධාධා තුනා

5. | තිරිකිට ධා- තිරිකිට ධා- | ධාධා තිරිකිට ධාධා තුනා |
තිරිකිට තා- තිරිකිට තා- ධාධා තිරිකිට ධාධා තුනා

- කොටස 3

තිහායි

| ධාධා තිරිකිට ධාධා | තුනා ධා- -- ධාධා තිරි|කිට
| ධාධා තුනා ධා- -- ධාධා තිරිකිට ධාධා තුනා
ධා

කොටස 4

මුඛඩා

| තිරිකිට ධා--- තිරිකිට ධා--- | ධා-තිරි කිටතක තා-තිරි කිටතක |
| තිරිකිට ධා-තිත් ධා--- තිරිකිට ධා-තිත් ධා--- තිරිකිට ධා-තිත්
ධා
X

| ධාති ටධා තිට ධා- | තිරිකිට ධා-තිරි කිටධා- තිට |
| ධා- ධා-තිරි කිටධා- තිට ධා- ධා-තිරි කිටධා- තිට
ධා
X

ක්‍රියාකාරකම 15

# රාගධාරී ශාස්ත්‍රීය පදනමක් සහිත සිංහල, හින්දි, සරල ගී දෙකක් හෝ චිත්‍රපට ගී දෙකක් හෝ ඇසුරින් රසාස්වාදයේ යෙදීම සහ ගායනය, වාදනය

නිපුණතාව 4.0 :- සංගීත රසාස්වාදයේ යෙදෙමින් ජීවිතයේ සතුට හා බැඳි මානසික තත්ත්වයන් ළඟා කරගැනීමට හුරු වෙයි.

නිපුණතා මට්ටම 4.1 :- රාගධාරී සංගීතය ආශ්‍රයෙන් නිර්මාණය වී ඇති ගායන විශ්ලේෂණාත්මක ව සාකච්ඡා කරමින්, ප්‍රායෝගික රසාස්වාදයක යෙදෙයි.

ක්‍රියාකාරකම :- රාගධාරී ශාස්ත්‍රීය පදනමක් සහිත සිංහල, හින්දි, සරල ගී දෙකක් හෝ චිත්‍රපට ගී දෙකක් හෝ ඇසුරින් රසාස්වාදයේ යෙදීම සහ ගායනය, වාදනය.

කාලච්ඡේද සංඛ්‍යාව :- 06

ඉගෙනුම් ඵල :-

- රාගධාරී ශාස්ත්‍රීය පදනමක් සහිත සරල ගීත වර්ග හඳුනා ගනියි.
- සිංහල, හින්දි චිත්‍රපට වශයෙන් රාගධාරී ශාස්ත්‍රීය පදනමක් සහිත සරල ගී යෙදෙන බව අවබෝධ කර ගනියි.
- රාගධාරී ශාස්ත්‍රීය පදනමක් සහිත සරල ගීත වර්ග ගායනය කිරීමට කැමැත්ත පළ කරයි.
- ගීත වර්ගවල තිබෙන රාග අංග පැහැදිලි කරයි.
- සිංහල, හින්දි චිත්‍රපට වශයෙන් රාගධාරී ශාස්ත්‍රීය පදනමක් සහිත සරල ගීත ගායනය කරයි.

ගුණාත්මක යෙදවුම් :-

- අදාළ ගීත පටිගත කළ කැසට් පට හා කැසට් යන්ත්‍රයක්
- ගීත ගබඩා කළ Pendrive එකක් සමග ලැප්ටොප් එකක්, CD තැටි.
- සර්පිනාව
- ගීත ලියූ දෘශ්‍යාධාර
- ඇමුණුම අංක 02 කියවීම් පත්‍රිකාවේ පිටපත්

විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක්

මෙම පාඩම සැලසුම් කර ගැනීමේ දී ඇමුණුම් අංක 01හි දක්වා ඇති විෂය කරුණු පළමු ව කියවා අවබෝධ කරගන්න.

ඇමුණුම අංක 01හි ඇතුළත් ගීත ලැයිස්තුවෙන් ඔබ කැමති රාගධාරී ශාස්ත්‍රීය පදනමක් සහිත සිංහල සරල ගීතයක් ද, හින්දි චිත්‍රපට ගීතයක් ද I වාරයට යොදා ගෙන ද ඒ අතරින් තවත් ගීත දෙකක් II වාරය සඳහා යොදාගෙන ද ඉගැන්වීම මෙම ක්‍රියාකාරකමින් අපේක්ෂා කෙරේ.

ගායනයක, වාදනයක ඇතුළත් සියුම් කොටස් විශ්ලේෂණය කරමින්, රාග ඥානය මෙන් ම ව්‍යාවහාරික සංගීතයේ තාක්ෂණික ක්‍රම ශිල්ප හා ගීතයන්හි ඇතුළත් ශිල්ප ක්‍රම පිළිබඳ ව ද සිසුන්ට අවබෝධයක් ලබාදීම තවත් අපේක්ෂාවකි. ගීත ගායනය, වාදනය මඟින් සිසුන්ගේ ප්‍රායෝගික දක්ෂතා තව දුරටත් වර්ධනය වීමක් ද සිදු වනු ඇත.

පාඩම සංවර්ධනය

- මීට පෙර ඉගෙන ගත් රාගධාරී ශාස්ත්‍රීය පදනමකින් යුත් සරල ගීතයක් ගායනය කිරීමට සිසුන්ට අවස්ථාවක් ලබා දෙන්න. එම ගීතයේ තනුව, රිද්මය, භාෂාව, නිර්මාණයට පාදක වූ රාගය, රාග අංග සමඟ අර්ථය උද්දීපනය වන අයුරින් කෙටි සාකච්ඡාවක් මෙහෙයවන්න.
- ඇමුණුම අංක 01හි ගීත ලැයිස්තුවෙන් ගුරුවරයාට අභිමත පරිදි සිංහල ගීතයක් තෝරාගෙන එහි දෘශ්‍යාධාරය ප්‍රදර්ශනය කරන්න. කැසට් යන්ත්‍රයක් හෝ පරිගණකයක් හෝ භාවිත කරමින් ගීතය වාදනය කර සිසුන්ට ශ්‍රවණය කිරීමට අවස්ථාව ලබා දෙන්න. ගීතය ගායනය/වාදනය කරවන්න.

කාලච්ඡේද 01

- ගීත ලැයිස්තුවෙන් තවත් හින්දි චිත්‍රපට ගීතයක් තෝරාගන්න. දෘශ්‍යාධාරය ප්‍රදර්ශනය කරන්න. ඉහත ක්‍රියා පිළිවෙළ ම මේ ගීතය ඉගැන්වීමට අනුගමනය කරන්න.
- ඇමුණුම අංක 02 කියවීම් පත්‍රිකාවේ පිටපත් සිසුන්ට ලබා දී එම ශීර්ෂ ඔස්සේ සාකච්ඡාවක් මෙහෙයවන්න. සටහනක් පිළියෙළ කරවන්න.

කාලච්ඡේද 01

- III වන කාලච්ඡේදයේ දී ගායනය, වාදනය කළ ගීත 2කින් එක් ගීතයක ස්වර ප්‍රස්තාරයක්, සර්පිනාවෙන් හෝ ස්වර පුවරුවෙන් හෝ වාදනය කිරීමට යොමු කරවන්න.

කාලච්ඡේද 01

- II වාරයට අදාළ ගීත ඉගැන්වීමේ දී I වාරය සඳහා අනුගමනය කළ ක්‍රමවේදය ම යොදා ගන්න.

කාලච්ඡේද 03

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :-

- රාගධාරී ශාස්ත්‍රීය පදනමකින් යුත් සිංහල හා හින්දි චිත්‍රපට ගීත තාලය හා ලය පවත්වා ගනිමින්, ස්වර හා තනුව නිවැරදි ශ්‍රැතියට ගායනය කළ සිසුන් තෝරා අගයන්න.
- ගීත ස්වර ප්‍රස්තාර නිවැරදි ව වාදනය කළ සිසුන් තෝරා අගයන්න.

පැවරුම :- සිංහල හා හින්දි චිත්‍රපට ගීත ඇතුළත් පොත් පිංචක් සකස් කිරීමට යොමු කරවන්න. නිදහස් කාලච්ඡේදයන්හි දී එම ගීත සර්පිනාවෙන් හෝ ස්වර පුවරු භාණ්ඩයකින් හෝ වාදනය කිරීමට යොමු කරවන්න. (ගීත වාදනය කිරීමේ දී ගුරු සහාය ලබා දෙන්න.)

ඇමුණුම : අංක 01

රාගධාරී ශාස්ත්‍රීය පදනමක් සහිත බොහෝ සරල ගී ඇත. එසේ ම රාගධාරී සංගීත පදනමක් සහිත හින්දි චිත්‍රපට ගීත රාශියක් ශ්‍රී ලාංකික සමාජය තුළ ජනප්‍රිය ව පවතී. පහත දැක්වෙන ගීත ලැයිස්තුව මෙම ශ්‍රේණිය සඳහා යෝජනා කෙරේ.

එම ගීත ලැයිස්තුවේ සිංහල සරල ගී අතරින් එක් ගීතයක් ද, හින්දි චිත්‍රපට ගී අතරින් තවත් ගීතයක් ද වශයෙන් ගීත දෙකක් පළමු වාරයටත් ඒ අතරින් තවත් ගීත දෙකක් දෙවන වාරයටත් යොදා ගන්න.

**: රාගධාරී ශාස්ත්‍රීය පදනමක් සහිත සරල ගීත**

**ශාස්ත්‍රීය අංග වන ආලාප, තානාලංකාර, තබ්ලා බෝල් ආදිය ඇතුළත් ගීත**

| | | | |
|---|---|---|---|
| 1. | හංසරාජිනී | - සුනිල් එදිරිසිංහ | - මාලකෞන්ස් |
| 2. | හෝපලු වනපෙත | - වික්ටර් රත්නායක | - භාගේශ්‍රී |
| 3. | කමලාසනී | - පී. වී. නන්දසිරි | - හන්සධ්වනි |

සරල ශාස්ත්‍රීය ගීත

| | | | |
|---|---|---|---|
| 1. | මුව මුක්තාලතා | - එඩ්වඩ් ජයකොඩි | - පීළු |
| 2. | චාමර පවන් සලා | - අමරා රණතුංග | - ශිවරංජනී |
| 3. | මාරම්බරී | - එඩ්වඩ් ජයකොඩි | - තිලක්කාමෝද් |
| 4. | දුරස් වන්නට මේ ලෙසින් | - දයාරත්න රණතුංග | - කලාවතී, ජනසම්මෝහිනී |

**ඨුම්රි, ගසල්, ධූන්, භජන් වැනි සරල ශාස්ත්‍රීය ගායන-වාදන ශෛලීන්ට අනුව සැකසුන සිංහල සරල ගීත**

| | | | |
|---|---|---|---|
| 1. | මම දෙව්ඳුනි | - සුජාතා අත්තනායක | - දර්බාරිකානඩා |
| 2. | මන්නාරම් කන්‍යාරාමේ | - රශ්මි සංගීතා | - තෝඩි |
| 3. | ඇවිළුණු ගිනිදැල් | - සනත් නන්දසිරි | - කලාවතී රාගය ජනසම්මෝහිනී/කලාශ්‍රී |
| 4. | වස්දඬුරාවේ | - අමරා රණතුංග | - ශිවරංජනී |
| 5. | ආසාවරී මනමෝහිනී | - සුදත් සමරසිංහ | - දේස් |
| 6. | සඳ සරා කුමාරී | - සුදත් සමරසිංහ | - හමීර් |
| 7. | මකරන්ද පාද පුෂ්පේ | - මිල්ටන් පෙරේරා | - හමීර් |
| 8. | ලොවේ සැමදා | - හරුන් ලන්ත්‍රා | - ජෞනපුරි |
| 9. | මයුරාසන හිඳ පාන තෙදැති | - සුනිල් එදිරිසිංහ | - බහාර් |
| 10. | පටු අදහස් නම් පවුරින් ලෝකය | - පණ්ඩිත් අමරදේව | - කේදාර් |

**හින්දි චිත්‍රපට ගීත ලැයිස්තුව**

| | | | |
|---|---|---|---|
| 1. | කොහිනූර් | - මධුබනමෙ රාජිකා | - හමීර් රාගය |
| 2. | අභිමාන් | - තෙරේ මේරේ | - ඛමාජ් රාගය |
| 3. | පාකීෂා | - මෝසම්හෙ | - යමන් රාගය |
| 4. | ජනක් ජනක් පායල භාජේ | - ජනක් ජනක් පායල භාජේ | - අඩානා, දර්බාරිකානඩා |
| 5. | බෛජු බව්රා | - මනතරෆත හරි දර්ශන කො ආජ | - මාලකෞන්ස් |
| 6. | බෛජු බව්රා | - තු ගංගා කිමෝජු මෙ | - භෛරවී |
| 7. | බෛජු බව්රා | - භගවා භගවා | - දර්බාරිකානඩා |
| 8. | සංගම් | - මේරේ මන්කී ගංගා | - භෛරවී |
| 9. | සත්‍යම් ශිවම් සුන්දරම් | - සත්‍යම් ශිවම් සුන්දරම් | - ශිවරංජනී/දර්බාරිකානඩා |

ඇමුණුම් අංක 02 (විෂය කරුණු හා බැඳි ශීර්ෂ)

- පදමාලාවෙන් ප්‍රකාශිත අදහස
- තනු නිර්මාණය සඳහා පාදක වූ රාග
    - එම රාගයේ රාග අංග තනුවේ පිහිටා ඇති ආකාරය (ප්‍රායෝගික ව දැක්වීම)
    - පෙර වාදන, අතුරු වාදනවල ගැළපීම
    - යොදා ඇති විවිධ රාගධාරී ශාස්ත්‍රීය අංග
    - යොදා ඇති සංගීත භාණ්ඩ

ක්‍රියාකාරකම 16

# ශ්‍රී ලංකාවේ ගැමි ගී පිළිබඳ තොරතුරු

නිපුණතාව 5.0 :- දේශීය ජන සංගීතාංග පිළිබඳ ප්‍රායෝගික හැකියා වර්ධනය කර ගනිමින් සංස්කෘතික උරුමයන් රැක ගනියි.

නිපුණතා මට්ටම 5.1 :- ගැමි ගායනා පිළිබඳ ව තර්කානුකූල අදහස් දක්වමින් ගැමි ගී ගායන, වාදන දක්ෂතා වර්ධනය කර ගනියි.

ක්‍රියාකාරකම :- ශ්‍රී ලංකාවේ ගැමි ගී පිළිබඳ තොරතුරු

කාලච්ඡේද සංඛ්‍යාව :- 02

ඉගෙනුම් පල :-
- ගැමි ගී නිර්වචනය කරයි.
- ගැමි ගී වර්ග විස්තර කරයි
- ගැමි ගී නිර්මාණයට පදනම් වූ හේතු සාධක විස්තර කරයි.
- ගැමි ගීවල විශේෂ ලක්ෂණ පැහැදිලි කරයි.
- ගැමි ගී වර්ග කර දක්වයි.
- ගැමි ගී සංස්කෘතික හා සමාජීය වශයෙන් අගය කරයි.

ගුණාත්මක යෙදවුම් :-
- ඇමුණුම අංක 01 හා 02ට අදාළ ව අවශ්‍ය තොරතුරු පමණක් ඇතුළත් දෘශ්‍ය උපකරණයක්.
- සර්පිනාව නැතහොත් ස්වර වාද්‍ය භාණ්ඩයක්

විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක් :-

2007 10 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශයේ 'ජන ගී වර්ගීකරණය' පිළිබඳව 4.0 නිපුණතාව යටතේ 4.2.1 ක්‍රියාකරකමින් ඉගෙන ගෙන ඇත. ගැමියා ජීවිතයේ විවිධ අවස්ථාවන්හි දී ගායනා කර ඇති ගැමි ගීවලින් සැබෑ ජීවන තත්ත්වය නිර්ව්‍යාජ ව ප්‍රකාශ කර ඇත. ගැමි සමාජයේ සංස්කෘතිය විදහා දක්වන කැඩපතක් ලෙස ගැමි ගී අගය කළ හැකි ය. ඇමුණුම්වලට අදාළ විෂයය කරුණු ඔස්සේ න්‍යායික ව හා ප්‍රායෝගික ව සාකච්ඡාවක් මෙහෙයවීම මින් අපේක්ෂා කෙරේ.

පාඩම සංවර්ධය :-

- ගැමි ගීයක් හා සේ ගීයක් ගයමින් පාඩමට ප්‍රවේශ වන්න. එම ගී වර්ග පිළිබඳ ව සිසු අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න. ඇමුණුම අංක 01හි ඇතුළත් විෂයය කොටස්වලට අදාළ ව ඔබ සකස් කළ කියවීම් පත්‍රිකා බෙදා දෙන්න. සැලසුම් කළ ක්‍රියාකාරකම්වල සිසුන් යොදවන්න.

  (කාලච්ඡේද 01)

- ගැමි සමාජයේ සාමූහික බව දනවන ගී වර්ගවලින් ඔබ කැමති ගීයක් ගයමින් පාඩමට ප්‍රවේශ වන්න. එම ගීතයෙන් සාමූහික බව දනවන ආකාරය පිළිබඳ ව සිසු අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න. සාකච්ඡාවක් මෙහෙයවන්න. ඇමුණුම අංක 02හි ඇතුළත් ගැමි ගී සංස්කෘතික හා සමාජීය වශයෙන් අගය කළ හැකි අවස්ථා පිළිබඳ ව

කියවීම් පත්‍රිකා සකස් කර බෙදා දෙන්න. සැලසුම් කළ ක්‍රියාකාරකම්වල සිසුන් යොදවන්න.

(කාලච්ඡේද 01)

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :-

- එක් එක් විෂයය කොටසක් අවසානයේ වාචික හෝ ලිඛිත හෝ ප්‍රශ්න මඟින් අගයන්න.
- සියලු ම විෂයය කොටස් ආවරණය වන පරිදි රචනාවක් / ලිපියක් හෝ පැවරුමක් සකස් කිරීමට මඟ පෙන්වන්න.

අතිරේක උදවු :-

- 2007 10 ශ්‍රේණිය පෙරදිග සංගීතය ගුරු මාර්ගෝපදේශයේ පිටු අංක 93 - 95 තෙක්.
- 2009 පෙරදිග සංගීතය - 12 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය - පිටු අංක 138 - 140 තෙක්.
- හෙළ ගී මඟ - ඩබ්. බී. මකුලොලුව
- සිංහල ජන කවියේ සාහිත්‍යමය අගය හා සංස්කෘතික ලක්‍ෂණ
  - නිමල් ජේ. ගමගේ
- සිංහල ජන කවි සංග්‍රහ ප්‍රවේශය - සුනන්ද මහේන්ද්‍ර
- ජන කවි වාරම් - නිමල් ප්‍රේමතිලක
- උපදේශ ජනකවි - බණ්ඩාර වැවගෙදර
- ජන කවියෙන් හෙළි වන සිංහල ගෘහ ජීවිතය - අමරසිරි වික්‍රමරත්න

ඇමුණුම - අංක 01

සාකච්ඡාව සඳහා අවශ්‍ය විෂයය කරුණු

- ගැමි ගී හා සේ ගී වශයෙන් ජන ගී බෙදෙන ආකාරය
- ගැමි ගී හා සේ ගී සඳහා නිර්වචන සැපයීම
- ගැමි ගී නිර්මාණයට පදනම් වූ හේතු සාධක
- ගැමි ගී වර්ග හා ඒවාට උදාහරණ දැක්වීම.
- ගැමි ගීවල රිද්මය හා තාලය
- ආඝාතාත්මක හා අනාඝාතාත්මක ගැමි ගී
- ගැමි ගීයේ සුවිශේෂ ලක්ෂණ

ඇමුණුම - අංක 02

ගැමි ගී සංස්කෘතික හා සමාජීය වශයෙන් අගය කළ හැකි අවස්ථා සාකච්ඡාවට යොමු කරන්න.

A ගැමි සමාජයේ සාමූහික බව දනවන අවස්ථා :-

ගොයම් ගී, නෙළුම් ගී, කමත් ගී, දැල් ගී, ශාන්තිකර්ම ගී, ජන ක්‍රීඩා, එළුවන් කැම, මේවර කෙළිය, ලී කෙළිය, කළගෙඩි කවි

උදා :- නෙළුම් ගී - බෝගම්බර අපි නෙළුමට යන කොට

තිස් දෙන්නෙක් නෙළතෙයි තාලම්

B දාර්ශනික බව පෙන්නුම් කරන අවස්ථා :-

පහත දැක්වෙන කවි ගායනා කරමින් දාර්ශනික බව පෙන්වන අවස්ථා පැහැදිලි කිරීම.

**පැල් කවි :-** වෙල් යායක ගොන් දෙන්නෙක් කකා උනී
දුප්පත් කමත් වලිගය නැති ගොනා වැනී

**පාරු කවි :-** සූරිය උදාවන තුරු පිනි බැව්ල්ල
කාරිය කෙරෙන තුරු කාගෙත් රැවටිල්ල

**පාරු කවි :-** පෙර බලලා පැදගෙන යන ඔරුව පිට
පෙරළුණ පිටට කදිමයි කීය මේ පිට

**ගැල් ගී :-** තණ්ඩලේ දෙන්නා දෙපොළේ දක්කනවා
පව් කළ ගොනෝ ඇදපන් හපුතල් යනවා

C සන්නිවේදන කාරකයක් වශයෙන් යොදාගත් අවස්ථා :-

ගැල් ගී, පැල් ගී, පාරු ගී, බඹර ගී

මේ පිළිබඳ ව සාකච්ඡාවක් මෙහෙයවන්න.

D සාරධර්ම අගයන් පිළිබඳ ව යොදාගත් අවස්ථා :-

බඹර ගී, පතල් ගී, ගොයම් ගී

**බඹර ගී :-** අම්මපල්ලා බඹරුන් අත වරද නැතී
බඹර කපන අය නරකාදියේ යතී

**පතල් ගී :-** ඉන්නෙත් දුම්බරයි මහ කළු ගලක් යට
යන්නේ කවදා ද මවුපියො දකින්නට

**ගොයම් ගී :-** උදයට පායන ඉරු දෙවියන්ටයි
වැඳලා ගුරුවර අවසර ගන්ටයි

**ජන කවි :-** බඩගිනි වෙලා මා ගිය කල පුතුගෙ ගෙට
මැනල ද පුතේ කිරි දුන්නේ මා නුඹට

E අධ්‍යාපන කාරකයක් වශයෙන් යොදාගත් අවස්ථා :-

වැලිතලප සාදන අයුරු - කැකුළු සහල් පිටියෙන් ද

කුරහන් තලප සාදන අයුරු

1. මිදිකර ඇටගෙන උණු දියරෙහි ලා පදමට තම්බා පෙරමින්නේ
වැඩිපුර කොටවා පිටිගෙන ළිග්ගල් දෙකට දෙපය දී ඉඳගන්නේ
වැඩිපුර දියවෙන බඳුනක වත්කර තද උණුවතුරෙහි පිටි ලන්නේ
කඩිසර ව ම ගොලගැට නොගැසෙන්නට විගහට කවළම් කර ගන්නේ

2. ඔරු පදිනා ලෙස ඇද ඇද පතුගා දියවර තුනකින් තම්බන්නේ
තරු පෙනෙනා ලෙස ඇස්වල දුම් වැද පදම බලාලා බාගන්නේ
සරු නොවනා ලෙස ගාගත් පොල් සහ තරමට ගුළි කරවා ගන්නේ

බරු දමනා ලෙස මඳ උණුසුම් පිට මාත්තු සමගින් වළඳන්නේ

3. මිරිස් ඇඹුල ලුණු සමබර තිබ්බටු හොද්දෙන් දඩ මස්සෙන් කැවයි
සුරුස් ගගා පවතින සෙම් කැහි මුසු විසි මේහය අරිසස් දුරු වෙයි
හරස් අතට බණ්ඩිය බේරීම ද හන්දි පිරුම් ඉදිමුම් ගුණ වෙයි
සරස් කියා ගුණ වෙයි මේ සැම ලෙඩ තද බඩගින්නට අත්දුටුවයි

මින් තලප සාදන ආකාරය, තලප කෑමට සාදන මිරිස් ඇඹුල සමඟ තිබ්බොටු හොද්ද, ඉන් සුව වන ලෙඩරෝග ආදිය ද විස්තර කෙරේ.

F නිර්ව්‍යාජ කලා මාධ්‍යයක් ලෙස යොදාගත් අවස්ථා :-

පැල් ගී, පතල් ගී, පාරු ගී, සිවුපද

**පැල් ගී** :- මැණිකෙගෙ පැල ළඟින් මා යන වෙලාවේ
මල් වැස්සක් වැස්සයි ඒ වෙලාවේ
ඒකයි පැලට ආවේ සිහි මුළාවේ
වැහැපන් හෙටත් මල් වැහි මේ වෙලාවේ

**පතල් ගී** :- රත්තරන් පණේ නුඹ එවූ පත දුටුවා
තිබුණට වැඩිය සොහොයුරු ආලේ වැඩුවා
එතකොට මගේ දෙනෙතින් කඳුළැලි ඉනුවා
දවස ම පුරා ඉඳ නෙත් කඳුළැලි සැලුවා

**පාරු ගී** :- කරුවළ තොටේ මම බැසලා නාන කොට
සුරඟන ලියක් ආවයි මගෙ ඉස්සර ට
කරේ තිබුණ මුතු දෙපොටේ ලස්සණට
අරන් යන්න හිතුණයි අඟුලෙන් ගමට

මෙම ජන කවිය පිටිසර බද ජීවත්වන ගැමියෙකුගේ සැබෑ ජීවන තත්ත්වය නිර්ව්‍යාජ ව ප්‍රකාශ කෙරෙන අවස්ථාවකි.

**සිවුපද** :- අනේ ගිරවුනේ මා බස අසාපන්
නගා සිටින තැන කොතැනද කියාපන්
පැලේ තනිව මා ඉඳිතෙයි කියාපන්
හිතේ දුකට නිදි නැතුවා කියාපන්

පාන්දර ම කිතුලෙන් බාගෙන බොනවා
මාන්දමට හබරල තම්බා කනවා
හීන් දරකෝටු මිටි බැඳ විකුණනවා
ඕන් ඔය ලෙසට අපටත් කල යනවා

ක්‍රියාකාරකම 17

# ගෝත්‍රික ගීත වශයෙන් වැදි ගී

නිපුණතාව 5.0 :- දේශීය ජන සංගීතාංග පිළිබඳ ප්‍රායෝගික හැකියා වර්ධනය කර ගනිමින් සංස්කෘතික උරුමයන් රැක ගනියි.

නිපුණතා මට්ටම 5.1 :- ගැමි ගායනා පිළිබඳ තර්කානුකූල අදහස් දක්වමින් ගැමි ගී ගායන, වාදන දක්ෂතා වර්ධනය කර ගනියි.

ක්‍රියාකාරකම :- ගෝත්‍රික ගීත වශයෙන් වැදි ගී

කාලච්ඡේද සංඛ්‍යාව :- 02

ඉගෙනුම් ඵල :-
- වැදි ගීත ගායනය කරයි.
- වැදි ගීවල සංස්කෘතික ලක්ෂණ ප්‍රකාශ කරයි.
- පැරණි ම ගීත විශේෂයක් බව පිළිගනියි.
- වැදි ගීවල සුවිශේෂ ලක්ෂණ විස්තර කරයි.

ගුණාත්මක යෙදවුම් :-
- වැදි ගීත ලියූ දෘශ්‍යාධාරයක්
- ස්වර වාද්‍ය භාණ්ඩයක්
- කියවීම් පත්‍රිකා

විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක් :-

වැදි ගී ආදිවාසීන්ගෙන් පැවත එන පැරණි ම ගීත විශේෂයක් වන අතර, එහි සුවිශේෂ ලක්ෂණ දක්වමින්, ගීත ගායනය කිරීම මෙම පාඩමින් අපේක්ෂා කෙරේ.

12 වන ශ්‍රේණියේ ගුරු මාර්ගෝපදේශයේ පිටු අංක 141 - 143 දක්වා වැදි ගී පිළිබඳ ක්‍රියාකාරකම ද අධ්‍යයනය කර, පුස්තකාල පොත්පත් පරිශීලනය කරමින් පහත දැක්වෙන ශීර්ෂ ඔස්සේ කරුණු රැස් කරගෙන ඒමට පාඩම ඉගැන්වීමට පෙර සිසුන්ට උපදෙස් දෙන්න.

- වැදි ගීවල සංස්කෘතික පසුබිම
- භාෂාව හා තනුවල විශේෂත්වය
- ගායනයේ සුවිශේෂතා
- ස්වර පරාසය
- නර්තනය සමඟ ගීත ගායනා කරන බව
- නූතන සරල ගී නිර්මාණයට වැදි ගී පදනම් වී ඇති බව

පාඩම සංවර්ධය :-

- වැදි ගීයක් ගායනය කරමින් පාඩමට පිවිසෙන්න. ඔබ ගැයූ ගීතය පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡාවක් මෙහෙයවන්න. ඇමුණුම අංක 01ට අදාළ විෂය කොටස් සඳහා ඔබ විසින් සකස් කරන ලද කියවීම් පත්‍රිකාව සිසුන්ට ලබා දෙන්න. සිසුන් පෙර සූදානම් කර ගත් කරුණු ද උපයෝගී කර ගනිමින්, විෂය කරුණු පැහැදිලි කිරීමේ අත්වැලෙහි සඳහන් ශීර්ෂ ඔස්සේ පාඩම ගොඩ නඟන්න.

(කාලච්ඡේද 01)

- ඇමුණුම අංක 02හි ඇතුළත් නිර්දේශිත වැදි ගීත ගායනය සඳහා තෝරා ගන්න. සුදුසු ස්වර වාද්‍ය භාණ්ඩයක් උපයෝගී කර ගනිමින් තෝරාගත් ගීත ගායනය / වාදනය කරන්න. සුදුසු ක්‍රමවේදයන් අනුගමනය කරමින් ගීත ගායනයට, වාදනයට සිසුන් යොමු කරන්න.

(කාලච්ඡේද 01)

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :-

- ''නූතන සරල ගී නිර්මාණයට වැදි ගී පාදක වී ඇත.'' එම ගීත ඇසුරින් මෙම කියමන සනාථ කරන්න.
- සියලු ම විෂයය කොටස් ආවරණය වන පරිදි පැවරුමක් සකස් කිරීමට මඟ පෙන්වන්න.

අතිරේක උදවු :-

- සිංහල ජන කවියේ සාහිත්‍යමය අගය හා සංස්කෘතික ලක්ෂණ - නිමල් ජේ. ගමගේ

ඇමුණුම - විෂයය කරුණු හා බැඳි ශීර්ෂ

ඇමුණුම 01

- වැදි ගීවල සංස්කෘතික පසුබිම
- ආදිවාසීන්ගෙන් පැවත එන ගීත විශේෂයක් බව.
- තනුවල විශේෂත්වය, ස්වර සීමාවේ පටු බව.
- ගීත ගායනයේ දී නර්තනය ද යොදා ගැනීම.
- විවිධ ශබ්ද යොදා ගැනීම.
- ජීවනෝපාය සඳහා සතුන් දඩයම් කිරීම.
- දරුවන් නැළවීමේ දී, මංගල අවස්ථාවන්හි දී, දඩයමේ යන අවස්ථාවන්හි දී වැදි ගීත ගායනය කිරීම.
- වැදි ගී ඇසුරෙන් නිර්මාණය වූ නූතන සරල ගී

  - නංගිට බැඳපු මල් වියනයි
  - රාජා ඕ මංගලියා
  - කොටා දමඤ්ඤං මර මර කොටා දමඤ්ඤං
  - මල් වියනෙන් බැඳි මහ බැද්දේ උන්
  - මල් නැනී මං කැකුළී මං

ඇමුණුම - අංක 02

2009 12 ශ්‍රේණියේ ගුරු මාර්ගෝපදේශයේ පිටු අංක 141 - 142 හි ගීත ලියූ දෘශ්‍යාධාරය ප්‍රදර්ශනය කර, සිසු අභ්‍යාස පොතේ ලියා ගැනීමට අවස්ථාව ලබා දෙන්න.

- පැට්ටි අඬන්නේ මොන්නට දෝ බොල
- යමු යමු කැකුළේ යමු කැකුළේ
- වැල් කොබ්බෑවල දුන්න නවාගෙන
- අනියම් ඉනියම් කෝමල බෑවා

ක්‍රියාකාරකම 18

# ශ්‍රී ලංකාවේ මුල් යුගයේ සංගීතඥයන් කිහිප දෙනකු විසින් නිර්මිත ආධ්‍යාපනික ග්‍රන්ථ කිහිපයක්

**නිපුණතාව 6.0** : සංගීත ඉතිහාසය පිළිබඳ තොරතුරු ගවේෂණය කරයි.

**නිපුණතා මට්ටම 6.1** : ශ්‍රී ලංකාවේ සංගීත ඉතිහාසය පිළිබඳ තොරතුරු ගවේෂණය කරයි.

**ක්‍රියාකාරකම** : මුල් යුගයේ සංගීතඥයන් සහ ඔවුන් විසින් නිර්මිත ආධ්‍යාපනික ග්‍රන්ථ

**කාලච්ඡේද සංඛ්‍යාව** : 08

**ඉගෙනුම් පල** :
- මුල් යුගයේ මෙරට සංගීතඥයන් ගේ පරිශ්‍රමය පැහැදිලි කරයි.
- ඔවුන් අතින් නිර්මිත සංගීත ග්‍රන්ථ කිහිපයක් නම් කරයි.
- එම ග්‍රන්ථ පිළිබඳ ව සොයා බැලීමට පෙලඹෙයි.
- තෝරාගත් ග්‍රන්ථ ස්වයං අධ්‍යයනයට යොමු වෙයි.
- සංගීත අධ්‍යාපනයට පොත් පත් කියවීම අත්‍යවශ්‍ය අංගයක් බව පිළිගනියි.
- විවිධ ක්ෂේත්‍රවලට වර්ග කළ ග්‍රන්ථ ලැයිස්තුවක් සකස් කරයි.

**ගුණාත්මක යෙදවුම්**:
- මාතෘකාවට අදාළ විෂය කරුණුවලට ගැළපෙන ලෙස සැකසූ දෘශ්‍ය උපකරණ. කියවීමේ පත්‍රිකා සහ ග්‍රන්ථ නාමාවලියක්

**විෂය කරුණු පැහැදිලි කරගැනීමට අත්වැලක්** :

- මෙරට සංගීතයේ විකාශය හා වර්ධනය පිළිබඳ සාකච්ඡා කිරීමේ දී භාරතයේ මෙන් අප රට තුළ ද, සංගීතඥයන්ගේ පරිශ්‍රමය වැදගත් සාධකයක් ලෙසට පිළිගත හැකි ය. ඒ අනුව මහා කවි රවීන්ද්‍රනාත් තාගෝර් තුමාගේ ලංකා ගමනයෙන් පසු භාරතයට ගොස් සංගීතය හදාරා මෙරටට පැමිණි සංගීත විද්වතුන් මෙරට සංගීත අධ්‍යාපනයට මහත් සේවාවක් ඉටු කර ඇත. එකල සංගීතය ඉගෙනීමට සුදුසු ලෙස සරල ව විෂය කරුණු අවබෝධ කර ගත හැකි ලෙස සිංහලයෙන් සැකසූ පොත්පත්වල හිඟයක් පැවතිණි. හින්දි බසින් රචිත මධ්‍යලය ගීත සිංහල ජනතාව පරිහරණය කිරීමේ දී ගැටලු ඇති විය. ඒ අඩුව පිරිමැසීමට එකල සංගීත අධ්‍යාපනයට උරදුන් සංගීතඥයකු ලෙසට ඇම්. ජී. පෙරේරා ගුරුතුමන් අදත් අගය කරනු ලැබේ. රජයේ සංගීත විද්‍යාලයය ආරම්භ වීමත් සමඟ එවකට එහි සේවය කළ ප්‍රේමවංශ හපුවලාන, බී. එස්. විජයරත්න, කුසුම් පෙරේරා. අමරා රණතුංග, බී. වික්ටර් පෙරේරා ('අභිනව මූලික ගීත' ඩබ්. බී. මකුලොලුව) ආදි ගුරුභවතුන් සිංහලයෙන් සංගීත ග්‍රන්ථ රචනා කර සිංහල සිසුන්ට භාරතීය රාගධාරී සංගීතය පිළිබඳ ඉගෙනීමට අත්වැලක් සපයා ඇත. විශාල ප්‍රමාණයක ග්‍රන්ථ අතරින් පැරණිතම ග්‍රන්ථයක්, සිද්ධාන්ත කරුණු සඳහා වෙන් වූ පැරණිතම ග්‍රන්ථ, රාගධාරී ගීත ප්‍රායෝගික අධ්‍යයනය සඳහා වෙන් වූ පැරණිතම ග්‍රන්ථ, සංගීත ඉතිහාසය ඉදිරිපත් කළ විශාලතම ග්‍රන්ථය, නාට්‍ය කලාව සහ හෙළ ජනසංගීත ක්ෂේත්‍රයේ ගුරු කොට සලකනු ලබන ග්‍රන්ථ ආදි වශයෙන් මෙම පාඩම සඳහා ග්‍රන්ථ තෝරා ගැනීමේ දී සැලකිලිමත් වී ඇත.

  මේ සඳහා වෙන් කර ඇති කාලච්ඡේද 08 පහත දැක්වෙන ලෙස අනුමාතෘකා සඳහා වෙන්කර ගනිමින් පාඩම සැලසුම් කරගන්න.

- ඇමුණුමේ දක්වා ඇති ගානවිද්‍යා, පෙරදිග සංගීත ශාස්ත්‍රය, සංගීත, සංගීත සංහිතා යන සිද්ධාන්ත කරුණු හා ඉතිහාසය හා සම්බන්ධ ග්‍රන්ථ හඳුන්වා දෙන්න. අදාළ විෂය කොටස් සඳහා ඇමුණුම ආශ්‍රයෙන් ඔබ සකස් කළ කියවීමේ පත්‍රිකා බෙදා දෙන්න. සිසුන් සමඟ සාකච්ඡාවේ යෙදෙන්න. සටහනක් පිළියෙල කරවන්න.

(කාලච්ඡේද 02)

- ඇමුණුමේ දක්වා ඇති භාවික ගීත, ඛ්‍යාල ගීත යන ප්‍රායෝගික කොටස් හා සම්බන්ධ ග්‍රන්ථ අතරින් රාගධාරී ගීතයක් ඉදිරිපත් කරන්න. එම ග්‍රන්ථ හඳුන්වා දෙන්න. අදාළ විෂය කොටස් සඳහා ඇමුණුම ආශ්‍රයෙන් ඔබ සකස් කළ කියවීමේ පත්‍රිකා බෙදා දෙන්න. සිසුන් අධ්‍යයනයේ යොදවන්න. සටහනක් පිළියෙළ කරවන්න.

(කාලච්ඡේද 01)

- ඇමුණුමේ දක්වා ඇති හෙළ ගී මග, ලංකාවේ සංගීත සම්භවය යන ජන සංගීත කොටස් හා සම්බන්ධ ග්‍රන්ථ අතරින් සුදුසු ගීතයක් ඉදිරිපත් කරන්න. එම ග්‍රන්ථ හඳුන්වා දෙන්න. අදාළ විෂය කොටස් සඳහා ඇමුණුම ආශ්‍රයෙන් ඔබ සකස් කළ කියවීමේ පත්‍රිකා බෙදා දෙන්න. සිසුන් අධ්‍යයනයේ යොදවන්න. සටහනක් පිළියෙළ කරවන්න.

(කාලච්ඡේද 02)

- ඇමුණුමේ දක්වා ඇති සිංහල ගැමි නාටකය යන නාට්‍ය කලාව හා සම්බන්ධ ග්‍රන්ථය හඳුන්වා දෙන්න. අදාළ විෂය කොටස් සඳහා ඇමුණුම ආශ්‍රයෙන් ඔබ විසින් සකස් කළ කියවීමේ පත්‍රිකා බෙදා දෙන්න. සිසුන් අධ්‍යයනයේ යොදවන්න. සටහනක් පිළියෙළ කරවන්න.

(කාලච්ඡේද 01)

- පුස්තකාලය මගින් නැතහොත් ඡායා පිටපත් මගින් නිර්දේශිත ග්‍රන්ථයක් හෝ කිහිපයක් හෝ සපයා සිසුන් කියවීමට යොමු කරන්න. ඒ සඳහා කියවීමට සුදුසු අතිරේක කාලයක් ලබා දෙන්න. ස්වයං අධ්‍යයනයට යොමු කරන්න. එම ග්‍රන්ථයේ හෝ ග්‍රන්ථවල හෝ ඇතුළත් විෂය කරුණු පිළිබඳ සාරාංශයක් වගුවක් ලෙස හෝ සටහනක් ලෙස හෝ පිළියෙළ කරවන්න. සිසුන් වැඩි සංඛ්‍යාවක් සිටින පන්තියක් නම් එක් එක් සිසුවාට වෙන වෙන ම තෝරාගත් ග්‍රන්ථ අධ්‍යයනය පවරන්න. සකස් කළ සාරාංශ පන්තිය ඉදිරියේ සාකච්ඡාවට යොමු කරන්න. අගයන්න. ආචාර්ය ලයනල් එදිරිසිංහ සූරීන් අතින් මෙරට සංගීත ක්ෂේත්‍රයට සිදු වූ සේවාව සංක්ෂිප්ත ව සාකච්ඡා කරන්න.

(කාලච්ඡේද 02)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- එක් එක් කාලච්ඡේද අවසානයේ ගොඩනගන සටහන අගයන්න.

පැවරුම -

- අතිරේක උදවු වශයෙන් ඇමුණුමේ දක්වා ඇති ග්‍රන්ථ ලැයිස්තුව සිසුන්ට සපයන්න. ඒ අතරින් පහසුකම් සහ කාලය ඇති පරිදි සංගීත ග්‍රන්ථවලින් තෝරා ගත් කොටස් කියවීමටත් හා ස්වයං අධ්‍යයනයටත් යොමු කරන්න. සිසුන් අධ්‍යයනය කළ ග්‍රන්ථ පිළිබඳ ව වරින් වර පන්තියේ දී විමසන්න. හැකි තරම් කියවීමට යොමු කරන්න. අගයන්න.

අතිරේක උදවු -

- ඇමුණුම අවසානයේ දක්වා ඇත.

ඇමුණුම:- (නිර්දේශිත සංගීත ග්‍රන්ථ හා ඒවා සම්බන්ධ තොරතුරු සැකෙවින්.)

- ගාන විද්‍යා - මෙම ග්‍රන්ථය ඇම්.ජී.පෙරේරා සූරීන් විසින් සම්පාදිත යි. ගාන විද්‍යා කොටස් කිහිපයකින් යුක්ත ය. 1937 වර්ෂයේ මුද්‍රණය කර ඇති අතර එවකට මිල රුපියල් 2.00කි. නාද, ස්වර, තාල, තාලපද, රාග, මේල ආදි සිද්ධාන්ත කරුණුත් ස්වර අභ්‍යාසත් ඇතුළත් ය.

- **සංගීත - සංගීත විශාරද ප්‍රේමවංශ හපුවලාන**

  මෙම ග්‍රන්ථය සංගීත විශාරද ප්‍රේමවංශ හපුවලාන විසින් සම්පාදිත යි. ප්‍රථම මුද්‍රණය 1967 ජූලි මස සිදු කර ඇති අතර එවකට මිල රුපියල් 10.00කි. පිටු 124කි. රාගධාරී සංගීතයේ සියලු සිද්ධාන්ත කරුණු ඇතුළත් කර ඇත. ඊට අමතර ව පුරාතන මධ්‍යකාලීන භාරතීය සංගීතඥයන් හා ඔවුන් අතින් නිර්මිත ග්‍රන්ථ ද, දශරාග ලක්ෂණ, ගායන ශෛලීන්, ස්වර සංඛ්‍යාත, ගායකයන්ගේ ගුණදොස් ආදියත්, හින්දුස්ථානී තාල පදත්, කර්ණාටක සංගීතයේ තාල ගොඩ නැගෙන ආකාරයත් සවිස්තරාත්මක ව දක්වා ඇත.

- **පෙරදිග සංගීත ශාස්ත්‍රය - සංගීත විශාරද බී. එස්. විජේරත්න**

  මෙම ග්‍රන්ථය සංගීත විශාරද බී. එස්. විජේරත්න විසින් සම්පාදිත යි. දෙවන මුද්‍රණය 1968 දී සිදු කර ඇති අතර එවකට මිල රුපියල් 2.50කි. පිටු 95කි. හින්දු සමය, මුස්ලිම් සමය, ඉංග්‍රීසි සමය, ස්වාධීන සමය වශයෙන් යුග 4ක සංගීත ඉතිහාසය පිළිබඳ වත්, රාගධාරී සංගීතයේ සිද්ධාන්ත පිළිබඳ වත් කරුණු ඉදිරිපත් කර ඇත. ඊට අමතර ව ධ්‍රැපද් ධමාර් ආදි ගායන ශෛලීන් පිළිබඳ වත්, රාග විස්තර සහිත ශ්ලෝක ඉදිරිපත් කරමින් ප්‍රධාන රාග 10 පිළිබඳ වත් කරුණු දක්වා ඇත.

- **භාවික ගීත - සංගීත විශාරද වින්සන්ට් සෝමපාල**

  මෙම ග්‍රන්ථය සංගීත විශාරද වින්සන්ට් සෝමපාල විසින් සම්පාදිත යි. ප්‍රථම මුද්‍රණය 1973 දී සිදු කර ඇති අතර එවකට මිල රුපියල් 6. 50 කි. පිටු 72කි. ඛ්‍යාල ගීත රාශියක් නිර්මාණය කර එළි දක්වා ඇති මෙම ග්‍රන්ථය සිංහල පද මාලා සහිත රාගධාරී ගීත අධ්‍යාපනයට එක් කළ අතලොස්සක් පොත් අතරින් ප්‍රධාන තැනක් ගන්නා ග්‍රන්ථයකි. එසේ වනුයේ අදත් එම ග්‍රන්ථයේ ඇතුළත් ගීත පාසල් පද්ධතියේ භාවිත ව පවත්නා හෙයිනි. සපිරුණු රතියේ, (බිලාවල්) නිති විදිමූ සුමධුර (යමන්) ගාමිණී පැරකුම්, රමණීය සිරිසාර, (යමන්) රාග රසේ විඳිමු (බිහාග, රාගිනී බමාජ් පා,) සැපිරිසි දී නෙක (කාෆි) සිරිසාර අතිශාන්ත (කාෆි) සුරපති කන්ද කුමාර (කාෆි) සඳ පහනේ රැස් දහරේ (භීමපලාසි) සිරිමලියේ ඔබ කොහිද ගියේ (බ්‍රින්දාමනී සාරාංග) වන කෝකිල පංචම නාද ඇසේ (කාලිංගඩා) ගීත නාද ඇසේ මනහර, අගනා වූ සොඳ ශිල්ප (භෛරවී) රාවණ හෙළ මහ වීර පියාණනි (මාලකෞන්ස්) ජීවිතේ දුක දේ ය සැමදා (තෝඩි) යන ගී අද දවසේ ද පාසල් පද්ධතිය තුළ ගුරුභවතුන් සහ සිසු පරපුර අතර බෙහෙවින් ජනප්‍රිය ය. පැහැදිලි ස්වර ප්‍රස්තාරවලට අමතර ව එක් එක් ගීතයට වෙන වෙන ම සරල තානාලංකාර කිහිපයක් බැගින් ද ඇතුළත් කර තිබීම ප්‍රශංසනීය වේ.

- **ඛ්‍යාල ගීත - සංගීත විශාරද ආනන්ද ජයසිංහ**

  මෙම ග්‍රන්ථය සංගීත විශාරද ආනන්ද ජයසිංහ විසින් සම්පාදිත යි. ප්‍රථම මුද්‍රණය 1962 දී සිදු කර ඇති අතර එවකට මිල රුපියල් 2 . 50 කි. පිටු 63 කි. ඛ්‍යාල ගීත නිර්මාණය කර සිංහල පදමාලා ඇතුළත් කොට එළි දක්වා ඇති මෙම ග්‍රන්ථය ද පාසල් පද්ධතිය තුළ ජනප්‍රිය ග්‍රන්ථයකි. බැබළේ පුර හඳ පෝ දිනේ (භූපාලි) සඳරැස් ගලා යේ බොහෝ සේ (කාෆි) සාමෙන් ජීවිතේ පලේ දූනේවි (භාගේශ්‍රී) හෝ ගා නැග රැල මූදේ (බ්‍රින්දාමණී) හෝ හෝ ගා ගලනා සුන්දර වූ (භීමපලාසි) ඔබ ම ය සිරිපා රකින සුරින්දා (භෛරව) යන ගීත පාසල් පද්ධතිය තුළ බෙහෙවින් ජනප්‍රිය ය.

- **සංගීත සංහිතා - විමල් අභයසුන්දර**

  මෙම ග්‍රන්ථය විමල් අභයසුන්දර විසින් රචිත ය. මෙය සිංහලයෙන් රචිත සංගීත ග්‍රන්ථ අතර දැවැන්තයා මෙම ග්‍රන්ථය යි. මෙහි පිටු 1184කි. භාරතීය සංගීතයේ

ඉතිහාසය සහ විකාශය මෙම ග්‍රන්ථයෙන් වැඩි වශයෙන් දක්වා ඇත. තාන්සෙන්, නායක් ගෝපාල්, නායක් බෛජු, අදාරංග සදාරංග වැනි සංගීතඥයන් මෙන් ම සංගීතයට සේවාවක් කළ අක්බාර් වැනි රජවරුන් පිළිබඳ ව ද මෙම ග්‍රන්ථයේ ඇතුළත් ය. ඊට අමතර ව සංගීත සිද්ධාන්තමය කරුණු විස්තරාත්මක ව දක්වා තිබීම විශේෂත්වයකි.

- **සිංහල ගැමි නාටකය - මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර**

  මෙම ග්‍රන්ථය මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර විසින් සම්පාදිත යි. පළමු මුද්‍රණය සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව මඟින් 1968 දී ද, දෙවන මුද්‍රණය ජාතික අධ්‍යාපන ආයතනය මඟින් 1992 දී ද, සිදු කර ඇත. දෙවන මුද්‍රණයේ එවකට මිල රුපියල් 200.00කි. පිටු 255ක් වූ මෙම ග්‍රන්ථයේ අවසාන පිටුවල ඡායාරූප 38ක් පමණ ඇතුළත් කර ඇත. නාට්‍යයේ ලක්ෂණ, නාට්‍ය කලාවේ ප්‍රභවය, සිංහල නාට්‍යයේ සංස්කෘතික පසුබිම, සහ ශාන්තිකර්ම, සොකරි කෝලම්, නාඩගම්, රූකඩ, පාස්කු වැනි ගැමි නාටක පිළිබඳ වත්, සිංහල නාට්‍ය කලාවේ නූර්ති ආදියේ නවීන ස්වරූපය පිළිබඳ වත් විස්තරාත්මක කරුණු අන්තර්ගත ය. පාසල් පද්ධතිය තුළ මෙම ග්‍රන්ථය නර්තනය, නාට්‍ය හා රංග කලාව වැනි විෂයවලත් බෙහෙවින් ජනප්‍රිය ය.

- **හෙළ ගී මග - ඩබ්. බී. මකුලොලුව**

  මෙම ග්‍රන්ථය ඩබ්. බී. මකුලොලුව විසින් සම්පාදිතයි. ප්‍රථම මුද්‍රණය මහරගම සමන් මුද්‍රණාලය මඟින් 1962 දී පළ කොට ඇත. දෙවන මුද්‍රණය එවකට සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ ජන සංගීතය පිළිබඳ කථිකාචාර්ය සුමනදාස කෙන්දසිංහ සූරීන් ගේ සංස්කරණය හා සමඟ සංස්කෘතික අමාත්‍යාංශය මඟින් රු.280කට අලෙවි කර ඇත. පළමු මුද්‍රණයේ පිටු 139 කි. හෙළ ගී මග කතුවරයා එම ග්‍රන්ථය නිර්මාණය කළේ තුන් පිහිටක් පතා ගෙන බව එහි හැඳින්වීමේ දක්වා ඇත. එනම්, හෙළ හුරුව සමඟ දනට ඉතිරි ව පවතින පැරණි ගැමි නාද මාලා සමූහය නැසෙන්නට නොදී රැක ගැනීමත්, හෙළ ගායනා විධිමත් ක්‍රමයක පිහිටුවීම සහ සිංහල සංගීතයකට අඩිතාලම දැමීම යන ඉලක්ක තුන ය. මෙම යුගයේ මකුලොලුව සූරීන් සිංහල සංගීතයකට අඩිතාලම දැමීම සඳහා විවිධ බාධක මැද අභියෝගාත්මකව මුහුණ දුන්හ. එකල හින්දුස්ථානී රාගධාරී සංගීතය සහ ශ්‍රී ලංකා ජන සංගීතය යන මැයෙන් මෙරට සංගීතඥයෝ කණ්ඩායම් දෙකකට බෙදී කරට කර හැපෙමින් සංවාදාත්මක විවේචනයන්හි යෙදුණෝ ය. ඒ යුගයේ මකුලොලුව සූරීන්ගේ අදහස් සමාජයට ගලා ආවේ මෙම ග්‍රන්ථය මඟින් ය. මෙම ග්‍රන්ථය මඟින් ජන සංගීතයට ගැළපෙන සිද්ධාන්ත කොටස් වශයෙන් විරිත, ලඝු-ගුරු මාත්‍රා, ආඝාතාත්මක, අනාඝාතාත්මක, යති, යති නියමය, විරිත් වර්ගීකරණය, ග්‍රහ, පද්‍ය ආදී විෂය කරුණු ඉදිරිපත් කර ඇත. ඊට අමතර ව දේශීය තිත් තාල පද්ධතිය ගොඩ නැඟෙන විද්‍යාත්මක ප්‍රවේශයක් ද ඉදිරිපත් කර ඇත. තිත සහ තිත් ප්‍රභේද පිළිබඳ දීර්ඝ විස්තරයක් මෙම ග්‍රන්ථයේ ඇතුළත් ව ඇත. ග්‍රන්ථයේ දෙවන කොටස වශයෙන් ''හෙළ ගී තනු'' නමින් කුඩා ම විරිතේ සිට විශාලතම විරිත තෙක් විවිධ ජනගී රාශියක ප්‍රස්තාර ඉදිරිපත් කර ඇත. මීට අමතර ව ටීකා, වන්නම්, ප්‍රශස්ති, විරිඳු, ආදි ගී පිළිබඳ වත් ප්‍රස්තාර ඉදිරිපත් කර ඇත. ශ්‍රී ලංකා ජන සංගීත අධ්‍යාපනය සඳහා පාසල් පද්ධතිය තුළ මෙම ග්‍රන්ථය අදත් ගුරු කොට ගනියි. නර්තනය, නාට්‍ය හා රංග කලාව වැනි විෂයවලත් මෙය බෙහෙවින් ජනප්‍රිය ය.

- **ලංකාවේ සංගීත සම්භවය - සී. ද ඇස්. කුලතිලක**

  මෙම ග්‍රන්ථය සී. ද ඇස්. කුලතිලක විසින් සම්පාදිත යි. ප්‍රථම මුද්‍රණය ලේක්හවුස් සමාගම මඟින් 1974 දී සිදු කර ඇත. මෙම මුද්‍රණයේ එවකට මිල රුපියල් 19.75කි. පළමු මුද්‍රණයේ පිටු 215කි. මෙම ග්‍රන්ථයේ භාරතීය සංගීතයේ වර්ධනය හා විකාශය, රාවණ රජු සමයේ සංගීතය, අනුරාධපුර යුගය, පොළොන්නරු යුගය, දඹදෙණි යුගය ආදී වශයෙන් මෙරට සංගීතයේ වර්ධනීය අවස්ථා හා විවිධ බලපෑම්, පංචතූර්ය

වාදනය, කැටයම් සහ වාමන රූප, මඟින් හෙළි වන සංගීතමය තත්ත්වයන්, මහාවංශය, චූලවංශය වැනි වංශකථා මඟින් හෙළිවන සංගීතමය තොරතුරු, සංදේශ කාව්‍ය මඟින් හෙළිවන සංගීතමය තොරතුරු ආදිය ඇතුළත් වේ. විශේෂයෙන් 12 ශ්‍රේණියට නිර්දේශ කර ඇති ''මහනුවර යුගයේ ශ්‍රී ලංකාවේ සංගීතයේ විකාශය'' යන මාතෘකාවට අදාළ විෂය කරුණු මෙම ග්‍රන්ථයේ පිටු අංක 186-201 තෙක් ඇතුළත් වේ. මෙම ග්‍රන්ථය අදත් විශ්ව විද්‍යාලයයන්හි සහ පාසල් පද්ධතිය තුළ ඉතා ජනප්‍රිය ය. එ සේ ම සංගීතය පිළිබඳ විවිධ පර්යේෂණ කරන්නන්ට ද මෙම ග්‍රන්ථය බෙහෙවින් උපකාරී වේ.

අතිරේක උදවු:-

- උසස් පෙළ නිර්දේශයේ ඇතුළත් නොවන, එහෙත් සංගීත අධ්‍යාපනයේ වැදගත් තැනක් උසුලන, තම සංගීතමය ඥානය වර්ධනය කර ගැනීමට උනන්දු වන සිසු සිසුවියන් සොයා බලා කියවීමට සුදුසු ග්‍රන්ථ කිහිපයක් පහත දක්වේ. මෙම ග්‍රන්ථ නාමාවලිය කට පාඩම් කිරීමට හෝ ඇගයීම සඳහා ප්‍රශ්න ගොඩ නැගීමට හෝ නොවේ. **හුදෙක් සංගීත අධ්‍යාපනය ලැබීමට හෝ පර්යේෂණ කාර්යයන්හි යෙදීමට හෝ අත්වැලක් සඳහා පමණි.** පන්ති කාමරයේ වැඩි දුර අධ්‍යාපනය ලබා දීමටත්, සිසුන් ස්වයං අධ්‍යයනයට යොමු කිරීමටත් අවධානය යොමු කරන ගුරුභවතුන්හට මෙම ග්‍රන්ථ ලැයිස්තුව ගුණාත්මක යෙදවුම් මඟින් පුස්තකාලය සඳහා මිල දී ගැනීමට හෝ ඡායා පිටපත් ලබා ගැනීමට හෝ අත්වැලක් විය හැකි ය.
- පැරණි සංගීත ග්‍රන්ථ අතරින් කිහිපයක්.

  හෙළ මියැසිය - කුමාරතුංග මුනිදාස
  ශිෂ්ට ගීත - වින්සන්ට් සෝමපාල.
  ගීත විද්‍යා - වින්සන්ට් සෝමපාල
  ගීත සුබෝධිනී - පී. දොන් දයානන්ද මිය.
  ගීත ශික්ෂක (i,ii,iii) - ඇම්. ජී. පෙරේරා
  සංගීත ශික්ෂක - ඩබ්. සිරිල් පෙරේරා
- රාගධාරී සිද්ධාන්ත හා ගීත ප්‍රස්තාර ඇතුළත් ග්‍රන්ථ කිහිපයක්

  පාසල් ගී - වින්සන්ට් සෝමපාල
  රාග ඥානය - ආනන්ද ජයසිංහ.
  ගීත ගෝවින්දය - ජයදේව - (පරිවර්තනය - සුචරිත ගම්ලත්)
  අභිනව මූලික ගීත - ඩබ්.බී.මකුලොලුව.
  සංගීත ප්‍රවේශිකා - ශ්‍යාමලී කුසුම් පෙරේරා
  සරස සම්භව - අමරා රණතුංග
  English Dictionary of Ragadari Music - Shanthi Geethadewa
  අප්‍රචලිත හා නව නිර්මිත රාග - ශාන්ති ගීතදේව.
  රාගධාරී ප්‍රවීණ ගීත - ශාන්ති ගීතදේව.
  සම්භාව්‍ය සංගීත ප්‍රවේශිකා - ප්‍රේමදාස මුදුන්කොටුව.
  අභිනව ස්වර අභ්‍යාස මාලිකා - සුදත් සමරසිංහ.
  රාග ශික්ෂා - සුගතදාස මලල්ගොඩ
  ගාන්ධර්ව විද්‍යා - යෝගානන්ද බාලසූරිය
  සාරාංශ සංග්‍රහ - සඳගිරි සංකල්පනා
  සංගීත සම්භාවනා - දයා රත්නසේකර
- ජන ගී හා සම්බන්ධ ග්‍රන්ථ කිහිපයක්

  නැළවිලි ගී - ආනන්ද ජයසිංහ
  විශ්ව සංගීත ක්ෂේත්‍ර - සී. ද ඇස්. කුලතිලක.
  සිංහල ගී - ආනන්ද ජයසිංහ.
  හෙළ ගී වදුල - සුගතදාස මලල්ගොඩ
  ජන සංගීත සිද්ධාන්ත - සී. ද ඇස්. කුලතිලක

ප්‍රශස්ති කාව්‍ය රසය - ජේ.ඊ.සේදරමන්.

ජන සංගීත විමර්ශන, නැළවිලි ගීයෙන් නිරූපිත සිංහල ජනශ්‍රැතිය - ඉරංගා සමින්දනී වීරක්කොඩි

- නාට්‍ය ක්ෂේත්‍රය හා සම්බන්ධ ග්‍රන්ථ කිහිපයක්

    සිංහල නාඩගම් සංගීත සම්ප්‍රදාය - ජයන්ත අරවින්ද.

    සිංහල නාඩගම් ගීසරණිය - පුණ්‍යසේන ගුණසිංහ

    ශ්‍රී ලංකාවේ නාට්‍ය හා රංග කලාව - රෝලන්ඩ් අබේපාල

    සිංහල කෝලම් රංග සම්ප්‍රදාය - ගාමිණී දැල බණ්ඩාර.

    සිංහල නාඩගම් සම්ප්‍රදාය - ගාමිණී දැල බණ්ඩාර.

    සිංහල නාට්‍ය ඉතිහාසය - ඩී.වී.හපුආරච්චි

    පුරාණ සිංහල නාඩගම් පිටපත් (i,ii,iii, කාණ්ඩ) - සුනිල් ආරියරත්න

    නූර්ති ගීත ශතකය - ඇඹුල්දෙණියේ ලයනල් ගුණතිලක

    ස්වර ප්‍රස්තාර සහිත නූර්ති ගී - සංස්කෘතික දෙපාර්තමේන්තුව.

    වෙස්සන්තර, සිරිසඟබෝ, පද්මාවතී නාට්‍ය පිටපත්,-සංස්කෘතික දෙපාර්තමේන්තුව.

    නූර්ති......... (i,ii,iii, කාණ්ඩ) - මහාචාර්ය සුනිල් ආරියරත්න

    පුරාතන නාඩගමේ අද්‍යතන ස්වරූපය - නිශ්ශංක දිද්දෙනිය

- සංගීත විචාර හා සම්බන්ධ ග්‍රන්ථ කිහිපයක්

    සංගීතයේ හරය - ජයන්ත අරවින්ද.

    සංගීත සමීක්ෂා - ආනන්ද ජයසිංහ

    සංගීත විමර්ශන - දයාරත්න රණතුංග

    Sangeetha - Dayaratna Ranathunga

    Music Mind Theropy- Dayaratna Ranathunga

    සංගීතයේ සංචාරිකා - කෝලිත භානු දිසානායක

    අසිරි මියුරු සර - ආචාර්ය ලයනල් අල්ගම

    සෞන්දර්ය - මහාචාර්ය සුචරිත ගම්ලත්

    සංගීත අධ්‍යාපනයේ ගමන් මඟ - ඉරංගා සමින්දනී වීරක්කොඩි

- අපරදිග සංගීතය හා සම්බන්ධ මුල් යුගයේ ග්‍රන්ථ කිහිපයක්

    අපරදිග සංගීතඥයෝ - සත්‍යජිත් අන්ද්‍රාදි.

    සිංහලෙන් බටහිර සංගීතය - ලූතිනන් දන්වත්ත

    දේශීය භාවිත සංගීතය හා අපරදිග සංඝාත - සුමතිපාල සෝලංගආරච්චි

- වාදනය හා සම්බන්ධ ග්‍රන්ථ කිහිපයක්

    දිල්රුබා වාදිනි - අනංගලාල් අතුකෝරල

    ක්‍රමවත් එස්රාජ් වාදනය - සී ද ඇස් කුලතිලක

    පෙරදිග සංගීත වාදනය - බී.එස්.විජයරත්න.

    ස්වර පුවරු වාදන ශිල්ප ක්‍රම - චන්ද්‍රසිරි රණසිංහ.

    ස්වර පුවරු වාද්‍ය දීපනී - සුදත් සමරසිංහ

    වාද්‍ය සංකලන - සංගීත ශාස්ත්‍රපති අනිල් මිහිරිපැන්න

    සංගීත් - සඟරාව - අධ්‍යාපන අමාත්‍යාංශය.

- තබ්ලා සහ තාල වාදනය හා සම්බන්ධ ග්‍රන්ථ කිහිපයක්

    අභිනව තාලද්වාරය - ඩී.සී.කොඩිතුවක්කු (දොරේ)

දසතාල ලක්ෂණය - වින්සන්ට් සෝමපාල, තාල ඥානය - වින්සන්ට් සෝමපාල
සම්භාව්‍ය තාල දීපනී - ඩී. ආර්. පීරිස්. තිත - සරත් විජයවර්ධන
තබ්ලා වාදනය - රංග පෙරේරා තබ්ලාව - විජයරත්න රණතුංග

- සරල සංගීතය සහ ව්‍යාවහාරික සංගීතය හා සම්බන්ධ ග්‍රන්ථ කිහිපයක්

  මියැසි මිහිර, සංගීතයේ අත්තිවාරම, ගුවන් තොටිල්ල, මල් මිහිර, සුනිල් හඬ.

  දේශීය සංගීතය - සුනිල් සාන්ත
  ආනන්ද සමරකෝන් අධ්‍යයනය - සුනිල් ආරියරත්න
  බයිලා කපිරිඤ්ඤා - සුනිල් ආරියරත්න
  ග්‍රැමෆෝන් ගී යුගය - සුනිල් ආරියරත්න
  ගාන්ධර්ව අපදාන (i,ii,iii, iv, v කාණ්ඩ) - සුනිල් ආරියරත්න
  නාද සිත්තම් - ඩබ්.ඩී.අමරදේව
  පැරණි රසාංග - ඇඹුල්දෙණියේ ලයනල් ගුණතිලක
  සිංහල සරල ගී රාගධාරී පසුබිම - බී.වික්ටර් පෙරේරා
  සෞන්දර්ය විද්‍යා ඉතිහාසය - මහාචාර්ය සුචරිත ගම්ලත්
  ශ්‍රී ලංකාවේ කණ්ඩායම් සංගීතය - සුනිල් ආරියරත්න

  මෙම ග්‍රන්ථ ලැයිස්තුවට සාමාන්‍ය පෙළ / උසස් පෙළ ශ්‍රේණි සඳහා මෑත යුගයේ ඉදිරිපත් කළ සංගීත විද්වතුන්ගේ පොත් අන්තර්ගත නොවේ. සංගීත ග්‍රන්ථ විශාල ප්‍රමාණයක් මෙරට සංගීත ක්ෂේත්‍රයට එකතු වී ඇති අතර ඒ අතරින් කිහිපයක් මග හැරී තිබිය හැකි ය. සංස්කරණ ගුරු කාර්ය සැසිවල දී සාකච්ඡා කර ගුරුවරයාට සුදුසු පරිදි ඒවා සිසුන්ට හඳුන්වා දිය හැකිය.

ආචාර්ය ලයනල් එදිරිසිංහ සූරීන් අතින් සංගීතයට සිදු වූ සේවාව ද අම්ළය

1938 වසරේ දී භාත්ඛණ්ඩ සංගීත විද්‍යාලයය විසින් ප්‍රථම වරට පළ කරන ලද සඟරාවකට ලයනල් එදිරිසිංහයන් ලිපි දෙකක් ලියා ඇති අතර ඉන් 'ලංකාවේ සංගීතය' නමින් ඔහු ලියූ ලිපිය ශ්‍රී ලංකාවේ සංගීතය පිළිබඳ ලෝකයට හඬ ගා කියන්නකි. **1940 වසරේ දී ප්‍රථම පන්තියේ විශිෂ්ට සමර්ථ්‍යයක් සහිත ව සංගීත විශාරද අභිඥාන පත්‍රය හිමිකර ගත්තේ ය.** හින්දුස්ථානී සංගීත ගායනය මෙන් ම සිතාර් සහ සූර්බහාර් භාණ්ඩය පිළිබඳ අතිදක්ෂයෙකි. 1944 ඔක්තෝබර් 02 දින අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන සංගීත පරීක්ෂකවරයා ලෙස පත් විය. ප්‍රාථමික පන්තිවල සිට උසස් අධ්‍යාපනය තෙක් ගුරු විදුහල්, ලංකා ගාන්ධර්ව සභාව, වැඩිහිටි අධ්‍යාපනය තෙක් විෂය නිර්දේශ සකස් කිරීම එතුමන් අතින් සිදු විය. ජන සංගීත විෂය නිර්දේශ සැකසීමේ ආරම්භය සිදු වූයේ ද එතුමන් අතිනි. 1948 ලංකාවට නිදහස ලැබීමෙන් පසු පැවැත් වූ 'පැජන්ට් ඔප් සිලෝන්' නම් සංගීතමය වැඩසටහනේ සංගීත නිර්මාතෘවරයා ද මෙතුමා ය. මුල් කාලයේ 'ශ්‍රී ලංකා මාතා පලා යස මහිමා' නමින් ජාතික ගීයක් ද ඉදිරිපත් කර ඇත. සංගීත ගුරු පුහුණු විද්‍යාලයය ඇති කර ඇත. 1952 ජූලි 02 වන දින ශ්‍රී ලංකාවේ රජයේ සංගීත විද්‍යාලයය ආරම්භ කර එහි අධිපති ධුරයට පත් වූයේ ය. මෙය අද සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයය නමින් ප්‍රචලිත ය. ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ උපදේශකයකු ලෙස මුල් යුගයේ සිට කටයුතු කර ඇත. 1970 මාර්තු මස 02 වන දින ආචාර්ය උපාධිය මෙතුමාට හිමි වී ඇති අතර, 1986 ප්‍රථම ජනාධිපති සම්මාන උළෙලේ කලාසූරි සම්මානයෙන් පිදුම් ලැබීය. වර්තමානයේ මෙරට පවතින උත්තර භාරතීය රාගධාරී සංගීතයේ දියුණුවට කටයුතු කළ පුරෝගාමී පඬිරුවනක් ලෙස ආචාර්ය ලයනල් එදිරිසිංහයන්ගේ සේවය සදානුස්මරණීය බව ශ්‍රී ලංකාවේ විද්වතුන් විසින් පිළිගනු ලැබේ. (මීට අමතරව ගුරුවරයා විසින් සපයාගන්න. ලයනල් එදිරිසිංහ ශූරීන් පිළිබඳ තොරතුරුද ඇතුළත් කරගත හැකිය)

**ක්‍රියාකාරකම 19**

# සොකරි කෝලම් රංග ශෛලීන්

**නිපුණතාව 7.0 :** - ව්‍යාවහාරික සංගීතය සහ රංග කලා හා බැඳි සංගීතාංග පිළිබඳ අත්දැකීම් ලබයි. සංගීත නිර්මාණ කාර්යයේ අත්හදා බැලීම් කරයි.

**නිපුණතා මට්ටම7.1 :-** ශ්‍රී ලංකාවේ රංග සම්ප්‍රදායයන් පිළිබඳ තොරතුරු දක්වමින් ගීත ගායනයේ/වාදනයේ යෙදෙයි.

**ක්‍රියාකාරකම:** - සොකරි, කෝලම්, නූර්ති, නාඩගම් රංග සම්ප්‍රදායන් හඳුනා ගැනීම.

**ඉගෙනුම් පල :-**

- සොකරි, කෝලම්, සම්ප්‍රදායයන්හි ස්වභාවය හා රංග ශෛලිය හඳුනා ගනී.
- සොකරි, කෝලම්, රංග සම්ප්‍රදායයන්හි සංගීතයේ ස්වභාවය හඳුනාගනී.
- සොකරි,කෝලම්, රංග සම්ප්‍රදායයන් පිළිබඳ ව සංසන්දනයක් කරයි.
- නිර්මාණ සංගීතය සඳහා සොකරි, කෝලම්, රංග සම්ප්‍රදායයන්හි ගී තනු සුදුසු පරිදි යොදා ගැනීමට පෙලඹෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව:-** 04

**ගුණාත්මක යෙදවුම්:-** සොකරි හා කෝලම් සඳහා පළඳින වෙස්මුහුණු කිහිපයක ඡායාරූප, එම රංගන අවස්ථා දක්වෙන ඡායාරූප, සර්පිනාවක් හෝ යතුරුපුවරුවක්, උඩරට ගැට බෙරයක්/පහතරට යක්බෙරයක්, පටිගත කරගත් සොකරි හා කෝලම් නාද මාලා ආශ්‍රිත ව නිර්මාණය වී ඇති සරල ගීත කිහිපයක් (උදා:- සුනිල් එදිරිසිංහයන් ගයන ලෙංචිනා මගේ.... ගීතය හා **සපයා ගත හැකි නම් පමණක්** මහාචාර්ය සනත් නන්දසිරි සූරීන් ගයන සිනහ නඟන්නී ගීතය....) වසර 2009 12 ගුරුමාර්ගෝපදේශ සංග්‍රහයේ පිටු අංක 176-177 පිටු. ඡායා පිටපත් කළ 2008 වසරේ පෙරදිග සංගීතය 7 ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ පිටු අංක 127, 128, 132-134.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :-**

12 වන ශ්‍රේණියේ උගන්නා සිසු/සිසුවියනට සොකරි ශෛලිය පිළිබඳ ව 7 වන ශ්‍රේණියේදීත්, කෝලම් පිළිබඳ ව 9 වන ශ්‍රේණියේ දීත් සරල ආකාරයට පැහැදිලි කර දී ඇත. එහෙත් 12 වන ශ්‍රේණියේ දී සොකරි හා කෝලම් පිළිබඳ ව ඊට වඩා ගැඹුරකින් ඉගැන්වීම මෙහි අපේක්ෂාවයි. පාඩම ආරම්භ කරන දිනයට ප්‍රථම සොකරි කෝලම් රංග ශෛලීන් පිළිබඳ ව පහත දක්වෙන ශීර්ෂ ඔස්සේ, සිසුවා මීට පෙර අධ්‍යයනය කළ තොරතුරුද ඇසුරු කරමින්, පුස්තකාල පොත් පත් පරිහරණය කරමින් කරුණු රැස් කරගෙන පැමිණීමට උපදෙස් දෙන්න.

- කථා ප්‍රවෘත්තිය
- රංග ශෛලිය, සංගීත ශෛලිය,
- චරිත, ඇඳුම් පැලැඳුම්, රංග වස්ත්‍රාභරණ,
- රංග ගත කළ ස්ථානය
- ගතවන කාලය, වේදිකාව
- ගී තනුවල ස්වභාවය, සංගීත භාණ්ඩ
- ස්වර පරාසය
- අත්වැල් ගායනය
- සිසුන් සූදානම් කරගෙන ඇති කරුණු විමසමින් ගුරුවරයා ඉහත සඳහන් ශීර්ෂ ඔස්සේ පාඩම ගොඩ නඟන්න. එහි දී කරුණු පැහැදිලි කිරීම සඳහා ප්‍රවෘත්තිය ලංකාවේ පළාතෙන් පළාතට සුළු වශයෙන් වෙනස් වන බවත්, සමහර චරිතවලට වෙනත් නම් භාවිත කරන බවටත්, සමහර පළාත්වල

ගැටබෙරය වෙනුවට දවුල යොදා ගන්නා බවටත් දැනුම්වත් කරන්න. වෙස්මුහුණු භාවිතය කෝලම්වල සොකරිවලට වඩා සංකීර්ණ බව හා අලංකාරයෙන් යුක්ත බව සිසුන්ට පහදා දිය යුතු ය. චරිත හඳුන්වා දීම කෝලම්වල ප්‍රබල වේ. නාටක දෙකේ ම පළාත් බද ශාන්තිකර්මවල ආභාසයත්, උඩරට හා පහතරට නැටුම් සම්ප්‍රදායවල සමහර අංගත් ඇතුළත් ව ඇති බව ද අවධාරණය කරන්න. ඇමුණුමේ දක්වා ඇති තොරතුරු පදනම් කරගෙන ඔබ විසින් කියවීම් පත්‍රිකා සකස් කර ගන්න.

**පාඩම සංවර්ධනය**

- ඔබට සපයා ගත හැකි වූවා නම් මහාචාර්ය සනත් නන්දසිරි සූරීන් ගයන ''..සිනහ නඟන්නී ..'' ගීතය ශ්‍රවණයට සලස්වමින් පාඩමට පිවිසිය හැකි ය. එසේ නොවේ නම් සොකරි නාටකයේ ගීතයක කොටසක් ගයමින් පාඩමට පිවිසෙන්න. මෙහිදී ඔබ ගැයූ ගීතය පිළිබඳ ව සිසුන් විමසිය හැකි ය. ඇමුණුමේ i වන කොටසට අදාළ තොරතුරු පත්‍රිකාව සිසුන්ට බෙදා දෙන්න. සොකරි නාට්‍යයේ කථා පුවත සිසුන් හා සමඟින් සාකච්ඡා කරන්න. එම ක්‍රියාකාරකම් අංක 2හි සිසුන් යොදවන්න.

(කාල ඡේද 02)

- ඔබ සපයා ගෙන ඇති ලෙංචිනා මගේ..... ගීතය ශ්‍රවණයට සලස්වන්න. ඇමුණමේ සඳහන් කර ඇති කෝලම් ගීතයක කොටසක් ගායනය කර පෙන්වන්න. සිසුන් ගෙන් එම නාද මාලා දෙකෙහි ඇති සම්බන්ධතාව විමසන්න. ඇමුණුමේ ii වන කොටසේ දක්වෙන තොරතුරු පත්‍රිකාව සිසුන් අතර බෙදා දෙන්න. සිසුන් විසින් කලින් සූදානම් කරගෙන ඇති කරුණු ද සැලකිල්ලට ගනිමින් විෂය කරුණු පැහැදිලි කිරීමේ අත්වැලෙහි සඳහන් ශීර්ෂ ඔස්සේ පාඩම ගොඩ නඟන්න.

(කාලච්ඡේද 02)

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්:-

- සොකරි හා කෝලම් ශෛලීන්හි රංග ලක්ෂණ හා සංගීත විශේෂතා පිළිබඳ ව සංසන්දනාත්මක විග්‍රහයක් කිරීමට සලස්වා එය අගයන්න.
- කොලම්වල හා සොකරිවල අඩංගු ශාන්තිකර්ම අංග පෙළ ගසන්න සලස්වා එය අගය කරන්න.

අතිරේක උදවු:-

සිංහල ගැමි නාටකය - එදිරිවීර සරච්චන්ද්‍ර - පිටු අංක 85-110, 125-136.

ඇමුණුම i :- ( විෂය හා බැඳි කරුණු)

- ඡායා පිටපත් කළ 2009 වසරේ පෙරදිග සංගීතය 12 ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ පිටු අංක 176-177 පිටු මේ සඳහා යොදා ගත හැකි ය. හෙළ ගී මග (නව මුද්‍රණය) 57 පිටුව සොකරි කථා ප්‍රවෘත්තිය පිළිබඳ ව කෙටියෙන් මතක් කර දෙන්න. උඩරට පළාතේ දී ගැටබෙරය උපයෝගී කරගෙන ඇතත් වන්නි ප්‍රදේශයේ දී දවුල භාවිත කරන බවද දැනුම් දෙන්න. දැනට උඩරට ප්‍රදේශයේ ද සොකරි රඟ දැක්වීම ඉතා කලාතුරකින් සිදු වන නිසා මේ රංගනය අනුක්‍රමයෙන් වියැකී යන කලාවක් බව ද අවධාරණය කළ යුතු වේ.

ඇමුණුම ii :- ( විෂය හා බැඳි කරුණු)

- ඡායා පිටපත් කළ 2008 වසරේ පෙරදිග සංගීතය 7 ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ පිටු අංක 127, 128, 132-134, පිටු මේ සඳහා යොදා ගත හැකි ය. 2009 වසරේ පෙරදිග සංගීතය 12 ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ අංක 178-181 පිටු ද, මේ සඳහා යොදා ගත හැකි ය.
- ඔබ විසින් සකස් කරන ලද කෝළම් කථා පුවත සඳහන් කියවීම් පත්‍රිකා.
- හොරණෑව සහ පහතරට යක් බෙරය එක් වන එක ම රංගනය වන්නේ කෝලම් බව ද සිසුන් දැනුවත් කරන්න.

**ක්‍රියාකාරකම 20**

# සොකරි හා කෝලම් ගීත ගායනය

**නිපුණතාවය 7.0 :-** ව්‍යාවහාරික සංගීතය සහ රංග කලා හා බැඳි සංගීතාංග පිළිබඳ අත්දැකීම් ලබයි. සංගීත නිර්මාණ කාර්යයේ අත්හදා බැලීම් කරයි.

**නිපුණතා මට්ටම7.1 :-** ශ්‍රී ලංකාවේ රංග සම්ප්‍රදායයන් පිළිබඳ තොරතුරු දක්වමින් ගීත ගායනයේ/වාදනයේ යෙදෙයි.

**ක්‍රියාකාරකම:-** සොකරි හා කෝලම් ගීත ගායනය/වාදනය

**ඉගෙනුම් පල :-**
- සොකරි හා කෝලම් ගීත ගායනය/වාදනය කරයි.
- නිර්මාණ සංගීතය සඳහා සොකරි, කෝලම්, රංග සම්ප්‍රදායයන්හි ගී තනු සුදුසු පරිදි යොදා ගැනීමට පෙලඹෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව:-** 04

**ගුණාත්මක යෙදවුම් :-** සොකරි හා කෝලම් ගීත ඇතුළත් දෘශ්‍ය උපකරණ, සර්පිනාවක් හෝ යතුරුපුවරුවක්, ගැට බෙරයක්/යක් බෙරයක්,

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්:-**

මෙයට පෙර පාඩමේ දී සොකරි හා කෝලම් රංග ස්වභාවය පිළිබඳව අවබෝධයක් ඇති නිසා එම රංග ශෛලීන්ගේ ගීත කිහිපයක් ගායනය මේ කාල පරිච්ඡේදයේ දී සිදු කළ යුතු වෙයි. සොකරි ගී තනු සංකීර්ණ නොවන නිසා ඉගැන්වීම පහසුවේ. සොකරි ගීත ශ්‍රවණය සඳහා සපයා ගත හැකි වීම අපහසු නිසා ගුරුවරයා විසින් ම ගායනය කර දැක්වීම වඩාත් පහසුය. සොකරි ගීත කිහිපයක් ඇමුණුමේ නම් කර ඇත. ඔබට සුදුසු යැයි ගැළපෙන ගීත මේ සඳහා යොදා ගන්න. මේ ගීතවලට අමතර ගීත වේ නම් ඒවා භාවිත කිරීම වරදක් නොවේ.

**පාඩම සංවර්ධනය**

- ඇමුණුම් 1හි දක්වා ඇති සොකරි සඳහා නිර්දේශිත ගීතයක් ගායනය සඳහා තෝරා ගන්න. සුදුසු යතුරු පුවරුවක් උපයෝගී කර ගනිමින් තෝරා ගත් සොකරි ගීතය පන්තියට ගායනය/වාදනය කර පෙන්වන්න. සුදුසු ක්‍රම වේදයක් අනුගමනය කරමින් ගීතය ගායනයට/වාදනයට සිසුන් යොමු කරන්න. ගැටබෙරය වාදනය කළ හැකි සිසුවකුගේ සහය තාල තබා ගැනීම සඳහා උපයෝගී කර ගන්න.

  (කාලච්ඡේද 02)
- ඇමුණුම් 2හි දක්වා ඇති කෝලම් ගායනා සඳහා නිර්දේශිත ගීතයක් ගායනය සඳහා තෝරා ගන්න. යතුරු පුවරුවක් උපයෝගී කර ගනිමින් තෝරා ගත් ගීතය පන්තියට ගායනය/වාදනය කර පෙන්වන්න. කෝලම් ගායනයේ දී පහතරට බෙරය වාදනය කිරීම පිළිබඳ ව සිසුන් හා සාකච්ඡා කරන්න. සුදුසු ක්‍රම වේදයක් අනුගමනය කරමින් කෝලම් ගීතය ගායනයට/වාදනයට සිසුන් යොමු කරන්න.

  (කාලච්ඡේද 02)

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්:-
- සිසුන් කැමති සොකරි හා කෝලම් ගීත ගායනයට අවස්ථාව ලබා දී නිවැරදිව හා මිහිරිව ගැයූ/ වැයූ සිසුන් අගයන්න.

අතිරේක උදවු:-

සිංහල ගැමි නාටකය - එදිරිවීර සරච්චන්ද්‍ර - පිටු අංක 85-110, 125-136.

<u>ඇමුණුම 1</u>

සොකරි ගීත කිහිපයක්

♦පාට වරුණ පුත පරමණ්ඩල පුත - නුඹ නාඩන් පුත හරිරාරෝ
නින්ද තොටිල්ලේ නැළවෙන් මගේ පුත - නුඹ නාඩන් පුත හරිරාරෝ

♦ වෙදා නටන්නේ පළමු ව සබේට එන්නේ -යොදා කියන්නේ තාලෙට ගත වෙවුලන්නේ
කුදා වැනෙන්නේ සබයේ කොක් හඬලන්නේ - විදා පාන්නේ අත් දෙක තැගි කියන්නේ

සොකරී එන්නී සබයෙන් අවසර ගන්නී - නැටුම් නටන්නි තාලෙට රාග කියන්නී
පද අල්ලන්නී පියයුරු ළැම සොල්ලන්නී - කැඩපත ගන්නී සුරතින් මූණ බලන්නී

♦ලක්‍ෂ වටින මගෙ සොකරිට පයට ගිගිරි කොයි
ලක්‍ෂ දෙලක්‍ෂය දීලා ඇන්න ඇන්න දෙයි
ලක්‍ෂ වටින මගෙ සොකරිට කරට මාල කොයි
ලක්‍ෂ දෙලක්‍ෂය දීලා ඇන්න ඇන්න දෙයි

<u>ඇමුණුම 2</u>

කෝළම් ගීත

♦ බස්ම නම් අසුර රජුගේ - සොහොනෙ ඉපදුණේ
තිස් දහස් පිරිවර හට- රජ ව සිටිමිනේ
ඉක්මනින් ගෝධීම්බර සමග යුද වුණේ
දූන් ඉතින් ඔළුව නැතිව - නිදිද හිමියනේ
(සඳකිඳුරු කෝලම)

♦ආල වෙලා පියසේ පටන් මම - කෝළ නැති ව සබයේ මෙදූන්
බාල මෙමගෙ වැරදි නොගන් - මෙම රාළහමිලා මට ආයුබෝවන්

වරදක් ඇති මුත් මහතුනේ - එම වරදය සිතකට නො ම ගෙනේ
දියෙහි ඇඳපු ඉර සේ මෙනේ දොසැතොත් දුරලනු සබෙ මහතුනේ
(ජස පෙන්විනා කෝලම)

♦ගම්භිර කාලිංග නුවර නිරිඳුගේ වාසල තුලයට -
ඉන්න දනා සේම රජුට සෝදා පට පිළී සොඳට
ඉන් නරනා තැබූ නම මට පේඩි විදානේ සත්තට
මම් මෙතනට ආමි වියන් බඳිනට නරනිඳු එන විට
(ජස පෙන්විනා කෝලම)

- 2009 වසරේ පෙරදිග සංගීතය 12 ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ පිටු අංක 176-177 පිටු සහ අංක 178-181 පිටුද, මේ සඳහා යොදා ගත හැකි ය.

ක්‍රියාකාරකම 21

# දේස් රාගය ගයමු, වයමු

| | | |
|---|---|---|
| නිපුණතාව 1.0 | :- | සම්භාව්‍ය සංගීතයේ ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනා ගනිමින් ගායන වාදන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි. |
| නිපුණතා මට්ටම 1.2 | :- | උත්තර භාරතීය සංගීතයට අයත් රාග කිහිපයක ස්වභාවය සහ සම විෂමකම් හඳුනා ගනිමින් ගායනයේ / වාදනයේ යෙදෙයි. |
| ක්‍රියාකාරකම | :- | රාගධාරී ගී ගයමු වයමු. දේස් රාගය |
| කාලච්ඡේද සංඛ්‍යාව | :- | 18 |
| ඉගෙනුම් ඵල | :- | • දේස් රාගයේ ස්වර අභ්‍යාස ගායනය / වාදනය කරයි.<br>• දේස් රාගයේ ලක්ෂණ සහ ස්වභාවය විස්තර කරයි.<br>• දේස් සර්ගම් හා මධ්‍ය ලය ගී ගායනය / වාදනය කරයි.<br>• ආලාප හා මධ්‍යාලාප ගායනය / වාදනය කරයි.<br>• තානාලංකාර නිර්මාණය කරගනිමින් ගායනය / වාදනය කරයි. |
| ගුණාත්මක යෙදවුම් | :- | • තාම්පුරාව, සර්පිනාව, තබ්ලාව දෘශ්‍යාධාර |

විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක් :-

දේස් රාගයට අයත් ස්වර අභ්‍යාස සර්ගම් මධ්‍යලය ගී ආලාප, මධ්‍යාලාප, තානාලංකාර ප්‍රයෝගික ව ගායනය / වාදනය පුහුණු කිරීම මෙම ක්‍රියාකාරකමෙන් අපේක්ෂිත ය. මේ තුළින් රාග සංගති, රාග ස්වභාවය වර්ධනය වී නිර්මාණකරණයට ද අවස්ථාව ලැබෙනු ඇත.

මේ සඳහා දේස් රාගයට අයත් ස්වර අභ්‍යාස සර්ගම් මධ්‍ය ලය ගී ආලාප මධ්‍යාලාප තානාලංකාර පුහුණුව හා ඇගයීම සමඟ කාලච්ඡේද 18ක් යොදා ගත හැකි ය.

රාග ස්වභාවය මැනවින් විදහා දක්වෙන ගීත මේ සඳහා යොදා ගත හැකි ය. ගීත තෝරා ගැනීම සඳහා ඇමුණුමේ දක්වෙන ගීත යොදා ගත හැකි ය. වාදනය කරන සිසුන් සඳහා රාගාංග මැනවින් විදහා දක්වෙන වාදිතයන් යොදා ගත හැකි ය.

ශ්‍රැතිය ස්වර ස්ථාන, ස්වර සංගති, තාලය සහ මිහිරිතාව, රසභාවය පිළිබඳ ව වඩාත් සැලකිලිමත් වෙමින් පුහුණු කිරීමේ කාර්යයෙහි යොදවන්න.

මෙම නිපුණතා මට්ටම හා බැඳි ක්‍රියාකාරකම් අතරතුර දී හා අවසානයේ දී කරනු ලබන ඇගයීම් තුළින් සිසුන් ළඟා වී ඇති නිපුණතා මට්ටම පිළිබඳ සොයා බලා දුර්වලතා මගහරවා ගැනීමට අවශ්‍ය පියවර ගත හැකි ය.

පාඩම සංවර්ධනය :-

- පාඩම් අංක 04 භාගේශ්‍රී රාගයේ පාඩම සංවර්ධන ක්‍රියාකරකමේ පිළිවෙත අනුගමනය කරන්න.

(කාලච්ඡේද 18)

- දේස් රාගය හා සම්බන්ධ ඇමුණුම් යොදා ගන්න.

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :-

- මෙම නිපුණතා මට්ටම හා බැඳි සෑම ක්‍රියාකාරකමක් අතරතුර දී ශ්‍රැතිය, ස්වරස්ථාන, තාලය, මිහිරි බව පිළිබඳ ව නිරන්තර ඇගයීම් කළ යුතු ය.
- දේස් රාගයේ මධ්‍යලය ගීතය ආලාප තානාලංකාර සහිත ව ගායනය / වාදනය කරවා සුදුසු ලෙස අගයන්න.
- ප්‍රස්තාර කිරීම හා රාගයන්ගේ සුවිශේෂතා තහවුරු වීමට සුදුසු ඇගයීම් සකසා ගන්න.

මූලාශ්‍රය :- පාඩම් අංක 04

ඇමුණුම - අංක 01

**දේස් රාගය**

| | |
|---|---|
| මේලය | - ඛමාජ් |
| ආරෝහණ | ස රි, ම ප නි, ස̇ |
| අවරෝහණ | ස̇ නි̲ ධ ප, ම ග රි, ග ස |
| ජාතිය | සම්පූර්ණ සම්පූර්ණ |
| වාදි | රි |
| සංවාද | ප |
| මුඛ්‍යාංගය | රි ම ප, නි̲ ධ ප, ප ධ ප ම, ග රි ග ස |
| ගාන සමය | රාත්‍රි II ප්‍රහරය |

දේස් රාගයේ ආරෝහණ ගාන්ධාරය සහ ධෛවතය දුර්වල යි. වර්ජිත නොවේ. එම නිසා සම්පූර්ණ ජාති රාගයකි. උච්ච සප්තකයේ දී කෝමල ගාන්ධාරය විවාදි ස්වරයක් ලෙස යොදා ගනී.

(රි̇ ග̲̇ රි̇ ග̲̇ රි̇ ස̇)

අවරෝහණයේ දී රිෂභය වක්‍ර ව යෙදේ. (ම ග රි ග ස)

රිෂභය න්‍යාය ස්වරයකි. දේස් පූර්වාංගවාදී රාගයකි.

ආරෝහණයේ ශුද්ධ නිශාදයත් අවරෝහණයේ දී කෝමල නිශාදයත් යෙදේ.

රි ම ප, ප ධ ම ග රි, රි ප ම ග රි, රි ම ප ධ ම ග රි, ම ග රි ග ස

ම ග රි ග නි̣ ස, ම ප නි ස̇, රි ම ප නි ස̇, ප නි ස රි̇ නි̲ ධ ප

වැනි ස්වර සංගති නිතර යෙදේ.

නි̣ ස රි

නි̣ ස රි ම ග රි ග ස

නි̣ ස රි ම ප ම ග̇ රි ග ස

නි̣ ස රි ම ප ධ ප ම ග රි ග ස

නි̣ ස රි ම ප නි ධ ප ප ධ ප ම ග රි ග ස

නි̣ ස රි ම ප නි ස නි ධ ප ප ධ ප ම ග රි ග ස

නි̣ ස රි ම ප නි ස̇ රි̇ ස̇ නි ධ ප ප ධ ප ම ග රි ග ස

## සර්ගම්

**ස්ථායි**

| | | | |
|---|---|---|---|
| නි ධ ප ම | ග රි ග ස | රි රි ම ප | නි නි ස̇ |
| රි̇ ග̇ රි̇ ස̇ | නි ධ ම ප | ස̇ නි ධ ප | ම ග රි රි |
| රි ග රි ප | ම ග රි ස | ස̇ රි̇ ස̇ නි | ධ ප ම ප |
| 0 | 3 | x | 2 |

**අන්තරා**

| | | | |
|---|---|---|---|
| ම - ම ප | - ප නි - | නි ස̇ - ස̇ | ම̇ ග̇ රි̇ ස̇ |
| රි̇ ප̇ ම̇ ග̇ | ස̇ රි̇ නි̇ ස̇ | නි නි ස̇ රි̇ | ස̇ නි ධ ප |
| 0 | 3 | x | 2 |

- පහත දැක්වෙන ගීත අතුරින් කැමති මධ්‍යලය ගීතයක් තෝරාගත හැකි ය.

    1. රබගුණා ගායරේ තුමනා
    2. මේ හාරේ බන බන ඩාර ඩාර
    3. රමාපති රාම තුම්ර බව චරනා

ක්‍රියාකාරකම 22

# දේස් තිලක්කාමෝද් රාග යුගලයන්හි සමප්‍රකෘති බව

නිපුණතාවය 1.0 :- සම්භාව්‍ය සංගීතයේ ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනා ගනිමින් ගායන වාදන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම 1.2 :- උත්තර භාරතීය සංගීතයට අයත් රාග කිහිපයක ස්වභාවය සහ සම විෂමකම් හඳුනා ගනිමින් ගායනයේ / වාදනයේ යෙදෙයි.

ක්‍රියාකාරකම :- දේස් - තිලක්කාමෝද් යන රාග යුගලයන්හි සමප්‍රකෘති බව.

කාලච්ඡේද සංඛ්‍යාව :- 06

ඉගෙනුම් ඵල :-

- දේස් - තිලක්කාමෝද් යන රාග යුගලයන්හි සමප්‍රකෘති බව හඳුනා ගනී.
- දේස් තිලක්කාමෝද් රාගවල සම විෂමතා වගුගත කරයි.
- දේස් තිලක්කාමෝද් රාගවල ප්‍රධාන ස්වර සංගති ගායනය වාදනය කරයි.
- රාග ගායනයේ දී සමප්‍රකෘති රාග ඉගෙනීම අවශ්‍ය බව පිළිගනී.

ගුණාත්මක යෙදවුම් :- • තාම්පුරාව, සර්පිනාව, දෘශ්‍යාධාර

විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක් :-

දේස් තිලක්කාමෝද් යන රාග යුගලයේ ආරෝහණ අවරෝහණ ප්‍රධාන ස්වර සංගති, රාගාංග සහිත ස්වර අභ්‍යාස ප්‍රායෝගික ව ගායනය/වාදනය පුහුණු කිරීම මෙම ක්‍රියාකාරකමෙන් අපේක්ෂිත ය. ඒ තුළින් රාග ස්වභාවය, රාග සංගති පිළිබඳ මනා අවබෝධයක් ලැබෙන අතර රාග රස වින්දන ශක්තිය වර්ධනය වී, රාග දෙක අතර සම විෂමතා හඳුනා ගැනීමටත් රාග සංගති ගයා/වයා දැක්වීමටත් හැකියාව ලැබෙනු ඇත.

ඇමුණුමේ දැක්වෙන ස්වර අභ්‍යාස හෝ රාගාංග සහිත ඔබ සකසා ගත් ස්වර අභ්‍යාස මේ සඳහා යොදා ගත හැකි ය.

ශ්‍රැතිය, ස්වර ස්ථාන ස්වර සංගති සහ මිහිරි බව පිළිබඳ ව වඩාත් සැලකිලිමත් වෙමින් පුහුණු කිරීම් කරවන්න.

පාඩම සංවර්ධනය :-

- ඉගෙන ගත් දේස් රාගය මඟින් පාඩමට පිවිසීම කළ හැකි ය. දේස් රාගයට සමානතා ඇති තිලක්කාමෝද් රාගමය අංග පිළිබඳ අවධානය යොමු කරවන්න. තිලක්කාමෝද් රාගයේ ආරෝහණ අවරෝහණ ගායනය කරවන්න. එම රාගයේ ස්වර සංගති න්‍යාස ස්වර පිළිබඳ සාකච්ඡා කරන්න. ඇමුණුම් අංක 01 මේ සඳහා යොදාගත හැකි ය.

(කාලච්ඡේද 01)

- ඇමුණුම් අංක 02 ඇති ස්වර අභ්‍යාස හෝ තිලක්කාමෝද් රාගයේ රාගාංග හෝ යොදා ගනිමින් ඔබ සකසා ගත් ස්වර අභ්‍යාසය ගායනය වාදනය කරවන්න. රාගාංග සහ ප්‍රධාන ස්වර සංගති පිළිබඳ අවධානය යොමු කරවන්න.

(කාලච්ඡේද 02)

- ඉගෙන ගත් දේස් රාගයේ රාග විස්තර ස්වර සංගති සහ විශේෂ ලක්ෂණ

පිළිබඳ ව නැවත මතක් කරමින් ගායනය / වාදනය කරවන්න.

(කාලච්ඡේද 01)

- දේස් තිලක්කාමෝද් රාග දෙකේ සමප්‍රකෘති බව අවබෝධය ලැබෙන ලෙස ස්වර සංගති න්‍යාස ස්වර ගායනය වාදනය කරවන්න.

(කාලච්ඡේද 01)

- දේස් තිලක්කාමෝද් රාග යුගලයේ සම විෂමතා සාකච්ඡා කරන්න. පහත දැක්වෙන මාතෘකා අනුව සම විෂමතා ගොඩ නගන්න.
  - ආරෝහණ අවරෝහණ
  - ජාතිය
  - මේලය
  - වාදි සංවාදි
  - ගාන සමය
  - මුඛ්‍යාංගය
  - ප්‍රධාන ස්වර සංගති
  - න්‍යාස ස්වර
  - යෙදෙන ප්‍රකෘති විකෘති ස්වර
  - විවාදි ස්වර

(කාලච්ඡේද 01)

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :-

- ක්‍රියාකාරකම් අවසානයේ සිසුන් ළඟා වී ඇති නිපුණතා මට්ටම විමසා බලා දූර්වලතා මඟහරවා ගැනීමට උචිත ලෙස ඇගයීම් සංවිධානය කර ගත හැක.
- ක්‍රියාකාරකම් ආරම්භයේ සිට ම ශ්‍රැතිය ස්වර ස්ථාන, ස්වර සංගති, මිහිරි බව සඳහා නිරන්තර ඇගයීම් කළ යුතු වේ.

මූලාශ්‍රය :- Musicology of India - V. S. Nigam

ඇමුණුම් අංක 01

**රාග ලක්ෂණ**

| රාගය | ථාටය | ආරෝහණ අවරෝහණ | ජාතිය | වාදි | සංවාදි | මුඛ්‍යාංගය | ගානසමය |
|---|---|---|---|---|---|---|---|
| දේස් | ඛමාජ් | ස, රිමප, නිස<br>සනිධප, මගරි, ගස | සම්පූර්ණ | රි | ප | රිමප නිධප<br>ම ධ පම ගරිගස | රාත්‍රී දෙවන<br>ප්‍රහරය |
| තිලක්කා<br>මෝද් | ඛමාජ් | සරිගස, රිමපධ, මපස<br>ස,පධමග, සරිග,සනි | ෂාඩව | රි | ප | පනිසරිග,ස<br>රිපමග,සනි | රාත්‍රී දෙවන<br>ප්‍රහරය |

රාගයන්හි සුවිශේෂී ලක්ෂණ

| රාග | විශේෂ ස්වර සංගති | සුවිශේෂී ලක්ෂණ |
|---|---|---|
| දේස් | * නි, ස, රි | * ෂඩ්ජය මත න්‍යාස වේ. |
| | * ම ග රි | * ආරෝහණයේ දී ග, ධ දුර්වල වේ. |
| | * මපධ, මගරි / පධමගරි | * අවරෝහණයේ දී ෂඩ්ජය වක්‍ර ව යෙදේ. |
| | * රි ග ස | * පූර්වාංගවාදී රාගයකි. |
| | * රිමපධ, මගරි, ගනිස | * කෝමල ග විවාදි ලෙස යෙදේ. |
| | * රි ම ප නි සං / ම ප නි සං | (රිං ගු රිං) |
| | * ප නි සං රිං නි ධ ප | * ආරෝහණ ග ධ දුර්වල වන අතර වර්ජ්‍ය |
| | * නි සං රිං ගං - නි සං | නොවන නිසා සම්පූර්ණ ජාති රාගයකි. |
| | * සං නිධ ප | * සෝරට් අංග කලාතුරකින් යෙදේ. |
| | * රි ග නි ස | |
| තිලක්කාමෝද් | * සරිගස | * ග, ස, නි ස්වර මත න්‍යාස වේ. |
| | * පනිසරිග, සනි | * සංපධ මීන්ඩ් ලෙස යෙදේ. |
| | * රි ප ම ග, * රිමපධ මග | * පංචමය අවරෝහණයේ දී වක්‍ර ව යෙදේ. |
| | * සං ප ධ, මග | * පූර්වාංගවාදී රාගයකි. |
| | * සරිගසනි | * ඨුම්රි ගායනය සඳහා විශේෂ වූ රාගයකි. |
| | * රිමපධ මපසං | |
| | * ස නි ස | |

ඇමුණුම් අංක 02

## රාගය - තිලක්කාමෝද්

**ස්වර අභ්‍යාස**

1. ස රි ග ස, ස රි ම ග, ස රි ග ස

   ස රි ම ප ම ග, ස රි ග ස

   ස රි ම ප ධ ප ම ග ස රි ග ස

   ස රි මප ස̇ ස̇ ප ධ ප මග රි ස රි ග ස

   ස රි මප නි ස̇ රි̇ රි̇ ස̇ ප ධ ම ග රි, ස රි ග ස

   ස රි ම ප නි ස̇ රි̇ ග̇ ස̇ පධ ප ම ග රි ස රි ග ස

2. නි̣ ස රි ග ස

   නි̣ ස රි ම ග ස රි ග ස නි̣

   නි̣ ස රි ප ම ග ස රි ග ස නි̣

   නි̣ ස රි ම ප ධ ම ග ස රි ග ස නි̣

   නි̣ ස රි ම ප ස̇ ප ධ ම ග ස රි ස නි̣

   නි̣ ස රි ම ප නි ස̇ රි̇ නි ස̇ ප ධ ම ග ස රි ග ස නි̣

   නි̣ ස රි ම ප නි ස̇ රි̇ ග̇ ස̇ ප ධ ම ග ස රි ග ස නි̣

# තාන හා විවිධ තාන වර්ග හඳුනා ගනියි

| | | |
|---|---|---|
| නිපුණතාව 1.0 | :- | සම්භාව්‍ය සංගීතයේ ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනා ගනිමින් ගායන වාදන ප්‍රයෝගික හැකියා ප්‍රදර්ශනය කරයි. |
| නිපුණතා මට්ටම 1.3 | :- | සම්භාව්‍ය සංගීතයේ උසස් දක්ෂතා ප්‍රදර්ශනය කිරීමට උපයෝගී වන සංකල්ප පිළිබඳ ව අදහස් දක්වමින් ඒවා පිළිබඳ ව තමා තුළ ඇති ශිල්පීය ප්‍රාගුණ්‍යය ප්‍රදර්ශනය කරයි. |
| ක්‍රියාකාරකම | :- | තාන හා විවිධ තාන වර්ග |
| ඉගෙනුම් ඵල | :- | • තාන හා විවිධ තාන වර්ග හඳුනා ගනියි.<br>• තානාලංකාර ගායනය/වාදනය කරයි<br>• රාගවලට අයත් ස්වර සංගති අනුව විවිධ තාන නිර්මාණය කරයි. |
| කාලච්ඡේද | :- | 02 |
| ගුණාත්මක යෙදවුම් | :- | • සර්පිනාව, තබ්ලාව, තාම්පුරාව |

විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක්

- තාන සහ තාන වර්ග පිළිබඳ ව ප්‍රායෝගික හා සිද්ධාන්තමය වශයෙන් අවබෝධය ලබාදීම මෙම ක්‍රියාකාරකමෙන් අපේක්ෂිත ය.
- ශුද්ධ තාන, කූට තාන, මිශ්‍ර තාන, බෝල් තාන, ගමක් තාන අලංකාරික තාන වැනි විවිධ තාන වර්ග මෙම ක්‍රියාකාරකමට ඇතුළත් විය යුතු ය.
- නිවැරදි ව සටහනක් ගොඩනැගීමට මඟ පෙන්වන්න.

පාඩම සංවර්ධනය

- බාගේශ්‍රී, දේස් හෝ වෙනත් රාගයක මධ්‍යලය ගීතය හා තානාලංකාර ගායනය, වාදනය කර පාඩමට පිවිසෙන්න. ඒ ඔස්සේ තානාලංකාරවල ස්වභාවය හා වැදගත්කම සාකච්ඡා කරන්න. ඇමුණුම 01-1 කොටස ඇසුරෙන් ඔබ සකස් කළ කියවීම් පත්‍රිකා බෙදා දෙන්න. සිසුන් සැලසුම් කළ ක්‍රියාකාරකම්වල යොදවන්න. රාගවල ස්වර සංගති ඇසුරෙන් තානාලංකාර නිර්මාණය කර ගැනීමට මඟ පෙන්වන්න.

කාලච්ඡේද 01

- ඇමුණුම 11 කොටස ඇසුරෙන් සකසාගත් කියවීම් පත්‍රිකා බෙදා දෙන්න.
- තෝරාගත් රාගයකින් ශුද්ධ තාන, කූට තාන, අලංකාරික තාන නිර්මාණය කර ගැනීමට යොමු කරවන්න.

මිනිත්තු 10

- ඇමුණුම 11 කොටසට අදාළ බෝල්තාන්- ගමක් තාන් සඳහා සකසා ගත් කියවීම් පත්‍රිකා ඇසුරෙන් සැලසුම් කළ ක්‍රියාකාරකම්වල යොදවන්න. සිසුන් ස්වයං අධ්‍යයනයට යොමු කරන්න.

මිනිත්තු 30

ඇගයීම :- එක් එක් තාන වර්ගයට ප්‍රායෝගික ව නිදසුන් දක්වන්න.

පැවරුම :- මධ්‍යලය ගීතයක් විවිධ තාන වර්ග සහිත ව ගායනයට / වාදනයට සලස්වා අගයන්න.

අතිරේක පොත් :- සංගීත - ප්‍රේමවංශ හපුවලාන - සංගීත ප්‍රවේශිකා-ශ්‍යාමලී කේ . පෙරේරා

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් ඃ-

එක් එක් විෂය කොටස් අවසානයේ වාචික නැතහොත් කෙටි ලිඛිත ප්‍රශ්න මඟින් ඇගයීම කරන්න.

පැවරුම :- අධ්‍යයනය කළ මධ්‍යලය ගීතයක් විවිධ තානාලංකාර වර්ග සමඟ ප්‍රසංගාත්මක ව ගායනයට හෝ වාදනයට හෝ මඟ පෙන්වන්න. සුදුසු පරිදි අගයන්න.

මූලාශ්‍ර :-

සංගීත - ප්‍රේමවංශ හපුවලාන

සංගීත ප්‍රවේශිකා- ශ්‍යාමලී කේ පෙරේරා

සංගීත සංහිතා- විමල් අභයසුන්දර - පිටු අංක 497-501

රාගාලංකාරය - මහාචාර්ය සනත් නන්දසිරි

ඇමුණුම 01

I කොටස

I
- මධ්‍යලය ගීතවලට හා විලම්බ ලය ගීතවලට තානාලංකාර යොදාගනී.
- තානාලංකාර ගායනයෙන්/වාදනයෙන් පසු ගීතයේ මුඛඩාවෙන් තාලය හා සබඳ වීම.
- තානාලංකාර රාගාංග මූලික කරගෙන නිර්මාණය වන බව.
- විලම්භලය ගීතවල දී දෙ ගුණ, සිවු ගුණ, හය ගුණ, අට ගුණ, හෝ ඊට වැඩි ගුණයකින් යුත් තානාලංකාර යොදා ගනී.
- තානාලංකාර ගායනයෙන් / වාදනයෙන් ගායකයාගේ හෝ වාදකයාගේ ශිල්පීයත්වය, නිර්මාණශීලීත්වය, නිපුණත්වය පෙන්නුම් කරන බව
- වීණා, සිතාර්, සරෝද්, වයලින්, භාණ්ඩවලින් වයන තානාලංකාර ''තෝඩා'' නමින් හඳුන්වයි.

II 2007 11 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය පිටු අංක 25-29 දක්වා ඇති කොටස.

- **ශුද්ධ තානඃ-**

ආරෝහණ අවරෝහණ ස්වරූපය ඇති ව ගැයෙන, වැයෙන තානාලංකාර ශුද්ධ තාන වේ සපට් තාන, සරල තාන නමින් ද හඳුන්වයි.

- **කූට තානඃ-**

කූට තානවල දී වක්‍ර ව හා ඍජු ව ස්වර ගමන් කරයි. රාග දෙකක හෝ ඊට වැඩි ගණනක හෝ ස්වරූපය ඇති අවස්ථා ඇත. සරි, ගරි, ධප, මප, රිගමප, ලෙස උදාහරණ දැක්විය හැකි ය. ක්‍රමවත් නොවන අයුරින් ස්වර පිහිටීම මෙහි අර්ථය යි.

- **මිශ්‍ර තානः-**

  ශුද්ධ තාන සහ කූට තානයන්ගේ මිශ්‍ර වීම මිශ්‍ර තාන ලෙස හඳුන්වයි.

- **බෝල් තානः-**

  කිසියම් තානාලංකාරයක් ගීතයේ වචන පරිහරණය කරමින් ගයන විට එය බෝල් තාන නමින් හඳුන්වයි.

- **ගමක තානः-**

  ස්වරයන්ගේ කම්පනය හෙවත් ගමක ඇසුරෙන් ගයන වයන තානාලංකාර ගමක තාන නමින් හඳුන්වයි.

- **අලංකාරික තානः-**

  ස්වර අලංකාර ඇසුරු කරමින් ගායනා කරන තානාලංකාර අලංකාරික තාන නමින් හඳුන්වයි.

## රාගධාරී සංගීතයේ ශිල්ප ක්‍රම

නිපුණතාව 1.0 :- සම්භාව්‍ය සංගීතයේ ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනා ගනිමින් ගායන වාදන ප්‍රයෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම 1.3 :- සම්භාව්‍ය සංගීතයේ උසස් දක්‍ෂතා ප්‍රදර්ශනය කිරීමට උපයෝගී වන සංකල්ප පිළිබඳ අදහස් දක්වමින් ඒවා පිළිබඳ තමා තුළ ඇති ශිල්පීය ප්‍රාගුණ්‍යය ප්‍රදර්ශනය කරයි.

ක්‍රියාකාරකම :- රාගධාරී සංගීතයේ ශිල්ප ක්‍රම

ඉගෙනුම් ඵල :-
- රාගධාරී සංගීතයේ දී යොදා ගන්නා ශිල්ප ක්‍රම හඳුනා ගනියි.
- එම ශිල්ප ක්‍රම ප්‍රායෝගික ව ඉදිරිපත් කිරීමේ කුශලතාව ලබයි.
- ප්‍රසංගාත්මක ගායන - වාදනයක දී ශිල්ප ක්‍රමවල අවශ්‍යතාව පිළිගනී.

කාලයඃ- කාලච්ඡේද 08

ගුණාත්මක යෙදවුම් :-
- සර්පිනාවක් නැතහොත් ශ්‍රැති වාද්‍ය භාණ්ඩයක්
  වයලින්, එස්රාජ් වැනි ස්වර වාද්‍ය භාණ්ඩයක්.
  තබ්ලාව, ඇමුණුම 01. ශිල්පක්‍රම ඇතුළත් ගායන- වාදන කෘතියක්

විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක්

- හින්දුස්ථානි සම්භාව්‍ය සංගීතයේ ගායන වාදන ශෛලීන් සඳහා භාවිත කරන මීන්ඩ්, ගමක්, කන්, මූර්කි, උපජ්, ජලා මුඛඩා, තිහායි, චක්‍රදාර් යන සුවිශේෂී ශිල්ප ක්‍රම පිළිබඳ ව සිද්ධාන්ත සහ ප්‍රායෝගික වශයෙන් හඳුනා ගනිමින් ගායන වාදන ඉදිරිපත් කිරීමේ කුසලතාව වර්ධනය කිරීම මෙම ක්‍රියාකාරකම තුළින් මඟින් අපේක්‍ෂිත ය.
- ප්‍රවීණ ශිල්පීන්ගේ ගායනයන් වාදනයන් සවන් දීමෙන් මෙම ශිල්පාංගයන්ගේ ප්‍රායෝගික භාවිතය පිළිබඳ හොඳින් අධ්‍යයනය කළ හැකි ය.
- මේ සඳහා සූදානම් කරගත් CD, DVD භාවිත කළ හැකි ය. නැතහොත් මෙම ශිල්පාංගයන් ගායනය වාදනය කර දැක්වීමට ගුරු භවතාට හැකියාවක් තිබිය යුතු ය. මෙම ශිල්පාංග පිළිබඳ අවබෝධය ප්‍රායෝගික වශයෙන් ලබාදීම වැදගත් ය.

පාඩම සංවර්ධනය

- රාගධාරී සංගීතයේ ශිල්පාංග ඇතුළත් ගායනයක් හෝ වාදනයක් හෝ ඇසීමට සලස්වා පාඩමට පිවිසෙන්න. එහි යෙදෙන ශිල්පාංග පිළිබඳ ව සාකච්ඡා කරන්න.

  ඇමුණුම 01 කොටසට අදාළ ව ඔබ විසින් සකස් කරන ලද කියවීම් පත්‍රිකාව බෙදා දෙන්න. ප්‍රායෝගික ක්‍රියාකාරකම් මඟින් මීන්ඩ්, ශිල්පාංගය පැහැදිලි කරන්න. සිසුන් එම ක්‍රියාකාරකම්වල යොදවන්න.

(කාලච්ඡේද 01)

- ඇමුණුම 11 කොටසට අදාළ බෝල්තාන් - ගමක් තාන් සඳහා සකසා ගත් කියවීම් පත්‍රිකා ඇසුරෙන් සැලසුම් කළ ක්‍රියාකාරකම්වල යොදවන්න. සිසුන් ස්වයං අධ්‍යයනයට යොමු කරන්න.

මිනිත්තු 30

ප්‍රායෝගික ක්‍රියාකාරකම් මඟින් ගමක් ශිල්පාංග පැහැදිලි කරන්න. ඇමුණුම 11 කොටසට අදාළ ව ඔබ විසින් සකස් කළ කියවීම් පත්‍රිකාව බෙදා දී සිසුන් එම ක්‍රියාකාරකම්වල යොදවන්න. නිර්දේශිත රාගවලට ගමක් තාන් නිර්මාණය කර ගායනයට වාදනයට යොමු කරවන්න.

(කාලච්ඡේද 01)

- ඇමුණුමේ 111 කොටසට අදාළ ව ඔබ විසින් සකස් කළ කියවීම් පත්‍රිකා බෙදා දී ඛන් ස්වරවල ස්වභාවය හඳුනා ගැනීමට සහය වන්න. ඛන් ස්වර ඇසුරු කරමින් ගායනය වාදනය කරවන්න.

(කාලච්ඡේද 01)

- මූර්කි සහිත ගායනයක් හෝ වාදනයක් හෝ ශ්‍රවණයට සලස්වන්න. එහි එන මූර්කි කෙරෙහි අවධානය යොමු කරවන්න. ගුරුවරයාට හැකියාවක් ඇත් නම් මූර්කි ගායනය කර හෝ වාදනය කර හෝ පෙන්වන්න. ඇමුණුමේ iv කොටසට අදාළ ව ඔබ සකසාගත් කියවීම් පත්‍රිකාව ලබා දී සිසුන් ස්වයං අධ්‍යයනයෙහි හා ක්‍රියාකාරකම්වල යොදවන්න.

(කාලච්ඡේද 01)

- සූදානම් කරගත් ශාස්ත්‍රීය ගායනයක හෝ වාදනයක හෝ උපජ් කෙරෙහි අවධානය යොමු කරවන්න. ඇමුණුමේ v කොටසට අදාළ ව ඔබ සකසාගත් කියවීම් පත්‍රිකාව බෙදා දී උපජ් පිළිබඳ අධ්‍යයනයකට සිසුන් යොමු කරවන්න.

( කාලච්ඡේද 01)

- ඇමුණුමේ vi කොටසට අදාළ ව ඔබ සකසාගත් කියවීම් පත්‍රිකාව බෙදා දී  මුඛඩා පිළිබඳ අධ්‍යයනයකට සිසුන් යොමු කරවන්න. ඉගෙන ගත් මධ්‍ය ලය ගීත ඇසුරෙන් ක්‍රියාකාරකම්වල යොදවන්න.

(කාලච්ඡේද 01)

- රාගධාරී ශාස්ත්‍රීය වාදනයක් ශ්‍රවණයට සලස්වන්න. ජලා වාදනයේ ස්වභාවය සාකච්ඡා කරන්න. ඇමුණුමේ vii කොටසට අදාළ ව ඔබ සකසා ගත් කියවීම් පත්‍රිකාව බෙදා දී ජලා වාදනය පිළිබඳ අධ්‍යයනයකට සිසුන් යොමු කරවන්න. ඉගෙනගත් රාගයක ස්වර සංගති ඇසුරෙන් ක්‍රියාකාරකම්වල යොදවන්න.

(කාලච්ඡේද 01)

- රාගධාරී ශාස්ත්‍රීය ගායනයන් වාදනයන් ශ්‍රවණයට සලස්වා ජලා වාදනයේ ස්වභාවය සාකච්ඡා කරන්න. ඇමුණුමේ vii කොටසට අදාළ ව ඔබ සකසාගත් කියවීම් පත්‍රිකාව බෙදා දී ජලා වාදනය පිළිබඳ අධ්‍යයනයකට සිසුන් යොමු කරවන්න. ඉගෙනගත් රාගයක ස්වර සංගති ඇසුරෙන් ක්‍රියාකාරකම්වල යොදවන්න.

(කාලච්ඡේද 01)

ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- එක් එක් විෂය කොටස් අවසානයේ වාචික හෝ කෙටි ලිඛිත ප්‍රශ්නවලට පිළිතුර මඟින් අගයන්න.

පැවරුම :

සියලු ම ශිල්පාංග ආවරණය වන පරිදි ප්‍රසංගාත්මක ව ගායනයක් හෝ වාදනයක් හෝ සකස් කර ගැනීමට මඟ පෙන්වා සුදුසු පරිදි අගයන්න.

අතිරේක උදව් : සංගීත - ප්‍රේමවංශ හපුවලාන

පෙරදිග සංගීත ශාස්ත්‍රය- බී.එස්. විජයරත්න

සංගීතාංගි- මහාචාර්ය සනත් නන්දසිරි

ඇමුණුම : රාගධාරී සංගීතයේ ශිල්ප ක්‍රම

I කොටස

මීන්ඩ් :- එක් ස්වරයක සිට තවත් ස්වරයක් තෙක් හඬ නොකඩවා පවත්වා ගනිමින්, හඬ පාලනය කරමින් කරනු ලබන ගායනය වාදනය මීන්ඩ් නමින් හැඳින්වේ. මෙහි දී ස්වරයක සිට තවත් ස්වරයක් දක්වා හඬ නොබිඳී ගායනය වාදනය කිරීම සිදු වේ. රාග ගායන වාදනයෙහි දී, ස්වර ආරෝහණ සහ අවරෝහණ දෙපක්ෂයට ම උචිත හා අදාළ පරිදි මීන්ඩ් යොදා ගැනේ.

උදා :- තිලක්කාමෝද් රාගයෙහි ස ප භාගේශ්‍රී ධ ම මීන්ඩ් ස්වර සංගතිය. [සරෝද්, සාරංගී, වයලීන් වැනි භාණ්ඩයන්ගෙන් කෙරෙන මීන්ඩ් වාදනය 'සූත්' නමින් හැඳින්වේ.] ගායනය හා වාදන ශෛලීන්හි විවිධත්වය නිසා නම් දෙකකින් හැඳින්වුවත් ධ්වනියෙහි කිසි දු වෙනසක් නොවේ.

| | |
|---|---|
| බිහාග් රාගය | ග ම ග ස ස නි̣ ප |
| භාගේශ්‍රී රාගය | ස ම ම<u>ග</u>රිස     <u>ග</u> ම ධ ම |
| තිලක්කාමෝද් රාගය | ස̇ ප ධ ම ග |

II කොටස

ගමක් :- ස්වර විචිත්‍ර කරන, අලංකාරවත් කරන සැම ක්‍රමයකට ම සාමාන්‍යයෙන් ගමක යැයි කිව හැකි ය. හින්දුස්ථානී සංගීතයේ ස්වර කම්පනය කළ යුත්තේ වෙනත් ස්වරයන්ගේ ආධාරයෙනි. ඒ අනුව ස්වර චලනය කරමින් ගායනය කිරීම ගමක් යැයි හැඳින්විය හැකි ය. පැරණි ග්‍රන්ථවල ගමක 15ක් පිළිබඳ ව සඳහන් වේ. වර්තමානයේ හින්දුස්ථානී සංගීතයේ භාවිත වන 'තාන' ගායන වාදනයෙහි දී ගාම්භීර ප්‍රකෘතියෙන් යුතු ව හඬ ලෙළවා මිහිරි ලෙස ගැයීම ගමක් වේ.

| | |
|---|---|
| දේශ් රාගය | මමරිස නිස රිම  පපධපමගරි- |
| භාගේශ්‍රී රාගය | මමගුමමගුමම  ගුරිසනිධනිසම  ධධමධධමධධ |
| | ගුමමගු ගුරිස- |

III කොටස

බන් :- රාගයන්ගේ රස නිෂ්පත්තිය සඳහා ඇතැම් ස්වරයක් තවත් ස්වරයක අල්ප ස්පර්ශයක් ඇති ව භාවිත කරනු ලැබේ. මෙය බන් නමින් හැඳින්වේ. මෙය ගායනයේ දී මෙන් ම වාදනයේ ද යෙදේ. යම්කිසි ස්වරයකට පළමුවෙන් ලැබෙන ස්වරය හෝ පසු ව ලැබෙන ස්වරය හෝ 'බන්' වශයෙන් යොදාගත හැකි ය. මෙසේ ස්වර කිහිපයකට ඇතින් පිහිටි ස්වර වුව ද ස්පර්ශ කළ හැකි ය. එය කළ යුත්තේ මනා පුහුණුවකින් පසු ව ය. ස්වර ලියා දැක්වීමේ දී ප්‍රධාන ස්වරයට වම් පසින් අල්ප වශයෙන් ස්පර්ශ කරන ස්වරය ලියා දැක්විය යුතු ය. උදා $^{\text{ම}}$ප, $^{\text{ධ}}$ස, $^{\text{ග}}$රි, $^{\text{රි}}$ග

| | |
|---|---|
| භාගේශ්‍රී රාගය | $^{\text{ස}}$නි ස $^{\text{ස}}$මගුරිස |
| දේස් රාගය | |
| | ස $^{\text{ම}}$රි ම ප |
| ආශාවරී රාගය | |
| | ස $^{\text{ම}}$රි ම ප |

IV කොටස

මුර්කි :- කිසියම් ස්වරයක් එහි දෙපස ඇති ස්වර ඇසුරු කොට ගනිමින් චලනය කොට ගැයීම මුර්කි ලෙස හැඳින්වේ. බොහෝ විට මුර්කි ස්වර ලෙස යොදා ගනුයේ ස ම ප යන ස්වරය ය. මෙහිදී මුර්කි වන ස්වරය, මැදි කොට දෙපස ස්වර චලනය වේ. මුර්කි ස්වරය ලිවීමේ දී ස්වරය වරහන් තුළ යොදනු ලැබේ.

උදා :- (ස) සසරි(ස)නිප  ම - මමප(ම)ගම  ප - පපධපමප

IV කොටස

උපජ් :- රාගයක් ඉදිරිපත් කිරීමේ දී නිර්මාණාත්මකව ක්ෂණික ව ගොඩනගා ගන්නා නාද විග්‍රහ උපජ් ලෙස කෙටියෙන් හැඳින්වේ.

උදා :- කිසියම් ඛ්‍යාල් හෝ ගත් වාදනයක මුඛඩා කොටස විවිධ ආකාරයෙන් විවිධ නාද මාලාවලින් හෝ විවිධ ලයකාරීත්වයෙන් හෝ ඉදිරිපත් කිරීම.

VI කොටස

මුඛඩා ගීතයක හෝ වාදිතයක හෝ ආරම්භයේ සිට සමස්ථානයට ප්‍රවිෂ්ට වන තෙක් ගැයෙන කොටස මුඛඩා නමින් හැඳින්වේ.

VII කොටස

ජලා ද්‍රැත ඛ්‍යාල් ශෛලියේ වාදනයක අවසානයේ ජලා වාදනය කරයි. ජලා වාදනය කරනුයේ ද්‍රැත ලයෙනි. තාලානුකූල ලයාන්විත වාදනයකි.

මෙහි දී සෑම ස්වරයක් ම, ස්වර ඛණ්ඩයක් ම ආරම්භක ෂඩ්ජය මත පිහිටා සිටිමින් ප්‍රසංගාත්මක ව වේගයෙන් වාදනය කරයි. සිතාර්, බටනළා වැනි ඒ ඒ භාණ්ඩයන්ට විශේෂ වූ ජලා වාදන ශිල්ප ක්‍රම ඉතා මධුර වේ.

VIII කොටස

තිහායි :- මුඛඩාව හෝ නිශ්චිත ස්වර කොටසක් හෝ තෙවරක් ගායනය හෝ වාදනය හෝ කර දක්වමින් සමස්ථානයට පැමිණීම.

චක්‍රදාර් :- තිහායි සහිත වූ යම්කිසි පද කොටසක් තෙවරක් වාදනය කොට සංග්‍රහයට පැමිණීම.

ක්‍රියාකාරකම 25

# දේශීය තාල පද්ධතිය ගොඩ නැඟෙන අයුරු සහ දෙතිතට අයත් තිත් රූප

**නිපුණතාව 1..0** : සම්භාව්‍ය සංගීතයේ ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනාගනිමින් ගායන/වාදන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි..

**නිපුණතා මට්ටම 1.4** : තාලයේ ගති ලක්ෂණ පැහැදිලි කරමින් දේශීය සහ භාරතීය විවිධ තාල අතර ස්වභාවය හඳුනා ගනිමින් තාල නිරූපණය කරයි.

**ක්‍රියාකාරකම** : දේශීය තාල පද්ධතිය ගොඩ නැඟෙන අයුරු සහ දෙතිතට අයත් තිත්රූප

**කාලච්ඡේද සංඛ්‍යාව** : 04

**ඉගෙනුම් පල** :
- දේශීය තාල පද්ධතිය ගොඩ නැඟීමට ඉවහල් වන මත් ගණ නම් කරයි.
- දේශීය තාල පද්ධතිය තුළ සිද්ධාන්තමය පදනමක් ඇති බව පිළිගනියි.
- මත් ගණ තුන පදනම් කර ගනිමින් තිත්රූප ගොඩ නඟයි.
- දෙතිතට අයත් තිත්රූපවලට අදාළ බෙර පද නිරූපණය කර පෙන්වයි.

**ගුණාත්මක යෙදවුම්**:
- ඇමුණුමේ සඳහන් තොරතුරු හා බැඳි සකසා ගත් දෘශ්‍ය උපකරණ හෝ ඡායා පිටපත්.
- ඇමුණුමේ දක්වන පරිදි 2009 පෙරදිග සංගීතය 12 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ විෂය කරුණුවල සාරාංශ.
- දෙතිතට අයත් බෙර පද ප්‍රස්තාර කර සැකසූ දෘශ්‍ය උපකරණ.

**විෂයකරුණු පැහැදිලි කරගැනීමට අත්වැලක් :**

- තනිතිත හා එහි ප්‍රභේද පිළිබඳ ව මීට පෙර 6-11 ශ්‍රේණිවල දී සිසුන් අධ්‍යයනය කර ඇත. උසස් පෙළ සඳහා දෙතිතිට අයත් තිත් රූප නිර්දේශ කෙරේ. තිත් ක්‍රමය සහ තිත ගොඩ නැඟෙන අයුරු පිළිබඳ ව හෙළ ගී මග කතුවරයා පැහැදිලි විවරණයක් කර ඇත. එබැවින් හෙළ ගී මගෙහි දක්වෙන එම පරිච්ඡේදය ඡායා පිටපත් කර ගෙන ඉගෙනුම් උපකරණයක් ලෙස භාවිත කිරීම වඩාත් පලදායී වේ. සාමාන්‍ය විෂය කරුණු ප්‍රමාණයක් ඔබගේ පහසුව සඳහා මෙහි ඇමුණුමේ දක්වා ඇත.

**පාඩම සංවර්ධනය**

- තනි තිතේ තිත් රූප තුනට අදාළ ව සිසුන් සමඟ තාල ක්‍රියාකාරකමක යෙදෙන්න. එම තිත්රූපවල ඇති මත් ගණ නැතහොත් මත් කැටි විමසන්න. මූලික මත් ගණ තුන වූ මාත්‍රා දෙකේ, තුනේ සහ හතරේ මත් කැටි ඒකල ව යෙදෙන බව පැහැදිලි කරන්න. කලින් අධ්‍යයනය කර ඇති තනි තිතේ බෙර පද නැවත අතින් තාල තබා නිරූපණය කරවන්න.

  කාලච්ඡේද 01 යි.
- මූලික මත් ගණ තුන වූ මාත්‍රා දෙකේ තුනේ සහ හතරේ මත් කැටි එකිනෙක මිශ්‍ර කරමින් දෙතිත ගොඩ නඟන්න. ඒ ආකාරයෙන් තුන් තිත සහ සිවු තිත ගොඩ නැඟෙන අයුරු වගුවකින් දක්වන්න. එක් එක් තිත් රූපය නම් කරන අයුරු පැහැදිලි කරන්න.

  කාලච්ඡේද 01 යි.

- දෙතිතට අයත් තිත් රූපවලට අදාළ බෙර පද ප්‍රස්තාර කරවන්න. තිත් සංඥා යොදන අයුරු පැහැදිලි කරන්න. උඩරට, පහතරට, හා සබරගමු වශයෙන් දෙතිතට අයත් තිත් රූපවලට අදාළ බෙර පද ප්‍රස්තාර කරවන්න. එකිනෙක බෙර පදවල ඇති අවනද්ධාක්ෂරවල වෙනස්කම් දක්වන්න. ඊට හේතු විස්තර කරන්න.

කාලච්ඡේද 01 යි.

- දෙතිතට අයත් තිත් රූපවලට සමාන ව තාල රූප ගොඩ නැඟෙන හින්දුස්ථානී තාල පද ප්‍රදර්ශනය කර ප්‍රායෝගික ව සසඳන්න.

කාලච්ඡේද 01 යි.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- එක් එක් කාලච්ඡේදය අවසානයේ අධ්‍යයනය කළ විෂය කොටස් ඇසුරින් ප්‍රශ්නාවලියක් සකස් කර පිළිතුරු සැපයීමට උපදෙස් දෙන්න.

පැවරුම:-

- තිත් ක්‍රමය ගොඩ නැඟෙන අයුරු '' යන මැයෙන් ලිපියක් සකස් කරවන්න.

අතිරේක උදව් -

හෙළ ගී මග - ඩබ්. බී. මකුලොලුව - පිටු අංක 53 සිට 76 තෙක්

ඇමුණුම.

තනි තිතේ තිත් රූප තුනක් ගොඩ නැඟේ. සෑම විභාගයකට ම තෙයි ( / ) ලකුණ, සිසුන් ලවා යොදවන්න.

(1) 1 2 / 1 2 / 1 2 / 1 2 / - සුළු තනි තිත.

(2) 1 2 3 / 1 2 3 / - මැදුම් තනි තිත

(3) 1 2 3 4 / 1 2 3 4 / - මහතනි තිත.

දෙතිතේ තිත්රූප තුනක් ගොඩ නැඟේ. ( මත් ගණන අඩු විභාගවලට තිත් ( ^ ) ලකුණ ද, මත් ගණන වැඩි විභාගවලට තෙයි ( / ) ලකුණ ද, සිසුන් ලවා යොදවන්න.

(4) 1 2 / 1 2 3 / - සුළු මැදුම් දෙතිත.

(5) 1 2 / 1 2 3 4 / - සුළු මහ දෙතිත.

(6) 1 2 3 / 1 2 3 4 / - මැදුම් මහ දෙතිත.

ගණිතමය පදනමක් අනුව තුන් තිතේ තිත් රූප අටක් ගොඩනැඟේ. එහෙත් එක් තිත් රූපයක මාත්‍රා විභාග අපිළිවෙළට යෙදේ. අවනද්ධ වාදනයට නොගැළපේ. ගැළපෙන තිත් රූප වන්නේ කුඩා සංඛ්‍යාවන්ගෙන් යුක්ත විභාග ඉදිරියටත්, වැඩි මත් ගණනක් ඇති විභාග අගටත් යෙදෙන තිත් රූපයන් ය. එක් තිත් රූපයක මෙම තත්ත්වය බිඳී ඇත. පහත දැක්වෙන්නේ එම තිත් රූපය යි.

1 2 / 1 2 3 4 / 1 2 3 /

ගැළපෙන ඉතිරි තිත් රූප හත පහත දැක්වේ. (මත් ගණන අඩු විභාගවලට තිත් ( ^ ) ලකුණ ද, මත් ගණන වැඩි විභාගවලට තෙයි ( / ) ලකුණ ද, සිසුන් ලවා යොදවන්න.

(7) 1 2 / 1 2 / 1 2 3 /

(8) 1 2 / 1 2 / 1 2 3 4 /

(9) 1 2 3 / 1 2 3 / 1 2 3 4 /

(10) 1 2 / 1 2 3 / 1 2 3 /

(11) 1 2 / 1 2 3 4 / 1 2 3 4 /

(12) 1 2 3 / 1 2 3 4 / 1 2 3 4 /

(13) 1 2 / 1 2 3 / 1 2 3 4 /

සිවු තිතේ තිත් රූප 18 ගොඩ නැඟේ. එහෙත් තිත් රූප 6ක මාත්‍රා විභාග අපිළිවෙළට යෙදේ. අවනද්ධ වාදනයට නොගැළපේ. ගැළපෙන තිත් රූප නවයකි.

(14) 1 2 / 1 2 / 1 2 / 1 2 3 /

(15) 1 2 / 1 2 / 1 2 / 1 2 3 4 /

(16) 1 2 3 / 1 2 3 / 1 2 3 / 1 2 3 4 /

(17) 1 2 / 1 2 / 1 2 3 / 1 2 3 /

(18) 1 2 / 1 2 / 1 2 3 4 / 1 2 3 4 /

(19) 1 2 3 / 1 2 3 / 1 2 3 4 / 1 2 3 4 /

(20) 1 2 / 1 2 3 / 1 2 3 / 1 2 3 /

(21) 1 2 / 1 2 3 4 / 1 2 3 4 / 1 2 3 4 /

(22) 1 2 3 / 1 2 3 4 / 1 2 3 4 / 1 2 3 4 /

(23) 1 2 / 1 2 / 1 2 3 / 1 2 3 4 /

(24) 1 2 / 1 2 3 / 1 2 3 / 1 2 3 4 /

(25) 1 2 / 1 2 3 / 1 2 3 4 / 1 2 3 4 /

අවනද්ධ තාල වාදනයට අහිතකර තිත් රූප 7කි. ඒ අනුව

| | | |
|---|---|---|
| තනි තිතේ තිත් රූප | 3 | යි. |
| දෙතිතේ තිත් රූප | 3 | යි. |
| තුන්තිතේ තිත් රූප | 7 | යි. |
| සිවු තිතේ තිත් රූප | 12 | යි. |
| මේ අනුව ගැළපෙන තිත් රූප | 25 | කි. |
| නොගැළපෙන තිත් රූප | 07 | කි. |

මෙසේ තාල රූප නැතහොත් තිත් රූප 32 ක් ගොඩ නැඟේ.

'' දෙතිසක් තාල ගණන් ද
රාගත් එම ගණනින් ද
අබිනත් සූවිස්සෙන් ද
සවිදම් සිවු සැටකි''

- නෘත්‍ය රත්නාකරය - ජේ.ඊ.සේදරමන්

දෙතිතට අයත් බෙර පද

## සුළු මැදුම් දෙතිත

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| තිත් සංඥා | Λ | | / | | | Λ | | / | | |
| මාත්‍රා | 1 | 2 | 1 | 2 | 3 | 1 | 2 | 1 | 2 | 3 |
| උඩරට | දොං | - | ජිං | - | ත | ග | ත | දොං | - | ත |
| පහතරට | ගුං | - | දෙ | ග | ත | ගත් | - | ත | ගුං | - |
| සබරගමු | ජිං | - | ජි | මි | ත | තත් | - | ත | ක | ට |

| | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| තිත් සංඥා | Λ | | / | | | | Λ | | / | | | |
| මාත්‍රා | 1 | 2 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 1 | 2 | 3 | 4 |
| උඩරට | දොං | - | දොං | - | ජිං | - | ජිං | - | ග | ජි | ග | ත |
| පහතරට | දොං | - | දොං | - | ග | ත | ගත් | - | දිත් | - | ත | ක |
| සබරගමු | ජිං | - | ජි | මි | කි | ට | තත් | - | ත | රි | කි | ට |

| | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| තිත් සංඥා | Λ | | | / | | | | Λ | | | / | | | |
| මාත්‍රා | 1 | 2 | 3 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 4 |
| උඩරට | දොං | - | දොං | ජිං | - | ග | ත | ජි | ග | ත | දොං | - | ග | ත |
| පහතරට | ගුං | - | ද | ග | ති | ග | ත | ගත් | - | ත | ගු | දි | ගු | ද |
| සබරගමු | ජි | මිත් | - | තත් | - | කි | ට | ත | ක | ට | ජිං | - | ත | ක |

තිත් තාල රූප සමඟ හින්දුස්ථානී තාල සංසන්දනය.

- සුළු තනි තිත = ලාවණී තාලය
- මැදුම් තනි තිත = දාදරා තාලය
- මහ තනි තිත = ත්‍රිතාලය
- සුළුමැදුම් දෙතිත = කඩප් තාලය
- මැදුම් මහ දෙතිත = දීප්චන්දි තාලය
- දෙසුළු මැදුම් තුන් තිත = රූපක් තාලය

**ක්‍රියාකාරකම 26**

# තරානා ගීතයක් (මාල්කෞන්ස්) රාගය

නිපුණතාව 2.0 :- විශ්ව සංගීතයේ ස්වභාවය වටහා ගනිමින් විවිධතා ගවේෂණය කරයි.

නිපුණතා මට්ටම 2.2 :- භාරතීය සංගීතයේ විවිධතා පිළිබඳ විචාරාත්මක අදහස් දක්වමින් විවිධ ශෛලීන් ප්‍රායෝගික අධ්‍යයනට පෙලඹෙයි.

ක්‍රියාකාරකම :- තරානා ගීතයක් (මාල්කෞන්ස්) රාගය

කාලච්ඡේද සංඛ්‍යාව :- 04

ඉගෙනුම් පල :-
- තරානා ගායන ශෛලියේ විශේෂතා පිළිබඳ ව අදහස් දක්වයි.
- තරානා ගායන ශෛලිය පිළිබඳ අත්දැකීම් ලබයි.
- මාල්කෞන්ස් රාගයෙන් තරානා ගීතයක් ගයයි.

ගුණාත්මක යෙදවුම් :-
ශ්‍රැතියක් ස්වර වාද්‍ය භාණ්ඩයක්
තබ්ලාවක්
තරානා ගීතය ලියන ලද දෘශ්‍ය උපකරණය

විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක්

තරානා ගීතයක් ප්‍රායෝගික ව ගායනය කිරීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය. තරානා ගීතයක් ශ්‍රවණයට සැලැස්වීමට හැකි නම් සිසුන්ට ශ්‍රවණය මඟින් සෘජු අත්දැකීමක් ලබා දීමට හැකි වනු ඇත.

පාඩම සංවර්ධනය

- තරානා ගීතයක් ශ්‍රවණයට සලස්වා ඒ අනුව පාඩමට ප්‍රවේශය ලබාගන්න.

මිනිත්තු 20

- ගායනය සඳහා යෝජිත තරානා ගීතය ගයා වයා පෙන්වන්න.

කාලච්ඡේද 01

- සිසුන්ට කොටසින් කොටස ගායනයට හුරු කරවන්න.

කාලච්ඡේද 01

- ලය වැඩි කරමින් ගායනය කරවන්න. කාලච්ඡේද 01

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :-

තනි තනිව ගායනය කිරීමට සලස්වා ඇගැයීමට ලක් කරන්න.

මිනිත්තු 20

පැවරුම :- තරානා ගායන ශෛලිය පිළිබඳ තොරතුරු ඇතුළත් පත්‍රිකාවක් සකස් කරන්න.

අතිරේක උදව් :- භාරතීය ගායන ශිල්පීන් විසින් ගයන ලද තරානා ගීත ශ්‍රවණයට සලස්වන්න.

**ඇමුණුම් අංක 1**

මාල්කෞන්ස් රාගය තරානා ගීතය

| | x | | | | 2 | | | | 0 | | | | 3 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ස්ථායි | | | | | | | ස | නි | සම | ගම | ග | ස | – | ස | ධ | නි |
| | | | | | | | ත | න | නාS | දිරි | දිරි | දීS | Sම් | තS | දෙ | රෙ |
| | ස | – | ම | ග | ම | – | ස | නි | සම | ගම | ග | ස | – | ස | ධ | නි+ |
| | දා | S | නි | S | S | S | ත | න | නා | දිරි | දිරි | දීS | Sම් | තS | දෙ | රෙ |
| | ම | ධ | නි– | ධ– | මනි | ධම | ස | නි | | | | | | | | |
| | ත | දී | Sම් | තS | දීS | ම් | ත | න | | | | | | | | |
| අන්තරා | | | | | | | | | ගග | ගග | ම– | ම– | ධධ | ධධ | නි | නි |
| | | | | | | | | | දිරි | දිරි | දාS | නි | තුම් | දිරි | දා | නි |
| | නි | සं | –– | –සं | ගं | නි | සं | සं | ධනි | සंනි | මं– | ගं– | සं | නි– | ධ | ධ |
| | ත | දී | Sම් | තS | දී | ම් | ත | න | දී | SS | Sම් | තS | දී | S | ම් | ත |
| | ම | ධ | නි– | ධ– | ම | ම | ස | නි | | | | | | | | |
| | ත | දි | ය | නා | S | දෙ | රෙ | න | | | | | | | | |

ක්‍රියාකාරකම 27

## ස්වර පුවරු භාණ්ඩ වාදනය

නිපුණතාව : 3.0 වාද්‍ය භාණ්ඩයන්හි ස්වරූපය වටහා ගනිමින් වාදන හැකියා ප්‍රදර්ශනය කරයි

නිපුණතා මට්ටම : 3.1 රාගධාරී සංගීතයට අදාළ උසස් ගායනයක් වාදනයක් ඉදිරිපත් කිරීම සඳහා වර්ධනය කර ගත යුතු මූලික ගුණාංග ප්‍රායෝගික ව අධ්‍යයනය කරයි.

ක්‍රියාකාරකම 3.1.1 ස්වර පුවරු භාණ්ඩ වාදනය

කාලච්ඡේද සංඛ්‍යාව : 04

ඉගෙනුම් පල

- ස්වර පුවරු භාණ්ඩ Chord සමග වාදනය කළ යුතු බව දැන ගනියි.
- ස්වර පුවරු භාණ්ඩ Chord සමග වාදනය කරයි.
- ස්වර පුවරු භාණ්ඩ Chord සමග වාදන කිරීමෙන් වාදනය රසවත් වන බව හඳුනාගනියි.

ගුණාත්මක යෙදවුම් : ස්වර පුවරු වාදන භාණ්ඩ

විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැල

උසස් පෙළ සිසුනට ගැළපෙන අයුරින් මෙම පාඩම සකසා ගත යුතු ය. සිසුන් Chord සමග ගීත වාදන පුගුණ කළ යුතු බැවින් මෙම පාඩම සඳහා අවශ්‍ය වනුයේ ඕර්ගන් ය. 11 වසරේ දී මූල් chord භාවිතයෙන් ගීත වාදනය කර ඇති බැවින් 12 වසරේ දී එහි පියවර කිහිපයක් ඉදිරියට තබමින් C Major scaleහි භාවිත chord භාවිතයට මඟ පෙන්වා ඇත. ඒ සඳහා ඇමුණුම 1 භාවිත කරන්න. එහි ඇති ක්‍රියාකාරකම සිසුන් අතට පත් කිරීමට පෙර ඒ පිළිබඳ මනා අවබෝධයක් හා පුහුණුවක් ඔබ විසින් ලබා තිබීම අත්‍යවශ්‍ය ය.

ඇමුණුම 1හි ඇතුළත් අභ්‍යාසයන්ට අමතර ව එහි පියවර 5 දෙවන කොටස සඳහා ඔබ සිසුනට ගැළපෙන ගීත ප්‍රස්තාර තෝරා දෙන්න.

පාඩම සංවර්ධනය

- ඔබ විසින් නිර්මාණශීලීව සකසා ගත් උපක්‍රමයක් මඟින් ප්‍රවේශ වන්න.
- ගීතය සමග chord වාදනය කිරීමෙන් ඇති වන මිහිර පිළිබඳ ව සාකච්ඡා කරන්න.
- ඇමුණුම 1 සිසුන් අතට පත් කොට එය පුහුණුවීම සඳහා මඟ පෙන්වන්න.

(කාලච්ඡේද 2)

- ඔබ විසින් ක්ෂණික ව නිර්මාණය කරන ලද විවිධ ස්වර කාණ්ඩ හතරකට Chord යොදා වාදනය කිරීමට සලස්වා සිසුවා ග්‍රහණය කොට ඇති ප්‍රමාණය මැන අවශ්‍ය උපදෙස් ලබා දෙන්න. ( කාලච්ඡේද 02).

ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස්

ඉහත පියවර තුනෙහි ඇතුළත් තත්ත්වයන් තව දුරටත් ඇගයීමකට හැකි පරිදි ඇගයීම සකසා ගත යුතු ය.

අතිරේක උදවු

පොත්පත් හා වීඩියෝ දර්ශන

ඇමුණුම 01

පියවර 01

පහත දී ඇති ස්වර ප්‍රස්තාරයට ඉහත වගු ඇසුරින් chord යොදා ඔබගේ ගුරුතුමා හෝ තුමිය හෝ ලවා හරි වැරදි සලකුණු කර ගන්න. (ඔබ පළමු වාරයේ දී අධ්‍යයනය කළ වගු පරිශීලනය කර family හා Relative chord භාවිතයට ගන්න.)

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ස | – | ස | – | රි | – | නි̣ | – | ම | – | ග | – | ම | ප | ධ | – |
| ම | – | ග | රි | රි | නි̣ | රි | ම | ග | ප | – | නි | රි̇ | – | – | – |
| ප | ධ | ප | ම | ස̇ | – | ධ | – | ග | – | ම | ග | ප | ප | ධ | – |
| ග | – | – | ධ | රි̇ | – | නි | – | ම | – | ග | – | රි | ධ̣ | ස | – |

පියවර 02

''නිල් අහස් තලේ......'' ගීතයට ද ඉහත අයුරින් chord යොදන්න.

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ග | - | ම | ප | - | ග | ම | - | ග | රි | - | - |
| ග | - | ම | ප | - | ධ | නි | - | - | - | - | - |
| ධ | - | නි | ස̇ | - | ධ | ප | - | මග | රි | - | - |
| ප | - | රි | ග | - | රි | ස | - | - | - | - | - |

ක්‍රියාකාරකම 28A

# ස්වර වාද්‍ය භාණ්ඩයකින් අද්‍යතන සරල ගීතයක් හෝ රාගධාරී සංගීතාංගයක් හෝ වාදනය

නිපුණතාව 3.0 :- වාද්‍ය භාණ්ඩයන්හි ස්වරූපය වටහා ගනිමින් වාදන හැකියා ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම 3.1 :- රාගධාරී සංගීතයට අදාළ උසස් ගායනයක් වාදනයක් ඉදිරිපත් කිරීම සඳහා වර්ධනය කර ගත යුතු මූලික ගුණාංග ප්‍රායෝගික ව අධ්‍යයනය කරයි.

ක්‍රියාකාරකම :- ගායනය ප්‍රධාන කර ගත් සිසුන් සඳහා තෝරා ගත් ස්වර වාද්‍ය භාණ්ඩයකින් අද්‍යතන සරල ගීතයක් හෝ රාගධාරී සංගීතාංගයක් හෝ වාදනය නැතහොත් තබ්ලාව වාදනය (කායදා පල්ටා මුඛඩා)

කාලච්ඡේද සංඛ්‍යාව 04

ඉගෙනුම් පල

- තෝරා ගත් වාද්‍ය භාණ්ඩයෙන් වාදනය කළ යුතු කොටස් වෙන්කර ගනියි.
- වාදනය සඳහා කැමැත්ත පළ කරයි.
- නියමිත කොටස් වාදනය කරයි.

ගුණාත්මක යෙදවුම්

- ගීත ප්‍රස්තාර
- ඔබ විසින් නිර්මාණය කර ගන්නා ලද ගී පද පේළියක පද හා ස්වර වෙන වෙන ම ලියූ දෘශ්‍ය උපකරණ දෙක.
- රාගධාරී වාදනයන්හි ප්‍රස්තාර.
- සිසුන් වයන වාද්‍ය භාණ්ඩ.

විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්

සිසුන් ස්වර වාද්‍ය භාණ්ඩ පිළිබඳ ප්‍රායෝගික පුහුණුව පළමු වාරයේ දී කාලච්ඡේද 4ක් තුළ ලබා ඇත. එම ප්‍රායෝගික පුහුණුව තව දුරටත් සංවර්ධනය කරමින් මෙම කාලච්ඡේද 4 තුළ ක්‍රියාකාරකම් යොදා ගන්න.

ක්‍රියාකාරකම 28B

# තබ්ලාව වාදනය

නිපුණතාවය 3.0 :- වාද්‍ය භාණ්ඩයන්හි ස්වරූපය වටහා ගනිමින් වාදන හැකියා ප්‍රදර්ශනය කරයි

නිපුණතා මට්ටම 3.1 :- රාගධාරී සංගීතයට අදාළ උසස් ගායනයක් වාදනයක් ඉදිරිපත් කිරීම සඳහා වර්ධනය කර ගත යුතු මූලික ගුණාංග ප්‍රායෝගික ව අධ්‍යයනය කරයි.

ක්‍රියාකාරකම : තබ්ලාව වාදනය

කාලච්ඡේද සංඛ්‍යාව : (ඉදිරි පාඩමේ ඇති කාලච්ඡේද සංඛ්‍යාව ම මෙම පාඩමට ද යොදා ගැනේ.)

ඉගැනුම් පල :
- ශාස්ත්‍රීය තබ්ලා වාදනයක ස්වභාවය මූලික ව හඳුනාගනියි.
- කායදා පල්ටා තිහායි හා මුඛඩාවල ආකෘතිය හා අන්තර්ගත ලක්ෂණ හඳුනාගනියි.
- කායදා පල්ටා තිහායි හා මුඛඩාවල වාදන ශිල්ප විධි හඳුනාගනියි.

ගුණාත්මක යෙදුම් : තබ්ලා වාදන ඇතුළත් ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ. කියවීම් පත්‍රිකා.

විෂය කරුණු පැහැදිලි කරගැනීමට අත්වැලක් :

සිසුන් තබ්ලා වාදනය පිළිබඳ ප්‍රායෝගික පුහුණුව පළමු වාරයේ දී කාලච්ඡේද 4ක් තුළ ලබා ඇත. එම ප්‍රායෝගික පුහුණුව තව දුරටත් සංවර්ධනය කරමින් මෙම කාලච්ඡේද 4 තුළ ක්‍රියාකාරකම් යොදා ගන්න.

ක්‍රියාකාරකම 29

## වාදනය කරනු ලබන භාණ්ඩයේ ස්වර පිහිටීම, ව්‍යූහය, කොටස් පිළිබඳ දැනුම.

නිපුණතාව 3.0 වාද්‍ය භාණ්ඩයන්හි ස්වරූපය වටහා ගනිමින් වාදන හැකියා ප්‍රදර්ශනය කරයි

නිපුනතා මට්ටම 3.1 රාගධාරී සංගීතයට අදාළ උසස් ගායනයක් වාදනයක් ඉදිරිපත් කිරීම සඳහා වර්ධනය කර ගත යුතු මූලික ගුණාංග ප්‍රායෝගික ව අධ්‍යයනය කරයි.

ක්‍රියාකාරකම වාදනය කරනු ලබන භාණ්ඩයේ ස්වර පිහිටීම, ව්‍යූහය, කොටස් පිළිබඳ දැනුම.

කාලච්ඡේද සංඛ්‍යාව 02

ඉගෙනුම් පල

- වාද්‍ය භාණ්ඩයන්හි ස්වර පිහිටීම ව්‍යූහය හා කොටස් නම් කරයි.
- වාද්‍ය භාණ්ඩයන්හි ස්වර පිහිටීම ව්‍යූහය හා කොටස් හඳුනා ගැනීම මඟින් තමාගේ භාණ්ඩය පිළිබඳ ඇල්ම වර්ධනය වෙයි.
- වාද්‍ය භාණ්ඩයන් හි ධ්වනි ගුණයෙහි ගුණාත්මක බව වැඩි කිරීමට බලපාන හේතු පැහැදිලි කරයි.

ගුණාත්මක යෙදවුම්

- සංගීත ගුරු භවතා විසින් සකසන ලද දෘශ්‍යාධාරය.
- සිසුන් වයන වාද්‍ය භාණ්ඩ.

විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැල

මෙම පාඩම සාමාන්‍ය පෙළ පන්තියේ දී ඉගෙන ගෙන ඇතත් උසස් පෙළට ගැළපෙන පරිදි නැවත මතක් කර දීම මෙයින් අපේක්ෂිත ය. මෙය මඟ හැරී තිබූ සිසුවෙක් වේ නම් ඔහු හෝ ඇය ද එම දැනුම සම්පූර්ණ කරනු ඇත.

6, 7 ශ්‍රේණිවල දී සංගීත භාණ්ඩවල ස්වර පිහිටන අයුරු සහ ඒවායේ කොටස් පිළිබඳ සිසුන් මේ වන විටත් අධ්‍යයනය කර ඇත. එම දැනුම ඇසුරින් මෙම පාඩමට අවශ්‍ය දත්ත සපයා ගනිමින් උසස් පෙළ සිසුනට ගැළපෙන පරිදි සැකසූ දෘශ්‍ය උපකරණ මඟින් මෙම දැනුම සිසුන් වෙත සම්ප්‍රේක්ෂණය කළ හැකි ය. සිසුවා වයන භාණ්ඩය පිළිබඳ ව සුවිශේෂ දැනුමක් ලැබෙන පරිදි පාඩම පෝෂණය වීම අත්‍යවශ්‍ය ය. විශේෂයෙන් වයලීනය, සිතාරය, එස්රාජය, ගිටාරය, ඉංග්‍රීසි මැන්ඩලීනය යන තන්ත්‍රීය භාණ්ඩවලත් බටනළාවේත් ස්වර පිහිටන අයුරු සහ කොටස් නම් කිරීම මෙම ශ්‍රේණියේ සිසුන්ට ද හැකි විය යුතුය. එක් එක් භාණ්ඩයේ ඒ ඒ කොටස්වලින් සිදුවන ක්‍රියාවලිය පිළිබඳ ව ද සිසුන් ව දැනුම්වත් කළ යුතු ය. ඇමුණුමේ දක්වා ඇති විෂය කරුණු ප්‍රයෝජනයට ගනිමින් සුදුසු ක්‍රියාකාරකමක් ගොඩනගා එක් එක් සංගීත භාණ්ඩවල ගුණාත්මක බව වැඩි වීමට හෝ අඩුවීමට හෝ බලපාන හේතු විද්‍යාත්මක ව සැසඳීමට සිසුන් හුරු කරන්න.

පාඩම සංවර්ධනය

- තෝරා ගත් සංගීත භාණ්ඩ කිහිපයක කොටස් නම් කළ දෘශ්‍ය උපකරණ ප්‍රදර්ශනය කරමින් සාමාන්‍ය පෙළ දී සිසුන් ලබා ගත් දැනුම ද පිරික්සමින් පාඩමට පිවිසිය හැකි ය.

(විනාඩි 05)

පියවර 02

- එක් එක් භාණ්ඩයේ ස්වර පිහිටන අයුරු සහ කොටස් සිසුන් සමග සාකච්ඡා කරන්න. ඒ සඳහා දෘශ්‍ය උපකරණ භාවිතයට ගන්න. එක් එක් කොටසින් භාණ්ඩයේ ධ්වනි ගුණය ඇති කිරීමට කරනු ලබන බලපෑම සාකච්ඡා කරන්න.

(විනාඩි 35)

පියවර 03

- ඇමුණුමේ සඳහන් විෂය කරුණු සිසුනට සපයා එක් එක් සංගීත භාණ්ඩයේ ගුණාත්මක බව අඩු වැඩි කිරීමට බලපාන හේතු සාකච්ඡා කරන්න.

. (විනාඩි 35)

ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස්

ඇමුණුමෙහි දැක්වෙන ක්‍රියාකාරකමේ යොදවා අගය කරන්න.

(විනාඩි 05)

අතිරේක උදවු
සංගීත භාණ්ඩ පිළිබඳ ව ලියැවුණු ග්‍රන්ථ.

ඇමුණුම:-පහත දැක්වෙන පත්‍රිකාව සිසුන්ට බෙදා දී ක්‍රියාකරකමක යොදවන්න.

- තන්ත්‍රීය භාණ්ඩවල ධ්වනි ගුණය ඇති කිරීමට බලපාන හේතු විමසන්න.
    - වාදන ඉරියවු මොනවා ද?
    - තත් කම්පනය වී නාද හටගන්නේ කෙසේ ද?
    - බෝව උපයෝගී කරගනිමින් හෝ මිස්රබ් එකකින් හෝ පික් එකකින් හෝ වැයීමෙන් නිකුත් වන නාදය වෙනස් වන අයුරු.
- සුෂිර භාණ්ඩවල ධ්වනි ගුණය ඇති කිරීමට බලපාන හේතු විමසන්න.
    - වාදන ඉරියවු මොනවා ද?
    - නාද හටගන්නේ කෙසේ ද?
- අවනද්ධ භාණ්ඩවල ධ්වනි ගුණය ඇති කිරීමට බලපාන හේතු විමසන්න.
    - වාදන ඉරියව් මොනවා ද?
    - නාද හටගන්නේ කෙසේ ද?
- ඝන භාණ්ඩවල ධ්වනි ගුණය ඇති කිරීමට බලපාන හේතු විමසන්න.
    - වාදන ඉරියවු මොනවා ද?
    - නාද හටගන්නේ කෙසේ ද?
- පහත දැක්වෙන කරුණු භාණ්ඩයේ ගුණාත්මක බව කෙරෙහි බලපාන්නේ කෙසේ ද?
- වයලීනය
    - වයලීනයක බ්‍රිජ් එක උසින් වැඩි වීම.
    - ගට් කොටසට ලෝහ කම්බියක් දැමීම.
    - සවුන්ඩ් පෝස්ට් එක ගැවී තිබීම හෝ නිවැරැදි ස්ථානයේ ස්ථාපිත නොකිරීම.
    - බෝ එකේ කෙඳි අවශ්‍ය පරිදි තද කිරීමට නොහැකි වීම.
    - බෝ එකේ රෝසින් හොඳ හැටි ගෑවී නොතිබීම.

- ෆ බෝවේ කෙඳි ඉතා ස්වල්පයක් පමණක් තිබීම.
- ෆ වයලීනයේ තත් සහ ඇඟිලි පුවරුව අතර වැඩි පරතරයක් තිබීම.
- සිතාරය
  - සිතාරයේ ජවාරී හරිහැටි නොතිබීම.
  - නායකී තත ගනකමින් වැඩි වීම.
  - ෆ්‍රෙට්ස් සහ නායකී තත අතර උස වැඩි වීම.
  - වට්ටක්කා තුම්බාව සහ ලී දණ්ඩ ෆයිබර් ග්ලාස් යොදා නිපදවීම
- තබ්ලාව.
  - බද්ධි සට්ටාවලින් ඉවත්ව තිබීම.
  - ස්‍යාහි ගැලවී තිබීම.
  - චාන්ටිය තැනින් තැන ඇද වී තිබීම.
  - බායාවේ ගැඹුර අඩුකම.
  - දායාව සැකසීමට බුරුල් ලී විශේෂයක් භාවිත කර තිබීම.
  - බායාවේ බද්ධි සඳහා සම් පටි නොදමා නයිලෝන් නූල් දමා තිබීම.
  - බද්ධි පළල අඩුකම.
- බටනලාව
  - බටය සූරා තීන්ත ආලේප කර තිබීම.
  - පිඹින සිදුරෙන් සුළං හඬ නිකුත් වීම.
  - කිරල ඇබයක් වෙනුවට රිජිෆෝම් වැනි ද්‍රව්‍යයකින් වසා තිබීම.
  - ස්වර නිකුත් වන සිදුරු අදාළ නියමිත දුරකින් විද නොතිබීම.
  - බට ලීය පදම් කර නොතිබීම.
  - ස්වාභාවික බට ලීයක් වෙනුවට එස්ලෝන් බට හෝ වෙනත් ලෝහ බට හෝ යොදා ගැනීම.

- ගිටාරයේ සහ මැන්ඩලීනයේ ගුණාත්මක බව අඩු වීමට බලපානා කරුණු පෙළ ගසන්න. විස්තර කරන්න.

ක්‍රියාකාරකම 30

# රාගධාරී ශාස්ත්‍රය පදනමක් සහිත සිංහල, හින්දි, සරල ගී දෙකක් හෝ චිත්‍රපට ගී දෙකක් හෝ ඇසුරින් රසාස්වාදනයේ යෙදීම සහ ගායනය, වාදනය

නිපුණතාවය 4.0 :- සංගීත රසාස්වාදනයේ යෙදෙමින් ජීවිතයේ සතුට හා බැඳි මානසික තත්ත්වයන් ළඟා කරගැනීමට හුරු වෙයි.

නිපුණතා මට්ටම 4.1 :- රාගධාරීසංගීතය ආශ්‍රයයෙන් නිර්මාණය වී ඇති ගායන විශ්ලේෂණාත්මක ව සාකච්ඡා කරමින්, ප්‍රායෝගික රසාස්වාදනයක යෙදෙයි.

ක්‍රියාකාරකම :- රාගධාරී ශාස්ත්‍රය පදනමක් සහිත සිංහල, හින්දි, සරල ගී දෙකක් හෝ චිත්‍රපට ගී දෙකක් හෝ ඇසුරින් රසාස්වාදයේ යෙදීම සහ ගායනය, වාදනය.

කාලච්ඡේද සංඛ්‍යාව :- 06

ඉගෙනුම් පල :-

- රාගධාරී ශාස්ත්‍රීය පදනමක් සහිත සරල ගීත වර්ග නම් කරයි.
- සිංහල, හින්දි චිත්‍රපට,ගීත වශයෙන් රාගධාරී ශාස්ත්‍රීය පදනමක් සහිත සරල ගීත ලැයිසතු ගත කරයි.
- රාගධාරී ශාස්ත්‍රීය පදනමක් සහිත සරල ගීත වර්ග ගායනය කිරීමට කැමැත්ත පළ කරයි.
- ගීත වර්ගවල තිබෙන රාග අංග පැහැදිලි කරයි.
- සිංහල, හින්දි චිත්‍රපට,ගීත වශයෙන් රාගධාරී ශාස්ත්‍රීය පදනමක් සහිත සරල ගීත ගායනය කරයි.

ගුණාත්මක යෙදවුම් :-

- අදාළ ගීත පටිගත කළ කැසට් පට හා කැසට් යන්ත්‍රයක්
- ගීත ගබඩා කළ Pendrive එකක් සමඟ ලැප්ටොප් පරිගණකයක්, CD තැටි.
- සර්පිනාව
- ගීත ලියූ දෘශ්‍යාධාර
- ඇමුණුම අංක 02 කියවීම් පත්‍රිකාවේ පිටපත්

විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක්

මෙය I වාරයේ අංක 15 ක්‍රියාකාරකම යටතේ ද ඉගැන්වීම් කටයුතු සිදු කර ඇත.

ඇමුණුම අංක 01 හි ඇතුළත් ගීත ලැයිස්තුවෙන් ඔබ කැමති රාගධාරී ශාස්ත්‍රීය පදනමක් සහිත සිංහල සරල ගීතයක් ද, හින්දි චිත්‍රපට ගීතයක් ද පළමු වාරයට ඉගැන්වීම සඳහා යොදා ගෙන ඇත. එම වාරයට යොදා නොගත් හින්දි සහ සිංහල ගීත දෙකක් දෙවන වාරය සඳහා යොදාගෙන ඉගැන්වීම මෙම ක්‍රියාකාරකමින් අපේක්ෂා කෙරේ.

ගායනයක, වාදනයක ඇතුළත් සියුම් කොටස් විශ්ලේෂණය කරමින්, රාග ඥානය මෙන්ම ව්‍යවහාරික සංගීතයේ තාක්ෂණික ක්‍රම ශිල්ප හා ගීතයන් හී ඇතුළත් ශිල්ප ක්‍රම පිළිබඳ ව ද සිසුන්ට අවබෝධයක් ලබාදීම

තවත් අපේක්ෂාවකි. ගීත ගායනය, වාදනය මඟින් සිසුන්ගේ ප්‍රායෝගික දක්ෂතා තව දුරටත් වර්ධනය වීමක් ද සිදු වනු ඇත.

පාඩම සංවර්ධනය

- මීට පෙර උගත් රාගධාරී ශාස්ත්‍රීය පදනමකින් යුත් සරල ගීතයක් ගායනය කිරීමට සිසුන්ට අවස්ථාවක් ලබා දෙන්න. එම ගීතයේ තනුව, රිද්මය, භාෂාව, නිර්මාණයට පාදක වූ රාගය, රාග අංග සමඟ අර්ථය උද්දීපනය වන අයුරින් කෙටි සාකච්ඡාවක් මෙහෙයවන්න.
- ඇමුණුම අංක 01 ගීත ලැයිස්තුවෙන් ගුරුවරයාට අභිමත පරිදි සිංහල ගීතයක් තෝරාගෙන එහි දෘශ්‍යාධාරය ප්‍රදර්ශනය කරන්න. කැසට් යන්ත්‍රයක් හෝ ලැප්ටොප් පරිගණකයක් හෝ භාවිත කරමින් ගීතය වාදනය කර සිසුන්ට ශ්‍රවණය කිරීමට අවස්ථාව ලබා දෙන්න. ගීතය ගායනය/වාදනය කරවන්න.

කාලච්ඡේද 01

- ගීත ලැයිස්තුවෙන් තවත් හින්දි චිත්‍රපට ගීතයක් තෝරාගන්න. දෘශ්‍යාධාරය ප්‍රදර්ශනය කරන්න. ඉහත ක්‍රියා පිළිවෙළම මේ ගීතය ඉගැන්වීමට අනුගමනය කරන්න.
- ඇමුණුම අංක 02 කියවීම් පත්‍රිකාවේ පිටපත් සිසුන්ට ලබා දී එම ශීර්ෂ ඔස්සේ සාකච්ඡාවක් මෙහෙයවන්න. සටහනක් පිළියෙළ කරවන්න.

කාලච්ඡේද 01

- තෙවන කාලච්ඡේදයේ දී ගායනය, වාදනය කළ ගීත 2 කින් එක් ගීතයක ස්වර ප්‍රස්තාරයක්, සර්පිනාවෙන් හෝ ස්වර පුවරුවෙන් හෝ වාදනය කිරීමට යොමු කරවන්න.

කාලච්ඡේද 01

- දෙවන වාරයට අදාළ ගීත ඉගැන්වීමේ දී පළමු වාරය සඳහා අනුගමනය කළ ක්‍රමවේදය ම යොදා ගන්න.

කාලච්ඡේද 03

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :-

- රාගධාරී ශාස්ත්‍රීය පදනමකින් යුත් සිංහල හා හින්දි චිත්‍රපට ගීත තාලය හා ලය පවත්වා ගනිමින්, ස්වර හා තනුව නිවැරදි ශ්‍රැතියට ගායනය කළ සිසුන් තෝරා අගයන්න.
- ගීත ස්වර ප්‍රස්තාර නිවැරදි ව වාදනය කළ සිසුන් තෝරා අගයන්න.

පැවරුම :- සිංහල හා හින්දි චිත්‍රපට ගීත ඇතුළත් පොත් පිංචක් සකස් කිරීමට යොමු කරවන්න. නිදහස් කාලච්ඡේදයන් හි දී එම ගීත සර්පිනාවෙන් හෝ ස්වර පුවරු භාණ්ඩයකින් වාදනය කිරීමට යොමු කරවන්න. (ගීත වාදනය කිරීමේ දී ගුරු සහාය ලබා දෙන්න.)

ඇමුණුම : අංක 01

රාගධාරී ශාස්ත්‍රීය පදනමක් සහිත සරල ගී ඇත. එසේ ම බෝහෝ රාගධාරී සංගීත පදනමක් සහිත හින්දි චිත්‍රපට ගීත රාශියක් ශ්‍රී ලාංකික

සමාජය තුළ ජනප්‍රිය ව පවතී. පහත දැක්වෙන ගීත ලැයිස්තුව මෙම ශ්‍රේණියේ ප්‍රයෝජනය සඳහා යෝජනා කෙරේ.

එම ගීත ලැයිස්තුවේ සිංහල සරල ගී අතරින් එක් ගීතයක් ද, හින්දි චිත්‍රපට ගී අතරින් තවත් ගීතයක් ද වශයෙන් ගීත දෙකක් පළමු වාරයටත් ඒ අතරින් තවත් ගීත දෙකක් දෙවන වාරයටත් යොදා ගන්න

ගීත ලැයිස්තුව : රාගධාරී ශාස්ත්‍රීය සරල ගීත

| | | | |
|---|---|---|---|
| 1. | හංසරාජිනී | - සුනිල් එදිරිසිංහ | - මාලකෞන්ස් |
| 2. | මුව මුක්තාලතා | - එඩ්වඩ් ජයකොඩි | - පීළු |
| 3. | හෝපලු වනපෙත | - වික්ටර් රත්නායක | - භාගේශ්‍රී |
| 4. | මම දෙව්ඳුනි | - සුජාතා අත්තනායක | - දර්බාරිකානඩා |
| 5. | මන්නාරම් කන්‍යාරාමේ | - රශ්මි සංගීතා | - තෝඩි |
| 6. | ඇවිළුණු ගිනිදැල් | - සනත් නන්දසිරි | - කලාවතී රාගය<br>ජනසම්මෝහිනී / කලාශ්‍රී |
| 7. | වස්දඬුරාවේ | - අමරා රණතුංග | - ශිවරංජනී |
| 8. | ආසාවරී මනමෝහිනී | - සුදත් සමරසිංහ | - දේස් |
| 9. | සරා සඳ කුමාරී | - සුදත් සමරසිංහ | - හමීර් |
| 10. | මකරන්ද පාද පුෂ්පේ | - ජේ. ඒ. මිල්ටන් පෙරේරා | - හමීර් |
| 11. | ලොවේ සැමදා | - හරුන් ලන්ත්‍රා | - ජෞනපුරි |
| 12. | මයුරාසන හිඳ පාන තෙදැති | - සුනිල් එදිරිසිංහ | - බහාර් |

හින්දි චිත්‍රපට ගීත ලැයිස්තුව

| | | | |
|---|---|---|---|
| 1. | කොහිනූර් | - මධුබනමෙ රාජිකා | - හමීර් රාගය |
| 2. | අභිමාන් | - තෙරේ මේරේ | - බමාජ් රාගය |
| 3. | පාකීෂා | - මෝසම්හෙ | - යමන් රාගය |
| 4. | ජනක් ජනක් පායල භාජේ | - ජනක් ජනක් පායල භාජේ | - අඩානා |
| 5. | බෛජූ බව්රා | - මනතරෆත හරි දර්ශන කො ආජ | - මාලකෞන්ස් |
| 6. | බෛජ් බව්රා | - තූ ගංගා කිමෝජු මෙ | - භෛරවී |
| 7. | බෛජූ බව්රා | - භගවාන් භගවාන් | - දර්බාරිකානඩා |
| 8. | සංගම් | - මේරේ මන්කී ගංගා | - භෛරවී |
| 9. | සත්‍යම් ශිවම් සුන්දරම් | - සත්‍යම් ශිවම් සුන්දරම් | - ශිවරංජනී/දර්බාරිකානඩා |

ඇමුණුම් අංක 02 (විෂය කරුණු හා බැඳි ශීර්ෂ)

- පදමාලාවෙන් ප්‍රකාශිත අදහස
- තනු නිර්මාණය සඳහා පාදක වූ රාග
- එම රාගයේ රාංග අංග තනුවේ පිහිටා ඇති ආකාරය (ප්‍රායෝගික ව දැක්වීම)
- පෙර වාදන, අතුරු වාදනවල ගැළපීම
- යොදා ඇති විවිධ රාගධාරී ශාස්ත්‍රීය අංග
- යොදා ඇති සංගීත භාණ්ඩ

ක්‍රියාකාරකම 31

# උඩරට, පහතරට, සබරගමු වශයෙන් ගැමි ගායනාවල වෙනස්කම්

**නිපුණතාව 5.0** :-

දේශීය ජන සංගීතාංග පිළිබඳ ප්‍රායෝගික හැකියා වර්ධනය කර ගනිමින් සංස්කෘතික උරුමයන් රැක ගනියි.

**නිපුණතා මට්ටම 5.1** :-

ගැමි ගායනා පිළිබඳ තර්කානුකූල අදහස් දක්වමින් ගැමි ගී ගායන / වාදන දක්ෂතා වර්ධනය කරගනියි.

**ක්‍රියාකාරකම** :- උඩරට, පහතරට, සබරගමු වශයෙන් ගැමි ගී ගායනවල වෙනස්කම් (ශාන්ති කර්ම ගී ඇසුරින්)

**කාලච්ඡේද** :- 04

**ඉගෙනුම් ඵල** :-
- උඩරට, පහතරට, සබරගමු සම්ප්‍රදායයන්ට අයත් ශාන්ති කර්ම ගී හඳුනා ගනියි.
- සම්ප්‍රදාය තුනට අයත් ශාන්ති කර්ම ගී ගායනය කරයි.
- සම්ප්‍රදාය තුනට අයත් භාෂාව, නාදරටා, ස්වර පරාසයන් හා සුවිශේෂතා විස්තර කරයි.

**ගුණාත්මක යෙදවුම්** :-
- උඩරට, පහතරට, සබරගමු ශාන්ති කර්ම ගී ලියූ දෘශ්‍යාධාර
- කියවීම් පත්‍රිකා (ඇමුණුම ඇත (01) සිට (04) තෙක් අදාළ තොරතුරු පමණි.)
- ස්වර වාද්‍ය භාණ්ඩයක් හා සම්ප්‍රදාය තුනට අයත් තාල වාද්‍ය භාණ්ඩ

**විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක්** :-

උඩරට, පහතරට, සබරගමු ශාන්ති කර්ම ගී ගායනා කිරීම හා ඒවායේ සුවිශේෂ ලක්ෂණ පිළිබඳ වත්, මාතෘකාව සඳහා වෙන් කර ඇති කාලච්ඡේද 04 න් පාඩම සංවර්ධනය කිරීම පිළිබඳ වත් මඟ පෙන්වා ඇත.

**පාඩම සංවර්ධනය** :-

ඩෙන්නා ඩෙනා නා ඩෙන ඩෙන ඩෙන්නා ඩෙනෝ

ඩෙන්නා ඩෙනා නා ඩෙනනා ඩෙන්න ඩෙනෝ

ආයිබෝ වේවා...!

ශාන්ති කර්ම නාද මාලාවන්ගෙන් නිර්මාණය වූ ඉහත සඳහන් කවි පද දෙක ගයමින් පාඩමට පිවිසෙන්න. ඔබ විසින් ඉදිරිපත් කරන ලද ගායනය පිළිබඳ ව සිසුන් සමග සාකච්ඡා කරන්න. ඇමුණුම I කොටසට අදාළ විෂයය කොටස් ඇතුළත් වන සේ ඔබ සකස් කරගත් කියවීම් පත්‍රිකාව සිසුන්ට බෙදා දී සිසුන් ක්‍රියාකාරකම්වල යොදවන්න.

(කාලච්ඡේද 01)

- ඇමුණුම අංක 02 හි ඇතුළත් උඩරට ශාන්ති කර්ම ගීතය ඉගැන්වීම සඳහා සකස් කර ගත් දෘශ්‍යාධාරය ප්‍රදර්ශනය කරමින් සිසුන් ක්‍රියාකාරකමේ යොදවන්න.

(කාලච්ඡේද 01)

- ඇමුණුම අංක 03 හි ඇතුළත් පහතරට ශාන්ති කර්ම ගීතය ඉගැන්වීම සඳහා සකස් කර ගත් දෘශ්‍ය උපකරණය ප්‍රදර්ශනය කරමින් සිසුන් ක්‍රියාකාරකමේ යොදවන්න.

(කාලච්ඡේද 01)

- ඇමුණුම අංක 04 හි ඇතුළත් සබරගමු ශාන්ති කර්ම ගීතය ඉගැන්වීම සඳහා සකස් කර ගත් දෘශ්‍ය උපකරණය ප්‍රදර්ශනය කරමින් සිසුන් ක්‍රියාකාරකමේ යොදවන්න.

(කාලච්ඡේද 01)

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :-

- එක් එක් විෂයය කොටසක් අවසානයේ ලිඛිත හෝ වාචික හෝ ප්‍රශ්න මඟින් අගයන්න.
- සියලු ම ගීත කොටස් ආවරණය වන පරිදි ගායනය කිරීමට අවස්ථාව ලබා දී අගයන්න.

**අතිරේක උදවු :-**

- 2009 පෙරදිග සංගීතය - 12 ශ්‍රේණිය පිටු අංක 144 සිට 147 තෙක්
- හෙළ ගී මග - ඩබ්. බී. මකුලොලුව,
- වරම් ගී - ආනන්ද ජයසිංහ
- ශාන්ති කර්ම හා ආචාර විධි - ඥානසිරි පීරිස්

**විෂයය කරුණු හා බැඳි ශීර්ෂ**

**ඇමුණුම අංක 01 කොටස**

- උඩරට, පහතරට, සබරගමු වශයෙන් ශාන්තිකර්ම හැඳින්වීම හා එහි සංස්කෘතික පසුබිම.
- සම්ප්‍රදාය තුනේ භාෂාව, නාදරටා, ස්වර පරාසය, ගී තනු, ගායන විධි, තාල ලක්ෂණ හා රිද්මය පිළිබඳ ව.
- සම්ප්‍රදාය තුනට අදාළ ව කරනු ලබන ශාන්ති කර්ම වර්ග පැහැදිලි කිරීම.
- ශාන්තිකර්ම ගීවල නර්තන, ගායන, වාදන, සැරසිලි හා ඒවායේ සුවිශේෂතා.
- ආවේනික භාණ්ඩ

**ඇමුණුම අංක 02 කොටස**

උඩරට ශාන්තිකර්මයන්ට අදාළ ගීත කිහිපයක් පහත දැක්වේ. ඉන් එක් ගීතයක් තෝරාගෙන ගායනය පුහුණු කරවන්න.

- සුරතට රැගෙන පන්දම යාගෙට ඇදුරා
- අන්ද ගුවන් හැර නැංග අසුන් පිට

- නිරිත කොන යුතා මල් මල් සුවඳැති

ඇමුණුම අංක 03 කොටස

පහතරට ශාන්ති කර්මයන්ට අදාළ ගීත කිහිපයක් පහත දැක්වේ. ඉන් එක් ගීතයක් තෝරාගෙන ගායනය පුහුණු කරවන්න.

- උපත පෙරා කලිඟු පුරා
- ආලවඩන ගන්ධ කුටියෙ මුනි වැඩ සිටගෙන
- එර්දි වෙලා උඩු ගුවනෙ වඩින්නේ

(කිරි අම්මා ශාන්ති කර්ම ගී)

**ඇමුණුම අංක 04 කොටස**

සබරගමු ශාන්ති කර්මයන්ට අදාළ ගීත කිහිපයක් පහත දැක්වේ. ඉන් ඔබ තෝරා ගත් ගීතයක් පුහුණු කරවන්න.

- ගුණ දනේ බෝසත් අනේ පෙර ඉපදුණේ - ගිරවකු ලෙසේ
- සුද්ධෝදන රජුට දාව උපන් එනරවර
- හිස මුව තුළ බෙල්ල දෙඋර
- සුවඳ පැනින් හිස දෝවා ගන්නේ

ක්‍රියාකාරකම 32

# මහනුවර යුගයේ ශ්‍රී ලංකාවේ සංගීත විකාශය

**නිපුණතාව 6.0** : සංගීත ඉතිහාසය පිළිබඳ තොරතුරු ගවේෂණය කරයි.

**නිපුණතා මට්ටම 6.1** : ශ්‍රී ලංකාවේ සංගීත ඉතිහාසය පිළිබඳ තොරතුරු ගවේෂණය කරයි.

**ක්‍රියාකාරකම** : මහනුවර යුගයේ ශ්‍රී ලංකාවේ සංගීතයේ විකාශය.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 10

**ඉගෙනුම් පල** :
- මහනුවර යුගයේ දී සංගීතයේ වර්ධනයට රාජ අනුග්‍රහය ලැබූ අයුරු විස්තර කරයි.
- රජවාසලේ සංගීතය හා සම්බන්ධ ආයතන නම් කරයි.
- එම ආයතනවලින් ඉටු වූ කාර්යයන් පැහැදිලි කරයි.
- කවිකාර මඩුවෙන් ගොඩ නැගුණු සංගීතාංග විස්තර කරයි.
- ශ්‍රී ලංකාවේ සංගීතයේ විකාශය කෙරෙහි කර්ණාටක සංගීතයේ සිදුවූ බලපෑම විවිධ සංගීතාංග මඟින් විස්තර කරයි.
- මහනුවර යුගයේ දී දකුණු ඉන්දීය සංස්කෘතිය මෙරට සංස්කෘතිය හා මිශ්‍ර වූ බව පිළිගනියි.
- කවිකාර මඩුව ආශ්‍රිත ව ගොඩ නැගුණු සංගීතාංග ප්‍රායෝගික ව ඉදිරිපත් කරයි.

**ගුණාත්මක යෙදවුම්:**
- මාතෘකාවට අදාළ විෂය කරුණුවලට ගැළපෙන ලෙස සැකසූ දෘශ්‍ය උපකරණ. කියවීමේ පත්‍රිකා සහ ස්වර වාද්‍ය භාණ්ඩයක්

**විෂයකරුණු පැහැදිලි කරගැනීමට අත්වැලක් :**

- මහනුවර යුගයේ දී ශ්‍රී ලංකාවේ සංගීතයේ ඇතිවූ විකාශය සංක්ෂිප්ත ව සාකච්ඡා කිරීම මෙම පාඩමින් අපේක්ෂිත ය. මෙහි අවසානයේ ඇමුණුම වශයෙන් දක්වා ඇති මාතෘකා ශීර්ෂ මේ සඳහා යොදා ගත හැකි ය. මෙම මාතෘකාව සඳහා වෙන් කර ඇති කාලඡේද 10 පාඩම සංවර්ධනය සඳහා මඟ පෙන්වා ඇති පරිදි වෙන් කර ගත හැකි ය. ඉගැන්වීමට නියමිත කාලච්ඡේදයට හෝ කිහිපයට ගැළපෙන පරිදි ක්‍රියාකාරකම් සැලැස්ම ගුරුවරයා විසින් ගොඩනගා ගත යුතු වේ.

  මහනුවර යුගයේ ශ්‍රී ලංකාවේ සංගීතයේ විකාශය යනුවෙන් නම් කර ඇති මෙම ක්‍රියාකාරකම තුළ අනුමාතෘකා කිහිපයක් ඇත. මේ සඳහා වෙන් කර ඇති කාලච්ඡේද 10 නැත හොත් එක් සතියක කාලය පහත දැක්වෙන ලෙස අනු මාතෘකා සඳහා වෙන් කර ගනිමින් පාඩම සැලසුම් කරගන්න.

**පාඩම සංවර්ධනය**

- ප්‍රශස්තියක කොටසක් හෝ වන්නමක තානමක් ගයා වයා පාඩමට පිවිසෙන්න. ඔබ විසින් ඉදිරිපත් කළ ගායන විශේෂය පිළිබඳ අදහස් විමසන්න. ඇමුණුමේ I කොටස ට අදාළ විෂය කොටස් සඳහා ඔබ සකස් කළ කියවීමේ පත්‍රිකා බෙදා දෙන්න. සිසුන් සැලසුම් කළ ක්‍රීයාකාරකම්වල යොදවන්න.

  කාලච්ඡේද 01 යි.

- ඇමුණුමේ ii කොටස ට අදාළ දකුණු ඉන්දීය රජ වාසලේ එවකට පැවති සංගීතාංග මහනුවර රජ වාසලට ගලා ඒම පිළිබඳ විෂය කොටස් සඳහා ඔබ විසින් සකස් කරන ලද කියවීමේ පත්‍රිකා බෙදා දෙන්න. සිසුන් සැලසුම් කළ ක්‍රියාකාරකම්වල යොදවන්න.

  කාලච්ඡේද 01 යි.

- ඇමුණුමේ iii කොටස ට අදාළ රාජ සභාවට අයත් සංගීත නැටුම් ආයතන අතරින් කවිකාර මඩුව සහ එහි කාර්ය භාරය පිළිබඳ විෂය කොටස් සඳහා ඔබ විසින් සකස් කළ කියවීමේ පත්‍රිකා බෙදා දෙන්න. සිසුන් සැලසුම් කළ ක්‍රියාකාරකම්වල යොදවන්න.

  කාලච්ඡේද 01 යි

- ඇමුණුමේ iii කොටස ට අදාළ රාජ සභාවට අයත් වාහල ඉලංගම, තඹරු පුරම්පෙට්ටුකාර අංශය, සිංහාරක්කාර අංශය, සහ එහි කාර්ය භාරය පිළිබඳ විෂය කොටස් සඳහා ඔබ සකස් කළ කියවීමේ පත්‍රිකා බෙදා දෙන්න. සිසුන් සැළසුම් කළ ක්‍රියාකාරකම්වල යොදවන්න.

  කාලච්ඡේද 02 යි

- ඇමුණුමේ iv කොටස ට අදාළ මහනුවර රජ සමයේ පැවති උත්සව සඳහා රාජ අනුග්‍රහය ලැබීම සහ එම උත්සවවල දී සංගීතය එකතු කර ගැනීම පිළිබඳ විෂය කොටස් සඳහා ඔබ සකස් කළ කියවීමේ පත්‍රිකා බෙදා දෙන්න. සිසුන් සැලසුම්කළ ක්‍රියාකාරකම්වල යොදවන්න.

  කාලච්ඡේද 01 යි

- ඇමුණුමේ v කොටස ට අදාළ ශ්‍රී ලංකාවේ සංගීතයේ විකාශය කෙරෙහි කර්ණාටක සංගීතයේ සිදුවූ බලපෑම වන්නම්, ප්‍රශස්ති, සහ නාඩගම්වල අදාළ කොටස්වල ප්‍රායෝගික ක්‍රියාකාරකම් මගින් පැහැදිලි කරන්න. අදාළ විෂය කොටස් සඳහා ඔබ විසින් සකස් කළ කියවීමේ පත්‍රිකා බෙදා දෙන්න. සිසුන් ස්වයං අධ්‍යයනයට යොමු කරන්න. සටහනක් පිළියෙල කරවන්න.

  කාලච්ඡේද 04 යි

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- එක් එක් විෂය කොටස අවසානයේ වාචික හෝ කෙටි ලිඛිත හෝ ප්‍රශ්න මඟින් අගයන්න.

පැවරුම -

- සියලුම විෂය කොටස් අවරණය වන පරිදි රචනාවක්/ ලිපියක් / පැවරුමක් සකස් කිරීමට මඟ පෙන්වන්න. සුදුසු පරිදි අගයන්න.

අතිරේක උදවු -

- 2009 පෙරදිග සංගීතය 12 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය.
- සිංහල ගැමි නාටකය - මහාචාර්ය එදිරිවීර සරත්චන්ද්‍ර - පිටු අංක 27, 28, 29, 160, 161, 162 දක්වා
- ශ්‍රී ලංකාවේ සංගීත සම්භවය- සී. ද එස්. කුලතිලක - පිටු අංක 186-201 දක්වා

ඇමුණුම:- (විෂය කරුණු හා බැඳී ශීර්ෂ.)

කොටස i

- මහනුවර රාජධානියේ ආරම්භය, රජවරුන් ද ඉන්දීය කුමාරිකාවන් සරණ පාවා ගැනීම හා රාජ මාලිගාවේ පැවති සංගීතයට රජ අනුග්‍රහය ලැබීම. බෞද්ධ භක්ති සම්ප්‍රදායයේ මූලාරම්භය, දළදා සින්දුව, දක්ෂිණ භාරතීය තූර්ය වාදක භාණ්ඩ ව්‍යාප්ත වීම (මෘදංග, මද්දල, වීණා)

කොටස ii

- දකුණු ඉන්දීය රජ වාසලේ එවකට පැවති සංගීතාංග මහනුවර රජ වාසලට ගලා ඒම. (නාටකම්, තේරුක්කුත්තු, නාට්ටුකුත්තු, සහ ඒවායේ ආභාසය)

කොටස iii

- රාජ සභාවට අයත් සංගීත නැටුම් ආයතන සහ ඒවායේ කාර්ය භාරය සැකෙවින්.
- කවිකාර මඩුව - ( මහනුවර රාජසභාවට අයත් නැටුම් ගැයුම් වැයුම් පැවැත් වූ ස්ථානය. මුහන්දිරම් නිලමේ වරයකු යටතේ පාලනය, වැඩි වශයෙන් පැවැත් වූයේ ගායනා බව, මෙහි ස්ථිර ගායක පිරිස 13 දෙනෙකු වීම. රම්මොලක අදිකාරම්, නරේන්ද්‍ර සිංහ රජතුමා වෙනුවෙන් ලියන ලද ''ශෘංගාලංකාරය'' නම් ප්‍රශස්ති ඇතුළත් පොත. කවිකාර මඩුවේ සේවයට පැමිනි නායක්කර් කර්ණාටක සංගීතඥයෝ - ගණිතාලංකාර, අලගනායිදු, කවිකාර මඩුවේ ගයන ලද ගායනා- ප්‍රශස්ති, හටන් කවි, විරහ ගී, වන්නම්, සවුදම්, රාගම්, සින්දු, ස්ත්‍රීන් විසින් ගයන ලද ගී - ලිය ගී.
- නැටුම් ඉලංගම. (ස්ත්‍රීන්ගෙන් සමන්විත ය. නෛයඩි, වෙස්, පන්තේරු, උඩැක්කි යන නැටුම් වර්ග 4 ක් පැවැත්වීම,)
- වාහල ඉලංගම. ( පිනුම් කාරයන්, යුදහරඹ කාරයන්, වෙනත් නළුනාටක, ඉන්ද්‍රජාල ආදියෙන් සමන්විත ය)
- තඹරුපුරම්පෙට්ටුකාර අංශය. (බෙර සහ ශුෂිරවාදක භාණ්ඩවලින් සැදුණු පරිවාර වාද්‍ය කණ්ඩායමක්, විදේශීය තූර්යභාණ්ඩ පරිහරණය - ත්‍රොම්බෝන්, ට්‍රම්පට්,
- සිංහාරක්කාර අංශය. ( මහනුවර අවසාන රජ ශ්‍රී වික්‍රම රාජසිංහ විසින් ආරම්භ කර ඇත. දවුල්, තම්මැට්ටම්, හොරණෑවලින් සමන්විත ය.)

කොටස iv

- මහනුවර රජ සමයේ පැවති උත්සව සඳහා රාජ අනුග්‍රහය ලැබීම සහ එම උත්සවවල දී සංගීතය එකතු කර ගැනීම.

  අවුරුදු මංගල්‍යය, - හින්දු උත්සවයක් වූ අලුත් අවුරුදු උත්සවය මහනුවර සමයට පෙර සිට ම පැවත එන්නකි. හින්දු වත්පිළිවෙත් ඇතුළු ව ඇත. මඟුල් මඩුවේ දී පවත්වා ඇත.

  ඇසළ මංගල්‍යය, - විෂ්ණු දෙවියන්ගේ උපත සැමරීම වස් සශ්‍රීකත්වය මුල් කොට ගෙන හින්දු දේවාලය සම්බන්ධ කර ගනිමින් පවත්වා ඇත. ලී කෙළි, කඩු, තාලම් නැටුම්, භක්ති ගීත ගායනය, දළදා සින්දුව, බුදුගුණ සින්දුව වශයෙන් ගායනය,

  නානුමුර මංගල්‍යය- සෑම බදාදා දිනයකම පවත්වා ඇත. (ආලත්ති මංගල්‍යය) කාර්තික උත්සවය, අලුත් සහල් මංගල්‍යය, )
- පත්තිනි හෑල්ල කවි පොත මහනුවර සමයේ නිර්මාණය වීම.

කොටස v

- ශ්‍රී ලංකාවේ සංගීතයේ විකාශය කෙරෙහි කර්ණාටක සංගීතයෙන් සිදු වූ බලපෑම විවිධ සංගීතාංග මගින්
- වන්නම්වල නම් ( කුදිරඩි, ඊරඩි, නෛයඩි, මුසලඩි,)

  වන්නම්වල ඇතුළත් කොටස් (තානම, අඩව්ව, කස්තිරම, )
- ප්‍රශස්තිවල ඇතුළත් කොටස් (තානම, උරුට්ටුව)

  නාඩගම් රංග සම්ප්‍රදාය මඟින් (නාටකම්, තෝඩායම්, මද්දලය)

  නාඩගම්තාල පද (පසන්, තිර්ලානා, වඩිමුඩි, තංගපාට, කොබහාරපසන්)

ක්‍රියාකාරකම 33

# නාඩගම් හා නූර්ති රංග ශෛලීන්

**නිපුණතාව 7.0 :-** ව්‍යාවහාරික සංගීතය සහ රංග කලා හා බැඳි සංගීතාංග පිළිබඳ අත්දැකීම් ලබයි. සංගීත නිර්මාණ කාර්යයේ අත්හදා බැලීම් කරයි.

**නිපුණතා මට්ටම7.1 :-** ශ්‍රී ලංකාවේ රංග සම්ප්‍රදායයන් පිළිබඳ තොරතුරු දක්වමින් ගීත ගායනයේ/වාදනයේ යෙදෙයි.

**ක්‍රියාකාරකම:-** නූර්ති හා නාඩගම් රංග ශෛලීන්

**ඉගෙනුම් පල:-**

- නාඩගම් හා නූර්ති රංග සම්ප්‍රදායන්හි ස්වභාවය හා එම රංග ශෛලිය හඳුනා ගනී.
- නාඩගම් හා නූර්ති රංග සම්ප්‍රදායන්හි සංගීතයේ ස්වභාවය හඳුනා ගනී.
- නාඩගම් හා නූර්ති රංග සම්ප්‍රදායන්හි පිළිබඳ සංසන්දනයක් කරයි.
- නිර්මාණ සංගීතය සඳහා නූර්ති හා නාඩගම් රංග සම්ප්‍රදායන්හි ගී තනු සුදුසු පරිදි යොදා ගැනීමට පෙළඹෙයි.

**කාල ඡේද සංඛ්‍යාව:-** 02

**ගුණාත්මක යෙදවුම් :-** සර්පිනාවක්, තබ්ලාවක්, මද්දලයක්

විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :-

- නාඩගම් හා නූර්ති ගීත ගායනය පිළිබඳ පාඩම් මීට පෙර වසරවල දී සිසු/සිසුවියන් සංක්ෂිප්ත ව හදාරා ඇතත් රංග ශෛලීන් හා සංගීතය පිළිබඳ ව සංසන්දනාත්මකව විස්තරයක් ගැඹුරින් හදාර නැත. මේ පාඩමේ මූලික අපේක්ෂාව වන්නේ සිසු/සිසුවියන්ට නූර්ති හා නාඩගම් රංග ශෛලීන් හා සංගීතය පිළිබඳ ව වෙන්කර හඳුනා ගත හැකි වන ආකාරයට දැනුවත් කිරීමකි. නියමිත කාලච්ඡේද සංඛ්‍යාව තුළ දී පාඩම සාර්ථකව ගොඩ නැංවීම සඳහා ඔබ විසින් පසු පිටේ සඳහන් ඇමුණුම් ආශ්‍රයෙන් ක්‍රියාකාරකම් සැලැස්මක් ගොඩ නගා ගත යුතුවේ. එහි කියවීම් පත්‍රිකාව සිසුන් අතර බෙදා දී සැලසුම් කළ ක්‍රියාකාරකම්හි යොදවන්න. කියවීම් පත්‍රිකා සකස් කිරීමේ දී සිසුන්ට ප්‍රයෝජනවත් වන සටහනක් ලෙසට ගොඩ නගන්න.

පාඩම් සංවර්ධනය:-

- ඇමුණුම් අංක 2 ට අදාළ ව, දකුණු ඉන්දියානු කර්ණාටක සංගීතයේ ආභාසය නාඩගම් සඳහා බලපෑ ආකාරයත්, උතුරු ඉන්දියානු හින්දුස්ථානී සංගීතය නූර්ති සඳහා බල පෑ ආකාරයත් පිළිබඳ ව ඔබ විසින් සකස් කළ කියවීම් පත්‍රිකාව සිසුන් අත බෙදා දී එහි ඔබ විසින් සැලසුම් කළ අනුව ක්‍රියාකාරකම් හි සිසුන් යොදවන්න.

  (මිනිත්තු 20)
- නූර්ති ගීතයක හෝ නාඩගම් ගීතයක කොටසක් ගයමින් ඔබට පාඩමට පිවිසිය හැකි වේ. ඔබ ගැයූ ගීතය පිළිබඳ ව සිසුන් විමසන්න. ඇමුණුම් අංක 1 ට අදාළ විෂය කොටස් සඳහා ඔබ විසින් සකස් කළ කියවීම් පත්‍රිකා සිසුන් අතට පත් කරන්න. එහි සඳහන් සැලසුම්වලට අනුව ක්‍රියාකාරකම්වල යොදවන්න.

  (මිනිත්තු 20)
- ඇමුණුම් අංක 3 ට අදාළ ව, නාඩගම් හා නූර්ති රංග සම්ප්‍රදායන් පිළිබඳ ව ඔබ සංසන්දනාත්මකව සකස් කළ කියවීම් පත්‍රිකාව බෙදා දෙන්න. එහි ඔබ විසින් සැලසුම් කළ ක්‍රියාකාරකම් හි සිසුන් යොදවන්න.

  (මිනිත්තු 20)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්:-**

එක් එක් විෂය කොටස් අවසානයේ වාචික ව ප්‍රශ්න මඟින් සිසුන් අගයන්න.

**පැවරුම:-**

කියවීම් පත්‍රිකා ආශ්‍රයයෙන් ඒ ඒ කොටස් පැහැදිලි වන පරිදි නාඩගම් හා නූර්ති සංගීතය පිළිබඳ ව සටහනක් සකස් කර ගැනීමට උපදෙස් දෙන්න.

**අතිරේක උදවු:-**

2009 පෙරදිග සංගීතය ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය පිටු අංක 186 සිට, සිංහල නාඩගම් ගී සරණිය - පුණ්‍යසේන ගුණසිංහ පිටු අංක 9 සිට 19, සිංහල සංගීත සම්ප්‍රදාය - ජයන්ත අරවින්ද, හඬ - ගුවන් විදුලි සඟරාව 2013 ජනවාරි කලාපය

ඇමුණුම :- (විෂය හා බැඳි කරුණු)

කොටස 1

- නාඩගම් හා නූර්ති ලංකාවේ ආරම්භ වූ කාලය
- නාඩගම සඳහා දකුණු ඉන්දියානු තෙරික්කූත්තු නම් වීදි නාට්‍ය ක්‍රමයේ ආභාසය
- ක්‍රි.ව. 1877 දී බොම්බායේ බලිවාලා ප්‍රමුඛ The Elphiniston Dramatic Company නම් නාට්‍ය කණ්ඩායමේ ලංකාගමනය නූර්ති නාට්‍ය මෙරට ස්ථාපිත වීම සඳහා බලපෑම

කොටස 2

- නාඩගම සඳහා දකුණු ඉන්දීය අලගනායිදු නම් කර්ණාටක සංගීතඥයාගේ දායකත්වය
- නූර්ති සංගීතය සඳහා උතුරු ඉන්දියානු සංගීතඥයන් සම්බන්ධ කර ගැනීම (විශ්වනාත් ලෞජී,ජයා ශංකර්, සතා සිවම්, අබ්දුල් අසීස්)

කොටස 3

<u>නාඩගම්</u>

- සංස්කෘත භාෂාවේ එන නාටක යන පදය නාටකම්, නාඩගම් වශයෙන් සිංහල වාක්කෝෂයට එකතුවීම, ලංකාවේ නාඩගම් පැතිර ගිය ප්‍රදේශ රංග මණ්ඩපය (කරළිය), කවි නාඩගම්, කර්ණාටක සංගීතය, කතෝලික ගායනා අලංකරණය, උරුට්ටුව, ඒකාකාරී ගී තනු, පොතේ විරිදුව, මද්දල් දෙකක් වාදනය, සංගීත භාණ්ඩ, මද්දල් පද, තානම, තාල පද්ධතිය, නව නිර්මාණ.

<u>නූර්ති</u>

නූර්ති ආරම්භය, සි.දොන් බස්තියන් නීතිඥ ජෝන් ද සිල්වා නීතිඥ චාර්ල්ස් ඩයස් වැනි දේශීය නූර්ති නිෂ්පාදකයන් ගේ සම්බන්ධය ඉන්දීය සංගීතඥයන්ගේ සේවය ලබා ගැනීම, ප්‍රථම සිංහල නූර්තිය රොමලින් හෙවත් දිව්‍ය කුසුම, පුෂ්ප ශාලාව, රාමායණය, සිරි සඟබෝ, පද්මාවතී, විධුර, වෙස්සන්තර

නූර්ති සංගීතය මෙරටට කළ බලපෑම, දේශීය සංගීතඥයන් දායක කර ගැනීම (එච්.ඩබ්.රූපසිංහ මාස්ටර්, රොමලස් ද සිල්වා මාස්ටර්)

වාද්‍ය ශිල්පීන්,ටවර් රඟහල, ග්‍රැමෆෝන් ගීත සඳහා නූර්ති ගීත යොදා ගැනීම.

ක්‍රියාකාරකම 34

# නූර්ති නාඩගම් ගීත ගායනය/වාදනය

**නිපුණතාව 7.0 :-** ව්‍යාවහාරික සංගීතය සහ රංග කලා හා බැඳි සංගීතාංග පිළිබඳ අත්දැකීම් ලබයි. සංගීත නිර්මාණ කාර්යයේ අත්හදා බැලීම් කරයි.

**නිපුණතා මට්ටම7.1 :-** ශ්‍රී ලංකාවේ රංග සම්ප්‍රදායයන් පිළිබඳ තොරතුරු දක්වමින් ගීත ගායනයේ/වාදනයේ යෙදෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :-** 04

**ක්‍රියාකාරකම :-** නූර්ති/නාඩගම් ගීත ගායනය/වාදනය

**ඉගෙනුම් පල :-**

- නූර්ති හා නාඩගම් රංග ශෛලිවලට අයත් ගීත හා විවිධ තනු හා තාල පද පිළිබඳ ව ප්‍රායෝගික ව හඳුනා ගනියි.
- එම ගීතයන්හි රාගධාරී පසුබිම, රාගධාරි සුවිශේෂී ශිල්පාංග ගායනය/වාදනය කරයි.
- නිර්මාණාත්මක සංගීතය සඳහා නූර්ති හා නාඩගම් ගී තනු සුදුසු පරිදි යොදා ගනී.
- නූර්ති/නාඩගම් ගී ගයමින් /වයමින් රස විඳියි.

**ගුණාත්මක යෙදවුම්:-** සර්පිනාවක් , තබ්ලාවක්. නූර්ති ගීත ලියූ දෘශ්‍යාධාර

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්:-**

නූර්ති හා නාඩගම් ගීත ගායනය වාදනය කිරීම මඟින් සිසු/සිසුවියන්ට ගීත රසාස්වාදය පහසුවෙන් හුරු කළ හැකි වේ. ඔබ විසින් තෝරා ගත් ගීත පිළිබඳ ව ඔබ සෑහීමකට පත් වන අයුරින් ඉගැන්වීමට පෙර සූදානම බොහෝ වැදගත් වේ. ව්‍යාවහාරික සංගීතය තුළ නූර්ති හා නාඩගම් ගීත විවිධ අන්දමට භාවිත වන නිසා එය ඔබට මහත් අභියෝගයකි. නිවැරදි තනුව ඉගැන්වීම කෙරෙහි ඔබේ දැඩි අවධානය යොමු කරමින් හැකි නම් ගීතයේ නාට්‍යමය අවස්ථාව පිළිබඳ ව කෙටි හැඳින්වීමක් කරමින් පාඩමට පිවිසිය හැකි ය. ඇමුණුමේ දක්වා ඇති ගීත ඉගැන්වීම සුදුසු වේ.

**පාඩම සංවර්ධනය:-**

- ඇමුණුමේ දක්වා ඇති නාඩගම් ගීත ලැයිස්තුවේ උරුට්ටුව, තෝඩායම, ඉන්නිසය වැනි සුවිශේෂී අංග ඇතුළත් එක් ගීතයක් තෝරා ගෙන ගායනයට හුරු කරවන්න.

(කාලච්ඡේද 01)

- ඉහත විශේෂතා රහිත ගීතයක් ඇමුණුමේ දක්වා ඇති නාඩගම් ගීත ලැයිස්තුවෙන් තෝරා ගෙන ගායනයට හුරු කරවන්න.

(කාලච්ඡේද 01)

- ඇමුණුමේ නූර්ති ගීත ලැයිස්තු දෙකක් දක්වා ඇත. ඉන් 1 වන කොටසින් එක් ගීතයක් තෝරා ගෙන ගායනයට හුරු කරවන්න.

(කාලච්ඡේද 01)

- ඇමුණුමේ 2 වන කොටසේ ඇති ගීත ලැයිස්තුවෙන් එක් ගීතයක් තෝරා ගෙන ගායනයට හුරු කරවන්න.

(කාලච්ඡේද 01)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :-**

- එක් එක් කාල ඡේදයක් අවසානයේදී සුදුසු ක්‍රමවේදයක් අනුගමනය කරමින් සිසුන් කේවල ව ගීත ගායනයේ යොදවා අගය කරන්න. සිසුන් සියල්ල ඇගයීම සඳහා කාලච්ඡේද ප්‍රමාණවත් නොවන නිසා සංගීත විෂයයට වෙන් නොකළ කාලච්ඡේද මේ සඳහා යොදා ගත හැකි ය.

පැවරුම:- ඉගෙන ගත් ගීතවලට අමතර ව ඇති වෙනත් නාඩගම් ගීත එකතුවක් කරවන්න.

අතිරේක උදවු:-

- 2009 පෙරදිග සංගීතය 12 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය පිටු අංක 182 සිට 184
- ස්වර ලිපි සහිත සිංහල නෘත්‍ය ගීත - විල්මට් පී. විජයතුංග
- ශතක සත්සර ටවර් ගී සරණිය - ස්ටැන්ලි පෙරේරා

ඇමුණුම :නාඩගම් ගීත ලැයිස්තුව

- මෙමගින් ගිය - ඉයුජින්
- උත්තම වන් ලොව - ජොහානා
- ගම්භිර තෙදැති - බැලසන්ත
- පායාලා අඹරේ - බැලසන්ත
- දුල් නිමල් දිසි සේ දිසි - ඉයුජින්
- රුවිනා පුන් සඳ සේ බබළනා - ලියනෝරා
- ලෝ පසිඳු - බ්‍රම්ෆෝර්ඩ්
- ස්වර්ණ රන් පට සළු - ඇහැළෙපොල
- යානත අතුළ මල් පෙති - ඉයුජින්
- දූතියනේ - ඉයුජින්
- සිරියෙන් ද බල රැන්දු - විධුර
- ඒ බුදු බව පතමින් - වෙස්සන්තර
- බැන්ද මට ආදර - බ්‍රම්ෆෝර්ඩ්
- ගගන රිවි සොමි - ඇහැළෙපොල

ඇමුණුම :- නූර්ති ගීත ලැයිස්තුව

**1 වන කොටස**

- මිහිරි නාද කෝකිලාදි - රාමායණය (නීතීඥ ජෝන් ද සිල්වා සූරීන්)
- මෝක්ෂාචාර්ය තිලෝනගේ - පද්මාවතී නූර්තිය (නීතීඥ චාර්ල්ස් ඩයස් සූරීන්)
- සීතා මා සිරියා ඉන්නේ - රාමායණය නූර්තිය (නීතීඥ ජෝන් ද සිල්වා සූරීන්)
- සිරසා පුදාලා - සිරිසඟබෝ නූර්තිය (නීතීඥ ජෝන් ද සිල්වා සූරීන්)
- මා පාද චාරී - සීදේවි (සිරිසේන විමලවීර මහතා)

**2 වන කොටස**

- සෝබමාන දේවපුරා - පද්මාවතී (නීතීඥ චාර්ල්ස් ඩයස් සූරීන්)
- වාසනා දිනේකි මේක - වෙස්සන්තර (නීතීඥ ජෝන් ද සිල්වා සූරීන්)
- බන්දා මා දේ දෝ - රාමායණය නූර්තිය (නීතීඥ ජෝන් ද සිල්වා සූරීන්)
- පාද පාද දැන් නගා - සකුන්තලා (නීතීඥ ජෝන් ද සිල්වා සූරීන්)
- හෘදේ මගේ ශෝක බෝ වේ - පද්මාවතී (නීතීඥ චාර්ල්ස් ඩයස් සූරීන්)
- රූප විරාජ මෝහනියේ ලෝලියා ආලවෙනු - ශූලා හෙවත් කපටි බෑනා (සී. දොන් බස්තියන්)

**ක්‍රියාකාරකම 35**

# නාඩගම් සංගීත ශෛලිය

**නිපුණතාව 7.0 :-** ව්‍යාවහාරික සංගීතය සහ රංග කලා හා බැඳි සංගීතාංග පිළිබඳ අත්දැකීම් ලබයි. සංගීත නිර්මාණ කාර්යයේ අත්හදා බැලීම් කරයි.

**නිපුණතා මට්ටම 7.1 :-** ශ්‍රී ලංකාවේ රංග සම්ප්‍රදායයන් පිළිබඳ තොරතුරු දක්වමින් ගීත ගායනයේ/වාදනයේ යෙදෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :-** 04

**ක්‍රියාකාරකම :-** නාඩගම් සංගීත ශෛලිය

**ඉගෙනුම් පල :-**

- ශ්‍රී ලංකාවේ රංග සම්ප්‍රදායන් අතරින් නාඩගම් නාට්‍යයන්හි සංගීත ශෛලිය හා එම ශෛලියට අදාළ විවිධ
  තනු හා තාල පද පිළිබඳ ව හඳුනා ගනියි.
- එම ගීතයන්හි රාගධාරී පසුබිම, තාල පද, සංගීත භාණ්ඩ පිළිබඳ ව විස්තර කරයි.
- විවිධ තනුවලට බැඳුණු සුවිශේෂී ගීත කොටස් ගායනය/ වාදනය කරයි.
- නිර්මාණාත්මක සංගීතය සඳහා නාඩගම් තනු සුදුසු පරිදි යොදා ගනියි.

**ගුණාත්මක යෙදවුම්:-** සර්පිනාවක්, මද්දලයක් නැතහොත් තබ්ලාවක්. නාඩගම් ගීතයන්හි තෝඩායම, ඉන්නිසය, උරුට්ටුව, තර්ගය, අගහාරන් අංග ඇතුළත් ගීත පද මාලා ලියූ දෘශ්‍යාධාර,

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්:-**

නාඩගම් සංගීත ශෛලීයේ හි ගීතයන්හි විවිධ තනු ,තාල පද, භාණ්ඩ , සුවිශේෂ අංග පිළිබඳ ව සාකච්ඡා කිරීම මෙම පාඩමින් අපේක්ෂිත ය. අවසානයේ දක්වා ඇති ඇමුණුම් ආශ්‍රය කරගෙන කියවීම් පත්‍රිකාවක් ඔබ විසින් සකසා ගන්න. එම විවිධ අංග ඇතුළත් ගීත ප්‍රායෝගික ව ඉගැන්වීමේ දී ඔබට අභිමත ඊට ගැළපෙන ගීත තෝරා ගැනීමේ නිදහස ඇත. (බැලසන්ත, ඉයුජින්, බ්‍රම්ෆෝර්ඩ්, වෙස්සන්තර වැනි පැරණි නාඩගම්වල ගීත තෝරා ගැනීම වැදගත්ය.) වේදිකාව හැඳින්වීමේ දී කරළිය යන වදන භාවිතය ත්, පොතේ ගුරුන්නාන්සේ, අත්වැල් ගායක කණ්ඩායම හා වාදක මණ්ඩලය කරලිය තුළ ම ස්ථානගත ව හිඳීම, මද්දල් දෙකක් අඩු තාල් හා වැඩි තාල් වශයෙන් යොදා ගැනීම ආදී නාඩගමට ආවේණික කරුණුවලින් සිසුන් දැනුම්වත් කිරීම වැදගත් වේ.

**පාඩම සංවර්ධනය :-**

- පෙර ඉගෙන ගත් නාඩගම් ගීතයක් ගයමින් පාඩමට පිවිසෙන්න. ඔබ ඉදිරිපත් කළ ගායනයේ සංගීත ලක්ෂණ පිළිබඳ ව සිසුන් විමසන්න. දෘශ්‍යාධාරය උපයෝගි කරගෙන එහි ගීත ආකෘතිය පිළිබඳ ව සාකච්ඡා කරන්න. නාඩගම් ගීතවල විවිධ ගායනා, තාල පද සංගීත භාණ්ඩ පිළිබඳ ව ඇමුණුම් 1 හි දක්වා ඇති විෂය කොටස් ද උපයෝගී කරගෙන ඔබ කියවීම් පත්‍රිකාවක් සකස් කර ගන්න. එය සිසුන් අතර බෙදා දී සැලසුම් කළ ක්‍රියාකාරකම්හි සිසුන් යොදවන්න.

(කාලච්ඡේද 02)

- ඇමුණුම් ii කොටසට අදාළ තෝඩායම, ඉන්නිසය, පොතේ සින්දුව, උරුට්ටුව, තර්ගය, අගහාරන් යන කොටස් ඇතුළත් ගීත කොටස් ඔබ නිදසුන් ලෙස ගායනය කර පෙන්වන්න. එම කොටස් හි විශේෂතා පිළිබඳ ව ඇමුණුම් ii ට ඔබ සකස් කළ කියවීම් පත්‍රිකා සිසුනට ලබා දෙන්න. එහි සැලසුම් කළ ක්‍රියාකාරකම් හි සිසුන් යොදවන්න.

(කාලච්ඡේද 02)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :-**

- එක් එක් විෂය කොටස් අවසානයේ දී හෝ වාචික ව හෝ කෙටි ලිඛිත ප්‍රශ්න මඟින් සිසුන් අගයන්න.

පැවරුම:-

- ඒ ඒ සුවිශේෂි කොටස් පැහැදිලි වන පරිදි නාඩගම් සංගීතය පිළිබඳ ව කුඩා පොත් පිංචක් සකස් කිරීමට මඟ පෙන්වන්න. සුදුසු පරිදි අගයන්න.

අතිරේක උදවු:-

- 2009 පෙරදිග සංගිතය 12 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය පිටු අංක 186 සිට 192
- සිංහල නාඩගම් ගී සරණිය - පුණ්‍යසේන ගුණසිංහ පිටු අංක 9 සිට 19
- සිංහල සංගීත සම්ප්‍රදාය - ජයන්ත අරවින්ද
- හඬ - ගුවන් විදුලි සඟරාව 2013 ජනවාරි කලාපය

ඇමුණුම :- (විෂය හා බැඳි ශීර්ෂ)

කොටස i

- මහාචාර්ය සරච්චන්ද්‍රයන්ගේ සිංහල ගැමි නාටකය ග්‍රන්ථයේ දැක්වෙන පරිදි කර්ණාටක සංගීතය නාඩගම් සංගීතයට බලපා ඇති බවට සාධකඃ
- දක්ෂිණ භාරතීය තෙරුක්කුත්තු නම් වීදි නාට්‍යවල නාඩගම් ගී තනුවලට මුල් වූ තනු අන්තර්ගත ව පැවතීම.
- දෙමළ නාඩගම් සිංහලයට පරිවර්තනය වීමේ දී එම ගීතනුවලට ම සිංහල පද මාලා නිර්මාණය වීම.
- කතෝලික පසන්, කන්තාරු තනුවල ආභාසය ලැබීම. කතෝලික ගීතිකාවන්හි හඬ නාඩගම් ගායනා සඳහා ද, බලපෑම. උදා:- (බැලසන්ත) ඉඳින් බබෝ ඉඳින් .......
- තාල රහිත පද ගායනා සඳහා දෙමළ විරිත් භාවිතය.
  – විරිත්තම් - (විරිදු වෘත්තයන්) ඉන්නිසය, කලිප්පා, කොච්චකම්, කව්වෙන්ඩා,
- දක්ෂිණ භාරතීය මේල භාවිතය
  – ශංකරාභරණම් - (බිලාවල්)
  – හනුමන්තෝඩි (භෛරවී )
  – කරහරප්‍රිය (කාෆි)
  – හරිකාම්බෝජ (ඛමාජ්)
- හින්දුස්ථානි සංගීතයේ පවතින ස්ථායි අන්තරා ගීත ආකෘතියක් නාඩගම් ගීතවල වෙන් කොට දැක්විය නොහැකි වීම.

කොටස ii

**තෝඩායම**

- මෙය නාඩගමේ ප්‍රාරම්භක තාල රහිත ගීයේ ම අවශේෂ කොටසක් ලෙස සැලකේ. පූර්ණ විරිදුව හෙවත් පොතේ සින්දුව ලෙස ද හැඳින්වේ.
- තෝඩායමෙන් නමස්කාරය සහ ප්‍රේක්ෂකයන්ගෙන් සමාව අයැදීම සිදු කෙරේ.

  උදා:- වෙස්සන්තර (ගීතය අවිඳු ගනඳුර....)
  (2009 ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ 189 පිටුව පරිහරණය කරන්න.)
  බැලසන්ත (ගගන දිය....)

**පොතේ සින්දුව**

- 2009 ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ 190 පිටුව පරිහරණය කරන්න.

**ඉන්නිසය**

- අවස්ථාවක් නැතහොත් කොටසක, චරිතයක් කරළියට ගෙන්වීම සඳහා ඉන්නිසය භාවිත කෙරේ. මෙයට ම පොතේ විරිදුව කියා ද හඳුන්වයි.

  උදා:- ඉයුජින් (නැණ රුවින් සිප් සයුර ....)
  බ්‍රම්පෝර්ඩ් (කෙතේ බැඳි පඹයා සේ ..........)
  වෙස්සන්තර(සසර සයුරෙහි සරණ..)
  (2009 ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ 188 පිටුව පරිහරණය කරන්න.)

**උරුට්ටුව**

- අලංකරණය - ආභරණය යන අරුත් ඇති උරුට්ටුව යන්නෙන් නාඩගම් ගී තනුවට ආවේණික කිසියම් තනු ඛණ්ඩයක් හැඳින්වීම සඳහා භාවිත වන්නකි. ගීතයේ මූලික ලය වෙනස් නොකර තාලය ද්විගුණ කිරීම උරුට්ටුවේ ලක්ෂණය යි. ඉහළ ස්වර පරාසයක් ඇසුරු කරන විශේෂ තනු ඛණ්ඩයකි.

  උදා:- ඉයුජින් ( දුල් නිමල් දිසි සේ දිසි..... **ගීතය** )
  (දිසි ලන්දු ගයන නිති..... **උරුට්ටු** )

**තර්ගය**

- චරිත දෙකක් අතර ඇතිවන සංවාදයක් තර්ගය ලෙස හැඳින් වේ.

  උදා :- ඉයුජින් (යානත අතුළ මල්පෙති.....)
  (දූතියනේ සවණේ....)
  වෙස්සන්තර (ඒ බුදු බව පතමින ලොබිනේ....)

**අගහාරං**

- නාඩගම් ගීතයක් ගැයීමේ දී එහි ගී පාදයක හෝ ගී පාද ඛණ්ඩයක හෝ අග පිහිටි කිසියම් අක්ෂරයක් උචිත ස්වර රටාවක් අනුව තාලය නොබිඳෙන සේ ඇද පැද ලෙළවා ගැයීම අගහාරං වශයෙන් නාඩගම් ශිල්පීහු හඳුන්වති.

  උදා:- පොතේගුරු ඉන්නිසය - අගහාරං කොටස වරහන් තුළ දක්වේ.
  කෙ තේ - / බැ ඳි/ ප ඹ යා/ (සේ - - / - - - /)

(කාලච්ඡේද 01)

ක්‍රියාකාරකම 36

# සංගීත අධ්‍යාපනය සඳහා අන්තර්ජාල භාවිතය

නිපුණතාව 10 :- සංගීතය හා බැඳි භෞතික විද්‍යාත්මක තත්ත්වයන් අධ්‍යයනය කර ප්‍රසංගාත්මක හැකියා වඩාත් සාර්ථක ලෙස ඉදිරිපත් කරයි.

නිපුණතා මට්ටම :- නව තාක්ෂණික උපකරණ සංගීත නිර්මාණයේ දී සහ අධ්‍යයනයේ දී උපයෝගී වන අයුරු පරීක්ෂා කරමින් භාවිත කරයි.

ක්‍රියාකාරකම :- සංගීතය හා බැඳි අන්තර්ජාලයේ සබැඳියාව. (රස විඳීමට, බාගත කර ගැනීම(Download), අධ්‍යයනයට, නිර්මාණ ප්‍රචාරණයට, බෙදා හැරීමට, ගබඩා කිරීමට හා සංරක්ෂණයට, නිර්මාණ හුවමාරු කර ගැනීමට හා Email)

කාලච්ඡේද සංඛ්‍යාව :- 10

ඉගෙනුම් පල :-

- සංගීතය රසවිඳීමට හා බාගත කර ගැනීම(Download) කර ගැනීමට හැකි වෙබ් අඩවි හඳුනා ගනියි.
- සංගීත අධ්‍යයනයට අන්තර්ජාලය භාවිත කළ හැකි බව පිළිගනී.
- නිර්මාණ ප්‍රචාරණයට හා බෙදාහැරීමට අන්තර්ජාලය භාවිත කිරීම පිළිබඳ ව විස්තර කරයි.
- සංගීතය ගබඩා කිරීමට හා සංරක්ෂණය සඳහා අන්තර්ජාලය තුළ භාවිත කළ හැකි වෙබ් අඩවි නම් කරයි.

ගුණාත්මක යෙදවුම් :- අන්තර්ජාලය හා සම්බන්ධ වූ පරිගණකයක් හෝ පරිගණක විද්‍යාගාරයක්

විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක් :-

අන්තර්ජාලය හා බැඳගත් සංගීත විෂයය හා සම්බන්ධ ව සාකච්ඡා කිරීම මේ පාඩමින් අපේක්ෂා කෙරේ. මෙම පාඩම අනුකොටස්වලට බෙදා ඉගැන්වීම කළ යුතු වේ. එම කරුණු පිළිබඳ ව පාඩම සංවර්ධනයේ දී පැහැදිලි කර ඇත.

වර්තමානයේ නිදහස් Wifi කලාප රජය විසින් පිහිටුව ඇත. එමෙන් ම Google සමාගම විසින් ලංකාවට ම අන්තර්ජාල පහසුකම් නොමිලේ ලබා දීමට සැලසුම් කර ඇත. මේ වන විට එය ක්‍රියාත්මක වෙමින් පවතී. මෙම තත්ත්වය මත අන්තර්ජාලය හා සම්බන්ධ වීම හා අන්තර්ජාලය භාවිතය ඉතා සැලකිය යුතු හා පහසු කටයුත්තක් වනු ඇත. එම නිසා මෙම පාඩම ඔබ හෝ මේ පිළිබඳ ව හොඳින් අවබෝධයක් ඇති සම්පත් දායකයකු මඟින් හෝ ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු ය.

පාඩම සංවර්ධනය :-

- අන්තර්ජාලය මඟින් you tube හි ඇති සංගීත කෘතියක් නැරඹීමට සැලැස්වීමට පාඩමට පිවිසෙන්න. මේ පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡා කරන්න. අන්තර්ජාලයෙහි ඇති වැදගත්කම පිළිබඳ ව සිසුන් විමසන්න.

(කාලච්ඡේද 01)

- ඇමුණුම 01 සඳහන් ක්‍රියාකාරකම්වල යෙදෙන්න. සිසුන් සමග සාකච්ඡා ස්වරූපයෙන් පාඩමේ ක්‍රියාකාරකම්වල යෙදෙන්න. රස විඳීම සඳහා භාවිත වන වෙබ් අඩවි හා බාගත කර ගැනීම කරගන්නා අයුරු පිළිබඳ ව වෙන් වෙන් වශයෙන් සාකච්ඡා කරන්න.

(කාලච්ඡේද 02)

- ඇමුණුම 02 සඳහන් ක්‍රියාකාරකම්වල යෙදෙන්න.

(කාලච්ඡේද 02)

- ඇමුණුම 03 සඳහන් ක්‍රියාකාරකම්වල යෙදෙන්න.

(කාලච්චේද 02)

- ඇමුණුම 04 සඳහන් වෙබ් අඩවියට පිවිස එහි ගිණුමක් (Email account) සාදන ක්‍රියාකාරකමක යෙදෙන්න. දී ඇති එක් එක් වෙබ් අඩවි වෙත පිවිස පරීක්ෂා කරන්න.

(කාලච්ඡේද 01)

- ඇමුණුම 05 සඳහන් වෙබ් අඩවිය වෙත පිවිස Email ගිණුමක් විවෘත කරන්න. Email මඟින් දත්ත හුවමාරු කර ගත හැකි ආකාරය පිළිබඳ ව සාකච්ඡා කරන්න. attach file යන්න click කොට MP3 ගීතයක් attach කර ගන්නා ආකාරය සාකච්ඡා කරන්න.

(කාලච්ඡේද 02)

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :-

- එක් එක් විෂය කොටස් අවසානයේ අගයන්න.
- සියලු ම විෂය කොටස් ආවරණය වන පරිදි ලිපියක් සැකසීමට උපදෙස් දෙන්න.

අතිරේක උදවු :-

- 11 ශ්‍රේණිය කියවීම් පොත

**ඇමුණුම 01 - සංගීතය රස විඳීමට බාගත (download) කර ගැනීම**

මේ සඳහා ඉතා වැදගත් ම වෙබ් අඩවිය ලෙස you tube.com හඳුන්වා දිය හැකිය. ඔබ පරිගණක අන්තර්ජාලයට සම්බන්ධ කොට පහත සඳහන් සබඳය ලින්ක් එක link නැතහොත් URL (Uniform Resource Locator) web adress කවුළුව මත type enter යතුර ඔබන්න.

www.youtube.com දැන් ඔබ මෙම වෙබ් අඩවිය වෙත පිවිස ඇත. දැන් ඔබට අවශ්‍ය ගීතයේ නම එහි ඇති සෙවුම් කවුළුව මත (search box) type කරන්න.

උදා :- nim him sewwa - Amaradeva

දැන් නැවත enter යතුර ඔබන්න. එම ගීතයේ විවිධ ආකාරයෙන් video ලෙස ඔබට දිස්කෙටවනු ඇත. ඔබට එය ඔබගේ පරිගණකයට බාගත කර ගැනීමට (download) IDM (Internet Download Manager) යන මෘදුකාංගය අවශ්‍ය වේ. නැතහොත් you tube downloder යන නොමිලේ ලබා දෙන මෘදුකාංගය බාගත කර ඔබගේ පරිගණකයේ ස්ථාපිත කර ගන්න. එහි අදාළ URL එක නැතහොත් ඉහළ

කවුළුවේ සඳහන් වන web adress එක copy කර paste කිරීමෙන් අවශ්‍ය ගීතය download කර ගත හැකිය. (Audio හෝ Video ලෙස.)

තව ද ඔබට අවශ්‍ය ගීත ලබා ගත හැකි web site කිහිපයක URL පහත දැක්වේ.

www.music.lk

www.elakiri.com

www.sinhalageetha.ocm

www.anammanan.com

www.topsinhalamp3.com

www.helanada.com

www.hirufm.lk

www.sinhalasongs.lk

www.sarigama.lk

www.sinhalajukebox.org

www.sinhalaoldhits.com

ආදිය වේ.

මීට අමතර ව you tube අඩවියේ ඔබ නරඹන වීඩියෝව Audio file video ලෙසින් download කර ගැනීමට URL හි you tube යන වචනයට පෙර ss යනුවෙන් type කර enter කරන්න. උදා :- https://www.ssyoutube.com/wach? v = lz ලෙසින්) එවිට අන්තර්ජාලයේ ඇති en.savefrom.net අඩවිය මඟින් ඔබේ file එක download කර දෙනු ඇත.

**ඇමුණුම 02**

සංගීතය ඉගෙන ගැනීමට හා අධ්‍යයනයට :-

මේ සඳහා ඉතා වැදගත්ම website එක ලෙස you tube හැඳින්විය හැකිය. මෙම web අඩවියට පිවිස how to....යනුවෙන් type කර ඔබට අවශ්‍ය දේ අධ්‍යයනය කිරීමට පුළුවන. How to make gintar යනුවෙන් type කර බලන්න.

මේ සඳහා ඉතා වැදගත් තවත් web site එකක් ලෙස www.wikipeadia.org හැඳින්විය හැක. මෙය අන්තර්ජාල විශ්ව කෝෂයකි. ඔබට අවශ්‍ය ඕනෑ ම කරුණක් පිළිබඳ ව මෙම website ට පිවිසීමෙන් ලබාගත හැක. ඔබගේ සෙවුම් කවුළුව මත (search box) Bhajan songs wikipedia යනුවෙන් type කර enter කොට බලන්න. මෙවැනි තවත් විශ්ව කෝෂ කිහිපයක URL පහත දැක්වේ.

www.encyclopedia.com

www.britannica.com

www.worldbook.com

www.answers.com

www.freebase.com

www.reference.com

www.who2.com

www.eol.org

මීට අමතර ව සංගීතය ඉගෙන ගත හැකිබොහෝ වෙබ් අඩවි තවත් ඇත. www.interactives.weebly.com/music.html යනුවෙන් type කර බලන්න. තවද www.musictechteacher.com යනුවෙන් type කර බලන්න. මෙය ඉතා ම වැදගත් website එකක් වන අතර ඔබගේ දැනුම පරීක්ෂා කර ගත හැකි quizzes පවා ඇත. මීට අමතර මුදල් ගෙවා online ඉගෙන ගැනීමට හැකි website ද ඇත.

උදා :- www.asaphmusic.com

www.upstartmusic.de

www.musicltup.ocm

ඉන්දියානු සංගීත ඉගෙන ගැනීමට

www.mio.to

www.shankarmahadevanacademy.ocm

www.omenad.net

www.musichoolindia.com වෙත පිවිසෙන්න.

**ඇමුණුම 03**

නිර්මාණ ප්‍රචාරයට නැතහොත් මුදා හැරීමට

මේ සඳහා අන්තර්ජාලය භාවිත කළ හැකි ක්‍රම 02කි.

1. තමන් විසින්ම upload කිරීම.

2. වෙනත් සංගීත ප්‍රචාරණ website වෙත තමාගේ නිර්මාණ ලබා දීම

1. තමන් විසින් upload කිරීමට නම් ඔබ you tube හි ඔබේ නමින් ගිණුමක් සාදාගත යුතු ය. ඔබගේ search box හී How to create you tube accont යනුවෙන් type කර බලන්න. නැතහොත්

   www.youtube.ocm/watch? V=j_47rrfftbk යන URL type කර enter කරන්න.

2. වෙනත් ලංකාවේ ජනප්‍රිය music website සඳහා ඔබගේ නිර්මාණ ලබා දිය හැකිය. ඒ සඳහා music.lk/elakiri.com/anammanan.lk ආදි websiteවලට පිවිස contact වෙත පිවිස දුරකථන අංක ලබාගෙන ලබාදිය හැකිය.

**ඇමුණුම 04**

ඔබගේ නිර්මාණ කෘති ගබඩා කිරීම සහ සංරක්ෂණය කිරීමට :-

නිර්මාණකරුවන් සඳහා මෙය ඉතා වැදගත් කාර්යයක් වන අතර ඔබට ඔබගේ ගීත, Document වැදගත් සහතික පත්‍ර scan කරගත් files, ස්වර ප්‍රස්තාර ආදි ඕනෑම දෙයක් අන්තර්ජාලය තුළ රඳවා තැබීමට හැකිය. මේ සඳහා ඔබ කළ යුත්තේ අන්තර්ජාලයේ පහත web අඩවි වලට පිවිස ගිණුමක් සාදා ගැනීම යි.

www.google.com/APPS/Drive - 30 GB (නොමිලේ ගබඩා කර ගත හැකි දත්ත ප්‍රමාණය)

www.dropbox.com - 2GB ඔබ විසින් මෙම වෙබ් අඩවියට යහළුවකු සම්බන්ධ කළ විට එක් අයකුට 16 GB බැගින් ඔබට උපයා ගත හැක.

www.mediafire.com - 50GB මෙය ද ඉතා වැදගත් web site එකක් වේ. මෙහි ඔබ විසින් upload කරන දත්ත සදාකල් සුරකේ.

ඇමුණුම 5

තොරතුරු හා දත්ත හුවමාරුව - විද්‍යුත් තැපෑල

ඔබ හට අවශ්‍ය දත්ත හුවමාරුව මෙන් ම සන්නිවේදනය සඳහා අන්තර්ජාලය තරම් වේගවත් හා පහසු මාධ්‍යයක් තවත් ඇත්තේ නැත. මේ සඳහා භාවිත කළ හැකි හොඳම ක්‍රමය නම් Email හෙවත් විද්‍යුත් තැපෑල යි. මෙය ලෝකයේ සමාගම් කිහිපයක් මඟින් ම නොමිලේ ලබා දෙන පහසුකමකි. එම සමාගම් කිහිපයක් සහ ඔවුන්ගේ Email පහත දක්වේ.

Google - gmail

Yahoo - yahoomail

MSN - hotmail

මෙම පහසුකමේ දී ඔබට ගීතයක් හෝ කිහිපයක් හෝ එක් වරකට හුවමාරු කර ගත හැකිය. MP3 format එකට පරිවර්තනය කරන ලද ගීත මේ සඳහා යෝග්‍ය වේ. මුලින් ම ඔබ විසින් Email ගිණුමක් සාදාගත යුතු ය. මේ සඳහා පහසුවෙන් ම yahoo හෝ gmail හෝ ගිණුමක් සුදුසු ය. ඔබ විසින් ඔබගේ search box එකේ signup to gmail හෝ signup to yahoo mail යන්න type කර enter කරන්න. දැන් පෙනෙන සෙවුම් කරුණු අතරින් signup gmail යන්න තෝරා එම web අඩවිය වෙත පිවිසෙන්න. දැන් ඔබට පිරවීමට පෝරමයක් ලැබෙනු ඇත. එම පෝරමය නිවැරදි ව පුරවා අවසානයේ create account click කිරීමෙන් ඔබට ම විද්‍යුත් ලිපිනයක් ලබා ගත හැකිය. ඔබගේ නම අනුව උදා :- nimalp@gmail.com. දැන් ඔබට මේ මඟින් ඔබට අවශ්‍ය කරන තොරතුරු හුවමාරු කර ගත හැකිය. සාමාන්‍යයෙන් gmail සහ yahoomail ඔස්සේ උපරිම එක් වරකට හුවමාරු කර ගත හැකි උපරිමදත්ත ප්‍රමාණය 25MB වේ.

ක්‍රියාකාරකම 37

# රාගධාරී ගී ගයමු, වයමු. (ආසාවරී රාගය)

නිපුණතාව 1.0 :- සම්භාව්‍ය සංගීතයේ ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනාගනිමින් ගායන වාදන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම 1.2 :- උත්තර භාරතීය සංගීතයට අයත් රාග කිහිපයක ස්වභාවය සහ සම විෂමතා හඳුනා ගනිමින් ගායනයේ/වාදනයේ යෙදෙයි.

ක්‍රියාකාරකම :- රාගධාරී ගී ගයමු, වයමු.

කාලච්ඡේද සංඛ්‍යාව :- 18

ඉගෙනුම් ඵල :-

- ආසාවරී රාගයේ ස්වර අභ්‍යාස ගායනය/වාදනය කරයි.
- ආසාවරී රාගයේ ලක්ෂණ සහ ස්වභාවය සාකච්ඡා කරයි.
- ආසාවරී සර්ගම්, මධ්‍යලය ගී, ගායනය/වාදනය කරයි.
- ආලාප හා මධ්‍යාලාපය ගායනය/වාදනය කරයි.
- තානාලංකාර නිර්මාණය කරගනිමින් ගායනය/වාදනය කරයි.

ගුණාත්මක යෙදවුම් :- තාම්පුරාව, සර්පිනාව, තබ්ලාව, දෘශ්‍යාධාර

විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක් :-

ආසාවරී රාගයට අයත් ස්වර අභ්‍යාස, සර්ගම් මධ්‍යලය ගී, ආලාප, මධ්‍යාලාප, තානාලංකාර ප්‍රායෝගික ව ගායනය/වාදනය පුහුණු කිරීම මෙම ක්‍රියාකාරකමෙන් අපේක්ෂිත ය. මේ මඟින් රාග සංගති. රාග ස්වභාවය පිළිබඳ මනා අවබෝධයක් ලැබෙන අතර රාග රසවින්දන ශක්තිය වර්ධනය වී නිර්මාණයට ද අවස්ථාවක් ලැබෙනු ඇත.

මේ සඳහා ආසාවරී රාගයට අයත් ස්වර අභ්‍යාස, සර්ගම්, මධ්‍යලය ගී, ආලාප, මධ්‍යාලාප, තානාලංකාර පුහුණුව හා ඇගයීම සමඟ කාලච්ඡේද 18ක් යොදාගෙන ඇත.

රාග ස්වභාවය මැනවින් විදහා දක්වෙන ගීත මේ සඳහා යොදාගත හැකිය. ඇමුණුමේ දක්වෙන ගීතයක් හෝ වෙනත් ගීතයක් හෝ ඔබට තෝරා ගත හැකිය.

වාදනය කරන සිසුන් සඳහා රාගාංග මැනවින් විදහා දක්වෙන වාදිතයක් යොදාගත හැකිය.

ශ්‍රැතිය ස්වර ස්ථාන ස්වර සංගති, තාලය සහ මිහිරිතාව රසභාවය පිළිබඳව වඩාත් සැලකිලිමත් වෙමින් පුහුණු කිරීමේ කාර්යයෙහි යොදවන්න.

මෙම නිපුණතා මට්ටම හා බැඳි ක්‍රියාකාරකම් අතරතුර දී හා අවසානයේ දී කරනු ලබන ඇගයීම් මඟින් සිසුන් ළඟා වී ඇති නිපුණතා මට්ටම පිළිබඳව සොයා බලා දුර්වලතා මඟ හරවා ගැනීමට අවශ්‍ය පියවර ගත හැකිය.

පාඩම සංවර්ධනය :-

- පාඩම් අංක 04 භාගේශ්‍රී රාගයේ පාඩම් සංවර්ධන ක්‍රියාකාරකම් පිළිවෙළ අනුගමනය කරන්න.

(කාලච්ඡේද 18)

- ආසාවරී රාගය හා සම්බන්ධ ඇමුණුම් යොදා ගන්න.

ආසාවරී රාගය

| | | |
|---|---|---|
| මේලය | - | ආසාවරී |
| ආරෝහණ | - | ස, රි, ම, ප, ධ, ස̇ |
| අවරෝහණ | - | ස̇, නි ධ, ප, ම, ග, රි, ස |
| ජාතිය | - | ඖඩව සම්පූර්ණ |
| වාදී | - | ධ |
| සංවාදී | - | ග |
| මුඛ්‍යාංගය | - | රි, ම, ප, නි, ධ, ප |
| ගානසමය | - | දිනයේ දෙවන ප්‍රහරය |

ආසාවරී රාගයේ ආරෝහණය ගාන්ධාරය සහ නිෂාදය වර්ජිත ය අවරෝහණයේ සියලු ස්වර යෙදේ. මෙම රාගයේ ග ධ නි කෝමළව ද අනෙක් ස්වර ශුද්ධ ව ද යෙදේ. ආසාවරී රාගය උත්තරාංගවාදී රාගයකි.

රි, ම, ප, නි ධ, ප - ආසාවරී රාගයේ මුඛ්‍යාංගය යි. ධ, ම, ප, ධ ග, රි, ස, රි̇, ම, ප, ස̇, ධ, ප මුඛ්‍යාංගය ලෙස ද මතයක් ඇත.

රි, ම, ප, මපධ මප, ධ ධපමපග, පග රිස, පග̇රි̇ස̇ රි̇ නි ධ ප, ස̇ නි ධ ප, ම ප ධ ධ ස̇ වැනි ස්වර සංගති නිතර යෙදේ.

**ආසාවරී රාගය**

ස්වර අභ්‍යාස

ස රි ස

ස රි ම ග රි ස

ස රි ම ප ම ග රි ස

ස රි ම ප ධ ප ම ප ධ ප ම ග රි ස

ස රි ම ප ධ නි ධ ප ම ප ධ ප ම ග රි ස

ස රි ම ප ධ ස̇ නි ධ ප ම ප ධ ප ම ග රි ස

ස රි ම ප ධ ස̇ රි̇ ම̇ ග̇ රි̇ ස̇ නි ධ ප ම ප ධ ප ම ග රි ස

ස රි ම, රි ම ප, ම ප ධ, ප ධ ස̇

ස̇ නි ධ, නි ධ ප, ධ ප ම, ප ම ග, ම ග රි, ග රි ස

මම රිමම රිමම ගරිස

පප මපප මපප රිමම ගරිස

ධධ පධධ පධ ධ මපප රිමම ගරිස

නිනි ධ නි නි ධ නි නි පධ ධ මපප රිමම ගරිස

ස්ස් ධස්ස් ධස්ස් ධනිනි පධධ මපප රිමම ගරිස

මේ ඇසුරෙන් ස්වර අභ්‍යාස ගොඩ නගා ගත හැක.

**සර්ගම්**

| | | | |
|---|---|---|---|
| රි ම ප නි | ධ ධ ප ප | ම ප ධ ප | ග ග රි ස |
| රි ස ධ ප | ම ප ධ ස | රි ම ප ධ | ග ග රි ස |
| 3 | x | 2 | 0 |

අන්තරා

| | | | |
|---|---|---|---|
| ම ප ධ ධ | ස් - රි ස් | ධ ධ ස් ග් | රි ස් ධ ප |
| ප ග් රි ස් | රි ස් ධ ප | ම ප ධ ප | ග ග රි ස |
| 3 | x | 2 | 0 |

- පහත දැක්වෙන ගීත අතුරින් කැමති මධ්‍ය ලය ගීතයක් තෝරාගත හැකි ය.

භාගේශ්‍රී රාගය
1. අකියා ලාගී
2. හරිබින තේරා කෝනස හාර්
3. අරෙමන සමජ සමජ

ක්‍රියාකාරකම 38

# ආසාවරී ජෞනපූරී යන රාග යුගලයන්හි සම ප්‍රකෘති බව

නිපුණතාව 1.0 :- සම්භාව්‍ය සංගීතයේ ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනා ගනිමින් ගායන වාදන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම 1.2 :- උත්තර භාරතීය සංගීතයට අයත් රාග කිහිපයක ස්වභාවය සහ සම විෂමකම් හඳුනා ගනිමින් වාදනයේ යෙදෙයි.

ක්‍රියාකාරකම :- ආසාවරී ජෞනපූරී යන රාග යුගලයන්හි සමප්‍රකෘති බව

කාලච්ඡේද සංඛ්‍යාව :- 06

ඉගෙනුම් ඵල :-

- ආසාවරී ජෞනපූරී රාග යුගලයන්හි සමප්‍රකෘති බව හඳුනා ගනී.
- ආසාවරී ජෞනපූරී රාගවල ප්‍රධාන ස්වර සංගති ගායනය/වාදනය කරයි.
- ආසාවරී ජෞනපූරී රාගවල සම විෂමතා වගුගත කරයි.
- රාග භාවිතයේ දී සමප්‍රකෘති රාග ඉගෙනීමේ අවශ්‍යතාව පිළිගනී.

ගුණාත්මක යෙදවුම් :- තාම්පූරා, සර්පිනා දෘශ්‍යාධාර

විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක්

ආසාවරී රාගය ජෞනපූරී රාගය යන රාග යුගලයන්හි ආරෝහණ අවරෝහණ ස්වර ප්‍රධාන ස්වර සංගති රාගාංග සහිත ස්වර අභ්‍යාස ප්‍රායෝගික ව ගායනය/වාදනය පුහුණු කිරීම මෙම ක්‍රියාකාරකමෙහි අපේක්ෂිත ය. මේ මඟින් රාග ස්වභාවය රාග සංගති පිළිබඳ මනා අවබෝධයක් ලැබෙන අතර රාග රසවින්දන ශක්තිය වර්ධනය වී රාග දෙක අතර සම විෂමතා හඳුනා ගැනීමට රාග සංගති ගයා/වයා දැක්වීමටත් හැකියාව ලැබෙනු ඇත.

- ඇමුණුමේ දැක්වෙන ස්වර අභ්‍යාස රාගාංග සහිත බව සකසා ගත් ස්වර අභ්‍යාස මේ සඳහා යොදා ගත හැකිය.
- ශ්‍රැතිය, ස්වර ස්ථාන, ස්වර සංගති නිවැරදි බව සහ මිහිරි බව පිළිබඳ වඩාත් සැලකිලිමත් වෙමින් පුහුණු කිරීම් කරවන්න.

පාඩම සංවර්ධනය

පාඩම් අංක 22 දේස් තිලක්කාමෝද් සමප්‍රකෘති රාගවල පාඩම සංවර්ධන පිළිවෙළ අනුගමනය කරන්න.

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :-

ක්‍රියාකාරකම් අවසානයේ සිසුන් ළඟා වී ඇති නිපුණතා මට්ටම විමසා බලා දුර්වලතා මඟහරවා ගැනීමට උචිත ලෙස ඇගයීම් සංවිධානය කර ගත හැකිය.

ක්‍රියාකාරකම් ආරම්භයේ සිට ම ශ්‍රැතිය, ස්වර ස්ථාන ස්වරසංගති මිහිරි ව හා නිවැරදි ව ගායනය/වාදනය සඳහා නිරන්තර ඇගයීම් කළ යුතු වේ.

මූලාශ්‍ර :- Musicology of India - US Nigam

**ඇමුණුම් අංක 04 - රාග ලක්ෂණ**

| රාගය | ථාටය | ආරෝහණ අවරෝහණ | ජාතිය | වාදී | සංවාදී | මුඛ්‍යාංග | ගානසමය |
|---|---|---|---|---|---|---|---|
| ආසාවරී | ආසාවරී | සරි,මප, ධ, ස්<br>ස් නි ධ ප ම ග රි ස | ඖඩව සම්පූර්ණ | ධ | ග | රි, ම, ප, නි, ධ ප | දිවා දෙවන ප්‍රහරය |
| ජෞනපූරි | ආසාවරී | ස රි ම, ප, ධ, නි ස්<br>ස්, නි, ධ, ප, ම ග රි ස | ඖඩව සම්පූර්ණ | ධ | ග | මප,නි ධ ප මපග,රිමප | දිවා දෙවන ප්‍රහරය |

රාගයන්හි සුවිශේෂ ලක්ෂණ

| රාගය විශේෂ ස්වර සංගති | සුවිශේෂ ලක්ෂණ | |
|---|---|---|
| **ආසාවරී** | ස, ම රි ම ප | උත්තරාංගවාදී රාගයකි. ආරෝහණයේ ග නි ස්වර වර්ජිත ය. |

රිමප, නි ධ ප

මපධ මප, ග, රි ස

රි් නි ධ ප

ප, ධ ස්

ධ ධ පමප ග, රි ස

මප, ධ ධ, ස්

ප ග රි ස, - පග් රිස්

රිමපස් ධ ප,

**ජෞනපූරි**

ස රි මප

ම ප ධ මප ග රි ස

ම ප ධ නි ස්

නි ස් නි ස් ධ ප

ධ ධ පමප ග, රි ස

ප ධ නි ස් නි ස් ධ ප

- උත්තරාංගවාදී රාගයක්
- ආරෝහණයෙ ග වර්ජිත යි.
- මප ^ම^ග, රි ම ප යන ස්වර ඛණ්ඩ නිතර යෙදේ.

රි ම ප නි ධ ප

රි නි ධ ප

ම ප ධ ම ප ^ම^ග රි ස

ම ප ග, රි ම ප

ක්‍රියාකාරකම 39

# භාරතීය සංගීතයේ ස්වභාවය

නිපුණතාව 2.0 :- විශ්ව සංගීතයේ ස්වභාවය වටහා ගනිමින් විවිධතා ගවේෂණය කරයි.

නිපුණතා මට්ටම 2.2 :- භාරතීය සංගීතයේ විවිධතා පිළිබඳ විචාරාත්මක අදහස් දක්වමින් විවිධ ශෛලීන් ප්‍රායෝගික අධ්‍යයන ට පෙලඹෙයි.

ක්‍රියාකාරකම :- භාරතීය සංගීතයේ ස්වභාවය

කාලච්ඡේද සංඛ්‍යාව :- 02

ඉගෙනුම් ඵල :-

- භාරතීය සංගීත පද්ධති නම් කරයි.
- භාරතීය සංගීතයේ ස්වභාවය විස්තර කරයි.
- භාරතීය සංගීත පද්ධතියේ ස්වභාවය විස්තර කරයි.

ගුණාත්මක යෙදවුම් :- මාතෘකාවට අදාළ විෂය කරුණුවලට ගැළපෙන ලෙස සැකසූ දෘශ්‍ය උපකරණ

කියවීම් පත්‍රිකා, ස්වර වාද්‍ය භාණ්ඩයක්

විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක්

භාරතීය සංගීතය ප්‍රධාන කොටස් දෙකක් බවත් අප ඉගෙන ගන්නා සංගීතය උත්තර භාරතීය සංගීතය බව වටහා දීමත් එහි ස්වභාවය පිළිබඳ ව මූලික කරුණු අධ්‍යයනය කිරීමත් මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

පාඩම සංවර්ධනය

- භාරතීය සංගීතය කොටස් වශයෙන් බෙදෙන බව දක්වෙන දෘශ්‍ය උපකරණය ප්‍රදර්ශනය කරමින් එම කොටස් පිළිබඳ ව සාකච්ඡාවක් මෙහෙයවන්න.

(කාලච්ඡේද 01)

- ඇමුණුම් අංක 02 හි කියවීම් පත්‍රිකාව කියවීමට සිසුන්ට කියවීමට යොමු කරන්න.

එම කරුණු එකින් එක පිළිබඳ ව සාකච්ඡාවක යෙදෙන්න.

(කාලච්ඡේද 01)

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :-

කියවීම් පත්‍රිකාවේ සඳහන් කරුණු ගොනුගත වන සේ සකස් කළ කෙටි ප්‍රශ්නාවලියක් සකස් කර සිසුන්ට ලබාදී පිළිතුරු සැපයීමට උපදෙස් දෙන්න.

පැවරුම :- විෂය කරුණු ආවරණය වන පරිදි ලිපියක් සකස් කිරීමට මඟ පෙන්වන්න.

අතිරේක උදවු :- සංගීත සංහිතා (විමල් අභයසුන්දර)

2009 පෙරදිග සංගීතය ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය.

ඇමුණුම අංක 01

භාරතීය සංගීතය

- මාර්ග සංගීතය
- දේශීය සංගීතය
  - හින්දුස්ථානි සංගීතය
  - කර්ණාටක සංගීතය

ඇමුණුම අංක 02

භාරතීය සංගීතය කොටස් දෙකකට බෙදේ.

මාර්ග සංගීතය දෙවියන් කරා ළඟා වීමට හැකි සංගීත ක්‍රමයක් බැවින් ඉන් පුද්ගලයකුගේ මානසික තත්ත්වය දියුණු කළ හැකි බව.

සාමාන්‍ය ජනතාව අතරේ පවතින සංගීතය දේශීය සංගීතය බව.

දේශීය සංගීත උත්තර හා දක්ෂිණ වශයෙන් කොටස් 02 ඇති බව.

ඒකල ගායනය හා පුද්ගල හැකියා ශිල්පීය දක්ෂතා ප්‍රදර්ශනය කිරීමට ඉඩ සැලසෙන බව.

ලිඛිත ක්‍රමයට වඩා නිර්මාණාත්මක බවට විශේෂත්වයක් ලැබෙන බව.

පද්ධති දෙකේ ම සංගීත ලක්‍ෂණ වෙන් වෙන් වශයෙන් අවබෝධ කර ගත හැකි බව.

සංගීත භාණ්ඩ යොදාගෙන කේවල ව සම්පූර්ණ වාදනයක් ඉදිරිපත් කළ හැකි වේ.

එකිනෙකට වෙනස් වූ ගායන ශෛලීන් රාශියක් ඇති බව.

මීන්ඩ්, ගමක් මූර්කි ආදි සුවිශේෂ ශිල්පාංග යොදා ගන්නා බව.

විවිධතා ඇති තාල පද්ධතියක් භාවිත වන බව.

තත්, ඝන, ශුෂිර, අවනද්ධ, යන වර්ග 04 අයත් භාණ්ඩ භාවිත වන බව හා ඒවායේ ඒකල වාදන ඇති බව.

ථාට මූලික ව බිහි වී ඇති බව.

විවිධ භාෂා ශෛලීන් භාවිතය හින්දි, ගුජරාට, තෙලිඟු, ද්‍රවිඩ, මරාට ආදි...

ක්‍රියාකාරකම 40

# උත්තර හා දක්ෂිණ භාරතීය සංගීත පද්ධතිවල සම විෂමතා

| | | |
|---|---|---|
| නිපුණතාව 2.0 | :- | විශ්ව සංගීතයේ ස්වභාවය වටහා ගනිමින් විවිධතා ගවේෂණය කරයි. |
| නිපුණතා මට්ටම 2.2 | :- | භාරතීය සංගීතයේ විවිධතා පිළිබඳ විචාරාත්මක අදහස් දක්වමින් විවිධ ශෛලීන් ප්‍රායෝගික අධ්‍යයනයට පෙලඹෙයි. |
| ක්‍රියාකාරකම | :- | උත්තර හා දක්ෂිණ භාරතීය සංගීත පද්ධතිවල සම විෂමතා |
| කාලච්ඡේද සංඛ්‍යාව | :- | කාලච්ඡේද 02 |

ඉගෙනුම් පල :-
- උත්තර හා දක්ෂිණ භාරතීය සංගීත පද්ධතිවල ලක්ෂණ විස්තර කරයි.
- උත්තර හා දක්ෂිණ භාරතීය පද්ධතිවල ලක්ෂණ අගය කරයි.
- පද්ධති දෙකෙහි ලක්ෂණ සංසන්දනය කරයි.

ගුණාත්මක යෙදවුම් :-
- ඇමුණුම් අංක 01හි සඳහන් මාතෘකා අනුව සකස් කර ගත් කියවීම් පත්‍රිකාවේ පිටපත්.
- හින්දුස්ථානී, කර්ණාටක සංගීත පද්ධතිවලට අදාළ ගායනයක් හෝ වාදනයක් හෝ ඇතුළත් CD / DVD.

විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක්

උත්තර හා දක්ෂිණ භාරතීය සංගීත පද්ධති දෙකෙහි බොහෝ සමානකම් ඇතත් මේ දෙක අතර සැලකිය යුතු වෙනස්කම් ඇත. සිද්ධාන්තමය හා ප්‍රායෝගික වශයෙන් මෙම පද්ධති දෙකෙහි ඇති සම විෂමතා හඳුනා ගැනීමත් ඒවා සංසන්දනාත්මක ව අධ්‍යයනය කිරීමත් මෙම පාඩමෙන් අපේක්ෂිත ය. ඇමුණුම් අංක 01හි සඳහන් විෂය මාතෘකා අනුව කියවීම් පත්‍රිකාවක් සකසා ගැනීම ගුරුවරයා විසින් කළ යුතු ය.

.පාඩම සංවර්ධනය

- හින්දුස්ථානි හා කර්ණාටක ශෛලි වලට ආවේණික ගායනයක් හෝ වාදනයක් ශ්‍රවණයට සලස්වන්න.
- එම ගායන වාදන තුළ දකිය හැකි ලක්ෂණ පිළිබඳව විමසන්න.

  ඇමුණුම් අංක 01 මාතෘකා අනුව සඳහන් හින්දුස්ථානි හා කර්ණාටක සංගීත පද්ධතිවල ලක්ෂණ පිළිබඳ ව ඔබ සකස් කරගත් පත්‍රිකා බෙදා දෙන්න.

(කාලච්ඡේද 01)

- පද්ධති දෙකෙහි ලක්ෂණ පිළිබඳ ව සංසන්දනාත්මක සාකච්ඡාවක යෙදෙන්න.
- පද්ධති දෙකෙහි සම විෂමතා පිළිබඳ ව ලැයිස්තුවක් සකස් කරන්න.

(කාලච්ඡේද 01)

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :-

කියවීම් පත්‍රිකාවේ සඳහන් කරුණු ඇතුළත් වන සේ සකස් කළ කෙටි

ප්‍රශ්නාවලියක් සිසුන්ට ලබාදී පිළිතුරු සැපයීමට උපදෙස් දෙන්න.

පැවරුම :- විෂය කරුණු ආවරණය වන පරිදි ලිපියක් සකස් කිරීමට මඟ පෙන්වන්න.

අතිරේක උදව් :- සංගීත සංහිතා (විමල් අභයසුන්දර)

2009 පෙරදිග සංගීතය ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය.

ඇමුණුම් අංක 01

මේල රාග සිද්ධාන්තය

ආලාප තාන්

ගමක්, මීන්ඩ්, මූර්කි

ස්වර සංඛ්‍යාව

ගීත ආකෘතිය

ස්වර වාද්‍ය භාණ්ඩ හා තාල වාද්‍ය භාණ්ඩ

ප්‍රධාන තත් වාද්‍ය

භාෂාව

ස්වර නාම

මේල සංඛ්‍යාව

මේල නාමයන්

තාල සංඛ්‍යාව

ගායන ශෛලීන්

ඉහත සඳහන් මාතෘකා ආශ්‍රය කරගෙන පද්ධති දෙකෙහි සම විෂමකම් ලැයිස්තු ගත කරන්න. මීට අමතර තොරතුරු ඇත්නම් ඒවා ද ලැයිස්තු ගත කිරීමට සිසුන් යොමු කරවන්න.

ක්‍රියාකාරකම 41

# උතුරු ඉන්දීය ගායන ශෛලින් ධ්‍රැපද්, ධමාර්, චතුරංග හා බැඳි සිද්ධාන්ත

නිපුණතාවය 2.0 :- විශ්ව සංගීතයේ ස්වභාවය වටහා ගනිමින් විවිධතා ගවේෂණය කරයි.

නිපුණතා මට්ටම 2.2 :- භාරතීය සංගීතයේ විවිධතා පිළිබඳ විචාරාත්මක අදහස් දක්වමින් විවිධ ගායන ශෛලින් ප්‍රායෝගික අධ්‍යයනට පෙලඹෙයි.

ක්‍රියාකාරකම :- උතුරු ඉන්දීය ගායන ශෛලීන් ධ්‍රැපද්, ධමාර්, චතුරංග හා බැඳි සිද්ධාන්ත

කාලච්ඡේද සංඛ්‍යාව :- 02

ඉගෙනුම් පල :-
- ධ්‍රැපද් හා ධමාර් යන ශෛලින් පිළිබඳ ව විස්තර කරයි.
- චතුරංග ගායන ශෛලින් පිළිබඳ විස්තර කරයි.
- ධ්‍රැපද්, ධමාර් හා චතුරංග ගායන ශෛලීන්ගේ වෙනස්කම් පිළිගනියි.
- එක් එක් ගායන ශෛලීන්වල ලක්ෂණ සංසන්දනය කරයි.

ගුණාත්මක යෙදවුම් :-
- අදාළ ඇමුණුම්වලට සකස් කළ කියවීම් පත්‍රිකා පිටපත්
- සර්පිනාව

විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක්

භාරතීය ගායන ශෛලින් කිහිපයක සිද්ධාන්තමය කරුණු අධ්‍යයනය කිරීම මෙම පාඩමින් අපේක්ෂිතය. මේවා පිළිබඳ සංසන්දනාත්මක අධ්‍යයනයකින් සාර්ථක ප්‍රතිඵල අත්කර ගත හැකිය. භාරතීය ගායන ශෛලින්වල ලක්ෂණ හා ඒවායේ විවිධතා පිළිබඳ සාකච්ඡා කිරීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය. ඉගැන්වීමට නියමිත කාලච්ඡේද 2 කට ගැළපෙන පරිදි දී ඇති ඇමුණුම් ඔස්සේ කියවීම් පත්‍රිකා සකස් කර ගත යුතු වේ.

පාඩම සංවර්ධනය

- එක් ගායන ශෛලියකට අදාළ ගීතයක කොටසක් ගයමින් පාඩමට පිවිසෙන්න. ඔබ විසින් ඉදිරිපත් කළ ගායන විශේෂය පිළිබඳව සිසුන්ගෙන් විමසන්න.

- ඇමුණුමේ I කොටසට අදාළ විෂය කොටස් සඳහා ඔබ සකස් කළ කියවීමේ පත්‍රිකා බෙදා දෙන්න. සැලසුම් කළ ක්‍රියාකාරකම්වල සිසුන් යොදවන්න.

(කාලච්ඡේද 01)

- ඇමුණුමේ II කොටසට අයත් විෂය කොටස් සඳහා ඔබ සකස් කළ කියවීමේ පත්‍රිකා බෙදා දෙන්න. සැලසුම් කළ ක්‍රියාකාරකම්වල සිසුන් යොදවන්න.

- ඇමුණුමේ අංක III කොටසට අයත් විෂය කොටස් සඳහා ඔබ විසින් සකස් කළ කියවීම් පත්‍රිකා බෙදා දෙන්න. සැලසුම් කළ ක්‍රියාකාරකම්වල සිසුන් යොදවන්න.

(කාලච්ඡේද 01)

**ඇමුණුම (විෂය කරුණු හා බැඳි ශීර්ෂ)**

I කොටස

ධ්‍රැපද් ගායන ශෛලියේ ආරම්භය, ව්‍යාප්තිය, ගීත ආකෘතිය, තාල භාවිතය, ශෛලිය හා සම්බන්ධ ගායන ශිල්පීන්/ශිල්පිනියන් විශේෂ ගායන අංග සහ ගුණ කිරීම් ආදිය

II කොටස

ධමාර් ගායන ශෛලියේ ආරම්භය, ව්‍යාප්තිය, ගීත ආකෘතිය, තාල භාවිතය, ශෛලිය හා සම්බන්ධ ගායන ශිල්පීහු/ශිල්පිනියෝ විශේෂ ගායන අංග සහ ලය වැඩි කිරීම් ආදිය

III කොටස

චතුරංග ගායන ශෛලියේ ආරම්භය, ව්‍යාප්තිය, ගීත ආකෘතිය, තාල භාවිතය, ශෛලිය හා සම්බන්ධ ගායන ශිල්පීහු/ශිල්පිනියෝ විශේෂ ගායන අංග, ගුණ කිරීම් ආදිය

ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස්

- එක් එක් විෂය කොටස් අවසානයේ වාචික ප්‍රශ්න හෝ කෙටි ලිඛිත ප්‍රශ්න මඟින් අගයන්න.
- සියලු ම විෂය කොටස් ආවරණය වන පරිදි වගුවක් සම්පූර්ණ කිරීමට මග පෙන්වන්න. සුදුසු පරිදි අගයන්න.

අතිරේක උදව් :

- 2009 පෙරදිග සංගීතය ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය
- සංගීත සංහිතා විමල් අභයසුන්දර

ක්‍රියාකාරකම 42

# ඛ්‍යාල් ගායන ශෛලිය

නිපුණතාවය 2.0 :- විශ්ව සංගීතයේ ස්වභාවය වටහා ගනිමින් විවිධතා ගවේෂණය කරයි.

නිපුණතා මට්ටම 2.2 :- භාරතීය සංගීතයේ විවිධතා පිළිබඳ විචාරාත්මකව අදහස් දක්වමින් විවිධ ශෛලීන් ප්‍රායෝගික අධ්‍යයනට පෙළඹෙයි.

ක්‍රියාකාරකම :- ඛ්‍යාල් ගායන ශෛලිය

කාලච්ඡේද සංඛ්‍යාව :- 04

ඉගෙනුම් පල :-
- ඛ්‍යාල් ගායන ශෛලිය පිළිබඳ අදහස් දක්වයි.
- ඛ්‍යාල් ගායනා ශෛලිය - චොටා ඛ්‍යාල්, බඩා ඛ්‍යාල් වශයෙන් කොටස් දෙකකට බෙදෙන බව.
- විලම්භලය ගායන ශෛලිය (බඩා ඛ්‍යාල්) පිළිබඳ වෙනස්කම් අගය කරයි.
- ඛ්‍යාල් ගායන ශෛලියේ විලම්බලය (බඩා ඛ්‍යාල්) ගීතයක් ගායනය කරයි.

ගුණාත්මක යෙදවුම් :- සර්පිනාව, තබ්ලාව, ගීතය ලියූ දෘශ්‍යාධාරයක්, ඇමුණුමේ පිටපත්

විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක් :-

ඛ්‍යාල් ගායන ශෛලිය පිළිබඳ ව සිද්ධාන්තමය කරුණු ඉගැන්වීම සහ විලම්බලය ගීතයක ස්ථායීකොටසක් ගායනය කිරීම මෙම ක්‍රියාකාරකමෙන් අපේක්ෂා කෙරේ.

පාඩම සංවර්ධනය:-
- විෂය නිර්දේශයට අයත් රාගයකින් බඩා ඛ්‍යාල් ගායනයක් ඉදිරිපත් කරමින් පාඩමට පිවිසෙන්න.
- විලම්බලය ගීතය ලියූ දෘශ්‍යාධාරය ප්‍රදර්ශනය කරමින් ගීතය ගායනය කරවන්න.

(කාලච්ඡේද 02)

- ඇමුණුම් අංක 01 හි ඇතුළත් කියවීම් පත්‍රිකාව සිසුන්ට බෙදා දී ක්‍රියාකාරකමෙහි යොදවන්න.

(කාලච්ඡේද 02)

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :-
- විලම්බලය ගීතය තාලය හා ලය පවත්වා ගනිමින් ගීතය හා ස්වර නිවැරදිව ශ්‍රැතියට ගායනය කළ සිසුන් තෝරා අගයන්න.

අතිරේක උදව්:- 2009 පෙරදිග සංගීතය ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය.
- රාගාලංකාර මහාචාර්ය සනත් නන්දසිරි

පැවරුම :- ඛ්‍යාල් ගායන ශෛලිය පිළිබඳ ව විලම්බලය ගීත ද ඇතුළත් කරමින් ලිපියක් සකස් කරවන්න.

ඇමුණුම 01
- ඛ්‍යාල් ගායන ශෛලියේ ආරම්භය හා ව්‍යාප්තිය
- ඛ්‍යාල් ගායන ශෛලියේ නිර්මාතෘ
- ඛ්‍යාල් ගායන ශෛලියේ ආකෘතිය
- ඛ්‍යාල් ගායක ගායිකාවන්
- ඛ්‍යාල් ගායන ශෛලිය සඳහා වාදනය කරන වාද්‍ය භාණ්ඩ
- ඛ්‍යාල් ගායන ශෛලියේ සුවිශේෂ ලක්ෂණ

(කාලච්ඡේද 01)

ක්‍රියාකාරකම 43

# භජන් ගායන ශෛලිය

| | | |
|---|---|---|
| නිපුණතාව 2.0 | :- | විශ්ව සංගීතයේ ස්වභාවය වටහා ගනිමින් විවිධතා ගවේෂණය කරයි. |
| නිපුණතා මට්ටම 2.2 | :- | භාරතීය සංගීතයේ විවිධතා පිළිබඳ විචාරාත්මක අදහස් දක්වමින් විවිධ ශෛලීන් ප්‍රායෝගික අධ්‍යයනයට පෙළඹෙයි. |
| ක්‍රියාකාරකම | :- | භජන් ගායන ශෛලිය |
| කාලච්ඡේද සංඛ්‍යාව | :- | 04 |

ඉගෙනුම් ඵල :-

- භජන් ගායන ශෛලියේ සංගීතමය තොරතුරු දක්වයි.
- භජන් ගායන ශෛලියේ ආකෘතිමය ලක්ෂණ ඉදිරිපත් කරයි.
- භජන් ගී ගයන ගායක ගායිකාවන් ගැන තොරතුරු දක්වයි.
- භජන් ගායන ශෛලියෙහි සෛද්ධාන්තික කරුණු ඉදිරිපත් කරයි.
- භජන් ගීත ගායනය කරයි.

ගුණාත්මක යෙදවුම් :- මාතෘකාවට අදාළ විෂය කරුණුවලට ගැළපෙන ලෙස සැකසූ දෘශ්‍ය උපකරණ

ඇමුණුම් අංක 01 ට හා 02 ට අයත් පත්‍රිකා

සර්පිනාවක්, තබ්ලාවක්

විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක්

භජන් ගායන ශෛලිය පිළිබඳ ව සෛද්ධාන්තික කරුණු අධ්‍යයනය කිරීමත් භජන් ගීතයක් ප්‍රායෝගික වශයෙන් ගායනය කිරීමත් මෙම පාඩමෙන් අපේක්ෂිත ය. මේ සඳහා උසස් පෙළ පන්ති මට්ටමට ගැළපෙන භජන් ගීතයක් ගුරුවරයාගේ අභිමතය පරිදි තෝරා ගැනීමට ඔබට නිදහස ඇත.

පාඩම සංවර්ධනය

- නිර්දේශිත භජන් ගීතයක් හෝ ඔබ දන්නා වෙනත් භජන් ගීතයක් සිසුන් සමඟ ගායනය කරන්න. එක් එක් සිසුවාගේ ගායන කුසලතාව වර්ධනය කරවීමට සහය වන්න.

(කාලච්ඡේද 01)

- සිසුන් උගත් භජන් ගීතයේ නාදමාලාව එක් එක් ළමයාට තහවුරු වන තෙක් අභ්‍යාසයේ යොදවන්න.

(කාලච්ඡේද 01)

- ප්‍රචලිත රඝුපති රාගව වැනි භජන් ගීතයක කොටසක් ගයා පාඩමට පිවිසෙන්න. ඇමුණුම් 01 ට අදාළ වගුව සම්පූර්ණ කිරීමට ක්‍රියාකාරකම්වල සිසුන් යොදවන්න.

(කාලච්ඡේද 02)

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :-

එක් එක් විෂය කොටස් අවසානයේ ලිඛිත හෝ වාචික ප්‍රශ්න මඟින් අගයන්න.

එක් එක් සිසුවාගේ ගායනය ශ්‍රවණය කරමින් අගයන්න.

පැවරුම :-

අන්තර්ජාලය ඇසුරෙන් භජන් ගීත 05ක් තෝරාගෙන නිදහස් කාලච්ඡේදවල දී භජන් ගී ගායනය කරන්න.

අතිරේක උදවු :- 2009 ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය පිටු අංක-114

ඇමුණුම අංක 02

- තුමක චලිත රාම චන්ද්‍ර
- පායෝජී මෛනෙ
- වෛශ්ණු වජනකෝ
- ධීර සමීරේ යමුනා තීරේ

ඇමුණුම් අංකය 01

## භජන් ගායන ශෛලිය

| ආරම්භය හා ව්‍යාප්තිය | ගායක/ගායිකාව | භජන් ශෛලියේ විශේෂතා | යොදාගත් වාදන භාණ්ඩ |
|---|---|---|---|
| | | | |

ක්‍රියාකාරකම 44

# ගසල් ගීතයක් ගායනය

නිපුණතාවය 2.0 :- විශ්ව සංගීතයේ ස්වභාවය වටහා ගනිමින් විවිධතා ගවේෂණය කරයි.

නිපුණතා මට්ටම 2.2 :- භාරතීය සංගීතයේ විවිධතා පිළිබඳ විචාරාත්මක අදහස් දක්වමින් විවිධ ශෛලි ප්‍රායෝගික අධ්‍යයනයට පෙළඹෙයි.

ක්‍රියාකාරකම :- ගසල් ගීතයක් ගායනය

කාලච්ඡේද සංඛ්‍යාව :- 03

ඉගෙනුම් ඵල :-
- ගසල් ගායන ශෛලියේ විශේෂතා පිළිබඳව අදහස් දක්වයි.
- ගසල් ගායන ශෛලිය පිළිබඳ අත්දැකීම් ලබයි.
- ගසල් ගීතයක් ගයයි.

ගුණාත්මක යෙදවුම් :- සර්පිනාව, තබ්ලාවක් ගීතය ඇතුළත් (CD/DVD පට)

ඇමුණුම අංක 01ට අයත් ගසල් ගීත ඇතුළත් පත්‍රිකාව

විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක්

ගසල් ගීතයක් ප්‍රායෝගික ව අධ්‍යයනය කිරීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය. ප්‍රසිද්ධ ගසල් ගීතයක් ශ්‍රවණය කිරීමට සලස්වන්න. ගසල් ගායනාවල ලක්ෂණ හා ශෛලිය පිළිබඳව විස්තර කරමින් ප්‍රායෝගික ව පුහුණුවීමෙහි යොදවන්න.

පාඩම සංවර්ධනය

- ගසල් ගීතයක් ශ්‍රවණයට සලස්වා ඒ අනුව පාඩමට ප්‍රවේශය ලබාගන්න.

  මිනිත්තු 20

- ගායනය සඳහා යෝජිත ගසල් ගීතය ගයා වයා පෙන්වන්න.

  කාලච්ඡේද 01

- සිසුන්ට කොටසින් කොටස ගායනයට හුරු කරවන්න.

  කාලච්ඡේද 01

- ගසල් ගායනයේ දී සර්පිනාව හා තබ්ලාව යොදාගන්නා ආකාරය ගැන සාකච්ඡාවක යෙදෙන්න.

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :-

එක් එක් ප්‍රශ්නවලට සැපයූ පිළිතුරු පිළිබඳ ව නැවත සාකච්ඡාවක යෙදෙන්න.

මිනිත්තු 20

අතිරේක උදවු :- අන්තර්ජාලය ඇසුරින් ගසල් ගීතය ශ්‍රවණය කිරීමට යොමු කරවන්න.

**ඇමුණුම් අංක 1**

**යෝජිත ගසල් ගීත**

චාන්දි ජෛසා රංග - පංකජ් උදාස්
චුප්කේ චුප්කේ - ගුලාම් අලි
ශ්‍යාමෙ හම් - පංකජ් උදාස්

ක්‍රියාකාරකම 45

# ස්වර පුවරු භාණ්ඩ වාදනය

නිපුණතාව 3.0 වාද්‍ය භාණ්ඩයන්හි ස්වරූපය වටහා ගනිමින් වාදන හැකියා ප්‍රදර්ශනය කරයි

නිපුණතා මට්ටම 3.1 රාගධාරී සංගීතයට අදාළ උසස් ගායනයක් වාදනයක් ඉදිරිපත් කිරීම සඳහා වර්ධනය කර ගත යුතු මූලික ගුණාංග ප්‍රායෝගික ව අධ්‍යයනය කරයි.

ක්‍රියාකාරකම 3.1.1 ස්වර පුවරු භාණ්ඩ වාදනය

කාලච්ඡේද සංඛ්‍යාව 04

ඉගෙනුම් පල

- ස්වර පුවරු භාණ්ඩ Chord සමඟ වාදනය කළ යුතු බව දැන ගනියි.
- ස්වර පුවරු භාණ්ඩ Chord සමඟ වාදනය කරයි.
- ස්වර පුවරු භාණ්ඩ Chord සමඟ වාදනය කිරීමෙන් වාදනය රසවත් වන බව හඳුනාගනියි.

ගුණාත්මක යෙදවුම්

විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැල

උසස් පෙළ සිසුනට ගැළපෙන අයුරින් මෙම පාඩම සකසා ගත යුතු වනු ඇත. සිසුන් Chord සමඟ ගීත වාදන ප්‍රගුණ කළ යුතු බැවින් මෙම පාඩම සඳහා අවශ්‍ය වනුයේ ඕර්ගන් ය. 11 වසරේ දී මූලික chord භාවිතයෙන් ගීත වාදනය කර ඇති බැවින් 12 වසරේ දී එහි පියවර කිහිපයක් ඉදිරියට තබමින් C Major scaleහි භාවිත Relative chord භාවිතයට මග පෙන්වා ඇත. ඒ සඳහා ඇමුණුම 1 භාවිත කරන්න. එහි ඇති ක්‍රියාකාරකම සිසුන් අතට පත් කිරීමට පෙර ඒ පිළිබඳ මනා අවබෝධයක් හා පුහුණුවක් ඔබ විසින් ලබා තිබීම අත්‍යවශ්‍ය ය.

ඇමුණුම 1හි ඇතුළත් අභ්‍යාසයන්ට අමතර ව එහි පියවර 5 දෙවන කොටස සඳහා ඔබ සිසුනට ගැළපෙන ගීත ප්‍රස්තාර තෝරා දෙන්න.

පාඩම සංවර්ධනය

- ඔබ විසින් නිර්මාණශීලිව සකසා ගනු ලැබූ උපක්‍රමයක් මඟින් ප්‍රවේශ වන්න.
- ගීතය සමඟ chord වාදනය කිරීමෙන් ඇති වන මිහිර පිළිබඳ ව වාකච්ඡා කරන්න.

(මිනිත්තු 10)

- ඇමුණුම 1 සිසුන් අතට පත් කොට එහි 4 වන පියවර දක්වා පළමු හා දෙවන කාලච්ඡේද දෙක භාවිත කරන්න.

( කාලච්ඡේද 02)

- පස් වන පියවර සඳහා තෙවන හා සිවු වන කාලච්ඡේද භාවිත කරන්න.

(මිනිත්තු 10)

- ඔබ විසින් ක්ෂණික ව නිර්මාණය කරන ලද විවිධ ස්වර කණ්ඩ හතරකට Chord යොදා වාදනය කිරීමට සලස්වා සිසුවා ග්‍රහණය කොට ඇති ප්‍රමාණය මැන අවශ්‍ය උපදෙස් ලබා දෙන්න.

( මිනිත්තු 10).

ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස්

ඉහත පියවර තුනෙහි ඇතුළත් තත්ත්වයන් තව දුරටත් ඇගයීමකට හැකි පරිදි ඇගයීම සකසා ගත යුතු ය.

( මිනිත්තු 10).

අතිරේක උදවු

ස්වර පුවරු භාණ්ඩ වාදනය පිළිබඳ පොත්පත් හා වීඩියෝ දර්ශන

ඇමුණුම 01

කාලච්ඡේදයන්ට ගැළපෙන අයුරින් උසස් පෙළට සුදුසු ගීත තෝරාගෙන වාදනය කරවන්න.

ක්‍රියාකාරකම 46 A

# ස්වර වාද්‍ය භාණ්ඩයකින් අද්‍යතන සරල ගීතයක් හෝ රාගධාරී සංගීතාංගයක් හෝ වාදනය

| | | |
|---|---|---|
| නිපුණතාව 3.0 | :- | වාද්‍ය භාණ්ඩයන්හි ස්වරූපය වටහා ගනිමින් වාදන හැකියා ප්‍රදර්ශනය කරයි. |
| නිපුණතා මට්ටම 3.1 | :- | රාගධාරී සංගීතයට අදාළ උසස් ගායනයක් වාදනයක් ඉදිරිපත් කිරීම සඳහා වර්ධනය කර ගත යුතු මූලික ගුණාංග ප්‍රායෝගික ව අධ්‍යයනය කරයි. |
| ක්‍රියාකාරකම | :- | ගායනය ප්‍රධාන කර ගත් සිසුන් සඳහා තෝරා ගත් ස්වර වාද්‍ය භාණ්ඩයකින් අද්‍යතන සරල ගීතයක් හෝ රාගධාරී සංගීතාංගයක් හෝ වාදනය, නැතහොත් තබ්ලාව වාදනය (කායදා පල්ට මුඛඩා) |
| කාලච්ඡේද සංඛ්‍යාව | :- | 04 |

ඉගෙනුම් පල :-

- තෝරා ගත් වාද්‍ය භාණ්ඩයෙන් වාදනය කළ යුතු කොටස් තෝරා ගනියි.
- වාදනය සඳහා කැමැත්ත පළ කරයි.
- නියමිත කොටස් වාදනය කරයි.

ගුණාත්මක යෙදවුම් :-

- ගීත ප්‍රස්තාර
- ඔබ විසින් නිර්මාණය කර ගන්නා ලද ගී පද පේළියක පද හා ස්වර වෙන වෙන ම ලියූ දෘශ්‍ය උපකරණ දෙක.
- රාගධාරී වාදනයන්හි ප්‍රස්තාර.
- සිසුන් වයන වාද්‍ය භාණ්ඩ.

විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :-

සිසුන් ස්වර වාද්‍ය භාණ්ඩ පිළිබඳ ප්‍රායෝගික පුහුණුව පළමු සහ දෙවන වාරවල දී ලබා ඇත. එම ප්‍රායෝගික පුහුණුව තව දුරටත් සංවර්ධනය කරමින් මෙම කාලච්ඡේද 4 තුළ ඔබට අභිමත පරිදි ක්‍රියාකාරකම් සැලසුම් කර ගන්න.

**ක්‍රියාකාරකම 46 B**

# තබ්ලාව වාදනය

නිපුණතාවය 3.0 :- වාද්‍ය භාණ්ඩයන්හි ස්වරූපය වටහා ගනිමින් වාදන හැකියා ප්‍රදර්ශනය කරයි

නිපුණතා මට්ටම 3.1 :- රාගධාරී සංගීතයට අදාළ උසස් ගායනයක් වාදනයක් ඉදිරිපත් කිරීම සඳහා වර්ධනය කර ගත යුතු මූලික ගුණාංග ප්‍රායෝගික ව අධ්‍යයනය කරයි.

ක්‍රියාකාරකම : තබ්ලාව වාදනය

කාලච්ඡේද සංඛ්‍යාව : (ඉදිරි පාඩමේ ඇති කාලච්ඡේද සංඛ්‍යාව ම මෙම පාඩමට ද යොදා ගැනේ.)

ඉගැනුම් පල :
- ශාස්ත්‍රීය තබ්ලා වාදනයක ස්වභාවය මූලික ව හඳුනා ගනියි.
- කායදා පල්ටා තිහායි හා මුඛඩා ආකෘතිය හා අන්තර්ගත ලක්ෂණ විස්තර කරයි.
- කායදා පල්ටා තිහායි හා මුඛඩා වාදන ශිල්ප විධි හඳුනා ගනිමින් වාදනය කරයි.

ගුණාත්මක යෙදුම් : තබ්ලා වාදන ඇතුළත් ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ. කියවීම් පත්‍රිකා, තබ්ලාවක්.

විෂය කරුණු පැහැදිලි කරගැනීමට අත්වැලක් :

සිසුන් තබ්ලා වාදනය පිළිබඳ ප්‍රායෝගික පුහුණුව පළමු සහ දෙවන වාරවල දී හදාරා ඇත. එම ප්‍රායෝගික පුහුණුව තවදුරටත් සංවර්ධනය කරමින් මෙම කාලච්ඡේද 4 තුළ ක්‍රියාකාරකම් යොදා ගන්න.

ක්‍රියාකාරකම 47

# ස්වර වාද්‍ය භාණ්ඩ සුසර කිරීම

| | |
|---|---|
| නිපුණතාව 3.0 | වාද්‍ය භාණ්ඩයන් හි ස්වරූපය වටහා ගනිමින් වාදන හැකියා ප්‍රදර්ශනය කරයි |
| නිපුණතා මට්ටම 3.1 | රාගධාරී සංගීතයට අදාළ උසස් ගායනයක් වාදනයක් ඉදිරිපත් කිරීම සඳහා වර්ධනය කර ගත යුතු මූලික ගුණාංග ප්‍රායෝගික ව අධ්‍යයනය කරයි. |
| ක්‍රියාකාරකම 3.1.4 | ස්වර වාද්‍ය භාණ්ඩ සුසර කිරීම |
| කාලච්ඡේද සංඛ්‍යාව | 02 |

ඉගෙනුම් පල

- ස්වර වාද්‍ය භාණ්ඩ තනි ව සුසර කර ගනියි.
- සුසර කළ වාද්‍ය භාණ්ඩයන්ගෙන් නිවැරදි මිහිරි හඬක් නිකුත් වන බට වටහා ගනියි.

ගුණාත්මක යෙදවුම්

- සිසුන් වයන තන්ත්‍රීය වාද්‍ය භාණ්ඩ.
- ඇමුණුම 1
- ස්වර පුවරු වාද්‍ය භාණ්ඩයක්.

විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්

උසස් පෙළ සිසුන් තම වාද්‍ය භාණ්ඩය තනි ව සුසර කර ගැනීම අත්‍යවශ්‍ය කාර්යයකි. මෙම කාර්ය සඳහා සාර්ථක මඟ පෙන්වීමක් ඔබ විසින් සිදුකළ යුතු ය. මෙම පාඩම් සටහන ආධාරයෙන් එම කටයුත්ත ඇරඹීමට ඔබට හැකි වුවත් සිසුවා තුළ එම හැකියාව වර්ධනය කිරීම ඔබගේ නොමඳ කැප වීමෙන් ම ඉටු විය යුත්තකි. ඒ සඳහා නිරතුරුව ප්‍රතිකාරක අධ්‍යාපන ක්‍රමවේදය භාවිතයට ගැනීමට ඔබට සිදු වේ.

වර්තමානයේ දී සුසර කිරීම සඳහා භාවිතයට ගත හැකි උපකරණ රාශියක් ඇත. එම Tuner පිළිබඳ ව සිසුනට ප්‍රායෝගික ව හඳුන්වා දෙන්න. තව ද නවීන පන්නයේ දුරකථනයකට අන්තර් ජාලයෙන් ලබා ගත් Tuner එකක් මඟින් ද සාර්ථක ව භාණ්ඩ සුසර කළ හැකි බවට දැනුම්වත් කිරීම අත්‍යවශ්‍ය ය. මේවා මඟින් වයලින් වැනි භාණ්ඩයක ස්වර පිහිටීම නිවැරදි ව ගොඩනඟා ගත හැකි බව ද පෙන්වා දෙන්න.

උපකරණ කොතෙක් තිබුණත් භාණ්ඩ සුසර කර ගැනීම සඳහා තම කන දියුණු කර ගැනීම අනිවාර්ය බව අවධාරණය කරන්න. ඒ සඳහා ස්වර ඥානය දියුණු කර ගත යුතු බව පහදා දෙමින් පසු වැඩ සඳහා මෙම ශක්තිය දියුණු කරන අභ්‍යාස සපයන්න.

පාඩම සංවර්ධනය

- සුසර නොකළ තත් වාද්‍ය භාණ්ඩයක් මඟින් නිල් අහස් තලේ... වැනි ගීතයක් වයා ශ්‍රවණයට සලස්වන්න.
- එය ඇසුණු අයුරු විමසා නැවත භාණ්ඩය සුසර කර ගීතය වයා ඇසීමට සලස්වන්න.
- පළමු හා දෙවන අවස්ථාවේ දී ගීතය ශ්‍රවණය වූ ආකාරය පිළිබඳ ව සංසන්දනාත්මක ව සාකච්ඡා කොට සුසර කිරීමේ අගය වටහා දෙමින් පාඩමට පිවිසෙන්න.

- ඇමුණුම 1 සිසුන් අතට පත් කොට එහි ඇති ක්‍රියාකාරකමෙහි සිසුන් ව යොදවන්න.

(කාලච්ඡේද 01)

- පස් වන පියවර සඳහා තෙවන හා සිවු වන කාලච්ඡේද භාවිත කරන්න.

(කාලච්ඡේද 02)

- සුසර නොකළ භාණ්ඩ සුසර කිරීමට සලස්වා ප්‍රති පෝෂණය කරන්න

(කාලච්ඡේද 01).

ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස් :-

සුසර කිරීමේ හා ස්වර හඳුනා ගැනීමේ හැකියාව මැනෙන සේ ඇගයීම සකස් කර ගත යුතු ය.

( මිනිත්තු 10).

අතිරේක උදවු :-

ස්වර ඥානය දියුණු කර ගැනීමට අභ්‍යාස සපයා දෙන්න.

<u>ඇමුණුම 1</u>

ඔබ වයන වාද්‍ය භාණ්ඩය ඔබ විසින් ම සුසර කර ගැනීම අනිවාර්ය ය. ඒ සඳහා පළමු ව ඔබ විසින් ඔබගේ ස්වර ඥානය (ස්වර හඳුනා ගැනීමේ හැකියාව) දියුණු කර ගත යුතු ය. මේ සඳහා නිරතුරුව ම ඔබගේ සංගීත ගුරුතුමාගේ සහාය ලබා ගැනීම කළ යුතු ය.

දැන් ඔබ සතු ව ඇති ස්වර ඥානය භාවිතයෙන් පහත ක්‍රියාකාරකමෙහි යෙදෙන්න.

මේ සඳහා මිතුරකුගේ සහය අත්‍යවශ්‍ය ය. එසේ ම ස්වර පුවරු වාද්‍ය භාණ්ඩයක් ද සපයා ගත යුතු ය. අවශ්‍ය සෑම තැනක දී ම ගුරු උපදෙස් ලබා ගන්න.

පියවර 01.

ඔබ අතැති වාද්‍ය භාණ්ඩයේ තත් සුසර කරන ස්වර හඳුනා ගන්න.

පියවර 02.

එක් තතක් බුරුල් කරන්න.

පියවර 03.

දැන් එම තත සුසර කරන ස්වරය ස්වර පුවරුවෙන් වයන ලෙස මිතුරාට පවසන්න. මිතුරා වයන ස්වරයට ඉතා හොඳින් සවන් දෙන්න.

පියවර 04.

මනා සංයමයකින් යුක්ත ව ලිහිල් කළ තත සෙමෙන් සෙමෙන් තද කරමින් තතෙහි නාදය ඔබට ඇසෙන ස්වරයට සමාන කර ගන්න. මේ වන විට ස්වර සමාන වූ බව හඳුනා ගැනීමේ හැකියාව ඔබ සතු විය යුතු ය.

පියවර 05.

සෙසු සියලු තත් මේ අයුරින් සුසර කර ගන්න. පියවර සරලව පැවසුවත් මෙම තත්ත්වය ළඟා කර ගැනීම සඳහා ඔබගේ කැපවීම අත්‍යවශ්‍ය ය. ගුරු උපදෙස් මත ක්‍රියා කරමින් එම හැකියාව ලබා ගත යුතු ය. මෙය උසස් සිසුවකු සතු විය යුතු ම හැකියාවකි.

ක්‍රියාකාරකම 48

# අනාඝාතාත්මක මෙහෙ ගී (පතල්, බඹර, ටීකා සීපද)

| | | |
|---|---|---|
| නිපුණතාව 5.0 | :- | දේශීය ජන සංගීතාංග පිළිබඳ ප්‍රායෝගික හැකියා වර්ධනය කර ගනිමින් සංස්කෘතික උරුමයන් රැක ගනියි. |
| නිපුණතා මට්ටම 5.1 | :- | ගැමි ගායනා පිළිබඳ තර්කානුකූල අදහස් දක්වමින් ගැමි ගී ගායන, වාදන දක්ෂතා වර්ධනය කර ගනියි. |
| ක්‍රියාකාරකම | :- | අනාඝාතාත්මක මෙහෙ ගී (පතල්, බඹර, ටීකා සීපද) |
| කාලච්ඡේද සංඛ්‍යාව | :- | 06 |

ඉගෙනුම් පල :-

- පතල් ගී, බඹර ගී හා ටීකා සීපද පිළිබඳ තොරතුරු විස්තර කරයි.
- පතල් ගී, බඹර ගී හා ටීකා සීපද ගායනය කරයි.
- ගී වර්ග තුනේ ම සුවිශේෂතා පැහැදිලි කරයි.
- පතල් ගී, බඹර ගී හා ටීකා සීපදවල ලක්ෂණ වගුගත කරයි.

ගුණාත්මක යෙදවුම් :-

- පතල් ගී, බඹර ගී හා ටීකා සීපද ලියූ දෘශ්‍යාධාර
- ඇමුණුම්වලට අදාළ කියවීම් පත්‍රිකා
- හාර්මෝනියම් හෝ ස්වර වාද්‍ය භාණ්ඩයක්

විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක් :-

මෙහෙ ගී යටතේ එන පතල් ගී, බඹර ගී පිළිබඳ වත්, ටීකා සීපද පිළිබඳ වත් න්‍යායික ව හා ප්‍රායෝගික වශයෙන් ඉගෙනීම මෙම ක්‍රියාකාරකමින් අපේක්ෂා කෙරේ. මේ සඳහා කාලච්ඡේද හයක් වෙන් කර ඇත. ඉන් කාලච්ඡේද දෙක බැගින් වෙන් කර, ක්‍රියාකාරකම සැලසුම් කර ගැනීම ගුරුවරයා සතු කාර්යභාරය යි.

පාඩම සංවර්ධනය :-

- කැමැත්තෙන් ඉදිරිපත් වන සිසුවකුට හෝ සිසුවියකට හෝ පතල් ගීයක් ගයමින් භූමිකා රංගනයක් ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ලබා දෙන්න. ඉදිරිපත් කළ ගායනය හා රංගනය පිළිබඳ ව සිසු අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දී සාකච්ඡාවක් මෙහෙයවන්න.
- ඇමුණුම I කොටසට ඇතුළත් විෂය කොටස් අනුව සකස් කළ කියවීම් පත්‍රිකා ලබා දී සිසුන් ක්‍රියාකාරකමෙහි යොදවන්න.
- එහි ඇතුළත් කර ඇති පතල් ගීවලින් කැමති ගීතයක් ඉගැන්වීම සඳහා සකස් කරගත් දෘශ්‍යාධාරය ප්‍රදර්ශනය කරමින්, ගීතය ගායනය කරවන්න.

(කාලච්ඡේද 02)

- ඇමුණුම අංක II කොටසට අයත් තොරතුරු ඔස්සේ කියවීම් පත්‍රිකා සකස් කර සිසුන් ක්‍රියාකාරකමේ යොදවන්න.
- බඹර ගීතය ලියූ දෘශ්‍යාධාරය ප්‍රදර්ශනය කරමින්, ගීතය ගායනය කරවන්න.

(කාලච්ඡේද 02)

- ඇමුණුම අංක 03 කොටසට අයත් තොරතුරු ඔස්සේ කියවීම් පත්‍රිකා සකස් කොට සිසුන් ක්‍රියාකාරකමේ යොදන්න.
- ටීකා සීපද ලියූ දෘශ්‍යාධාරය ප්‍රදර්ශනය කරමින් ගීතය ගායනය කරවන්න.

(කාලච්ඡේද 02)

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්

- එක් එක් විෂය කොටස් අවසානයේ ලිඛිතව හෝ වාචික ව හෝ ප්‍රශ්න විමසීමෙන් අගයන්න.
- පතල්, බඹර හා ටීකා සීපද ගායනා කරවන්න. නිවැරදිව ගායනා කළ සිසුන් අගයන්න.
- ඇමුණුම් I, II, III ට අදාළ කරුණු ඔස්සේ බිත්ති පුවත්පතක් සකස් කිරීමට උපදෙස් දෙන්න.

අතිරේක උදවු :

- 2007 - 12 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශය - පිටු අංක 150 - 155
- 2007 - 12 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශය - පිටු අංක 152 - 153

ඇමුණුම අංක I කොටස

- මෙහෙ ගී යටතේ පතල් ගී හැඳින්වීම.
- පතල් ගීවල සමාජයීය තොරතුරු
- කාර්ය බද්ධ බව හා ජීවිතයේ දුක්කම්කටොලු ගීතවලින් ප්‍රකාශ වීම.
- ගැමි සංස්කෘතියේ ලක්ෂණ

පහත දැක්වෙන පතල් ගීවලින් එක් ගීතයක් ගායනය කිරීමට යොදා ගන්න.

- සබරගමුව එළියයි පෙරහැරදාට
- දොළු කන්දේ ගලදෝ අර පෙනෙන්නේ
- රත්තරන් පණේ ඔබ එවූ පත ලැබුණා
- කළුවන් කළු රුවයි මංගෝ දිලිසෙනවා
- මං මුලා මේ රට පසුවෙනවා
- එළිවෙලා කුකුළු හඬලන වෙලාවේ

ඇමුණුම අංක II කොටස

- මෙහෙ ගී යටතේ බඹර ගී හැඳින්වීම.
- කාර්ය බද්ධ ව වචන හා නාද රටා නිර්මාණය වීම.
- පරිසර වර්ණනා සහ උපදේශාත්මක අදහස් ගැබ් වීම.
- ගැමි සංස්කෘතිය හා ගැමි සමාජයේ ලක්ෂණ
- ගැමි සාරධර්ම

පහත දැක්වෙන බඹර ගීවලින් එක් ගීතයක් ගායනයට තෝරා ගන්න.

- ඕඩි හෙලේ ගෙලවට කර මුළුල්ලා

- බැද්ද වටට සුදු මොර මල් පිපිලා
- තව තවා බඹරු පිස පිස දමනකොට

ඇමුණුම අංක III කොටස

- ටීකා සීපද හැඳින්වීම.
- ටීකා සීපද ගැයූ අවස්ථාව පැහැදිලි කිරීම.
- ටීකා සීපදවල සුවිශේෂ ලක්ෂණ
- ආසාතාත්මක හා අනාසාතාත්මක ටීකා සීපද භාවිතයේ යෙදෙන බව.

පහත දැක්වෙන ටීකා සීපදවලින් එක් ගීතයක් ගායනයට තෝරා ගන්න.

- බැද්දේ ගියා වැලක් සොයා ගන්ට කියා
- කොළඹ සිටන් නා තම්දෙන තානම්
- වාරේ වාරේ කියනවා විනා කොස් වාරේ ද, අඹ වාරේ ද, දෙල් වාරේ ද...

ක්‍රියාකාරකම 49

# මෙහෙ ගී - නෙළුම් ගී (ඕසේ ගායනා) වරම් ගී

නිපුණතාව 5.0 :- දේශීය ජන සංගීතාංග පිළිබඳ ප්‍රායෝගික හැකියා වර්ධනය කර ගනිමින් සංස්කෘතික උරුමයන් රැක ගනියි.

නිපුණතා මට්ටම 5.1 :- ගැමි ගායනා පිළිබඳව තර්කානුකූල අදහස් දක්වමින් ගැමි ගී ගායන, වාදන දක්ෂතා වර්ධනය කර ගනියි.

ක්‍රියාකාරකම :- මෙහෙ ගී - නෙළුම් ගී (ඕසේ ගායනා) වරම් ගී

කාලච්ඡේද සංඛ්‍යාව :- 03

ඉගෙනුම් පල :-

- නෙළුම් ගී, වරම් ගී ගායනය කරයි.
- මෙහෙ ගී ගණයට අයත් වන ගීත විශේෂයක් බව පිළිගනියි.
- නෙළුම් ගී හා වරම් ගීවල නාද රටාව, අදහස හා රිද්මය පිළිබඳ අදහස් දක්වයි.
- ගී වර්ග දෙකේ සුවිශේෂතා පැහැදිලි කරයි.
- ගී වර්ග දෙකේ සංස්කෘතික පසුබිම විස්තර කරයි.

ගුණාත්මක යෙදවුම් :-

- උදයට පේළිය සෑදිලා - එන හැටි රුබර අඟනෝ
  කරවට ගෝමර මල් පිපිලා - ළැම පිට පවලම් පලඳා
  බඳේ වැටෙන හිරු තාපය නොදනෙ ද
  ළඳේ නුඹට තුරු සෙවණැලි උරණ ද

මේ ගීත කොටස ලියූ දෘශ්‍යාධාරයක්

- නෙළුම් ගී, වරම් ගී ලියූ දෘශ්‍යාධාරයක්
- ඇමුණුම්වලට අයත් කියවීම් පත්‍රිකා
- හාර්මෝනියම් නැතහොත් ස්වර වාද්‍ය භාණ්ඩයක්, තාලම්පටක්, ගැටබෙරයක්

විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක් :-

මෙහෙ ගී යටතේ එන නෙළුම් ගී හා වරම් ගී පිළිබඳ වත්, න්‍යායික ව හා ප්‍රායෝගික ව ඉගැන්වීම මෙම ක්‍රියාකාරකමින් අපේක්ෂා කෙරේ. මේ සඳහා කාලච්ඡේද තුනක් වෙන් කර ඇත. න්‍යායික කොටස් එක් කාලච්ඡේදයක් තුළත්, ගීත දෙක ඉතිරි කාලච්ඡේද දෙක තුළ ඉගැන්වීම ගුරුවරයාගේ කාර්යභාරය වේ.

පාඩම සංවර්ධය :-

- ගුණාත්මක යෙදවුම් යටතේ ලියා ඇති ගී කොටස ලියූ දෘශ්‍යාධාරය ප්‍රදර්ශනය කර, ගීතය ගයා, වයා, පාඩමට පිවිසෙන්න. ගීතයෙන් කියවෙන දේ පිළිබඳ ව සිසුන්ගෙන් විමසා සාකච්ඡාවක් මෙහෙයවන්න.
- ඇමුණුම 01හි ඇතුළත් විෂය ය කොටස් ඇතුළත් වන සේ සකස් කර ගත් කියවීම් පත්‍රිකාව සිසුන්ට බෙදා දී ක්‍රියාකාරකමෙහි යොදවන්න. සටහනක් පිළියෙළ කරවන්න.

(කාලච්ඡේද 01)

- ඇමුණුම 03හි ඇතුළත් නෙළුම් ගීතයේ දෘශ්‍යාධාරය ප්‍රදර්ශනය කරමින් එම ක්‍රියාකාරකමෙහි යොදවන්න.

(කාලච්ඡේද 01)

- ඇමුණුම 03හි ඇතුළත් වරම් ගීතයේ දෘශ්‍යාධාරය ප්‍රදර්ශනය කරමින් එම ක්‍රියාකාරකමෙහි යොදවන්න.

(කාලච්ඡේද 01)

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්

- එක් එක් විෂයය කොටසක අවසානයේ ගී වර්ග දෙක පිළිබඳ ව කෙටි ප්‍රශ්න කිහිපයක් දී පිළිතුරු ලිවීමට මඟ පෙන්වා සුදුසු පරිදි අගයන්න.
- ගායනය සඳහා යොදාගත් ගීත දෙක කණ්ඩායම් වශයෙන් හෝ කේවල ව ගායනය කිරීමට අවස්ථාව ලබා දී අගයන්න.

අතිරේක උදව් :

හෙළ ගී මග - ඩබ්. බී. මකුලොලුව

වරම් ගී - ආනන්ද ජයසිංහ

නැළවිලි ගී - ආනන්ද ජයසිංහ

අ.පො.ස. (උ.පෙළ) 12, 13 ශ්‍රේණිවල ගුරු මාර්ගෝපදේශ - 1996 - 1997

ඇමුණුම අංක 01

- නෙළුම් ගී හා වරම් ගී හැඳින්වීම.
- ගායනා කළ අවස්ථා
- සීමිත ස්වර පරාසයක් යෙදීම.
- කාර්ය හා සම්බන්ධය
- සමූහ ගායනයට වඩා උචිත බව.
- නෙළුම් ගී, වරම් ගීවල සංස්කෘතික ලක්ෂණ
- ගී වර්ග දෙකේ රිද්මය, භාෂාව, නාද රටා හා තාලය පිළිබඳ තොරතුරු

ඇමුණුම අංක 02

- නෙළුම් ඕසය ඇතුළත් ගීත දෙකක් පහත දැක්වේ. ඉන් එක් ගීතයක් තෝරාගෙන ගායනය පුහුණු කරවන්න.
- තේමිය ජාතියේ බෝසත් උපන්නේ (හොරණෑ ඕසය)
- දේවතා දුවක් ඇවිදින් කියන්නේ

ඇමුණුම අංක 03

වරම් ගීත දෙකක් පහත දැක්වේ. ඉන් එක් ගීතයක් තෝරාගෙන ගායනය පුහුණු කරවන්න.

- වරම් වරම් ශක්‍ර මහ බඹු අතින් වරම්
- අවර උදය පායන ඉරු දෙවිගෙ වරම්

**ක්‍රියාකාරකම 50**

# නූර්ති සංගීත ශෛලියේ රාගධාරි පසුබිම

**නිපුණතාව 7.0 :-** ව්‍යවහාරික සංගීතය සහ රංග කලා හා බැඳි සංගීතාංග පිළිබඳ අත්දැකීම් ලබයි. සංගීත නිර්මාණ කාර්යයේ අත්හදා බැලීම් කරයි.

**නිපුණතා මට්ටම7.1 :-** ශ්‍රී ලංකාවේ රංග සම්ප්‍රදායයන් පිළිබඳ තොරතුරු දක්වමින් ගීත ගායනයේ/වාදනයේ යෙදෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව:-** 04

**ක්‍රියාකාරකම:-** නූර්ති සංගීත ශෛලියේ රාගධාරි පසුබිම

**ඉගෙනුම් පල :-**

- ශ්‍රී ලංකාවේ රංග සම්ප්‍රදාය න් අතරින් නූර්ති නාට්‍යය සංගීත ශෛලිය හා විවිධ තනු හා තාල පද පිළිබඳ ව හඳුනා ගනියි.
- එම ගීතයන්හි රාගධාරී පසුබිම, රාගධාරි සුවිශේෂී ශිල්පාංග ඇතුළත් ගී හඳුනා ගනී.
- එම සුවිශේෂී ගීත කොටස් ගායනය/ වාදනය කරයි.
- නිර්මාණාත්මක සංගීතය සඳහා නූර්ති තනු සුදුසු පරිදි යොදා ගනී.

**ගුණාත්මක යෙදවුම්:-** සර්පිනාවක්, තබ්ලාවක්. නූර්ති ගීත ලියූ දෘශ්‍යාධාරයක්, විවිධ රාගාංග සහිත ගීත ස්වර ලියන ලද දෘශ්‍යාධාර

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්:-**

නාඩගම් කලාවට වඩා සංගීතය ප්‍රධාන වූ නාටකයක් ලෙස නූර්ති වැදගත් වෙයි. මන්ද, හින්දුස්ථානී සංගීත ආභාසයෙන් පෝෂණය වූ නූර්තියේ එම සංගීතයේ සුවිශේෂී බොහෝ ශිල්පාංග දක්නට ලැබීම යි. සිසුන් ට මූලික ව ඒ පිළිබඳ ව දැනුම්වත් කිරීම මේ පාඩමේ අපේක්ෂිත ඉලක්කය වෙයි. නාඩගමට වඩා වෙනස් වූ අංග පිළිබඳ ව නිදසුන් සහිත ව පැහැදිලි කර දීම ගුරුවරයාගේ වගකීම වේ. උසස් පෙළ සංගිතය හදාරන සිසු/සිසුවියනට ඉදිරි නිර්මාණ කටයුතු සඳහා මින් ලබා ගත හැකි පිටුවහල මිල කළ නොහැක්කකි. පියවරින් පියවරට ලබා ගත යුතු වූ රාගධාරී සංගීතයේ සුවිශේෂ ශිල්පාංග නූර්ති ගීත තුළින් ඉතා පහසුවෙන් ග්‍රහණය කර ගැනීමට හැකි වීම වත්මන් සංගීත සිසු පරපුරට හිමි වන අනගි දායාදයකි.

**පාඩම සංවර්ධනය:-**

- නූර්ති ගීත ලියන ලද දෘශ්‍යාධාරයක් සැමට පෙනෙන පරිදි ප්‍රදර්ශනය කරන්න. එම ගීත ආකෘතිය ගැන සිසු අදහස් විමසන්න. ඇමුණුම් 1 කොටසට අදාළ ව ඔබ විසින් සකස් කරන ලද කියවීම් පත්‍රිකාව සිසුන් අතට පත් කර එහි අඩංගු ද පිළිබඳ ව සාකච්ඡා කරන්න. අනතුරු ව සිසුන් විසින් සැලසුම් කරන ලද ක්‍රියාකාරකම් හි යොදවන්න.

  (කාලච්ඡේද 02)
- ඇමුණුමේ දක්වා ඇති හින්දුස්ථානී ගත්කාරී ශෛලිය (වාදිත) ආශ්‍රිත ව ගොඩ නැගී ඇති ගීත අතරින් එකක හෝ ඔබ විසින් ඒ අනුසාරයෙන් තෝරා ගත් ගීතයක හෝ පද හා ස්වර ලියූ දෘශ්‍යාධාරය සිසුනට ප්‍රදර්ශනය කර එම ස්වර ස්වර වාද්‍ය භාණ්ඩයකින් වාදනය කර දක්වන්න. එහි අන්තර්ගතය පිළිබඳ ව සිසු අදහස් විමසන්න. ඒ ආකාරයට ම තානාලංකාර ශෛලියට සමානකම් දැක්වෙන ගීත කොටස් ද, ගායනය හා වාදනය කර පෙන්වන්න. ධ්‍රැපද් ශෛලියට සමාන ගීත, ගායකී

ශෛලියට සමාන ගීත ද වැනි හින්දුස්තානී රාගධාරි අංග පිළිබඳ ව පුළුල් ව සාකච්ඡා කරමින් සිසු අදහස් විමසන්න.

(කාල ඡේද 02)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :-**

- එක් එක් විෂය කොටස් අවසානයේ දී වාචිකව හෝ කෙටි ලිඛිත ප්‍රශ්න මඟින් හෝ සිසුන් අගයන්න.

පැවරුම:-

- ඒ ඒ රාගධාරී කොටස් පැහැදිලි වන පරිදි නූර්ති ගීත ගායනය වාදනය කරවා එය අගයන්න.

අතිරේක උදව්:-

- 2009 පෙරදිග සංගිතය 12 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය පිටු අංක 182 සිට 184
- හඬ - ගුවන් විදුලි සඟරාව 2013 ජනවාරි කලාපය
- ස්වර ලිපි සහිත සිංහල නෘත්‍ය ගීත - විල්මට් පී. විජයතුංග
- ශතක සත්සර ටවර් ගී සරණිය - ස්ටැන්ලි පෙරේරා
- නූර්ති ගීත - සුජාතා අත්තනායක
- නූර්ති ගී ශතකය - ඇඹුල්දෙණියේ සිමියොන්
- නූර්ති ගීත - ප්‍රේමසිරි එදිරිසිංහ

ඇමුණුම :- (විෂය හා බැඳි ශීර්ෂ)

**රාගධාරි පසුබිම**

- උත්තර භාරතීය හින්දුස්ථානි සංගිතයේ ආභාසය ලැබිම.
- ගීත ආකෘතිය - ස්ථායි, අන්තරා
- සංගීත භාණ්ඩ - තබ්ලාව, සර්පිනාව, රවිකිඤ්ඤ(වයලීනය)
- ඉන්දීය සංගීතඥයන්ගේ සේවය,
- විශ්වනාත් ලෞජි, ජයා ශංකර්....

**හින්දුස්ථානි රාගාශ්‍රිත ගීත**

- දූරි රාජා - පහඩි රාගය ආශ්‍රිත
- සෝබමාන - ජෞනපූරි රාගය ආශ්‍රිත
- අප ගුණ සරු සිංහල - භෛරවී රාගය ආශ්‍රිත
- සවන් දී - භූප් කල්‍යාණ් රාගය ආශ්‍රිත
- සිරි සංඝබෝධි - පීළු රාගය ආශ්‍රිත
- මිහිරි නාද - සෝරට් රාගය ආශ්‍රිත
- පුත්‍ර පූත්‍රී - කාලිංගඩා රාගය ආශ්‍රිත
- ලෝනා මුනිරාජාගේ - ජෞනපූරී රාගය ආශ්‍රිත
- පායන මේ බැද්දේ - විලම්බ ඛ්‍යාල් ශෛලිය
- දොහොරාව - කෝමල මධුර බසිනී
- තානාලංකාර - සෝබමාන දේව පුරා (ප්‍රීතියෙන් ම දත්තැකි)
- ධ්‍රැපද් ශෛලිය - මෝක්ෂාචාර්ය
- ගායකී ශෛලිය - දීප තුප විහාරා
- ගත්කාරී ශෛලිය - සිරි සිරි නරන, සිරි සංඝබෝධි

ක්‍රියාකාරකම 51

# වයලීනය සුසර කිරීම

නිපුණතාව :-7.0 :- ව්‍යාවහාරික සංගීතය සහ රංග කලා හා බැඳි සංගීතාංග පිළිබඳව අත්දැකීම් ලබයි. සංගීත නිර්මාණ කාර්යයෙ හි අත්හදා බැලීම් කරයි.

නිපුණතා මට්ටම 7.1 :- ශ්‍රී ලංකාවේ රංග සම්ප්‍රදායයන් පිළිබඳ තොරතුරු දක්වමින් ගීත ගායනයේ/ වාදනයේ යෙදෙයි.

කාලච්ඡේද සංඛ්‍යාව :- 02

ක්‍රියාකාරකම :- වයලීනය සුසර කිරීමේ විවිධ ක්‍රම

ඉගෙනුම් පල :

- වයලීනයේ තත් නම් කරමින් පෙරදිග, අපරදිග හා ව්‍යාවහාරික ක්‍රමයන්ට සුසර කරයි.
- වාදනයට පෙර වයලීනය නිවැරදි ව සුසර කළ යුතු බව පිළිගනියි.
- වයලීනයෙන් කපිරිඤ්ඤා ගීතයක් වාදනය කරයි.

ගුණාත්මක යෙදවුම් :- සර්පිනාවක්, වයලීන කිහිපයක්, (වයලීන් ටියුනරයක්)

විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්:-

6 වන ශ්‍රේණියේ සිට උසස් පෙළ තෙක් සංගීතය ගායනය වාදනය හැදෑරූ සිසුනට ශාස්ත්‍රීය සංගීතයට හා ව්‍යාවහාරික සංගීත ලෝකයටත් ගැළපෙන පරිදි තම වාද්‍ය භාණ්ඩ තනිව සුසර කිරීමේ හැකියාවක් සරල ව හෝ ලබා දීමේ අරමුණින් ඉදිරිපත් කරන මේ පාඩම අත්‍යවශ්‍ය ම ප්‍රායෝගික පාඩමක් කර ගැනීමට ඔබ අදිටන් කර ගන්න. අද්‍යතන නව තාක්ෂණය අනුව සැකසුණු වයලීන් ටියුනරයක් පහසු මිලට වෙළෙඳ පොළෙන් ලබා ගත හැකිය. එය මේ සඳහා යොදා ගන්නේ අනාගතයේ දී සිසුවාට එහි ක්‍රියාකාරීත්වය සම්බන්ධ දැනුම ලබා දීමට මිස කෘත්‍රිම ව සුසර කිරීමට නොවන බව සිහි තබා ගන්න.

පාඩම සංවර්ධනය :-

- සිසුන්ගේ අවධානය සඳහා ඇමුණුම ප්‍රදර්ශනය කරන්න. එම ක්‍රම තුන පිළිබඳව ඔබ විස්තර කර දෙන්න. වයලීනයේ තත් නම් කර ඇති ආකාරයට ම අපරදිග සුසර කිරීම පිළිබඳ ව ඔවුන් දැනුම්වත් කරන්න.
- එක් වයලීනයක් ගෙන එහි තත් සතරින් තෙවන තත මධ්‍ය ෂඩ්ජයට සුසර කරන්න. මේ සඳහා සර්පිනාවේ මධ්‍ය ස ස්වරය වාදනය කිරීමට සිසුවකු යොදා ගන්න. ප්‍රථමයෙන් තත් සුසර කිරීමේ දී Tunning pegs භාවිත කරන්න. සිසුන් කණ්ඩායම් කිහිපයක් සඳහා මෙය නැවත නැවත සුසර කිරීමෙහි යොදවන්න.

(කාලච්ඡේද 01)

- දෙවනු ව වයලීනයේ දෙවන තත මධ්‍ය පංචමයට ඉහත ආකාරයට ම සුසර කරන්න. සර්පිනාවේ මධ්‍ය ප ස්වරය වයන විට සුසර කිරීම පහසු වෙයි. සංගීත ස්වර අන්තරවලට කන හුරු වූ විට ෂඩ්ජය පමණක් මේ සඳහා සෑහෙන බව සිසුනට පහදා දෙන්න. සිසු කණ්ඩායම් සඳහා මීට කාලයක් ලබා දෙන්න.
- පළමු තත හා සිවු වන තත් ව්‍යාවහාරික ක්‍රමයේ දී වෙනස් වන ආකාරය පිළිබඳ ව සිසුන් හා සාකච්ඡා කර තහවුරු කරවන්න.
- වයලීන ටියුනරයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ ව සිසුන් දැනුම්වත් කරන්න.
- පෙර ක්‍රමවේදය ම අනිකුත් ක්‍රම සඳහා ද අනුගමනය කරමින් ඉතිරි ස්වර ද සිසුන් සමඟ එක් වෙමින් සුසර කරන්න.

(කාලච්ඡේද 01)

ඇගැයීම් සහ තක්සේරුකරණය සඳහා උපදෙස් :

- එක් එක් සංගීත ක්‍රමයන් සඳහා යොදන සුසර කිරීම් පිළිබඳ ව වාචික ව ප්‍රශ්න අසා අගයන්න.

පැවරුම :

- විවිධ රාග සඳහා වයලීනය සුසර කිරීමේ දී 1 තත හා 4 තත සුසර කරන ස්වර ගැලීම් සටහනක් මඟින් පෙන්වන්න.

ඇමුණුම :- (විෂය කරුණු හා බැඳි ශීර්ෂ)

කොටස i

පෙරදිග ක්‍රමය :-

| 4 තත | 3 තත | 2 තත | 1 තත |
|---|---|---|---|
| ප් | ස | ප | ස් |

අපරදිග ක්‍රමය :-

| 4 තත | 3 තත | 2 තත | 1 තත |
|---|---|---|---|
| ප් | රි | ධ | ග් |

ව්‍යාවහාරික ක්‍රමය :-

| 4 තත | 3 තත | 2 තත | 1 තත |
|---|---|---|---|
| ම් | ස | ප | රි |

කර්ණාටක ක්‍රමය :-

| 4 තත | 3 තත | 2 තත | 1 තත |
|---|---|---|---|
| ස් | ප් | ස | ප |

ඇමුණුම 2 (කපිරිඤ්ඤා ගීත)

| | | | | |
|---|---|---|---|---|
| | F | B$^{s}$ | C$^{7}$ | |
| ධ නි | ස් - ධ නි ස් - | රි - ස් නි ධ - | නි - ප - ප - | ප - - - ප ධ |
| | C$^{7}$ | F | F | |
| | නි - ප ධ නි - | ස් - නි ධ ප - | ධ - ධ - ධ - | ධ - - - ධ නි |
| | F | B$^{s}$ | C$^{7}$ | |
| | ස් - ධ නි ස - | රි - ස් නි ධ - | නි - ප - ප - | ප - - - ප ධ |
| | C$^{7}$ | F | F | |
| | නි - ප ධ නි - | ස් - නි ධ ප - | ධ - ම - ම - | ම - - - ධ නි |
| | F C | F | C$^{7}$ | |
| | ස ම් - ග් ප් - | ම් ග් - රි ස් ධ | නි - ප - ප - | ප - - - ප ධ |
| | C | F C7 | F | |
| | ප ම් - ග් රි - | ස් ධ් ස. නි ප නි | ධ - ම - ම - | ම - - - - - |

ක්‍රියාකාරකම 52

# ශ්‍රැතිය, ස්වර පරාසය සහ ස්කේල නිර්මාණයක දී වැදගත් වන අයුරු.

**නිපුණතාව 8.0** : සංගීත නිර්මාණකරණයේ අත්හදා බැලීම් කරයි.

**නිපුණතා මට්ටම 8.1** : රිද්මය, තාලය, ලය සහ ස්වර, නිර්මාණයක දී වැදගත් වන අයුරු පිළිබඳ තර්කානුකූල අදහස් දක්වමින් නිර්මාණකරණයේ යෙදෙයි.

**ක්‍රියාකාරකම** : ශ්‍රැතිය, ස්වරපරාසය සහ Scale නිර්මාණයක දී වැදගත්වන අයුරු සහ ප්‍රායෝගික අත්හදා බැලීම්.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල** :
- විවිධ ස්වරස්ථාන ශ්‍රැති කරගත් ගීත නම් කරයි.
- එක් එක් ගීතයේ ශ්‍රැතිය සහ ස්කේලය එම ගීතයේ අර්ථය හා බද්ධ වන අයුරු තර්කානුකූල ව විස්තර කරයි.
- ගීතයක අදහස උද්දීපනය කිරීමට ඊට අදාළ සංගීත නිර්මාණය මෙන්ම තෝරාගන්නා ස්කේලය හා ශ්‍රැතිය වැදගත් වන බව පිළිගනියි.
- සරල සංගීත කොටසක් නිර්මාණය කර ශ්‍රැති ස්ථානය හා ස්කේල මාරුකරමින් ගැළපෙන හෝ නොගැළපෙන බව පිළිබඳව තර්ක තරයි.
- නිර්මාණ කාර්යයේ යෙදෙයි.

**ගුණාත්මක යෙදවුම්**:
- ඇමුණුමේ සඳහන් තොරතුරු හා බැඳි දෘශ්‍ය උපකරණ හෝ ඡායා පිටපත්.
- සර්පිනාවක් හෝ ස්වර පුවරු භාණ්ඩයක්.

**විෂයකරුණු පැහැදිලි කරගැනීමට අත්වැලක්** :

- ව්‍යාවහාරික සංගීතය හා බැඳි සංගීත නිර්මාණ '' ස '' ස්වරය ම ශ්‍රැති කරගෙන නිර්මාණය වී නැත. බොහෝ සරල ගී විවිධ ස්වර ශ්‍රැති කර ගෙන ඇත්තේ එම ගීවල පදමාලාවෙන් ප්‍රකාශනය වන අදහස තවදුරටත් තීව්‍ර වන අයුරින් ශ්‍රාවකයාගේ සිතට දැනවීමට ය. පද මාලාවකට තනුවක් යෙදීමේ දී, සංගීත නිර්මාණ කරුවා කරුණු ගණනාවක් පිළිබඳ ව තම අවධානය යොමු කළ යුතුව ඇත. ගීතයක් නම් එය සරල ගීතයක් ද, චිත්‍රපට ගීතයක් ද, ටෙලි නාට්‍ය ගීතයක් ද, ආදි වශයෙන් මෙන්ම ගීතය ගායනා කරවන්නේ කුමන ගායකයා හෝ ගායිකාව ලවා ද, යන කරුණු ද වැදගත් වේ. එසේ වන්නේ නිර්මාණය කරනු ලබන ගීතයේ ඉතා ඉහළ ස්වර පරාසයක් ඇත්නම් එය ගායකයාට හෝ ගායිකාවට නොගැළපිය හැකි වන නිසාය. භාරතීය ගීත කෝකිලාවිය ලෙස සැලකෙන ''ලතා මංගේෂ්කාර්'' ශිල්පිනියට ඉතා ඉහළ ස්වර පරාසයක් ඇසුරු කළ හැකි බව පෙනේ. ඉහළ ශ්‍රැති ස්ථානයකින් ගායනා ඉදිරිපත් කර ඇත. ශ්‍රී ලංකාවේ ගීත කලාවේ ඉහළ අගයක් හිමි කරගෙන ඇති විශාරද නන්දා මාලිනියගේ ජනප්‍රිය බොහෝ ගීතවල ශ්‍රැති ස්ථානය පහළ ස්වරයකි. එහෙත් එම ගීතවල අදහසට තෝරා ගත් ශ්‍රැති මනා ව ගැළපී රසවත් බව වඩාත් ඉස්මතු වී ඇත්තේ ඇයගේ කට හඬේ ධ්වනි වර්ණයට එම ශ්‍රැති ස්ථාන ගැළපෙන නිසා ය. නිර්මාණයක දී තනුවේ ස්වර පරාසය අඩු නම් ඉහළ ස්වරයක් ශ්‍රැති කර ගැනීමේ හැකියාව ඇති බව ද පිළිගත යුතු ය. මුලින් තනුව නිර්මාණය කර පසු ව ඊට ගැළපෙන පද නිර්මාණය කළ ගීත ද ජනප්‍රිය ව පවතී. ඇමුණුමේ දක්වෙන විෂය කරුණු මෙම පාඩම සංවර්ධනය කර ගැනීමට ඔබට උපකාරී වනු ඇත.

පාඩම සංවර්ධනය

- ඇමුණුමේ දැක්වෙන ගීතයක් තෝරාගෙන ඊට අදාළ නියමිත ශ්‍රැතියෙන් වාදනය සමඟ ගායනය කරමින් පාඩමට පිවිසෙන්න. අදාළ ගීතයේ පදමාලාවෙන් ගම්‍ය වන අර්ථය පිළිබඳව සිසුන් විමසන්න. පද මාලාවේ අදහසට තනුවේ හා රිද්මයේ ගැලපීම පිළිබඳ ව සිසුන් සමග සාකච්ඡා කරන්න. එම ගීතයේ ශ්‍රැති ස්ථානය සිසුන්ගෙන් විමසා පහදා දෙන්න. එම ගීතය ම පහළ හෝ ඉහළ හෝ ස්වරයක් ශ්‍රැති කරගනිමින් ගයා වයා පෙන්වා ගැළපෙන නොගැළපෙන බව සාකච්ඡා කරන්න. ඇමුණුමේ සඳහන් ගීත ලැයිස්තුවට අදාළ වගුව ප්‍රදර්ශනය කරමින් ගීත කොටස් ගයා වයා පෙන්වන්න. වෙනත් ශ්‍රැති ස්කේල මාරුකර යොදමින් ගයා වයා ගැළපෙන, නොගැළපෙන බව සාකච්ඡා කරන්න.

  කාලච්ඡේද 01 යි.
- සිසුන් කණ්ඩායම් වශයෙන් හෝ කේවල ව හෝ යොදා ගනිමින් කුඩා සංගීත කොටසක් නිර්මාණය කරවන්න. මේ සඳහා ශෝකය, ආදරය, කරුණාව, වීරත්වය, වැනි තේමාවක් තෝරා ගත හැකි ය. සිසුන්ගේ නිර්මාණය ගී තනුවක පාද 4 ක ප්‍රමාණය සෑහේ. එම නිර්මාණය ගයා වයා පෙන්වන්න. එම නිර්මාණ කොටස ම වෙනත් ශ්‍රැතියකින් සහ වෙනත් ස්කේලයකින් ඉදිරිපත් කරවන්න. වඩාත් ගැළපෙන සුදුසු ආකාරය සිසුන් සමඟ සාකච්ඡා කරන්න. නිර්මාණයක දී ශ්‍රැති ස්වරය, ස්වර පරාසය, ස්කේලය වැදගත් වන අයුරු සිසුන් සමග සාකච්ඡා කරන්න.

  කාලච්ඡේද 01 යි.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- සිසුන් දක්වන අදහස් අගයන්න.
- නිර්මාණය කළ සංගීත ඛණ්ඩය අගය කරන්න.

  පැවරුම -
- තේමා වාදන, සරල ගී, චිත්‍රපට ගී ආදි ක්ෂේත්‍රවලින් සිසුන් වඩාත් ප්‍රිය කරන නිර්මාණ 5ක් තෝරා ගෙන එම නිර්මාණවල ශ්‍රැති ස්වරය, ස්වර පරාසය සහ ස්කේලය සෙවීමට යොමු කරන්න. එම කොටස් ගීතයේ අර්ථයට සහ ග

  ඇමුණුමේ දැක්වෙන ගීතවල සංගීත නිර්මාණය, ගේය පද නිර්මාණය ගායනය ආදි තොරතුරු රැස් කරවන්න.

අතිරේක උදවු -

- 2009 පෙරදිග සංගීතය 12 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය. පිටු අංක 220 - 223 දක්වා පහත දැක්වෙන ග්‍රන්ථ කියවා නිර්මාණ සංගීතයේ දී ශ්‍රැතිය, ස්වර පරාසය, හා ස්කේල වැදගත් වන අයුරු සටහනක් පිළියෙළ කරවන්න.

  '' මාරම්බරී '' ග්‍රන්ථය - විශාරද එඩ්වඩ් ජයකොඩි ශූරීන් ගේ ගායනා

  '' සිංහල සංගීතයේ රෝහණ ලකුණ '' - ආචාර්ය රෝහණ වීරසිංහයන් ගේ නිර්මාණ පිළිබඳ තොරතුරු ඇතුළත් කළ ග්‍රන්ථය.

ඇමුණුම:-

විවිධ ස්වර ශ්‍රැති කරගත් සහ විවිධ ස්වර පරාසයන්ට අයත් ගීත ලැයිස්තුවක් පහත දැක්වේ. ඒවායේ ඇති ගති ලක්‍ෂණ සාකච්ඡා කිරීමෙන් සිසුන් තුළ නිර්මාණ හැකියාව වර්ධනය කළ හැකි ය.

| | ගීතයේ මුල් වචන | ශ්‍රැති ස්වරය | ස්කේලය | ප්‍රධාන කෝඩ්එක | ස්වර සහ විශේෂතා |
|---|---|---|---|---|---|
| 01. | අම්මාවරුනේ | $E^b$ | $E^b$ Minor | $E^b$ -Mi-Sus | ගිටාරයෙන් ප්‍රධාන කෝඩ් එක නිරතුරු ව වැයේ. ස්වර පරාසය අඩු ය. |
| 02 | සිනිඳු සුදුමුදු | C | C Minor | C Minor | මුහුදේ රැලි වෙරළේ හැපීම, ගැඹුර, රළු බව, චණ්ඩ බව, ශාන්ත බව දනේ. සංගීත භාණ්ඩ රාශියක් යොදා ගෙන ඇත. සංධ්වනියක් මෙන් ය. |
| 03. | සඳකඩ පහණක | A | A Minor | A Minor | සුනිල් එදිරිසිංහයන්ගේ ප්‍රථම චිත්‍රපට ගීතය. සෑම පාදයකට ම Counter parts පිරී ඇත. ස්වර පරාසය වැඩි ය. උච්ච ස්වර ඇසුරු කරයි. |
| 04. | කුරුටු ගෑ ගී පොතේ | $B^b$ | $B^b$ Major | $B^b$ Major | විශාරද නන්දා මාලිනිය ගායන කළ ගීතයක් |
| 05. | අහස නුඹ මෙතරම් | B | B Minor | B Minor | විශාරද දීපිකා ප්‍රියදර්ශනී ගායන කළ ගීතයක්. අතුරු වාදනවල තිහායි කොටසක් ඇත. එක ම ස්වරය ශුද්ධ ව හා කෝමල ව පිහිටයි. |
| 06. | මාරම්බරී | | | | විශාරද එඩ්වඩ් ජයකොඩි සූරීන්ගේ ගායනයක්. ගසල් ගායන ශෛලියේ ස්වරූපය. මුලින් තනුව නිර්මාණය කර පසු ව පද ''''රචනාව නිර්මාණය කළ එකකි. |

**ක්‍රියාකාරකම 53**

# හඬතල සඳහා සංගීත භාණ්ඩ නිර්මාණය වී ඇති අයුරු.

**නිපුණතාව 8.0** : සංගීත නිර්මාණකරණයේ අත්හදා බැලීම් කරයි.

**නිපුණතා මට්ටම 8.1** : රිද්මය, තාලය, ලය සහ ස්වර, නිර්මාණයක දී වැදගත් වන අයුරු පිළිබඳ තර්කානුකූල අදහස් දක්වමින් නිර්මාණකරණයේ යෙදෙයි.

**ක්‍රියාකාරකම** : විවිධ හඬතල, Violin family සහ Brass family

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල** :
- හඬතල නම් කරයි.
- එකිනෙක හඬතල අතර වෙනස්කම් දක්වයි.
- Brass සහ Violin නමින් ඇති පවුල්වලට අයත් භාණ්ඩ නම් කරයි.
- පෙරදිග සංගීතයට වඩා අපරදිග සංගීතයේ භාණ්ඩ විශාල සංඛ්‍යාවක් ඇති බව පිළිගනියි.
- හඬතල අනුව සංගීත භාණ්ඩ වෙන් කරයි. වගුගත කරයි.

**ගුණාත්මක යෙදවුම්**:
- ඇමුණුමේ සඳහන් තොරතුරු හා බැඳි දෘශ්‍ය උපකරණ හෝ ඡායා පිටපත්.
- 2009 පෙරදිග සංගීතය 12 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ 202, 203 පිටුවල ඡායා පිටපත්.
- වයලින් පවුල දැක්වෙන දෘශ්‍ය උපකරණයක්.
- Brass පවුලට අයත් සංගීත භාණ්ඩවල පින්තූර සටහන්.
- සප්තක හතක් ඇතුළත් ස්වර පුවරු රූපසටහනක්

**විෂය කරුණු පැහැදිලි කරගැනීමට අත්වැලක් :**

- සංඛ්‍යාතය 16-16000 හෝ 20-20000 දක්වා ඇති නාද මිනිස් කණට ශ්‍රවණය කළ හැකි යැ යි විද්වතුන් දක්වා ඇත. ඒ අනුව වඩා ඉහළ පහළ ස්වර ඇතුළත් කර සංගීත නිර්මාණය කිරීමට බටහිර සංගීතඥයන් පෙලඹෙති. එක ම සංගීත භාණ්ඩයකින් වැඩි ස්වර පරාසයක් භාවිත කළ නොහැකි නිසා එක ම හැඩයේ සංගීත භාණ්ඩ කිහිපයක් ප්‍රමාණයෙන් වෙනස් ව, හඬතල අනුව නිර්මාණය වී ඇත. හඬතල හයක් දක්වා බෙදෙන බව සඳහන් වුවත් මෙම ශ්‍රේණියේ දී ඉගැන්වීමට අපේක්ෂා කරනුයේ ප්‍රධාන හඬතල හතර පමණකි. 2009 පෙරදිග සංගීතය 12 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ 202, 203 පිටුවල ඡායාපිටපත් මඟින් ක්‍රියාකාරකමක යෙදවිය හැකි ය.

**පාඩම සංවර්ධනය**

- හඬතල හතරේ සංගීත භාණ්ඩ ඇතුළත් වාද්‍ය ඛණ්ඩයක් ශ්‍රවණයට සලසා ඒ පිළිබඳ සාකච්ඡාවකින් පිවිසෙන්න. සංගීතය 12 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ 202, 203 පිටුවල ඡායාපිටපත් ලබා දී ඒ මගින් ක්‍රියාකාරකමේ යොදවන්න. එය අපහසු නම් ඇමුණුමේ දක්වෙන රූප සටහන් ඉදිරිපත් කරමින් හඬතල හතර පිළිබඳව සාකච්ඡාවක නිරතවන්න.

- වයලින් පවුලේ පින්තූර සටහන ප්‍රදර්ශනය කර එක් එක් භාණ්ඩය හඳුනා ගැනීමට සලස්වා ඒවායේ හැඩය ප්‍රමාණය හා අයත් වන හඬතලය සාකච්ඡා කරන්න. ඒම භාණ්ඩවල තත් සුසර කරන ස්වර මොනවා දැයි පහදා දෙන්න.

කාලච්ඡේද 01 යි.

- ඇමුණුමේ දක්වෙන සුෂිර වාද්‍ය භාණ්ඩ ලැයිස්තුවට අදාළ රූප සටහන් බෙදා දෙන්න. එම භාණ්ඩ Wind Instruments ගනයට අයත් බව පහදා Wood wind සහ Brass Wind යන වර්ග දෙකට බෙදීමට යොමු කරන්න. සුදුසු වගුවක් සපයා දී හඬතල හතරට අදාලව බෙදමින් Brass family වර්ගයේ භාණ්ඩ වල රූප සටහන් ඇලවීමට යොමු කරන්න. මෙහි දී හැඩය හා ප්‍රමාණය සැලකිල්ලට ගන්න. ඒවායේ ඇති පොදු ලක්ෂණ සිසුන්ට පැහැදිලි කරන්න. සිසුන් සැකසූ දෘශ්‍ය උපකරණය අගයන්න.

කාලඡේද 01 යි.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- සිසුන් දක්වන අදහස් අගයන්න.
- නිර්මාණය කළ දෘශ්‍ය උපකරණය අගය කරන්න.

පැවරුම -


- String Instruments, සහ percusion Instruments භාණ්ඩ නාම වට්ටෝරුවක් සපයා ගෙන එම භාණ්ඩ හඬතල හතරට බෙදා දක්වන්න.


අතිරේක උදවු -


- http://www.newworldencyclopedia.org/entry/voice Range

ඇමුණුම:-

පහත දැක්වෙන රූප සටහන් පාඩම ගොඩ නැගීමට ඔබට උපකාරී වනු ඇත.






Wind Instruments:-

පිකලෝ, ෆ්ලූට්, ක්ලැරිනට්, සැක්සෆෝන්, ඕබෝ, කොරංගලී, බෙසූන්,

ට්‍රම්පට්, ෆ්‍රෙන්ච් හෝන්, ට්‍රොම්බෝන්, ඉයුෆෝනියම්, ටියුබා,

(පාසල් තූර්ය වාදක කණ්ඩායම්වල සහ හමුදා තූර්යවාදක කණ්ඩායම්වල මෙම සංගීත භාණ්ඩ භාවිතයේ පවතී.)

**ක්‍රියාකාරකම 54**

## මධ්‍යමය, පංචමය ශ්‍රැති කරගනිමින් ප්‍රස්තාරකරණය.

## F,G, Major & Minor Scale

**නිපුණතාව 9.0** : සංකේතානුසාරයෙන් සංගීතය ලියාදක්වන විධි හඳුනාගනිමින් විශ්ව සංගීත කෘති ඇසුරු කිරීමටත්, දේශීය සංගීතාංග ලෝකය වෙත යොමු කිරීමටත් අත්‍යවශ්‍ය මූලික නිපුණතා වර්ධනය කරගනියි.

**නිපුණතා මට්ටම 9.1** : විවිධ ස්වර ශ්‍රැති කරගනිමින් ප්‍රස්තාරකරණයේ යෙදෙයි.

**ක්‍රියාකාරකම** : '' **මධ්‍යමය** '' සහ '' **පංචමය** ''ශ්‍රැති ස්වරය ලෙස ගෙන ප්‍රස්තාර කරමු. ගීත ගයමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 04

**ඉගෙනුම් පල** :
- මධ්‍යමය, හෝ පංචමය ශ්‍රැති කරගනිමින් ශුද්ධ ස්වර සප්තකය පිහිටුවීමේ දී ලැබෙන ස්වර නම් කරයි.
- F Major , G Major, & F Minor, G Minor යන ස්කේලවලට අයත් ස්වර නම් කරයි.
- Major & Minor සිද්ධාන්ත විස්තර කරයි.
- තම සංගීත නිර්මාණ සඳහා විවිධ සංගීත ක්‍රම වල ආභාෂය ලබා ගැනීමට පෙලඹේ.
- C Major ස්කේලයට අයත් ස්වර ප්‍රස්තාරයක් F Major , G Major, ස්කේලවලට අයත් වන ලෙස පෙරළා ප්‍රස්තාර කරයි.
- C Minor ස්කේලයට අයත් ස්වර ප්‍රස්තාරයක් F Minor , G Minor, ස්කේලයන්ට අයත් වන ලෙස පෙරලා ප්‍රස්තාර කරයි.

**ගුණාත්මක යෙදවුම්:**
- ඇමුණුමේ සඳහන් තොරතුරු හා බැඳි සකසා ගත් දෘශ්‍ය උපකරණ හෝ ඡායා පිටපත්.
- ඇමුණුමේ දක්වන පරිදි 2009 පෙරදිග සංගීතය 12 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ මෙම මාතෘකාව හා බැඳි විෂය කරුණුවල සාරාංශ.

**විෂයකරුණු පැහැදිලි කරගැනීමට අත්වැලක් :**

- F Major, G Major, & F Minor, G Minor යන ස්කේලවලට අයත් ස්වර පිළිබඳ ව මීට පෙර ශ්‍රේණිවල දී සිසුන් අධ්‍යයනය කර ඇත. එම දැනුම ද යොදා ගනිමින් තව දුරටත් සංවර්ධනාත්මක ව මෙම පාඩම ඔබට සැලසුම් කර ගත හැකිවේ. සිද්ධාන්තමය කරුණුවලට වඩා විශේෂයෙන් වෙනත් ස්කේලයක ස්වර ප්‍රස්තාරයක් මෙම ස්කේලවලට පෙරළා ප්‍රස්තාර කිරීමේ කුසලතාව ලබා දීම අවශ්‍ය වේ. " F" Major Scale සහ " G " Major Scale යන දෙකෙහි ශුද්ධ ස්වර සප්තකය පිහිටන ආකාරය පිළිබඳ ව වැටහීමක් ද මෙමඟින් ලැබෙනු ඇත මෙම ස්කේල දෙක මත පිහිටා කිසියම් ගීතයක්, හෝ ජන ගීතයක් හෝ ගායනය කිරීමටත්, සර්පිනාව වැනි ස්වර පුවරු භාණ්ඩයකින් මෙම ස්කේල දෙක මත ගීත වාදනය කිරීමටත් සිසුනට හැකි වනු ඇත. යෝජිත ප්‍රවේශයේ දී සර්පිනාවේ යතුරු සිසුනට පෙනෙන සේ වාදනය කිරීම වඩාත් ඵලදායී වේ. මෙහි දී, Melodic Minor & Harmonic Minor යන සිද්ධාන්ත පෙරදිග සංගීතය හදාරන දරුවන්ට අවශ්‍ය නොවන අතර වැඩි වශයෙන් ව්‍යාවහාරික සංගීතය තුළ පවතින ස්කේල පමණක් හැදෑරීම ප්‍රමාණවත් ය. සිසුන්ගේ නිදහස් වේලාවල දී සර්පිනාවේ ඕනෑම ස්වරයක් ශ්‍රැති ස්වරය ලෙස ගෙන ශුද්ධ ස්වර සප්තකය වාදනය කිරීමට සිසුන් යොමු කිරීම වැඩි දුර අධ්‍යයනයට සුදුසු ය. එහි දී අතැඟිලි හැසිරවීම පිළිබඳ ව ද අවධානය යොමු කරවන්න.

**පාඩම සංවර්ධනය**

- මීට පෙර කළ ක්‍රියාකාරකම සහ මේජර් මයිනර් යන්න පිළිබඳ කෙටි සාකච්ඡාවක් කරන්න. ඇමුණුම අංක 01හි දැක්වෙන ප්‍රවේශය ඉදිරිපත් කරන්න. ඇති වූ වෙනස්කම් සාකච්ඡා කරන්න. ක්‍රියාකාරකම අංක 01හි යොදවන්න. F Major , G Major, ස්කේල්වල ස්වර පිහිටන අයුරු හඳුන්වා දෙන්න.

කාලච්ඡේද 02යි

- ඇමුණුම අංක 02හි දැක්වෙන ප්‍රවේශය යොදා ගන්න. ක්‍රියාකාරකම අංක 02හි යොදවන්න. වගුවේ ඇති සී මයිනර් ස්කේලයන් ගොඩ නැගී ඇති අයුරු වටහා ගැනීමට සහාය වන්න. 10, 11 ශ්‍රේණිවල දී අධ්‍යයනය කළ විෂය කරුණු වෙනස් වන ආකාරය පිළිබඳ අවධානය යොමු කරන්න. තොරතුරු පන්තියට ඉදිරිපත් කිරීමට සහාය වන්න.

කාලඡේද 02යි

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- එක් එක් කාල ඡේදය අවසානයේ අධ්‍යයනය කළ විෂය කොටස් ඇසුරින් ප්‍රශ්න නගා අගය කරන්න.

පැවරුම:- F Major , G Major, සහ F Minor , G Minor, ස්කේල්වලට අයත් සරල ගී දෙකක ස්වර ප්‍රස්තාර සොයා ගැනීමට යොමු කර ඒවා තම වයන වාද්‍ය භාණ්ඩයෙන් සහ සර්පිනාවකින් වැයීම හුරු වීමට යොමු කරන්න.

අතිරේක උදවු -

ගීත ප්‍රස්තාර - අනුර වන්නිආරච්චි

ඇමුණුම.

ප්‍රවේශය.

01. තෝරා ගත් ගීතයක් ''ස'' ස්වරය ශ්‍රැති ස්වර ලෙස ගෙන යතුරු පුවරුව ප්‍රදර්ශනය වන සේ (සර්පිනාවකින් හෝ මෙලෝඩිකාවකින් හෝ) වයා පෙන්වන්න. එම ගීතය ම මධ්‍යමය හා පංචමය ශ්‍රැති ස්වර ලෙස වාදනය කරන්න. ඇති වන වෙනස සාකච්ඡා කරන්න.

**ක්‍රියාකාරකම අංක 01**

02. පහත දැක්වෙන වගුව පුරවන්න.

| පෙරදිග | අපරදිග | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 1 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ස | රි | රි | ග | ග | ම | ම′ | ප | ධ | ධ | නි | නි | ස |
| '' ම '' ස්වරය ශ්‍රැති ස්වරය ලෙස ගෙන ශුද්ධ ස්වර සප්තකය | " F " Major Scale | F | | | | | | | | | | | | |
| '' ප '' ස්වරය ශ්‍රැති ස්වරය ලෙස ගෙන ශුද්ධ ස්වර සප්තකය | " G " Major Scale | G | | | | | | | | | | | | |
| '' ම '' ස්වරය ශ්‍රැති ස්වරය ලෙස ගෙන කෝමළ ස්වර ඇතුළත් සප්තකය | " F " Minor Scale | F | | | | | | | | | | | | |
| '' ප '' ස්වරය ශ්‍රැති ස්වරය ලෙස ගෙන කෝමළ ස්වර ඇතුළත් සප්තකය | " G " Minor Scale | G | | | | | | | | | | | | |

03. සර්පිනාව වැනි යතුරු පුවරුවකින් " F " Major සහ G " Major වාදනයට යොමු කරන්න.

04. තෝරාගත් ගීතයක් " F " Major සහ G " Major අනුව වාදනය කරවන්න.

05. තෝරාගත් ශුද්ධ ස්වර පමණක් යෙදෙන ජන ගී දෙකක් " F " Major සහ G " Major ස්කේල මත වාදනයට යොමු කරන්න.

06. ඉහත වගුව මෙන් සුදුසු ආකාරයකට මයිනර් ස්කේල සඳහා වගුවක් ගොඩනඟන්න.

07. “ F “ Minor සහ G “ Minor ස්කේල ගොඩනඟන්න .

08. තෝරාගත් කෝමල ස්වර යෙදෙන ජන ගී දෙකක් “ F “ Minor සහ G “ Minor ස්කෙල්යන් මත වාදනයට යොමු කරන්න.

09. තෝරාගත් වාද්‍ය භාණ්ඩයේ තෝරාගත් ජන ගී “ F “ Minor සහ G “ Minor ස්කෙල්යන් මත වාදනයට යොමු කරන්න.

10. මෙතෙක් අධ්‍යයනය කළ ජන ගීවල ෂඩ්ජ භාවයෙන් සකස් කළ ප්‍රස්තාර මධ්‍යමභාවයෙන් සහ පංචම භාවයෙන් පෙරලා ප්‍රස්තාර කරවන්න.

11. ස්වර පුවරුවෙන් සහ තෝරාගත් වාද්‍ය භාණ්ඩයෙන් මෙතෙක් අධ්‍යයනය කළ ජනගී මධ්‍යම භාවයෙන් සහ පංචම භාවයෙන් වාදන අභ්‍යාසයන්හි යොදවන්න.

මයිනර් ස්කේල ගොඩ නැඟීම හඳුනා ගැනීමට පහත දැක්වෙන වගුව අධ්‍යයනය කරන්න. අර්ධ ස්වරයක් Semi Tone ඇති තැන ⌴ ලකුණ යොදා ඇත.

ම´

| " A " Minor Scale | | | | | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ආරෝහණ | | | | | | | | | | | | | අවරෝහණ | | | | | | | | | | | |
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 1 | 12 | 11 | 10 | 9 | 8 | 7 | 6 | 5 | 4 | 3 | 2 | 1 |
| ස | රි | රි | ග | ග | ම | ම´ | ප | ධ | ධ | නි | නි | ස් | නි | නි | ධ | ධ | ප | ම´ | ම | ග | ග | රි | රි | ස |
| ධ | | නි | ස | | රි | | ග | ම | | ප | | ධ | | ප | | ම | ග | | රි | | ස | නි | | ධ |
| A | | B | C | | D | | E | F | | G | | A | | G | | F | E | | D | | C | B | | A |

•

'' සරිගමපධනිස'' යන ශුද්ධ ස්වර සියල්ල '' ධනිසරිගමපධ '' වශයෙන් යොදා ගත් විට එය “ A “ Minor Scale නමින් හැඳින්වේ. එම ස්වර “ C “ Minor Scale යට පෙරළුවිට ලැබෙන ස්වර මෙසේ ය.

'' ස රි ග ම ප ධ නි ස

ස නි ධ ප ම ග රි ස

මෙම ස්වර අපේ ආශාවරී මේලයට සමාන යී “ A “ Minor Scale යට සහ “ C “ Major Scale යට කිසි ම ෆ්ලැට් ස්වරයක් හෝ ෂාප් ස්වරයක් හෝ යෙදෙන්නේ නැත.

ක්‍රියාකාරකම 55

# කෝමල නි සහ කෝමල ග ස්වර ශ්‍රැති කරගනිමින් ප්‍රස්තාරකරණය.

## $B^b$,$E^b$ ,Major Scale

**නිපුණතාව 9.0** : සංකේතානුසාරයෙන් සංගීතය ලියාදක්වන විධි හඳුනාගනිමින් විශ්ව සංගීත කෘති ඇසුරු කිරීමටත්, දේශීය සංගීතාංග ලෝකය වෙත යොමු කිරීමටත් අත්‍යවශ්‍ය මූලික නිපුණතා වර්ධනය කරගනියි.

**නිපුණතා මට්ටම 9.1** : විවිධ ස්වර ශ්‍රැති කරගනිමින් ප්‍රස්තාරකරණයේ යෙදෙයි.
**ක්‍රියාකාරකම** : '' **කෝමල නි** '' සහ '' **කෝමල ග** ''ශ්‍රැති ස්වරය ලෙස ගෙන ප්‍රස්තාර කරමු. ගීත ගයමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 04

**ඉගෙනුම් පල** :
- කෝමල ග, නි, යන ස්වර ශ්‍රැති කරගනිමින් ශුද්ධ ස්වර සප්තකය පිහිටුවීමේ දී ලැබෙන ස්වර නම් කරයි.
- $B^b$ Major , $E^b$ Major, යන ස්කේලවලට අයත් ස්වර නම් කරයි.
- තම සංගීත නිර්මාණ සඳහා $B^b$ Major , $E^b$ Major, යන ස්කේල යොදා ගැනීමට පෙලඹේ.
- C Major ස්කේලයට අයත් ස්වර ප්‍රස්තාරයක් $B^b$ Major , $E^b$ Major, යන ස්කේලයන්ට අයත් වන ලෙස පෙරළා ප්‍රස්තාර කරයි.

**ගුණාත්මක යෙදවුම්:**
- ඇමුණුමේ සඳහන් තොරතුරු හා බැඳි සකසා ගත් දෘශ්‍ය උපකරණ හෝ ඡායා පිටපත්.
- ඇමුණුමේ දක්වන පරිදි 2009 පෙරදිග සංගීතය 12 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ මෙම මාතෘකාව හා බැඳි විෂය කරුණුවල සාරාංශ.

**විෂයකරුණු පැහැදිලි කරගැනීමට අත්වැලක් :**

- $B^b$ Major , $E^b$ Major, යන ස්කේල වැඩි වශයෙන් මෙරට සංගීත ක්ෂේත්‍රය තුළ භාවිත වේ. සරල ගී රාශියක් මෙම ස්කේල දෙකට අයත් ලෙස නිර්මාණය වී ඇත. එබැවින් මෙම ස්කේල දෙකෙහි ප්‍රායෝගික පුහුණුව ද උසස් පෙළ සිසුන්ට වැදගත් වනු ඇත. මීට පෙර පාඩමේ දී ස්කේල පිළිබඳ සිසුන් ලබා ඇති දැනුම ද උපයෝගී කර ගත හැකි ය. මීට " $B^b$ Major Scale සහ " $E^b$ Major Scale යන දෙකෙහි ශුද්ධ ස්වර සප්තකය පිහිටන ආකාරය පිළිබඳ වැටහීමක් ද ලැබෙනු ඇත. මෙම ස්කේල දෙක මත පිහිටා කිසියම් ගීතයක්, හෝ ජන ගීතයක් ගායනය කිරීමටත්. සර්පිනාව වැනි ස්වර පුවරු භාණ්ඩයකින් මෙම ස්කේල දෙක මත ගීත වාදනය කිරීමටත් සිසුනට හැකි වනු ඇත. යෝජිත ප්‍රවේශයේ දී සර්පිනාවේ යතුරු සිසුනට පෙනෙන සේ වාදනය කිරීම වඩාත් ඵලදායි වේ. සිසුන්ගේ නිදහස් වේලාවල දී සර්පිනාවේ ඕනෑම ස්වරයක් ශ්‍රැති ස්වරය ලෙස ගෙන ශුද්ධ ස්වර සප්තකය වාදනය කිරීමට සිසුන් යොමු කිරීම වැඩි දුර අධ්‍යයනයට සුදුසු ය. එහි දී අතැගිලි හැසිරවීම පිළිබඳව ද අවධානය යොමු කරවන්න. මෙම නිපුණතා මට්ටම හා බැඳි ක්‍රියාකාරකම් සියල්ල අවසානයේ කරනු ලබන ඇගයීම තුළින් සිසුන් ළඟාවී ඇති නිපුණතා මට්ටම විමසා දුර්වලතා මඟ හැරීමට පියවර ගත හැකි ය.

**පාඩම සංවර්ධනය**

- ඇමුණුම අංක 02හි දක්වෙන ප්‍රවේශය යොදා ගන්න. ක්‍රියාකාරකමෙහි යොදවන්න. වගුවේ ඇති ස්කේලයන් ගොඩ නැගී ඇති අයුරු වටහා ගැනීමට සහාය වන්න. $B^b$ Major $E^b$ Major, ස්කේලයන්ට අයත් ස්වර පැහැදිලි කර ගැනීමට සහාය වන්න.

(කාලච්ඡේද 02)

- ඇමුණුම අංක 03 හි දැක්වෙන ප්‍රවේශය යොදා ගන්න. ගීතයක භාවය හා රසවත් බව රැකීමට ශ්‍රැතිය වැදගත් වන ආකාරය සාකච්ඡා කරන්න. විවිධ ස්වර ශ්‍රැති ස්ථාන කරගත් ගීත කිහිපයක් යොදාගන්න. ගීතයේ පදමාලාවෙන් ප්‍රකාශිත අර්ථය වඩාත් උද්දීපනය වීමට ශ්‍රැතිය බලපාන ආකාරය සහ එය නිර්ණායකයක් වන ආකාරය පිළිබඳ නිදසුන් දක්වමින් සාකච්ඡා කරන්න. කෝමල නි සහ කෝමල ග ශ්‍රැති කරගනිමින් තෝරාගත් ගීත ප්‍රස්තාර කිරීමට යොමු කරන්න. වාදන අභ්‍යාසයේ යොදවන්න.

(කාලච්ඡේද 02).

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- එක් එක් කාල ඡේදය අවසානයේ අධ්‍යයනය කළ විෂය කොටස් ඇසුරින් ප්‍රශ්න නඟා අගය කරන්න.

පැවරුම:- $B^b$ Major $E^b$ Major, ස්කේලයන්ට අයත් සරල ගී දෙකක ස්වර ප්‍රස්තාර සොයා ගැනීමට යොමු කර ඒවා තමා වයන වාද්‍ය භාණ්ඩයෙන් සහ සර්පිනාවකින් වැයීම හුරු වීමට යොමු කරන්න.

අතිරේක උදවු -

සිංහලයෙන් රචිත බටහිර සංගීත ග්‍රන්ථවලට අමතර ව A HANDBOOK OF MUSICAL KNOWLEDGE ( Trinity College of Music London ) RUDIMENTS AND THEORY OF MUSIC ( Royal Schools of Music ) යන පොත් පත් පරිශීලනය කරන්න.

ඇමුණුම.

ප්‍රවේශය

01. පහත දක්වෙන ගීතය '' **ස** '' ස්වරය ශ්‍රැති ස්වරය ලෙස ගෙන යතුරු පුවරුව ප්‍රදර්ශනය වන සේ (සර්පිනාවකින් හෝ මෙලෝඩිකාවකින් හෝ) වයා පෙන්වන්න. වාදනය සමග ගීතය ද ගයන්න.

ස ස ස / රි රි රි / ග - රි / ස - - /
ස - ස / රි - රි / ග - ග / ම - - /
ම - ම / ග - ග / රි - රි / ස - - /
ස රි ග / ම - - / ම ග රි / ස - - /

එකට සතුටු සාගරේ
පීන පීන නාන සේ
සැමදා ම මේ ලෙසේ
නටමු ගී ගය ගයා

02. එම ගීතය ම '' **නි** '' ස්වරය ශ්‍රැති ස්වරය ලෙස ගෙන යතුරු පුවරුව ප්‍රදර්ශනය වන සේ ( සර්පිනාවකින් හෝ මෙලෝඩිකාවකින් හෝ) වයා පෙන්වන්න. වාදනය සමග ගීතය ද ගයන්න.

නි නි නි / ස ස ස / රි - ස / නි - - /
නි - නි / ස - ස / රි - රි / ග - - /
ග - ග / රි - රි / ස - ස / නි - - /
නි ස රි / ග - - / ග රි ස / නි - - /

03. එක ම ගීතයේ ස්වර ප්‍රස්තාර දෙකෙහි ඇති වූ වෙනස සාකච්ඡා කරන්න. ප්‍රස්තාර දෙකක් වුව ද කනට ඇසෙන ගීතය එකම බව සාකච්ඡා කරන්න.

ක්‍රියාකාකරකම 01.

01. පහත දැක්වෙන වගුව අධ්‍යයනය කිරීමට සලස්වන්න. එහි '' ස රි ග ම ප ධ නි ස '' යන ආරෝහණයට අයත් ස්වර අන්තරයන් හඳුනාගැනීමට සහාය වන්න. වගුව සම්පූර්ණ කිරීමට උපදෙස් දෙන්න.

| පෙරදිග | අපරදිග | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 1 | 2 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| '' ස '' ස්වරය ශ්‍රැති ස්වරය ලෙස ගෙන ශුද්ධ ස්වර සප්තකය | " C " Major Scale | ස | | රි | | ග | ම | | ප | | ධ | | නි | ස | |
| '' රි '' ස්වරය ශ්‍රැති ස්වරය ලෙස ගෙන ශුද්ධ ස්වර සප්තකය | "D " Major Scale | රි | | | | | | | | | | | | | |
| '' නි '' ස්වරය ශ්‍රැති ස්වරය ලෙස ගෙන ශුද්ධ ස්වර සප්තකය | " B$^{b}$ " Major Scale | නි | | | | | | | | | | | | | |
| '' ග '' ස්වරය ශ්‍රැති ස්වරය ලෙස ගෙන ශුද්ධ ස්වර සප්තකය | " E$^{b}$ " Major Scale | ග | | | | | | | | | | | | | |

- ''නි'' ස්වරය සහ ''ග''ශ්‍රැති ස්වරය ලෙස ගෙන ශුද්ධ ස්වර සප්තකය ගායනය කරවන්න.
- ''නි'' ස්වරය සහ ''ග'' ශ්‍රැති ස්වරය ලෙස ගෙන ශුද්ධ ස්වර සප්තකය ස්වර පුවරුවක වාදනය කරවන්න.
- ''එකට සතුටු සාගරේ'' ගීතය කෝමල නී සහ කෝමල ග ස්වර ශ්‍රැති ස්වර වශයෙන් ගෙන ප්‍රස්තාර කරවන්න.
- ශුද්ධ ස්වර පමණක් යෙදෙන මෙතෙක් අධ්‍යයනය කළ ජන ගීතයක් හෝ සරල ගීතයක කොටසක් ''නි'' ස්වරය සහ ''ග'' ශ්‍රැති ස්වරය ලෙස ගෙන නැවත ප්‍රස්තාර කරන්න.
- පෙරළා ප්‍රස්තාර කළ ගීතයේ ස්වර ප්‍රස්තාරය පන්තිය ඉදිරියේ ගයා වයා පෙන්වීමට අවස්ථාව සලසන්න. වඩාත් ගැළපෙන ශ්‍රැතිය පිළිබඳ අදහස් විමසන්න.

01. පහත දැක්වෙන වගුව පන්තියට ප්‍රදර්ශනය කරන්න. ඉන් එක් ගීතයක් තෝරා ගන්න. තෝරාගත් ගීතය අදාළ නියමිත ශ්‍රැතියෙන් ගයා වයා පෙන්වන්න. එම ගීතම ''ස'' ස්වරය ශ්‍රැති කරගනිමින් ගයා වයා පෙන්වන්න. ඇති වන වෙනස හා රසවත් භාවය අඩු කිරීමට හෝ වැඩි කිරීමටහෝ ශ්‍රැතිය බලපාන අන්දම සාකච්ඡා කරන්න.

| අනු අංකය | ගීතයේ මුල් කොටස | ශ්‍රැති ස්වරය | ස්කේලය | ප්‍රධාන Chord tl |
|---|---|---|---|---|
| 01 | අම්මාවරුණේ | | E$^{b}$ Minor | E$^{b}$ Minor Sus |
| 02 | සඳකඩ පහනක | | A Minor | A Minor |
| 03 | කුරුටු ගෑ ගී පොතේ | | B$^{b}$ Major | B$^{b}$ Major |
| 04 | අකුරු මැකී නෑ | | E$^{b}$ Major | E$^{b}$ Major |
| 05 | කරදිය ගැඹරේ | | E$^{b}$ Minor | E$^{b}$ Minor |

ක්‍රියාකාරකම 56

# පරිගණකය හඳුනා ගැනීම

නිපුණතාවය 10 :- සංගීතය හා බැඳි භෞතික විද්‍යාත්මක සහ ජීව තත්ත්වයන් අධ්‍යයනය කර ප්‍රසංගාත්මක හැකියා වඩාත් සාර්ථක ලෙස ඉදිරිපත් කරයි.

නිපුණතා මට්ටම 10.1 :- නව තාක්ෂණික උපකරණ සංගීත නිර්මාණයේ දී සහ අධ්‍යයනයේ දී උපයෝගී වන අයුරු පරීක්ෂා කරමින් භාවිත කරයි.

ක්‍රියාකාරකම 10.1.1 :- පරිගණකය හඳුනා ගැනීම.

ඉගෙනුම් පල :-
- පරිගණකය ඇතුළත ඇති කොටස් හඳුනා ගනී.
- පරිගණකයට පිටතින් සවි වන උපකරණ හඳුනා ගනී.
- පරිගණකය හා බද්ධ වී ඇති සංගීත ක්‍රියාකාරකම් හඳුනා ගනී.

කාලච්ඡේද :- 06

ගුණාත්මක යෙදවුම් :- පරිගණකයක් හෝ පරිගණක විද්‍යාගාරයක්, ඇමුණුමේ දැක්වෙන රූප සටහනක්, external sound card, extranal hard drive, pen drieve, midi keyboad, midi cable, music software

විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක් :-

1. 10, 11 ශ්‍රේණිවල දී මෙම පාඩමට අදාළ කරුණු අධ්‍යයනය කළත් මෙම අවස්ථාවේ දී එම කරුණු වඩාත් පුළුල් අයුරින් අධ්‍යයනය කිරීමට අපේක්ෂාව යි.

2. වර්තමානයේ ජංගම දුරකථන ලබා ඇති දියුණුව විශාල වශයෙන් සැලකිල්ලට ගත යුතු ය. ඇන්ඩ්‍රොයිඩ් ෆෝන් හෙවත් ස්මාර්ට් ෆෝනයකින් පරිගණකයක ඇති බොහෝ වැඩසටහන් ක්‍රියාත්මක කළ හැකිය. වෙනස් වන්නේ APPS හෙවත් Application ස්ථාපිත කරන O S හෙවත් Operation System ය. වර්තමානයේ පරිගණකයේ windows මත ස්ථාපිත කරන මෘදුකාංග ඇන්ඩ්‍රොයිඩ් Application ලෙස ස්මාර්ට් ෆෝනය ද ස්ථාපිත කර ගත හැකි ලෙස සකස් කර ඇත. තාම්පුරා හා තබ්ලා පද සහිත ව නිර්මාණය කරන ලද ඇන්ඩ්‍රොයිඩ් Application නොමිලේ ස්ථාපිත කරගත හැකිය. විශේෂයෙන් නූතන ලෝකයේ ගෝලීයකරණයත් සමඟම පරිගණකය මනුෂ්‍ය ජීවිතය හා දැඩි ව බැඳී පවතින්නේ ය. නව දැනුම සොයා යාමටත් නව දැනුම සම්ප්‍රේෂණය කිරීමටත් පරිගණකය අත්‍යවශ්‍ය මෙවලමකි. එමෙන් ම පරිගණකය භාවිතය ද අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ විශාල වශයෙන් ව්‍යාප්ත ව යමින් පවතී. ඉදිරි දශකය වන විට අධ්‍යයනයේ භාවිත වන කොපි පොත්, කියවීම් පොත් ආදිය භාවිතයෙන් ඉවත් ව ´Tab, Laptop ආදිය මගින් අධ්‍යාපනය ලබා දීමට සිදු වුවහොත් එය පුදුමයක් නොවනු ඇත. දැනට මත් ලෝකයේ බොහෝ රටවල අධ්‍යාපනය සඳහා භාවිත වන්නේ ඉහත සඳහන් උපකරණ ය.

3. මෙම පාඩමට සූදානම් වීමක් වශයෙන් 10, 11 ශ්‍රේණිවල මාර්ගෝපදේශ සංග්‍රහයේ පරිගණක හා සම්බන්ධ 10 ශ්‍රේණියේ ගු. මා. සං - පිටු අංක 78 - 89 දක්වා ද 11 ශ්‍රේණියේ ගු. මා. සං.- පිටු අංක 66 - 71 දක්වා ද පාඩම නැවත් කියවන්න එයින් මෙම පාඩම සඳහා මූලාරම්භයක් ලබා ගතහැකිය.

පාඩම සංවර්ධනය :-

- ඇමුණුම අංක 01හි දැක්වෙන ප්‍රවේශය යොදා ගන්න. පරිගණකාශ්‍රිත සංගීත නිර්මාණකරුවන්ගේ සංගීත නිර්මාණවල ඇති ගුණාත්මක වෙනස ම සිසුන් සමඟ සාකච්ඡා කරන්න. ක්‍රියාකාරකම අංක 01හි යොදවන්න. සිසුන්ට කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසන්න. සමාලෝචනයක යෙදෙන්න.

(කාලච්ඡේද 02යි.)

- ක්‍රියාකාරකම අංක 02හි යොදවන්න. සිසුන්ට කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසන්න. සමාලෝචනයක යෙදෙන්න.

(කාලච්ඡේද 02 යි.)

- ක්‍රියාකාරකම අංක 03හි යොදවන්න. සිසුන්ට කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසන්න. සමාලෝචනයක යෙදෙන්න.

(කාලච්ඡේද 02යි.)

ඇමුණුම 01 :

ප්‍රවේශය

01. පරිගණක ආශ්‍රිත ව සංගීතය නිර්මාණය කළ සංගීත ඛණ්ඩ ඇතුළත් තැටියකට හෝ ශ්‍රව්‍ය පටියකට සවන් දීමට යොමු කරන්න. (ජපන් ජාතික Kitaro නම් ලෝක ප්‍රසිද්ධ සංගීතඥයා විසින් The Silk Road ආදි නම්වලින් පරිගණකය ම යොදා ගනිමින් කළ සංගීත නිර්මාණ රාශියක් ඇත. මීට අමතර ව ශ්‍රී ලංකාවේ සංගීතඥයන් විසින් ද සත් සමුදුර තේමා වාදනය පරිගණකය පමණක් ම යොදා ගනිමින් කළ නිර්මාණ වෙළෙඳ පොළේ ඇත.)

02. එම සංගීතයේ ඇති තත්ත්වය ත් සාම්ප්‍රදායික සංගීත භාණ්ඩවලින් නැගෙන රාවය ත් සවන් දෙමින් ඒ පිළිබඳ ව සාකච්ඡා කරන්න.

03. මෙම ක්‍රියාකාරකම සම්බන්ධ ව පරිගණකය හා එහි ඇති කොටස් පිළිබඳ මූලික දැනුම විමසීමට පහත දැක්වෙන ක්‍රියාකාරකමෙහි යොදවන්න.

**ක්‍රියාකාරකම 01.**

01. පරිගණකයක් අසලට කැඳවාගෙන ගොස් එහි ඇති විවිධ කොටස් නම් කිරීමට සලස්වන්න.

02. පහත දැක්වෙන කොටස් කෙටියෙන් හඳුන්වන්න.

a) Monitor

b) Key Board

c) Mouse

d) System Unit

e) Speaker



03. සිස්ටම් යුනිට් කොටස ඇතුළත ඇති උපාංග හඳුනා ගැනීමට සලස්වා ඒවා සංගීත නිර්මාණ කාර්යයන් හි දී දායක වන අයුරු පිළිබඳ ව විමසන්න.

a) Mother Board

b) RAM

c) Hard Disk

d) Sound Card

e) VDA Card

f) MODEM

g) TV Card

04. පරිගණකය හා සම්බන්ධ පහත දැක්වෙන මූලික කොටස් මොනවා දැයි හඳුන්වන්න.

1. Hard Ware

2. Soft Ware

a. Application Software

b. Opereting System (OS) Software

05. පරිගණකය හා සම්බන්ධ ව තොරතුරු තාක්ෂණයේ දී කරනු ලබන පහත දැක්වෙන ක්‍රියාවලින් මොනවා දැයි විස්තර කරමින් එම ක්‍රියාවලි ඉටු කරලීමට සහාය වන උපාංග හඳුන්වන්න.

1. Input

2. Process

3. Store

4. Out Put

06. සංගීත නිර්මාණය හා ගායන වාදන හා සම්බන්ධ පහත දැක්වෙන කරුණු හඳුන්වන්න.

1. MIDI File Format හා ඊට වැය වන Kilo Byte, Megabite, ඉඩකඩ ප්‍රමාණය පිළිබඳ තොරතුරු.

2. Wave File Format හා ඊට වැය වන Kilo Byte, Megabite, ඉඩකඩ ප්‍රමාණය පිළිබඳ තොරතුරු.

3. MP3 File Format හා ඊට වැය වන Kilo Byte, Megabite, ඉඩකඩ ප්‍රමාණය පිළිබඳ තොරතුරු.

4. DVD File Format හා ඊට වැය වන Kilo Byte, Megabite, ඉඩකඩ ප්‍රමාණය පිළිබඳ තොරතුරු.

ක්‍රියාකාරකම 57

# සංගීතය පටිගත කිරීම, සංගීත නිර්මාණයක් කිරීම, සංගීතය සංරක්ෂණය හා සංයෝජනය කරයි.

නිපුණතාව 10 :- සංගීතය හා බැඳි භෞතික විද්‍යාත්මක තත්ත්වයන් අධ්‍යයනය කර ප්‍රසංගාත්මක හැකියා වඩාත් සාර්ථක ලෙස ඉදිරිපත් කරයි.

නිපුණතා මට්ටම :- නව තාක්ෂණික උපකරණ සංගීත නිර්මාණයේ දී සහ අධ්‍යයනයේ දී උපයෝගී වන අයුරු පරීක්ෂා කරමින් භාවිත කරයි.

ක්‍රියාකාරකම :- සංගීතය පටිගත කිරීම, සංගීත නිර්මාණයක් කිරීම, සංගීතය සංරක්ෂණය හා සංයෝජනය කරයි.

ඉගෙනුම් පල :-
- පරිගණකය ආශ්‍රිත සංගීත නිර්මාණය හා බැඳි ක්‍රියාකාරකම් හඳුනා ගනී.
- මෘදුකාංග භාවිත කරමින් සංගීත නිර්මාණය කරයි.

කාලච්ඡේද :- 10

ගුණාත්මක යෙදවුම් :- පරිගණකය ඇසුරින් නිර්මාණය කරන ලද සංගීත කෘති කිහිපයක්, CuBase 5 මෘදුකාංගය ස්ථාපිත කරන ලද පරිගණකයක් හෝ කිහිපයක් හෝ (පරිගණක විද්‍යාගාරය මේ සඳහා භාවිත කරන්නේ නම් ඉතා සුදුසු වේ.)

- External Sound Card එකක්
- Microphone එකක්
- Midi Keyboard එකක්
- Moniter Speakers

විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක් :-

10, 11 ශ්‍රේණිවල දී මේ පිළිබඳ ව අධ්‍යයනය කරන ලද මූලික කරුණු වඩාත් පුළුල් වශයෙන් අධ්‍යයනය කිරීම මෙම පාඩමෙන් අපේක්ෂා කෙරේ. මෙම ක්‍රියාකාරකම් පිළිබඳ ව ප්‍රායෝගික අවබෝධය ගුරුවරයාට නොමැති නම් සම්පත් පුද්ගල දායකත්වයක් ලබා ගත යුතු ම ය. ඒ සඳහා ගුණාත්මක යෙදවුම් මුදලේ Hop කොටසින් අදාළ මුදල් යොදවා ගත යුතු ය. (ඉහත ගුණාත්මක යෙදවුම් (B කොටසේ සඳහන්) සම්පත් දායකයා මඟින් සපයා ගන්න.)

පරිගණක සංගීතයේ දී stainberg සමාගම විසින් නිර්මාණය කරන ලද ලොව වැඩි වශයෙන් භාවිත වන cubase 5 නමැති මෘදුකාංගයෙන් කුඩා සංගීත ඛණ්ඩයක් නිර්මාණය කිරීම හා පටිගත කිරීමක් අධ්‍යයනය කිරීම මෙම පාඩමෙන් අපේක්ෂා කෙරේ. cubase 5 වෙනුවට එම සමාගමෙන් ම නිර්මාණය කරන ලද nuendo මෘදුකාංගය ද මේ සඳහා භාවිත කළ හැකි ය. මෙම මෘදුකාංග දෙක ම ඉතා ම සමාන වන අතර interface ද (මුහුණත) සමාන වේ. මෙම පාඩමට ආරම්භයක් වශයෙන් ක්ෂේත්‍ර චාරිකාවක් ලෙස ඔබ ප්‍රදේශයේ ඇති ශබ්දාගාරයකට සිසුන් රැගෙන

ගොස් නැරඹීමට හැකි නම් ඉතා අගනේ ය. දායකත්වය ලබා ගැනීම අපහසු ගුරුවරු කලාපයේ සංගීත විෂයය භාර ස. අ. අ. හෝ ගුරු උපදේශක හෝ සමග සාකච්ඡා කොට පාසල් කිහිපයක සිසුන් එකතු කර මෙම කාර්යය කරන්න.

පාඩම සංවර්ධනය :-

- 10 හා 11 ශ්‍රේණිවල දී පරිගණක ආශ්‍රිත සංගීත නිර්මාණය හා බැඳි ක්‍රියාකාරකම්වලින් ලැබූ දැනුම විමසීමෙන් හා ක්ෂේත්‍ර චාරිකාවක් මඟින් මෙම පාඩමට ප්‍රවේශයක් ලබා ගත හැකි ය.
- Cubase 5 හෝ Nuendo හෝ මෘදුකාංගය මගින් සංගීත කොටසක් නිර්මාණය කරන්න. (මෙම සංගීත ඛණ්ඩය ඇමුණුම 05 සඳහන් වේ.) පටිගත කිරීමක් කරන්න. සිසුන්ට නිර්මාණ ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසන්න. සමාලෝචනයක යෙදෙන්න. (ඇමුණුම 01)

ĐT INSTRUMENT මගින් DRUM BEAT එකක් නිර්මාණය කරන්න.

(කා. ජේ. 02)

ඇමුණුම 02 ට අනුව VST INSTUMENT

මගින් - CHORD - SLUR (PAD)

RHYTHM

BASS (කා.ජේ. 03)

ඇමුණුම 03 :- එම නිර්මාණයට අනුව කටහඬ පටිගත කරන්න. (කා. ජේ. 02)

ඇමුණුම 04 :- සරල FX (EFECTS) කිහිපයක් භාවිත කොට එම ගීතය සංයෝජනය (mix) කර ගන්න. (කා. ජේ. 03)

ඇගයීම :- පරිගණකය ඇසුරින් සංගීත ඛණ්ඩයක් නිර්මාණය කොට සංයෝජනය කරන්න.

අතිරේක උදවු :- අන්තර්ජාලය - youtube (how to create song with cabase)

මේ සම්බන්ධ ලියැවුණු පතපොත

විෂය කරුණු සාරාංශය :- VST Instrument

Recording

Voicing

Dubbing

Mixing

## පළමු වාරයේ ඇගයීම - ප්‍රායෝගික

**1. ආවරණය කෙරෙන නිපුණතා මට්ටම - 1.2**

උත්තර භාරතීය සංගීතයට අයත් රාග කිහිපයක ස්වභාවය සහ සමවිෂමතා හඳුනා ගනිමින් ගායනයෙ වාදනයේ යෙදේ.

**2. විෂය සන්ධාරය -**

භාගේශ්‍රී රාගය (සර්ගම් සහ මධ්‍යලය ගීත සමග රාග විස්තර හා ස්වර විස්තාර, කෙටි ආලාපඛණ්ඩ විශේෂ ස්වර සංගති, තානාලංකාර සමඟ ප්‍රායෝගික ව - ආලාප- මුඛ්‍යාංග )

**3. උපකරණයේ සවභාවය**

ප්‍රායෝගික ව ගායනයේ / වාදනයේ යෙදවීම.

**4. කාලය** කාලච්ඡේද 02

**5. අරමුණු** -

- රාගධාරී ගීත ප්‍රාසාංගික අංගයක් ලෙසට ඉදිරිපත් කරයි.
- රාගයේ ස්වභාවය පැහැදිලි කරයි.
- රාග විස්තර පැහැදිලි කරයි.
- රාගධාරී සංකල්ප කිහිපයක් පිළිබඳ ව පැහැදිලි කරයි.

**6. උපකරණ ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස්**

ගුරු උපදෙස්

- පළමු වාරයට අයත් බාගේශ්‍රී රාගය පළමු වාරයේ ප්‍රායෝගික ඇගයීම සඳහා යොදා ගත හැකිය. මේ අනුව ඉදිරි වාරවලට අයත් රාග ද මේ අනුව සකසා ගත හැකි ය.
- ක්‍රියාත්මක කරවීම.
  1 රාගයට අයත් සර්ගම් ගීතය ගායනයට/වාදනයට සලස්වන්න.
  2 ස්වර විස්තාරයක් හෝ ස්වර සංගති 4 ක් ගායනයට/වාදනයට සලස්වන්න.
  3. රාගයට අයත් මධ්‍යලය ගීතය ගායනයට හෝ වාදනයට සලස්වන්න.
  4. රාගයට අයත් තානාලංකාර ගායනයට හෝ වාදනයට සලස්වන්න.
  5. ඉදිරියේ දක්වෙන ප්‍රශ්න 4 ඉදිරිපත් කර පිළිතුරු ලබා ගන්න. (එක් පිළිතුරකට ලකුණු 01 බැගින් පිළිතුරු 4 ට ලකුණු හතරකි)

1 රාගයේ වාදි සංවාදී නම් කරන්න.
2 රාගයේ මුඛ්‍යාංගය ප්‍රායෝගික ඉදිරිපත් කරන්න.
3 ආලාප වර්ග නම් කර ඉන් එක් වර්ගයකට ප්‍රායෝගික උදාහරණයක් ලෙස කෙටි ආලාප කොටසක් ඉදිරිපත් කරන්න.
4 රාගයේ ආරෝහණ - අවරෝහණ ප්‍රායෝගික ව ඉදිරිපත් කරන්න.

නිර්ණායක -

| | | |
|---|---|---|
| 1 | සර්ගම් ගීතය නිවැරදි ව ගායනය කිරීම | ලකුණු 04 |
| 2 | ස්වර විස්තාරයක් හෝ ස්වර සංගති 4 ක් ගායනයට/වාදනයට | ලකුණු 04 |
| 3. | මධ්‍යලය ගීත නිවැරදිව ගායනය / වාදනය කිරීම | ලකුණු 04 |
| 4 | තානාලංකාර ගායනයට හෝ වාදනයට | ලකුණු 04 |
| 5 | කෙටි ප්‍රශ්න හතරේ පිළිතුරුවල නිරවද්‍යතාවයට | ලකුණු 04 |

## පළමු වාරයේ ඇගයීම - ප්‍රායෝගික නොවන

1. **ආවරණය කෙරෙන නිපුණතා මට්ටම** - 3.1

තාලයේ ගති ලක්ෂණ පැහැදිලි කරමින්, දේශීය සහ භාරතීය විවිධ තාල අතර ස්වභාවය හඳුනා ගනිමින් තාල නිරූපණය කරයි.

2. **විෂය සන්ධාරය** -

තාල සංකල්පය (ගති මිති ලය සහ තාලපදයක කොටස්)
ත්‍රිතාල්, ඣප්තාල්, දීප්චන්දි, දාදරා හඳුනා ගැනීමේ
අභ්‍යාස සහ සමගුණ, දෙගුණ නිරූපණය
ත්‍රිතාල්, ඣප්තාල්, දීප්චන්දි, දාදරා තාලවල අවනද්ධාක්ෂර
තබ්ලාවේ නිකුත් වන අයුරු

3. **උපකරණයේ සවභාවය**

කණ්ඩායම් ක්‍රියාකාරකම්

4. **කාලය** කාලච්ඡේද 02

5. **අරමුණු**

- ත්‍රිතාල්, ඣප්තාල්, දීප්චන්දි, දාදරා යන තාල පදවල කොටස් සහ විශේෂතා පැහැදිලි කරයි.
- එම තාල පද සමගුණ හා දෙගුණ වශයෙන් නිරූපණය කරයි.
- එම තාල පද තබ්ලාවෙන් නිකුත් වන අයුරු තබ්ලාවෙන් හෝ රූප සටහන් මඟින් පැහැදිලි කරයි.
-

6. උපකරණ ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස්

ගුරු උපදෙස්

- සිසුන් කණ්ඩායම් 04 කට බෙදන්න. ත්‍රිතාල්, ඣප්තාල්, දීප්චන්දි, දාදරා යන තාල පද අහඹු ලෙස කණ්ඩායම් 04 ට බෙදා දෙන්න. පහත දැක්වෙන ක්‍රියාකාරකම්වල යොදවන්න.

සිසු උපදෙස් - ක්‍රියාත්මක කරවීම.

1 ඔබ කණ්ඩායමට නියමිත තාල පදය සමගුණ හා දෙගුණ වශයෙන් නියමිත සංඥා සහිත ව ප්‍රස්තාර කරන්න.
2 එම තාල පදය සම ගුණ හා දෙගුණ වශයෙන් කණ්ඩායමේ සියලු සාමාජිකයින් එකවර අතින් තාල දමා නිරූපණය කරන්න.
3. එම තාල පදයේ අවනද්ධාක්ෂර තබ්ලාවෙන් නිකුත් වන අයුරු සුදුසු සටහනක් මඟින් පෙන්වා දෙන්න.
4. එම තාලයට අයත් ප්‍රචලිත ගීත 4 ක පළමු පාද තාලයට අනුව ප්‍රස්තාර කර ප්‍රායෝගික ව පෙන්වන්න.
5. ගුරුවරයා විසින් වයනු ලබන තාල පද 4 වෙන් කොට හඳුනාගෙන නම් කරන්න.

නිර්ණායක -

| | | |
|---|---|---|
| 1 | දෘශ්‍ය උපකරණයේ තොරතුරුවල නිවරැදි බව හා නිර්මාණාත්මක බව | ලකුණු 04 |
| 2 | තාල පදය සම, දෙගුණ වශයෙන් නිරූපණය | ලකුණු 04 |
| 3. | අවනද්ධාක්ෂර තබ්ලාවෙන් නිකුත් වන අයුරු දැක්වීම | ලකුණු 04 |
| 4 | තාලයට අනුව ප්‍රචලිත ගීත 4 ක කොටස් ප්‍රායෝගික ව දැක්වීම. | ලකුණු 04 |
| 5 | ශ්‍රවණ මාධ්‍යයෙන් තාල පද වෙන් කර හඳුනා ගැනීම | ලකුණු 04 |

**පළමු වාරයේ ඇගයීම - ප්‍රායෝගික නොවන**

**1. ආවරණය කෙරෙන නිපුණතා මට්ටම - 2.1**

සංගීතයේ පොදු ලක්ෂණ හා වෙනස්කම් විචාරාත්මක ව දැක්වීමට තොරතුරු රැස් කරයි.

**2. විෂය සන්ධාරය -**

- විවිධ නිර්වචන මගින් සංගීතය යනු පැහැදිලි කිරීම.
- සංගීතයේ වෙනස්කම් හා ඊට බලපාන හේතු (භාෂාව, දේශගුණික, භූගෝලීය සාධක)
- ලෝක සංගීතයේ එකිනෙකට වෙනස් පද්ධති (පෙරදිග සහ අපරදිග සංගීත පද්ධති දෙකෙහි ස්වභාවය Melody & Harmony සිද්ධාන්තය, ස්වර සාධනය)

**3. උපකරණයේ සවභාවය**

පැවරුම/ ඉදිරිපත් කිරීම
(ලිපියක් හෝ Powerpoint Presentation එකක්)

**4. කාලය** කාලච්ඡේද 02

**5. අරමුණු**

- සංගීතය පිළිබඳ විවිධ නිර්වචන රැස්කරයි.
- සංගීතයේ වෙනස්කම් හා ඊට බලපාන හේතු පැහැදිලි කරයි.
- ලෝක සංගීතයේ එකිනෙකට වෙනස් පද්ධති දක්වයි.
- අප්‍රිකානු සංගීතය ඇසුරින් විශ්ව සංගීතයේ ස්වභාවය හා විශේෂතා ඇතිවන අයුරු පැහැදිලි කරයි.
- Melody & Harmony සිද්ධාන්තය ස්වර කණ්ඩ මඟින් පැහැදිලි කරමින් භාරතීය සංගීතයේ ස්වභාවය අර්ථ දක්වයි.

6. උපකරණ ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස්

ගුරු උපදෙස්

- විෂය සන්ධාරයේ දැක්වෙන මාතෘකා අළලා විද්‍යාලයේ වාර්ෂික සඟරාවේ පළ කිරීමට සුදුසු ලෙස ලිපියක් සකස් කරවන්න. නැතහොත් පරිගණක අංශය භාවිත කර Powerpoint Presentation එකක් සකස් කරවන්න.
- අවශ්‍ය අවස්ථාවල දී රූපසටහන් ස්වර ඛණ්ඩ, Video Clips ආදිය යෙදීමට පොළඹවන්න. උපුටා ගත් කොටස් හා අදාළ ග්‍රන්ථ නිවැරදි ව දැක්වීමට මග පෙන්වන්න.
- ලිපියේ/ Powerpoint Presentation එකේ දැක්වෙන කරුණු පන්තිය ඉදිරියේ ඉදිරිපත් කරවන්න.

නිර්ණායක -

1. සකස් කළ ලිපියේ/Presentation එකේ සාරවත් බව ලකුණු 04
2. උපකරණයේ ආකර්ෂණීය බව හා නිර්මාණාත්මක බව ලකුණු 04
3. තර්කානුකූලව නිදසුන් දක්වමින් පැහැදිලි කිරීම ලකුණු 04
4. ඉදිරිපත් කිරීමේ කුසලතාවය ලකුණු 04
5. සමස්තය ලකුණු 04

## දෙවන වාරයේ ඇගයීම - ප්‍රායෝගික

**1. ආවරණය කෙරෙන නිපුණතා මට්ටම්**

1.2 උත්තර භාරතීය සංගීතයට අයත් රාග කිහිපයක ස්වභාවය සහ සමවිෂමතා හඳුනා ගනිමින් ගායනයෙ වාදනයේ යෙදේ.

1.3 සම්භාව්‍ය සංගීතයේ උසස් දක්ෂතා ප්‍රදර්ශනය කිරීමට උපයෝගි වන සංකල්ප පිළිබඳ අදහස් දක්වමින් ඒවා පිළිබඳ තමා තුළ ඇති ශිල්පීය ප්‍රාගුන්‍ය ප්‍රදර්ශනය කරයි.

**2. විෂය සන්ධාරය** -

දේස් රාගය (සර්ගම් සහ මධ්‍යලය ගීත සමඟ රාග විස්තර හා ස්වර විස්තාර, කෙටි ආලාප ඛණ්ඩ විශේෂ ස්වර සංගති, තානාලංකාර සමඟ ප්‍රායෝගික ව - ආලාප- මුඛ්‍යාංග)
දේස් - තිලක්කාමෝද් යන රාග යුගලයන්හි සම ප්‍රකෘති බව
මීන්ඩ්, ගමක්, කණ්, මූර්කි, උපජ්, ජලා, මුකඩා, තිහායි, සිද්ධාන්තික සහ ප්‍රායෝගික)

**3. උපකරණයේ ස්වභාවය**

ප්‍රායෝගික ව ගායනයේ / වාදනයේ යෙදවීම.

**4. කාලය** කාලච්ඡේද 02

**5. අරමුණු** -

- රාගධාරී ගීත ප්‍රාසාංගික අංගයක් ලෙසට ඉදිරිපත් කරයි.
- රාගයේ ස්වභාවය පැහැදිලි කරයි.
- රාග විස්තර පැහැදිලි කරයි.
- රාගධාරී සංකල්ප කිහිපයක් පිළිබඳ ව පැහැදිලි කරයි.
- දේස්-තිලක්කාමෝද් සම ප්‍රකෘති බව පැහැදිලි කරයි.
- මීන්ඩ්, ගමක්, කණ්, මූර්කි, උපජ්, ජලා, මුකඩා, තිහායි, යන සංකල්ප පැහැදිලි කරයි.

6. උපකරණ ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස් :-

ගුරු උපදෙස්

- දෙවන වාරයට අයත් දේස් රාගය දෙවන වාරයේ ප්‍රායෝගික ඇගයීම සඳහා යොදා ගත හැකිය. මේ අනුව ඉදිරි වාරවලට අයත් රාග ද මේ අනුව සකසා ගත හැකිය.
  මීන්ඩ්, ගමක්, කණ්, මූර්කි, උපජ්, ජලා, මුකඩා, තිහායි, යන සංකල්ප අහඹු ලෙස එක් එක් ශිෂ්‍යාගෙන් වෙන් වෙන්ව විමසන්න. අවශ්‍ය අවස්ථාවල දී ප්‍රායෝගික ව දැක්වීමට නියම කරන්න.
- ක්‍රියාත්මක කරවීම.

1. රාගයට අයත් සර්ගම් ගීතය ගායනයට/වාදනයට සලස්වන්න.
2. රාගයට අයත් මධ්‍යලය ගීතය ගායනයට හෝ වාදනයට සලස්වන්න.
3. රාගයට අයත් තානාලංකාර ගායනයට හෝ වාදනයට සලස්වන්න.
4. දේස් - තිලක්කාමෝද් රාග දෙකේ සමප්‍රකෘති බව ස්වර ඛණ්ඩ මඟින් ප්‍රායෝගික ව දැක්වීමටත්, ගුරුවරයා වාචිකව හා කේවලව අසනු ලබන ප්‍රශ්නවලට පිළිතුරු ලබා දීමටත් සිසුන් යොමු කරන්න.
5. මීන්ඩ්, ගමක්, කණ්, මූර්කි, උපජ්, ජලා, මුකඩා, තිහායි, යන සංකල්ප පිළිබඳ ව ගුරුවරයා වාචිකව හා කේවලව අසනු ලබන ප්‍රශ්නවලට පිළිතුරු ලබා දීමට හෝ ප්‍රායෝගික ව දැක්වීමට සිසුන් යොමු කරන්න.

නිර්ණායක -

| | | |
|---|---|---|
| 1. | සර්ගම් ගීතය නිවැරදි ව ගායනය කිරීම | ලකුණු 04 |
| 2. | මධ්‍යලය ගීත නිවැරදි ව ගායනය / වාදනය කිරීම | ලකුණු 04 |
| 3 | තානාලංකාර ගායනයට හෝ වාදනයට | ලකුණු 04 |
| 4 | දේස්-තිලක්කාමෝද් සමප්‍රකෘති බව දැක්වීමට | ලකුණු 04 |
| 5. | රාගධාරී සංකල්ප පිළිබඳ පැහැදිලි කිරීමට | ලකුණු 04 |

**දෙවන වාරයේ ඇගයීම - ප්‍රායෝගික**

**1. ආවරණය කෙරෙන නිපුණතා මට්ටම :-**

7.1 ශ්‍රී ලංකාවේ රංග සම්ප්‍රදායයන් පිළිබඳ තොරතුරු දක්වමින් ගීත ගායනයේ/ වාදනයේ යෙදෙයි.

**2. විෂය සන්ධාරය :-**

- සොකරි, කෝලම්, රංග ශෛලීන්
- සොකරි, කෝලම්, ගීත ගායන
- නූර්ති, නාඩගම්, රංග ශෛලීන්
- නූර්ති, නාඩගම්, ගීත ගායනය/වාදනය
- නාඩගම් සංගීත ශෛලිය (විවිධ තනු, තාලපද, භාණ්ඩ) තෝඩායම, ඉන්නිසය, පොතේසින්දුව, උරුට්ටුව යන අංශ ඇතුළත් ගීත ප්‍රායෝගික ව

**3. උපකරණයේ සවභාවය :-**

කණ්ඩායම් ක්‍රියාකාරකම් කාලච්ඡේද 02

**5. අරමුණු :-**

- සොකරි, කෝලම්, රංග ශෛලීන් විස්තර කරයි.
- නූර්ති, නාඩගම්, රංග ශෛලීන් පැහැදිලි කරයි.
- නාඩගම් සංගීත ශෛලියේ විශේෂතා දක්වයි.
- ශ්‍රී ලංකාවේ සංගීතයේ විකාශයට හා වර්ධනයට රංග ශෛලීන් බලපා ඇති බව පිළිගනියි.
- සොකරි, කෝලම්, ගීත ගායනයේ යෙදෙයි.
- නූර්ති, නාඩගම්, ගීත ගායනය/වාදනයේ යෙදෙයි.

**6. උපකරණ ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස් :-**

ගුරු උපදෙස්

- සොකරි කෝලම් රංග ශෛලීන් පළමු වාරයේ දීත්, නාඩගම් නූර්ති රංග ශෛලීන් දෙවන වාරයේ දීත්, සිසුනට අධ්‍යයනය කිරීමට ඉඩ සැලසේ. මෙම ඇගයීම එම රංග ශෛලීන් හතර ම ආවරණය වන ලෙස ක්‍රියාත්මක කෙරේ.
- ඇගයීමට පෙර දිනක සිසුන් කණ්ඩායම් 04කට බෙදන්න. රංග ශෛලීන් හතර අහඹු ලෙස කණ්ඩායම් 04ට බෙදා දෙන්න. පහත දැක්වෙන ක්‍රියාකාරකම්වලට ගැළපෙන ලෙස සූදානම් වීමට සිසුන්ට කාලයක් ලබා දෙන්න. ඇගයීම් දිනයේ පහත දැක්වෙන ක්‍රියාකාරකම්වල යොදවා අගයන්න. සිසු උපදෙස් - ක්‍රියාත්මක කරවීම.

1. ඔබ කණ්ඩායමට නියමිත රංග ශෛලිය පිළිබඳ ව තොරතුරු ඉදිරිපත් කරන්න.
2 එම රංග ශෛලියට අදාළ ගීතයක් රංගනය සමඟ ගායනය කරන්න.
3. රංග සම්ප්‍රදායට අදාළ සංගීත ශෛලියේ විශේෂ කොටස් වාචික ව හා ප්‍රායෝගික නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න.

නිර්ණායක -

| | | |
|---|---|---|
| 1 | රංග ශෛලියට අදාළ තොරතුරුවල නිවරැදි බව | ලකුණු 04 |
| 2 | ගීත ගායනයට | ලකුණු 04 |
| 3. | රංගනයට | ලකුණු 04 |
| 4 | සංගීත ශෛලියේ විශේෂ කොටස් නිදසුන් මඟින් පැහැදිලි කිරීමට | ලකුණු 04 |
| 5 | සමස්ත ක්‍රියාකාරකමේ නිර්මාණාත්මක බවට | ලකුණු 04 |